# ධර්ම පහුර හිස තබාගෙන
# මෝහ ගඟ තරණය කරන්නෝ



ආචාර්ය තිස්ස සේනානායක

# ධර්ම පහුර හිස තබාගෙන
# මෝහ ගඟ තරණය කරන්නෝ

ආචාර්ය
තිස්ස සේනානායක

සියලු හිමිකම් කතෘ සතුය

ආචාර්ය තිස්ස සේනානායක සහ ආචාර්ය මහිමා සේනානායක
විසින් ප්‍රකාශයට පත් කරන ලදි.

පිටකවරය: සමන් කළුබෝවිල

ප්‍රථම මුද්‍රණය: (2009 නොවැම්බර්)
දෙවන මුද්‍රණය: (2010 ජනවාරි)

මුද්‍රණය (**සැන්වින් ප්‍රයිවට් ලිමිටඩ්
35/3, කැරගල පාර, දෙල්ගොඩ.**

බෙදාහැරීම: සමස්ථ ලංකා ශ්‍රී සුමේධ ආයතනය, අස්වැද්දුව, වඳුරඹ, ගාල්ල
ටෙලිපෝන්: 0914901205

Published by Tissa Senanayake (PhD) and Mahima Senanayake (PhD).

Copyright by Dr. Tissa Senanayake

Cover design: Saman Kalubowilla

First Printing: 2009 November

Second Printing: 2010 January

Printed by :Sanvin (pvt) Limited 35/3 Keragala Road, Delgoda.
Distribution: Samastha Lanka Sri Sumeda Society, Aswassuwa, Waduramba, Galle.
Teli: 0914901205
**ISBN** 978-0-9804613-1-2

ස්තුතිය

මෙම කෘතිය මවිසින් 'ඉරිදා ලංකාදීප' පුවත් පතට ලියූ ලිපි පෙළක එකතුවකි. ' ඉරිදා ලංකාදීපය' මෙම ලිපි පල නොකෙළේ නම් මෙවැනි පොතක් බිහි නොවනු ඇත. ලිපිවල ඇති වටිනාකම දැක එම ලිපි පළකිරීම සම්බන්ධයෙන් මම ඉරිදා ලංකාදීප පුවත්පතෙහි කර්තෘතුමා ඇතුළු විජය පුවත්පත් ආයතනයේ සියලු කාර්ය මණ්ඩලයට පළමුව ස්තුතිවන්ත වෙමි. ඉරිදා ලංකාදීපයේ ප්‍රේමකීර්ති මැතිතුමාට මම දුරකථනයෙන් කතා කළේ මගේ බොහොමයක් ලිපි පළකිරීමෙන් පසුවය. සතිපතා පුවත් පතක මෙවැනි ලිපිපෙළක් පළ කිරීමට පුරෝගාමීව ක්‍රියාකළ එතුමාට, මෙම ලිපිවල ඇති සත්‍ය ධර්මය යම් තරමකින් හෝ දුටු පාඨකයන් වෙනුවෙන් ස්තුතිවන්ත වෙමි. මෙහි පිටකවරය නිර්මාණය කර සෝදුපත බලාදුන්නේද ලංකාදීපයේම සේවය කරන සමන් කළුබෝවිල හා සුමිඳු මධුරංග මහත්වරුන් විසිනි. එතුමන්ලාට ද මගේ ස්තුතිය. ලිපි කියවා බලා අඩුපාඩු සකස් කර දුන් මගේ ආදරණීය බිරිඳ මහිමාටත් පොත මුද්‍රණය කරදුන් සැන්වින් මුද්‍රණ ආයතනයටත් මගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

අවසාන වශයෙන් මගේ මව්ටත් පියාටත් මගේ ප්‍රණාමය පුද කර සිටිමි.


ආචාර්ය තිස්ස සේනානායක,

කථිකාචාර්ය,

ගොරෝකා විශ්වවිද්‍යාලයය,

පැපුවා නිව්ගිනියා.

# පෙරවදන

ගෞතම බුදුන් වහන්සේ දේශනා කළ අකාලික වූ ලෝකෝත්තර ධර්මය (අකාලිකෝ භගවතෝ ධම්මෝ) කාලයාගේ ඇවෑමෙන් විලෝපනය විය. මාර්ගඵල ලාභීන්ගෙන් ලෝකය හිස් විය. අවුරුදු දෙදහස් පන්සියයකට පසු, සංසාර ගමන නතර කරන්නා වූ එම ලෝකෝත්තර ධර්මය නැවත විවෘත විය. ප්‍රඥාව පහළ විය. ප්‍ර ඥාවත් සමග කේතුමතී රාජධානිය ද පහළ විය. එම කේතුමතී රාජධානියෙහි, නැවත විවෘත වූ මෙම ලෝකෝත්තර ධර්මය තවත් ඉදිරියට අවුරුදු දෙදහස් පන්සියයක් පවත්නේය.

'ධර්ම පහුර හිස තබාගෙන මෝහ ගඟ තරණය කරන්නෝ' නැමති මෙම ලිපිපෙළින් ඉදිරිපත් කරන්නාවූ ලෝකෝත්තර ධර්මය කිසිම ධර්ම ග්‍රන්ථයකින් උපුටාගන්නා ලද ධර්මයක් නොවේ. මෙම ධර්මය, දැනුමත්, කාලයත් ඉක්මවා පහළ විය. සියලුම දැනුම සහ ධර්ම ඉක්මවූ මෙම සත්‍යය, දැනුම තුළින් ම ඉදිරිපත් කරනවා විනා විවෘත කළ හැකි අන් ක්‍රමයක් නැත. උත්පත්තියෙන් හා මරණයෙන් නිදහස් වීමටම මෙලොවට පැමිණි අය මෙම ධර්මය අසා ප්‍රඥාව පහළ කර ගනිති. මරණයෙන් නිදහස් වෙති. තවත් කොටසක් මෙම ධර්මය අසා, බුදු දහම විකෘති කරන්නේ යයි චෝදනා කරති. නමුත් මරණය දැක, මරණයෙන් නිදහස් වූ මට, මරණයෙන් නිදහස් වන්නාවූ මෙම ධර්මය අන් අයට කියා දීමට අයිතියක් ඇත. මෝහය නිසා යම් කෙනෙකුට සත්‍යයට එරෙහි විය හැකිය. නමුත් මෙම සත්‍යය වූ ලෝකෝත්තර ධර්මය විවෘත කිරීම වැළැක්වීමට කිසිවෙකුට නොහැකි ය. සත්‍යය දකින්නෝ මරණින් නිදහස් වෙති. සත්‍යයට එරෙහි වන්නෝ මරණය හිස තබාගෙන යති. තම ජීවිතය මරණයෙන් කෙළවර කර ගනිති.

දැනුම ඉක්මවූ ප්‍රඥාව පහළ කර ගැනීමට තමන් විසින්ම දැකිය යුතු සූත්‍ර ධර්ම 20 කින් මෙම කෘතිය සමන්විත වෙයි. තම මනසින් ගොඩනගා ගත් ලෝකය මායාවක් බව දැක, උප්පත්තියෙන් හා මරණයෙන් නිදහස් වීම පාඨකයා සතු කාර්යයකි. මෙම ලිපි ඒ සඳහා මගපෙන්වීමක් පමණි.

මෙහි පෙන්වා දී ඇති ධර්මය පිළිගැනීමට නොව දැකීම සඳහා වෙයි. යම් කෙනෙකුට, මෙම ධර්ම ප්‍රඥාගෝචර වේ නම් හෝ දැකිය හැකි නම්, ලෞකික ධර්ම අතහැර සත්‍ය දැකීමට එය උදව් වෙයි. මෙහි දැක්වෙන ධර්ම තමන්ට ප්‍රඥාගෝචර නොවේ නම් හෝ ලිපි වලින් කියවෙන ධර්ම දැකිය නොහැකි නම්, මෙම ධර්මයට එරෙහි වන්න, පිළිනොගන්න. ධර්මයට එරෙහි වූ කෙනෙකුට ද යම් දවසක ධර්ම දැක සසරින් නිදහස් විය හැකි ය. එවිට කල් පසු වී හෝ සත්‍ය දැකිය හැකි ය. බුදුන්ට බැණ වැදුන බමුණෝ පසුව බුදුන් දැක සත්‍ය දුටහ. නමුත් ධර්ම පිළිගැනීමෙන් අනාගතයේදී හෝ සත්‍ය දැකීමේ අවස්ථාව දුරස් වෙයි. ලෞකික ධර්ම වලින් නිදහස් වී සත්‍ය හෙවත් නිවන් දැකීමට කැමති යම් කෙනෙකුට මෙම ලිපි පෙළ කල්‍යාණ මිත්‍රයකු වනු ඇත.

මෙහි පලවන 'දානය සහ එහි ආනිශංස' නැමති ලිපියේ කොටසක් පෙරවදනෙහි සඳහන් කිරීමට කැමැත්තෙමි.

'බුදුන් වහන්සේගේ ස්‍රාවකයන් වූ ගරුතර සංඝරත්නය අවුරුදු දෙදහස් පන්සියයකට වඩා වැඩි කාලයක ත්‍රිපිටක ධර්මය ආරක්ෂා කරගෙන පවත්වාගෙන ආහ. උන්වහන්සේලා ඒ වෙනුවෙන් කරන ලද සේවය සුළුපටු නොවෙති. ත්‍රිපිටක ධර්මය ආරක්ෂා කර පවත්වාගෙන ඒමට ගරු ස්වාමීන් වහන්සේලා තම දෙමව්පිය නෑදෑ හිතවතුන් අතහැර දමා පැවිදි වූහ. පාළි භාෂාව ද පරතෙරට ඉගෙන ගත් හ. ධර්ම ග්‍රන්ථ ආරක්ෂා කරගැනීමට ජීවිතය පවා පූජා කළහ. මෙසේ ආරක්ෂා කරන ලද ත්‍රිපිටක ධර්ම නිසා දැන් සත්‍ය දහම මතු වන්නේ ය. මෙම පොතෙහි එකොලොස් වන පරිච්ඡේදයේ විවෘත කර ඇති චූලකම්ම විභංග සූත්‍රය ඒ සඳහා එක් උදාහරණයක් පමණි. ත්‍රිපිටක ධර්ම සංඝ රත්නය විසින් ආරක්ෂා කර නොතිබුණි නම්, එවැනි ධර්ම පහළ වන්නේ නැත. නමුත් සංඝ රත්නයේ වටිනාකම ගිහියන් වන අප වටහා ගෙන ඇත්තේ ඉතාමත් අඩුවෙනි. ඉතාමත් කනගාටුවට කරුණ නම් බොහෝ ගිහියන්ගේ ආකල්පය වන්නේ සංඝ රත්නය වැඩ සිටින්නේ දන් දී තම මළගිය ඥාතියාට පිං පැමිණ වීමටත්, මතක බණ දේශනා කිරීමටත්, පමණක් ය යන්නයි. මෙය ඉතා අවාසනාවන්ත කරුණකි. සිල්වත් දුසිල්වත් ආදී කිසිම බෙදීමකින් හා ලාබ සත්කාරයකින්

තොරව සංඝ රත්නයට උපස්ථාන කිරීමට ගිහියන් වන අපි ඇප කැප වී සිටිය යුතුය. එය පිං තකා කරන ක්‍රියාවක් නොවිය යුතු ය.

නැවත ආරම්භ වී ඇත්තේ ගමත් පන්සලත් එක්තැන් කරන ප්‍රඥා යුගයයි. මම කුඩා කාලයේදී පන්සල යනු භාවනා මධ්‍යස්ථානයක් නොවීය. එකල පන්සලේ හාමුදුරුවන් වහන්සේලා භාවනා කුටි තුළ සිර නොවූ හ. දායකතුමන්ලා සමග ධර්ම කරුණු සාකච්ඡා කිරීමට උන්වහන්සේලාට කාලය තිබුණි. එකල බුදු දහම යනු ආගමක් ද නොවීය. 'අන්‍ය ආගමිකයන්' යන වචනය එදා බෞද්ධයෝ භාවිත නොකළහ. ඒ වෙනුවට ඔවුහු භාවිත කලේ 'ආගම් කාරයෝ' යන වචනයයි. බෞද්ධයා යනු 'ආගම් කාරයෙක්' නොවන බැවින් ආගම් අදහන අය බෞද්ධයා විසින් මේ නමින් හැඳින්වූහ. එකල පන්සල යනු ධර්මය දේශනා කරන, ධර්මය සාකච්ඡා කරන තෝතැන්නක් විය. නමුත් සත්‍යය විලෝපනය වී තිබූ බැවින් සද්ධර්මය විවෘත නොවීය. වර්තමානයේ යළිත් බුදුදහම මතුවී ඇති බැවින් ගෞතම බුදුන් වහන්සේ තම මෑණියන්ට දේශනා කළ සිල්ව්‍රත වලින් තොරවූ හේතුඵල දහම (අව්‍යා කථා) පන්සලේ දර්ම ශාලාවෙහි දී නැවත විවෘත වනු ඇත. පන්සලේ දායකතුමන්ලාත් හාමුදුරුවන් වහන්සේලාත් මෙම ධර්ම කරුණු සාකච්ඡා කරනු ඇත. තමන් ලබාගත් මෙම ජීවිතයේදීම මරණයෙන් නිදහස් වනු ඇත.

ඔබට පැනනැගෙන විසඳීමට අපහසු යම් ප්‍රශ්නයක් ඇත්නම් කරුණාකර මා වෙත එවන්න. ඔබේ විවේචන අගය කරමි.

ආචාර්ය තිස්ස සේනානායක

2009/09/10

Address in overseas:

Dr. Tissa Senanayake (PhD in Astrophysics)
Lecturer
Department of Mathematics and Computing
The University of Goroka
P.O.Box 1078, Goroka
Eastern Highland Province
Papua New Guinea (PNG)
E-mail: tissamahima@gmail.com
Phone: +6755321747

ශ්‍රී ලංකාවේ ලිපිනයට

ඝීපොල්වත්ත” කොබ්බෑවලල ගම්පොල

ටෙලිෆෝන්ට

+94716585871 +94813750672

# පිරිනැමුම

ආදරණීය කල්‍යාණ මිත්‍ර මාගේ ගුරුදේව සිරිවර්ධන
ලොකුගේ මැතිතුමාට

# පටුන


| | | |
|---|---|---|
| 1 | භෞතික විද්‍යාවේ අසත්‍ය පදනම හෙවත් මනසින් සාදාගත් ලෝකය | 1 |
| 2 | අකාලික විශ්වය තුළ මනසින් සාදාගත් කාලික භෞතික විද්‍යාව | 7 |
| 3 | දැනුමෙන් කාලයට, කාලයෙන් මරණයට | 13 |
| 4 | ධර්ම පහුර හිස තබාගෙන මෝහ ගඟ තරණය කරන්නෝ | 23 |
| 5 | අකාලික විශ්වය සහ අයින්ස්ටයින් විශ්වය | 27 |
| 6 | සත්‍ය ගවේශණය හෙවත් ධර්මය අතහැරීම | 32 |
| 7 | දානය සහ එහි ආනිශංස | 40 |
| 8 | එළු ව්‍රත බලු ව්‍රත සහ සිල් ව්‍රත | 46 |
| 9 | හේතුඵල දහම සහ තද නින්ද | 52 |
| 10 | කර්මය සහ දෙවියන් වහන්සේගේ කැමැත්ත | 58 |
| 11 | චූලකම්ම විභංග සූත්‍රය | 65 |
| 12 | ගැල්කරුවන් බිහිකරන තක්සලාව | 74 |
| 13 | පංච උපාදානස්කන්ධය දැනුම සහ වසුරු කඳ | 80 |
| 14 | අනිත්‍ය දුක්ඛ අනාත්ම | 87 |
| 15 | පංච උපාදානස්කන්ධය සහ විදර්ශනාව | 94 |
| 16 | චුල්ල පන්තක සහ මහා පන්තක | 100 |
| 17 | අත්තාහි අත්තනො නාතෝ | 105 |
| 18 | අන්තරා භවය ගන්ධබ්බයා සහ කාලය | 108 |
| 19 | සිත එකඟ කරගැනීම දරුවන්ට සුදුසු ද | 112 |
| 20 | අරංතලාවෙන් හෙළිකරන ලෝකෝත්තර දහම | 120 |
| 21 | ප්‍රශ්න සහ පිළිතුරු | 127 |

**1**

# භෞතික විද්‍යාවේ අසත්‍ය පදනම හෙවත් මනසින් සාදාගත් ලෝකය

පංච ඉන්ද්‍රියන්ට දෘශ්‍ය වන්නා වූ පදාර්ථයත් අදෘශ්‍ය වන්නා වූ මනසත් පදනම් කොටගෙන ලෝකයේ සියලුම විද්‍යාවන් ද දර්ශන ද ආගම් ද බිහි වී ඇත. භෞතික විද්‍යාව අනුව අපි ඇසෙන් වර්ණ රූපත් එහි හැඩයත් දකින්නෙමු. කණ නැමති ඉන්ද්‍රියෙන් අපි ශබ්ද අසන්නෙමු. මේ ආකාරයට ම නාසයෙන් ගඳ සුවඳ ද දිවෙන් රසය ද ශරීරයෙන් ස්පර්ශය ද ලබා ගන්නෙමු. කෙටියෙන් පැහැදිලි කළහොත්, අපි ඇසෙන් වර්ණ රූප ද, කණෙන් ශබ්ද රූප ද, දිවෙන් රස රූප ද, නාසයෙන් ගන්ධ රූප ද, ශරීරයෙන් ස්පර්ශ රූප ද ග්‍රහණය කර ගන්නේ යැයි පිළිගන්නෙමු.

මෙම පිළිගැනීම සත්‍යයක් ද? දකින්නට බාහිර වර්ණ තිබේ ද? අසන්නට ශබ්ද තිබේ ද? ග්‍රහණය කරගන්නට රස, ගන්ධ, ස්පර්ශ බාහිර තිබේ ද? බාහිර වර්ණ, ශබ්ද, රස, ගන්ධ සහ ස්පර්ශ පිළිගෙන, නිර්මාණය කරගෙන ඇති දැනුම සත්‍යයද? මේ ඔබට මෙතෙක් කල් පැන නොනැගුණු ප්‍රශ්න වැළකි.

වර්ණ, ශබ්ද, ගන්ධ, රස ස්පර්ශ නම් වූ පංච රූප පදනම් කරගත් භෞතික ලෝකය හෙවත් දැනුම අප විසින් නිර්මාණය කර ගන්නා ලැබුවේ ගුරු දෙගුරුන් ආදී බාහිර පුද්ගලයන්ගෙනි. බාහිරයෙන් ලබාගත් දැනුම අපි ගවේෂණය කර විශ්ලේෂණය කර තවත් අලුත් දැනුමක් අප විසින් නිර්මාණය කර ගනු ලැබූවෙමු. මෙම අලුත් දැනුම ලෝකයට ඉදිරිපත් කර ආචාර්ය මහාචාර්ය ආදී උපාධි ද ලබා ගනිති. නමුත් සියලුම ආචාර්ය මහාචාර්යවරුන් දැනගත යුතු එක් කරුණක් නම්, ඔබ නිර්මාණය කර ගත් අලුත්

දැනුමට ද පදනම වූයේ, ළදරු කාලයේ සිට අනුන්ගෙන් අසා ඉගෙනගත් දැනුම ම බවයි.

ඔබ විසින් ළදරු කාලයේදී ඇසින් දුටු රූප ගැනත්, කනෙන් ඇසූ ශබ්ද ගැනත්, දිවෙන් ගත් රස ගැනත්, නාසයෙන් දැණුන ගන්ධය ගැනත් ශරීරයෙන් ලැබූ ස්පර්ශ ගැනත් ඔබට කුතුහලයක් උපදී. බහ තෝරන වියට පැමිණි විට මේ වස්තුව මොකක්ද? මේ ශබ්දය කුමක්ද? මේ රසය කුමක්ද? ආදී වශයෙන් ප්‍රශ්න නගන්නට පටන් ගන්නා ලද්දේ මෙම කුතුහලය නිසාවෙනි. වැඩිහිටියෝ ඒවාට මේ පුතේ පුටුව, ඒ කාක්කෙක් කෑ ගසන ශබ්දය ආදී වශයෙන් පිළිතුරු දුන්හ. මේ ආකාරයට අනුන්ගෙන් අසා දැනගත් දැනුමක් ඔබ තුළ ඇත. මෙම දැනුමට අනුව බාහිර වස්තු ඇත. එම වස්තුවල වර්ණ ඇත. ශබ්ද පැන නගී. ආහාරවල රසයද ගන්ධයද ඇත. ඔබේ මෙම දැනුම 'දේවල් තිබෙනවාය', 'පුද්ගලයින් ඉන්නවාය' යන පිළිගැනීම මතපදනම් වී ඇත්තේ ය.

ඔබ මේසයකට තට්ටු කරන්නේ යයි සිතන්න. එවිට ශබ්දයක් පැන නැග්ගේ යයි ද එම ශබ්දය ඔබට ඇසෙන්නේ යයි ද ඔබ පිළිගනී. මෙහිදී සිදුවන භෞතික ක්‍රියාවලිය අපි ලබාගත් දැනුමෙන් පැහැදිලි කර ගැනීමට උත්සාහ කරමු. මේසයට තට්ටු කරන විට තට්ටු කළ ස්ථානයෙන් මේසය යම් ප්‍රමාණයක් පහළට තල්ලු වී යයි. නමුත් මේසය සාදා ඇති දැව වල ප්‍රත්‍යස්ථ ගුණය නිසා නැවත මේසය මුල් තත්ත්වයට පැමිණේ. භෞතික විද්‍යාවට අනුව අපි මෙය කම්පනයක් යයි කියමු. මේසයේ සිදුවන කම්පනය හේතුකොට ගෙන එම ස්ථානය අසල ඇති වායු අංශු ද කම්පනය වෙයි. මෙම කම්පනය වාතය හරහා සෑම දිශාවකටම ගමන් කරයි (වාතය හරහා කම්පනය ගමන් කරනු විනා වායු අංශු ගමන් නොකරන බව භෞතික විද්‍යාව සම්බන්ධයෙන් සුළු දැනුමක් ඇති ඔබ දන්නවා ඇතැයි මම සිතමි). මෙම කම්පනයෙන් කොටසක් ඔබේ කණ් බෙරය කරා ද ළඟා වෙයි. එවිට කණ් බෙරය ද කම්පනය වෙයි. කණ් බෙරයට සම්බන්ධ වී ඇති ස්නායු දිගේ මෙම කම්පනයනට අනුරූප වූ සංඥාවක් මොළයේ යම් විශේෂිත ස්ථානයකට ගමන් කරයි. මෙම සංඥාව

නිසා මොළයේ එම ස්ථානයේ රසායනික ජීව ප්‍රතික්‍රියාවක් සිදු වේ. මෙම භෞතික හා ජීව ක්‍රියාදාමයෙන් ශබ්දයක් පැන නැග්ගේ කවර තැනකද? තට්ටු කළ ස්ථානයේ කම්පනයක් ඇති වූ බවත්, එම කම්පනය කණ් බෙරයට ගමන් කළ බවත් සැබෑවකි. නමුත් කම්පනය යනු ශබ්දය නොවෙයි. එම කම්පනය ද ස්නායු දිගේ මොළයට ගමන් කළේ නැත. කම්පනය වෙනුවට මොළය කරා එම කම්පනයට අනුරූප වූ අයනික වෙනස් වීමක් ස්නායු තුළ සිදු විය. ඔබට ඇසෙන ශබ්දය පැන නැග්ගේ ඔබේ මොළයේ සිදු වූ රසායනික ක්‍රියාදාමයේ ප්‍රතිඵලයක් වශයෙනි. එම ශබ්දය මොළයෙහි නිර්මාණය වූ ධර්මතාවකි. බාහිරව ඇතිවූයේ කම්පනයකි. ශබ්දය බාහිර ඇති වූ ධර්මතාවක් නොවේ. නමුත් අපි භෞතික විද්‍යාව අනුව බාහිර පැනනැග්ගා වූ ශබ්දය කණ නැමති ඉන්ද්‍රිය උදව් කරගෙන අපට ඇසුනේ යැයි කියමු. අපගේ මුලාව එයයි. මෙම ශබ්දය බාහිර කම්පනයකින් තොරවද ඇති විය හැක. සමහර මානසික රෝගීන් විවිධ වූ ශබ්ද තමන්ට ඇසෙන්නේ යයි කියනු ඔබ අසා ඇත.

දැන් අපි වර්ණ රූපය සම්බන්ධයෙන් අපගේ ඉන්ද්‍රියන්හි සිදුවන භෞතික හා ජීව ක්‍රියාවලිය විමසා බලමු. උදාහරණයක් ලෙස ඔබ ඉදිරියේ ඔබ විසින් පිළිගත් රතු මලක් ද බාහිර සූර්යාලෝකය ද ඇතැයි සිතන්න. සූර්යාලෝකයෙහි විවිධ සංඛ්‍යාත පරාසයකින් යුත් විද්‍යුත් චුම්බක තරංග (රේඩියෝ තරංග, රූපවාහිනී තරංග, දෘශ්‍ය ආලෝක තරංග ආදී) ඇත. මෙම විශාල සංඛ්‍යාත පරාසයින් යුත් සියලුම තරංග මල මත පතිත වන අතර ඉන් කොටසක් මල අවශෝෂණය කර තව කොටසක් පරාවර්තනය කරයි. මෙම පරාවර්තනය වූ තරංග සෑම දිශාවකටම ගමන් කරන අතර, ඉතා සුළු ආලෝක කිරණ ප්‍රමාණයක් ඔබේ ඇසටද ළඟා වේ. මෙම සුළු ආලෝක කිරණ ප්‍රමාණය ඇසේ ඇති කාචයෙන් ගමන් කර දෘෂ්ඨි විතානයේ නාභි ගත වෙයි. ආලෝක කිරණවල ගමන් මග එතැනින් අවසන් වන අතර ආලෝකයේ ඇති ක්වන්ටම් (Quantum) ගුණය හෙවත් ඇති නැති වන ගුණය නිසා ආලෝකයේ ඇති කම්පනය දෘෂ්ඨි විතානයට සම්බන්ධ වී ඇති ස්නායු දිගේ සංඥාවක් ලෙස මොළයට ගමන් කරයි. මෙම සංඥාව

මොළයේ ඊට විශේෂිත වූ ස්ථානයේදී රසායනික ප්‍රතික්‍රියාවක් ඇති කරයි. රතු වර්ණය දැක්ම මෙම රසායනික ප්‍රතික්‍රියාවේ ප්‍රතිඵලයකි. එසේ නැතිව අපි පිළිගන්නා ආකාරයට මලෙහි ඇති රතු වර්ණයක් ස්නායු දිගේ මොළයට ගමන් කළේ නැත. මලෙහි රතු වර්ණයක් නැත. මලෙන් පරාවර්තනය වූ ආලෝක කිරණ වල ද රතු වර්ණයක් නැත. ඔබගේ මොළයේ සිදුවන රසායනික ක්‍රියාවලියන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් රතු වර්ණය ඔබම නිර්මාණය කරගන්නවා විනා, එය බාහිර ඇති වර්ණයක් නොවේ. මෙම ක්‍රියාවලියට මන ද සම්බන්ධ වන බැවින් වර්ණය අරූප ධර්මයකි. නමුත් සංසාරයෙහි දීර්ඝ කාලයක් බාහිර වර්ණ ඇතැයි ද එම වර්ණ ඇසෙන් දකින්නේ යයි ද පිළිගැනීම නිසා සත්‍යය වැසී මිනිසා මුළාවට පත් වී ඇත. සත්‍යය නම් ඔබ දකින්නේ බාහිර නැති මනසේ හෙවත් මොළයේ සාදාගත් වර්ණයකි.

අපි පාසැල් අවධියේ සිට විද්‍යුත් චුම්බක තරංග වර්ණාවලියෙන් ඇති දෘශ්‍ය ආලෝක පරාසය ගැන ඉගෙන ගන්නෙමු. එම පරාසයෙහි රතු, නිල්, කොළ ආදී වර්ණ ආලෝක කිරණ ඇතැයි ද ඉගෙනගෙන ඇත්තෙමු. දෘශ්‍ය පරාසයෙහි ඇති විද්‍යුත් තරංගවලට රතු, නිල්, කොළ ආදී නම් තැබුවාට වරදක් නැත. නමුත් අපි දකින්නා වූ රතු, කොළ, නිල් ආදී වර්ණ එම ආලෝක කිරණ වලට ඇතැයි පිළිගැනීම මුළාවකි. එම ආලෝක කිරණ ඇසෙහි කාචය හරහා දෘෂ්ඨි විතානයේ නාභිගත වී, මොළයට ගමන් කරන සංඥා නිසා, මොළයේ යම් තැනක ඇති වන රසායනික ප්‍රතික්‍රියාවෙන් රතු කොළ ආදී වර්ණයන් නිපදවා ගනී. එසේ නැතිව ඇසෙන් බාහිර ඇති රතු වර්ණය දැක්කා යයි පිළිගැනීම මුළාවකි.

ඉහත විස්තර කළ ආකාරයටම අප විසින් ගන්නා ආහාර වල රසයක් ද නැත. සුවඳක් ද නැත. විවිධ ආහාරවල විවිධ රස ඇතැයි අප පවසන්නේ එම ආහාරවල ඇති රස නොව එම ආහාර වල ඇති රසායනික ද්‍රව්‍ය දිවේ ඇති රස අංකුර වල ගැටීම නිසා ඇතිවන උද්දීපනය ස්නායු දිගේ මොළයට ගමන් කර මොළයෙහි ඇති වන රසායනික ප්‍රතික්‍රියාවයි. රස බාහිර ආහාර වල නොමැති

අතර එය අපගේ මොළයෙහි සාදාගත් රසයකි. ගන්ධයද එසේමැයි.

කුඩා කාලයේ සිට අනුන්ගෙන් අසා ඉගෙන ගත් දැනුමට පදනම වූයේ බාහිර නොමැති, එහෙත් තමන් විසින් ඇතයි පිළිගත් වර්ණ, ශබ්ද, රස, ගන්ධ සහ ස්පර්ශ යනුවෙන් හඳුන්වන පංච රූපයකි. මෙම වැරදි පදනමකින් නිර්මාණය කරගත් දැනුම සත්‍යය ද? අනෙක් අතට අනුන්ගෙන් අසා දැනගත් දැනුමක් කෙරෙහි විශ්වාසය තබාගත හැකිද? අනුන්ගෙන් අසා බාහිර දේවල්, වර්ණ, ශබ්ද, රස, ගන්ධ සහ ස්පර්ශ තිබෙනවා ය, පුද්ගලයින් ඉන්නවා ය, යනුවෙන් පිළිගත් දැනුම මුලාවකි. මෙම මුළාව නිසා නැති ලෝකයක් මවාගෙන එම නැති ලෝකයෙහි මිනිසා ජීවත් වෙයි. ඉන්ද්‍රියන්ගෙන් දකින ලෝකය යනු තමන් විසින් මනසින් සාදාගත් 'මනංකල්පිත' ලෝකයකි. තමන් මෙම ලෝකයෙහි ජීවත්ව සිටින තාක්කල්, ලෝකයෙහි වර්ණ ගන්ධ රස ස්පර්ශ හා ශබ්ද ආදී රූප ඇත. තමන් මියගිය දිනක තමනුත් සමග සියලුම රූප ද මිය යයි.

අපි බොහෝ විට දුකින් නිදහස් වීමක් ගැන කතා කරන්නෙමු. අප තුළ ඇති දුක නම් අප විසින් ගොඩනගා ගත් දැනුම පිළිගැනීම නිසා ඇති වූ දුකකි. උප්පත්තිය දුකකි. ජරාව දුකකි. ව්‍යාධිය දුකකි. මරණය දුකකි. උප්පත්තිය, ජරාව, ව්‍යාධිය, මරණය යනු දැනුම නිසා ගොඩනගා ගත් සංකල්ප (Concepts) මිස සත්‍ය නොවේ. ඒවා සංස්කාර ධර්ම වෙයි. දැනුම පිළිගත් මිනිස් සත්ත්වයා ජාති ජරා ව්‍යාධි මරණ උපාදානය කරයි. දැනුම ම පංච උපාදානස්කන්ධය වන බැවින්, දැනුම හරහා පංච උපාදාන ස්කන්ධයෙන් නිදහස් විය නොහැක. දැනුමෙන් ඔබ්බට ගිය විට උප්පත්තියෙන්, ජරාවෙන්, ව්‍යාධියෙන් හා මරණයෙන් නිදහස් වෙයි. බොහෝ පඬිවරුන් දේශනා කරන්නේ 'ජීවිතය අනියතය මරණය නියතය' කියාය. ජීවිතය පිළිගත් යමකුට මරණය ඇත. නමුත් ජීවිතය හා මරණය යනු දැනුමෙන් ගොඩනගා ගත් වැරදි පිළිගැනීමකි.

අපිට මෙම දැනුම නැමති මුළාවෙන් ගැලවිය හැකිද? යම්

කෙනෙක් තමන් විසින් නිර්මාණය කරගත් දැනුම් සම්භාරය වැරදි යයි දකී නම් ඔහු හෝ ඇය මුළාවෙන් නිදහස් වී මායාවක් වූ දැනුමෙන් ඔබ්බට යයි. පුද්ගලයෙක් ඉන්නවාය යන දෘෂ්ඨියෙන් ද නිදහස් වෙයි. සම්මා දෘෂ්ඨිය නැතහොත් කිසිම දෘෂ්ඨියක් නැති තැනකට පැමිණෙයි. ඇත්ත ඇති සැටියෙන් දකී. සිතුවිලි හෙවත් චින්තනය නිර්මාණය වී ඇත්තේ ද මෙම එකතු කරගත් දැනුමෙන් බැවින් දැනුමෙන් එතෙරවූ විට චින්තනයෙන් ද නිදහස් වෙයි. නමුත් සිතුවිලි උපාදානය කරගත් යෝගාවචරයෝ චින්තනය පාලනය කිරීමට මානසික වීර්යය යොදති. මෙම සිතුවිලි වලට අයිතිකරුවෙක් නොමැති බව ඔවුහු නොදකිති.

දැනුමෙන් එතෙර වූ විට මෙම ජීවිතයේදීම මරණයෙන් නිදහස් වෙයි. මරණය යනු අපගේ ශබ්ද කෝෂයෙහි ඇති වචනයක් පමණි. සත්‍ය නොවේ. සත්‍යය හෙවත් නිවනෙහි මරණයක් නැත. 'ජීවිතය අනියතය මරණය නියතය' කියා මරණානුස්මෘති භාවනාව වඩන්නෝ ගමන් කරන්නේ නිවනටද ? නැතිනම් මරණයටද?

බොහෝ දාර්ශනිකයන් සත්‍ය සොයා යන්නේත් අන් අයට උගන්වන්නේත් බාහිර නැති රූපයක් තිබෙනවා යයි පිළිගෙන නිර්මාණය කර ගත් වැරදි දැනුමක් ප්‍රයෝජනයට ගැනීමෙනි. අවිද්‍යාව නිසා මුලාවට පත් වූ පෘතග්ජනයා කායික වීර්යයත් මානසික වීර්යයත් යොදමින් අනුන්ගෙන් ඉගෙන ගත් දැනුම ම පිළිගනිමින් දැනුම හරහා ම සත්‍යය සොයමින් සංසාරයෙහි සැරිසරයි. නමුත් වැරදි රූපයකින් පදනම් වූ, තමන් විසින් ගොඩනගාගත් දැනුම හෙවත් පංච උපාදානස්කන්ධය (රූප, වේදනා, සංඥා, සංස්ඛාර සහ විඥ්ඥාන) තුළ සත්‍ය හෙවත් නිවන නම් නැත. යම් කෙනෙක් සත්‍ය දකින්නේ තමන් පිළිගත් සියලු දැනුමේ ඇති වැරදි දැක, දැනුමෙන් එතෙර වී, තමන් යන පුද්ගල දෘෂ්ඨියද බිඳ හෙළීමෙනි. ප්‍රඥාව යනු, දැනුමේ වැරදි දැක, දැනුම ඉක්මවා ගිය ධර්මයක් මිස, දැනුම හරහා වඩන ධර්මයක් නොවන බව බුද්ධිමත් ඔබට පැහැදිලි විය යුතුය.

2

# අකාලික විශ්වයෙහි මනසින් සාදාගත් කාලික භෞතික විද්‍යාව

යාන්ත්‍ර භෞතික විද්‍යාවේ මූලික පදනම වන්නේ කාලය, ස්කන්ධය හා දිගයි. ඇල්බට් අයින්ස්ටයින් සාපේක්ෂතාවාදය ලොවට ඉදිරිපත් කිරීමට පෙර, නිව්ටන්ගේ භෞතික විද්‍යාවෙහි සිරවී සිටි විද්‍යාඥයින් සිතුවේ, කාලය ස්කන්ධය හා දිග නිරපේක්ෂ රාශීන් බවයි. සාපේක්ෂවාදයට අනුව කාලය, ස්කන්ධය, දිග හා ප්‍රවේගය එකිනෙකට සම්බන්ධ වූ සාපේක්ෂ භෞතික ගුණ බව දැන් පිළිගෙන ඇත.

කාලය දිග හා ස්කන්ධය එකිනෙකට සාපේක්ෂ වූවත් ඒවා ලෝකයේ පවතින භෞතික ගුණ බව භෞතික විද්‍යාඥයින් පමණක් නොව සියලු පෘතග්ජන පුද්ගලයෝ පිළිගනිති. ඇත්තෙන්ම කාලය, දිග හා ස්කන්ධය විශ්වය තුළ පවතී ද?

බොහෝ දාර්ශනිකයින් හා විද්වතුන් කාලය නැමැති ප්‍රශ්නය විසඳා ගැනීමට නොහැකිව කාලයෙහි පැටලී ඇති ආකාරය පොත් පත් කියවන විට මා දැක ඇත. වර්තමානයේ සිටින මහා විද්වතකු වූ Stephen Hawking ගැන ඔබ අසා ඇති බවට සැක නැත. ඔහුගේ A Brief History of Time From the Big Bang to Black Holes නැමැති කෘතියේ කාලයේ ආරම්භය කුමක්ද යන ප්‍රශ්නය නගා ඇත. බොහෝ විද්වතුන් සිතන්නේ මහා පිපුරුම (Big Bang) කාලයේ උපත බවත් කළු කුහරය (Black Holes) කාලයේ විපත බවත්ය.

අයින්ස්ටයින්ගේ සාපේක්ෂතාවාදය ගැන අවබෝධයක් ඇත්නම් කාලය, ස්කන්ධය හා දිග, ප්‍රවේගය මත රඳා පවතින බව ඔබ දන්නවා ඇත (මෙම ලිපියෙන් සාපේක්ෂතාවාදය විස්තර කිරීමට බලාපොරොත්තු නොවන අතර භෞතික විද්‍යාව ගැන කිසිම දැනුමක් නැති පාඨකයකුට වුවද මෙම ලිපියේ කරුණු තේරුම් ගත හැකිය). කාලය, එය මනිනු ලබන රාමුව (frame) අනුව වෙනස් වේ. උදාහරණයක් ලෙස ඔබ දුම්රියක ගමන් කරන විට, ඔබට කාලය අඩුවෙන් ගත වේ. එයට හේතුව කාලය, එය මනිනු ලබන රාමුවේ ප්‍රවේගය මත රඳා පැවතීමයි. විශ්වයේ උපත සොයන විද්‍යාඥයින්ගෙන් මම ප්‍රශ්න කරන්නේ, මුළු විශ්වයම එකම රාමුවක් ලෙස ගත් විට මෙම විශ්ව රාමුවේ චලිතය (ප්‍රවේගය) ගැන නොසොයා විශ්වයේ උපත සොයන්නට යාම විහිළුවක් නොවේ ද යන්නයි.

සාපේක්ෂ බව කතා කිරීමට අඩුම වශයෙන් රාමු දෙකක්වත් තිබිය යුතුයි. මුළු විශ්වයම එකම රාමුවක් ලෙස ගත් විට විශ්වය නිරපේක්ෂ රාමුවකි. විශ්වය නිරපේක්ෂ නම් එහි ප්‍රවේගය ද නිරපේක්ෂ විය යුතුය. සාපේක්ෂතා වාදය අනුව විශ්වයේ ඇති එකම නිරපේක්ෂ ප්‍රවේගය ආලෝකයේ ප්‍රවේගයයි. යම් රාමුවක් හෝ වස්තුවක් ආලෝක ප්‍රවේගයෙන් ගමන්කරන විට කාලය ගතවන්නේ නැත. එබැවින් ආලෝක ප්‍රවේගයෙන් ගමන් කරන විශ්වයට කාලයක් නැත. විශ්වයේ උපත හා විපත එකතැන සිදුවන ක්‍රියාදාමයන් දෙකකි. බුදු දහමේ යමකය ලෙස හඳුන්වන්නේ ද මෙයයි. විශ්වයට මොහොතක තරම්වත් වයසක් නැත. ඇතිවන තැනම නැතිවේ (අකාලිකය). අපගේ පංච ඉන්ද්‍රියන්ට, මෙම එකතැන සිදුවන ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලි දෙක ග්‍රහණය කළ නොහැක්කේ අපි චින්තනයේ සිටින බැවිනි. එකවර සිදුවන ඇතිවීම හා නැතිවීම දැකිය හැක්කේ චින්තනය අභිබවා ගිය ප්‍රඥාව දැකීමෙන් පමණි.

විශ්වයට කාලය නොමැති වුවත්, වැඩිහිටි වූ අපට කාලයක් ඇත. ඇත්තෙන්ම විශ්වයට නොමැති නමුත් අපට ඇති කාලයේ

උපත කුමක්ද? වැඩිහිටියන් වූ අපි කාලය පිළිගනිමු. අතීතය වර්තමානය හා අනාගතය පිළිගනිමු. නමුත් අලුත ඉපදුන දරුවාට අපට මෙන් පංච ඉන්ද්‍රියන් හොඳින් ක්‍රියාත්මක වුවත් කාලය නැමැති සංකල්පයක් නැත. ඔහුට හෝ ඇයට ඊයේ අද හෙට යන සංකල්පයක් නැත. කාලයට අසුනොවී සිටින අලුත උපන් දරුවා වැඩිහිටියකු වන විට අතීත වර්තමාන අනාගත තුන් කාලය නිර්මාණය කර ගන්නේ කෙසේද?

කුඩා ළමයාට ද ඇස හොඳට ඇති නිසා ආලෝකය ඇති විට ඡායාවක් දකී. දිගින් දිගටම මෙම ඡායාව දකින විට (පුටුවක ඡායාව යයි සිතමු) ඇසේ ඇතිවන ඡායාව ගැන කුතුහලයක් උපදී. එය තමා තුළම ඇතිවන ස්වයංයෝජනයකි. බහ තෝරන වියට එළඹෙන විට මේ දකින්නේ කුමක්ද? යනුවෙන් ප්‍රශ්න නගන්නේ මේ කුතුහලය නිසාය. ළමයා ප්‍රශ්න කරන්නේ ඇසේ ඇතිවූ ඡායාව ගැන වුවත් මුළාවට පත්වී ඇති වැඩිහිටියන් පිළිතුරු දෙන්නේ බාහිර ඇති වස්තු ගැනයි. ළමයා මේ කුමක්දැයි ඇසූ විට 'ඒ පුතේ පුටුව' කියා වැඩිහිටියෝ පිළිතුරු දෙති. ළමයා 'පුටුව' නැමැති ශබ්දය ඔහුගේ මොළයෙහි ගබඩා කර ගනී. තව විදිහකින් කියනවා නම් මතක තබා ගනී. මෙම මතකයත් සමග දැන් කියන අවස්ථාව හෙවත් වර්තමානය නිර්මාණය වේ. ජීතිය ලෙස හඳුන්වන්නේ ද මෙම නිර්මාණය කර ගත් වර්තමානයයි.

ඊට පසු අවස්ථාවක ළමයා නැවත පුටුව දුටු විට 'පුටුව' නැමති වචනය මතක ගබඩාවෙන් එළියට ගනී. නම ස්මරණය කරයි. එවිට ඔහුගේ මතකය අතීතයට ගමන් කරයි. දැන් ඔහු අතීතය ද නිර්මාණය කර ගෙන ඇත. මතකය ඉස්මතු වන විට අතීතය නිර්මාණය වේ. දැන් ඔහුට හෝ ඇයට වර්තමානය මෙන්ම අතීතය ද ඇත. නමුත් තවම අනාගතය නැත.

අනාගතය නිර්මාණය කර ගන්නේ කෙසේද? ළමයා පියාගෙන් ටොෆියක් හෝ චොක්ලට් එකක් ඉල්ලයි. එම ඉල්ලන අවස්ථාවේදී ළමයාට දීමට චොක්ලට් නොමැති බැවින් 'පුතේ හෙට ගෙනත් දෙන්නම්' යයි පියා කියයි. ළමයා තවම අනාගතයට හසුවී

නොමැති බැවින් ඔහු හඬමින් නැවත නැවත චොක්ලට් ඉල්ලයි. ඔහුට චොක්ලට් අවශ්‍ය වන්නේ දැන් ය. කෙසේ හෝ පියා පසුදා චොක්ලට් ගෙනත් දෙයි. නැවත වරක් ඔහු චොකලට් ඉල්ලන විට 'පුතේ හෙට ගෙනත් දෙන්නම්' යයි කී විට ළමයා නිශ්ශබ්ද වන්නේ ඔහුට චොක්ලට් ගැන බලාපොරොත්තුවක් ඇති වන නිසයි. දැන් ඔහු චොක්ලට් ලැබෙන තෙක් බලා සිටී. අනාගතය නිර්මාණය වන්නේ මෙම බලාපොරොත්තු නිසයි.

දරුවා වැඩිහිටියකු බවට පත් වන විට කෙළවරක් නැති බලාපොරොත්තු වලින් මනස පුරවා ගනී. දැන් ළමයා අතීත වර්තමාන අනාගත යන තුන් කාලයටම අසුවී ඇත. මෙම කාලය නිර්මාණය කර ගන්නේ වචන වලිනි. හෙවත් දැනුමෙනි. දැනුම නිසා කාලය පිළිගෙන ඇත. ඔබව කාලයෙන් ගිලගෙන ඇත. ඔබව ගිලගෙන ඇත්තේ ඇත්ත වශයෙන්ම පවතින කාලයකින් ද? නැත. ඔබ විසින්ම නිර්මාණය කරගත් කාලයෙනි. විශ්වයේ නොමැති කාලයක් අපට ලැබුණේ චින්තනයෙන් බව දැන් අපි දනිමු.

සැබවින්ම කාලය යනු අප මනස තුළ සාදාගත් සංකල්පයකි. එය සත්‍යය නොවේ. ඔබ ඉදිරියේ ඇති බිත්ති ඔර්ලෝසුවේ තත්පර කටුව කැරකෙන බව දකින විට කාලය පවතී යැයි ඔබට සිතේ. ඔබගේ මනසේ ඇති තත්පර කටුව කැරකෙනවා මිස වෙන තත්පර කටුවක් ඔරලෝසුවේ නැත. ඔබේ මනසේ සාදාගත් ඔරලෝසුවක් මිස වෙන බාහිර ඔරලෝසුවක් ද නැත. අවදිව සිටින විට කාලයෙන් ගිලගත් ඔබ තද නින්දට ගිය විට වර්තමාන කාලයෙන් නිදහස්ය. රාත්‍රියේ නිදාගත් ඔබ රාත්‍රියේම අවදි වුවහොත් කොතරම් වේලාවක් නිදාගත්තා ද යන්න ඔබ දන්නේ නැත. සමහර රෝගීහූ පියවි සිහිය නොමැතිව දින ගණන්, සමහර විට අවුරුදු ගණන් සිටිති. නැවත සිහිය ආ විට කොපමණ කාලයක් අසිහියෙන් සිටියා ද යන්න ඔවුහු නොදනිති.

චින්තනයෙන් අපි විශ්වයත් අපත් වෙන් කර ගනිමු. මගේ, අපේ යන සංකල්ප ඊට හේතුවෙයි. අපි විශ්වය තුළ ඇති වෙන්කරගත් භෞතික රාමුවක සිරවී සිටින්නෙමු. නමුත් සත්‍යය නම් තමන් ද

විශ්වයේම කොටසක් බවයි. මෙම සත්‍ය දකින්නේ යම් කෙනෙක් 'තමන්' යන සංකල්පයෙන් ද ඉවත් වූ විට පමණි. එවිට ඔබ විශ්වයට එකතුවෙයි. කාලය අභිබවා යයි. ඔබ යම් කෙනෙකුට හිරිහැරයක් කළහොත් එහි විපාකය ඔබ කරා ආපසු එන්නේ දෙදෙනාම විශ්වයේම කොටසක් වන බැවිනි. ඔබත්, ඔබගේ තරඟකාරයාත් දෙදෙනකු නොවෙයි. චින්තනය නිසා වෙන්කරගෙන ඇත. එකිනෙකට බද්ධ වී ජීවත් වන පුද්ගලයන් ගැන ඔබ අසා ඇත. එතැන දෙදෙනෙක්ද? නැතිනම් එක් අයෙක්ද? එතැන දෙදෙනෙක් තබා එක් අයෙක්වත් නැත. දෙදෙනා වෙන්වන්නේ චින්තනයෙන් පමණි. චින්තනය යනු අප විසින් සාදාගත් ධර්මතාවක් මිස සත්‍ය නොවේ.

බුදු දහමේ කාලය පිළිබඳ දේශනා කර ඇති පාඨය වන්නේ 'අකාලිකෝ භගවතෝ ධම්මෝ යන්නයි' එහි සිංහල තේරුම වන්නේ 'භගවත් ගෞතමයන් වහන්සේ ගේ ධර්මය අකාලික බවයි'. බොහෝ බෞද්ධ පොත්පත් වල මෙය පැහැදිලි කරන්නේ 'බුදු දහම ඕනෑම කාලයකට ගැලපේ' යන්නයි. බුදුන්වහන්සේගේ ධර්මය ඕනෑම කාලයකට ගැලපෙන බව සත්‍යයකි. නමුත් 'අකාලිකෝ' යන්නෙහි තේරුම කාලයෙන් තොරවූ යන්නයි. බුදු දහම කාලය අභිබවා ගිය ධර්මයකි.

විශ්වයට කාලය නොමැති බව හෙවත් අකාලික බව ලොවට පළමුව ඉදිරිපත් කරන ලද්දේ බුදුන් වහන්සේ විසිනි. කාලය නැමති මිත්‍යාවෙන් ඔබ්බට ගිය එකම දහම බුදු දහමයි. භෞතික විද්‍යාව ඇතුළු සියලු විද්‍යාවන් ද දර්ශනයන් ද ආගම් ද ඔබ මෙතෙක් ඉගෙන ගත් බුදු දහම ද කාලය පදනම් කරගෙන බිහි වී ඇත. කෙටියෙන් කියනවා නම් සියලු දැනුම අවිද්‍යාව හෙවත් අසත්‍යය පදනම් කරගෙන බිහි වී ඇත. බුදු දහම හා නූතන විද්‍යාව ගැන ලිපි ලියන නූතන විද්‍යාඥයින් බුදු දහමත් නවීන විද්‍යාවත් අතර ඇති සමාන කම් පෙන්වමින් නවීන විද්‍යාවන් සමඟ සමගාමීව යන එකම ආගම බුදුදහම බව පෙන්වීමට මහත් උත්සාහයක් දරා ඇති බව එම ලිපි කියවීමෙන් පෙනී යයි.

කාලය පිළිගත් භෞතික ලෝකයෙහි විවිධ ආගම්ද, දර්ශනද, විද්‍යාවන්ද ඇත. නමුත් අකාලික විශ්වයෙහි කිසිදු විද්‍යාවක්, දර්ශනයක් හෝ ආගමක් පවතින්නේ නැත. කාලයෙන් එතෙර වූ බුදුන්වහන්සේලාද, රහතන් වහන්සේලා ද සියලුම විද්‍යාවන්ගෙන්, දර්ශනයන්ගෙන් හා ආගම් වලින් එතෙර වී ඇත.

කාලය නැමැති මිත්‍යාව පිළිගෙන අවිද්‍යාවෙන් බිහිවී ඇති කිසිම විද්‍යාවකට දර්ශනයකට හෝ ආගමකට කාලය අභිබවා ගිය බුදු දහම අංශු මාත්‍රයකින්වත් සමාන කළ නොහැකි බව බුද්ධිමත් ඔබට පැහැදිලි විය යුතුය. බුදුදහම විද්‍යාවක් ද නොවේ, දර්ශනයක් ද නොවේ, ආගමක් ද නොවේ. කාලයෙන් හා චින්තනයෙන් ඔබ්බට ගිය බුද්ධ ප්‍රඥාව ඔබ මෙතෙක් දැක නැත. බුද්ධ හෙවත් ප්‍රඥාව දැනුමෙන් ඉගෙන ගත හැකි හෝ වචන වලින් දේශනා කළ හැකි දහමක් නොවේ.

කාලය පදාර්ථය හා පුද්ගලයින් පිළිගෙන චින්තනයෙන් නිර්මාණය කර ගත් භෞතික විද්‍යාව ඇතුළු සියලු විද්‍යාවන් ද දර්ශන ද ආගම් ද අභිබවා මිනිසා දැන් ප්‍රඥාව අබියසට පැමිණ ඇත. තව අවුරුදු කීපයකින් ආරම්භ වන ඒ ප්‍රඥා යුගය මිනිසාගේ ස්වර්ණමය යුගය වේ. එම යුගය ආරම්භ වූ පසු මිනිසා දොර අගුළු සාදන්නේ නැත.

කාලයේ උපත දැනුම බවත් කාලයේ විපත දැනුම අභිබවා ගිය ප්‍රඥාව හෙවත් නිවන බවත් දැකිය හැක්කේ කාලය අභිබවා ගිය ප්‍රඥාව පහළ කර ගැනීමෙන් පමණි. කාලයට අසුවන බැවින් කායික වීර්යයත් මානසික වීර්යයත් ප්‍රඥාව පහළ කරගැනීමට උපකාරී නොවේ. ප්‍රඥාව පහළ වන්නේ කාලය මිත්‍යාවක් බව දැකීමෙනි. මනසින් ලෝකය පිළිගනී. දැනුම අභිබවා ගිය ප්‍ර ඥාවෙන් විශ්වය දකී.

3

# දැනුමෙන් කාලයට, කාලයෙන් මරණයට

'ඉරිදා ලංකාදීප පත්‍රයේ ඇසුවෙමි දුටුවෙමි' හි පළවී තිබූ එක්තරා සත්‍ය කථාවකින් මෙම ලිපිය ආරම්භ කරමි.

මෙම කතානායකයා තවත් කණ්ඩායමක් සමග ගංවතුරෙන් පීඩාවට පත්වූ ප්‍රදේශයකට ආධාර සැපයීමට ගොස් ඇත. අනාථ අයට ආහාර බෙදාදෙන අතර එම මහතා දුටුවේ, මෙම මහා විනාශය මැද කුඩා දරුවන් පිරිසක් ජල ක්‍රීඩා කරමින් සිටින ආකාරයයි. මෙම කතානායකයා දරුවන් අතරට ගොස් එක් දරුවකුට කතා කළේය.

'පුතාලගෙ ගෙදරත් ගං වතුරට යටවෙලා නේද, පුතාට නිදාගන්නවත් තැනක් නැහැ නේද?'
දරුවාගේ පිළිතුර වූයේ 'මම නිදාගන්නෙ අම්මා ළඟ' කියා යි.
'එතකොට අම්මා නිදාගන්නෙ කොහෙද?'
'ඒවා මම දන්නෙ නැහැ' කියමින් දරුවා දුවගොස් යහළුවන් සමග නැවත ක්‍රීඩාවට එක් විය.

මෙම කතාව කියවූ බොහෝ දෙනා කියනු ඇත්තේ 'අනේ ඒ නොදරුවාට තේරෙන හැටි' යනුවෙනි. නමුත් අපට එක් දෙයක් නම් පැහැදිළිය. නොදරුවෝ මහා විනාශය මැද සිනාසෙමින් ක්‍රීඩා කරති. දැනුම තේරුම ඇති වැඩිහිටියෝ දුකින් හඬා වැලපෙති. සංසාර දුකට හේතුව තමන් අනුන්ගෙන් අසා දැනගත් දැනුම ම නොවේ ද?

අපි උපන් දා සිට දැනුම සොයා යන්නෙමු. පාසල් යාමට පෙර සිටම දෙමව්පියන්ගෙන් ද සහෝදර සහෝදරියන්ගෙන් ද අපි දැනුම ලබා ගන්නෙමු. අපි දැනුමට ගරු කරන්නෙමු. ආචාර්ය

මහාචාර්ය ආදී උපධිධාරීන් ඉහළින් පිළිගන්නෙමු. නමුත් අපගේ සසර දුකට හේතුව මෙම අනුන්ගෙන් අසා පිළිගත් දැනුම බව දැක, සසරින් එතෙර වීමට දැන් කාලය පැමිණ ඇත.

දැනුමේ මූලික පදනම රූපයයි. වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාන නම් වූ නාමයත් සමග නාමරූප ගොඩනගා ගන්නේ ඉන්ද්‍රියන් හරහා රූපය ගෝචර වූ පසුවයිග වර්ණ ශබ්ද ගන්ධ රස හා ස්පර්ෂ නමින් රූප පහකි. අපි ඇසෙන් දකින වර්ණ රූප, කනෙන් අහන ශබ්ද රූප, නාසයට දැනෙන ගන්ධ රූප, දිවට දැනෙන රස රූප හා ශරීරයට දැනෙන ස්පර්ශ රූප, බාහිර නොමැති අපගේ මොළයේ සාදාගත් රූප බව මගේ 'භෞතික විද්‍යාවේ අසත්‍ය පදනම හෙවත් මනසින් සාදාගත් ලෝකය' නැමැති ලිපියෙන් පැහැදිළි කර ඇත.

කුඩා ළමයකු මුලින්ම එකවර කතා කරන්නේ එක් වචනයකි. ඔහු හෝ ඇය අම්මා, තාත්තා, පුටුව, මේසය ආදී වචන කතා කරයි. දරුවාට පුටුවක් පෙන්වා, 'මේ මොකක්ද?' යයි ඇසූ විට දරුවා 'ඒක පුටුව' යයි කියයි. ඇත්ත වශයෙන්ම ඔබවත් දරුවා වත් පුටුවක් දුටුවේ ද? නැත. ඔබ යම්කිසි හැඩයක් දුටු අතර, එම හැඩයට 'පුටුව' යන වචනය අනුන්ගෙන් අසා ආරූඪ කර ගත්තේ ය. ඇත්ත වශයෙන් ඔබ පුටුවේ හැඩයක් දුටුවේ ද? එකවර ඇතිවන හා නැතිවන අකාලික විශ්වය තුළ දකින්නට වස්තුවක් නැත. නැති වස්තුවක් දකින්නේ ආලෝකයේ ඇති ක්වන්ටම් ගුණය නිසයි. ඔබට පුටුව නැමති වස්තුව ඇසෙන් දකින්නට නොහැකි බව උදාහරණයකින් මම පෙන්වන්නම්.

ඔබ උත්තල හෝ අවතල කාච ගැන අසා ඇත. මෙම කාචයකින් වස්තුවක් දෙස බැලූ විට ඔබට වස්තුව පෙනේ ද? ඔබ එකවරම 'ඔව්' යයි කීවද, ඔබ දකින්නේ එම වස්තුවේ ඡායාවක් (ප ්‍රතිබිම්බය) මිස වස්තුව නොවේ. එය වස්තුවට වඩා කුඩා වී හෝ විශාල වී හෝ හැඩය වෙනස් වී හෝ පෙනේ. බොහෝ අය බැලීමට ඇස් කණ්ණාඩි භාවිත කරති. ඇස් කණ්ණාඩියේ ඇත්තේ ද, උත්තල හෝ අවතල කාච යුගලයකි. ඇස් කණ්ණාඩි දමාගෙන ඔබට වස්තුවක් දැකිය හැකි ද? නැත. ඔබ දකින්නේ වස්තුවේ ප

ප්‍රතිබිම්බයයි. දැන් ඔබ බාහිර කාචයක් හෝ ඇස් කණ්ණාඩියක් නොමැතිව වස්තුවක් දෙස බලන්නේ යයි සිතන්න. දැන් වස්තුවේ සිට එන ආලෝක කිරණ ඔබේ දෘෂ්ඨි විතානය මත පතිත වන්නේ ද, ඔබේ ඇසේ ඇති කාචය හරහායි. තව විදියකින් කියනවානම් ඔබ බලන්නේ ද ඔබේ ඇසේ ඇති කාචය හරහායි. කාචයකින් බලන ඔබට දැකිය හැක්කේ වස්තුව නොව එහි ප්‍රතිබිම්බයයි. නමුත් වස්තුව දැක්කා ය, යන පිළිගැනීමෙන් අපේ දැනුම ගොඩනැගී ඇත.

අදියරයෙන් අදියර කුඩා ළමයා ඉන්ද්‍රිය ධර්ම පිළිගැනීමෙන් දෘෂ්ඨිගත දැනුමක් ලබා ගනී. පළමුව එක් වචනයක් (උදා: මල) පමණක් කතා කරන දරුවා දෙවනුව වචන දෙකක් (උදා: 'රෝස මල') එකවර කතා කරයි. ළමයා 'මල' පිළිගන්නේ එහි ඡායාව දැකීමෙනි. තුන්වෙනුව 'රතු රෝස මල' ආදී වශයෙන් ඉගෙනීම තවදුරටත් වර්ධනය කරයි. රතු වර්ණය රෝස මලෙහි නොමැති අතර එය ළමයා ඔහුගේ මොළයේ නිර්මාණය කර ගත්තකි. නමුත් අපි බාහිර ඇති වර්ණයක් පිළිගන්නෙමු. ළමයා තවත් ඉදිරියට ගොස්' අම්මෙ, අයියා රතු රෝස මල කැඩුවා' යයි අම්මාට කේලාම් කියන විට ඔහු හෝ ඇය සංස්කාර (ක්‍රියා) වලට අසු වී පංච ස්කන්ධයම උපාදානය කර ගෙන ඇත. දැනුම ලෙස හඳුන්වන්නේ මෙම පංච උපාදාන ස්කන්ධයයි. දැනුමේ එන සෑම වචනයක් ම සත්‍ය නොවන බැවින්, එම වචන එකතු කර ගොඩනගා ගන්නා සෑම ක්‍රියාවක් ම සත්‍ය නොවේ. කෙටියෙන් කියනවා නම්, යම් කෙනකු විසින් කරනු ලබන හෝ ඉබේ සිදුවන හෝ ක්‍රියාවලියක් විශ්වය තුළ නැත. නමුත් අපි අපගේ දැනුමෙන් අනුන්ගෙන් අසා දැනගත් ක්‍රියාවලියක් පිළිගන්නෙමු. මෙම පිළිගත් වැරදි දැනුම නිසා මිනිසා එක් අවස්ථාවකදී සතුටට පත්වන අතර තවත් අවස්ථාවකදී දුකට පත් වී හඬා වැළපෙයි.

දැනුම සාපේක්ෂ වන අතර සාපේක්ෂ වූ කිසිම දෙයක් සත්‍ය නොවේ. අවුරුදු 7 ක් පමණ වයස් වන විට අපි බාහිර නැති ලෝකයක් මනසින් නිර්මාණය කර ගන්නෙමු. පුද්ගල දෘෂ්ඨිය හෙවත් සක්කාය දෘෂ්ඨියට හේතුව මෙම කුඩා කාලයේ සිට එකතු

කර ගන්නා දැනුමයි.

අවාසනාවකට මෙන් ලෝකයේ වෙසෙන ශාස්තෘවරුන් සත්‍ය සොයා යන්නේ මෙම දෘෂ්ඨිගත දැනුම ම පදනම් කරගෙනය. එම දැනුමෙන් ගොඩනගාගත් ක්‍රියාවලියක් අනුගමනය කිරීමෙනි. ඒ සඳහා කායික වීර්යයත් මානසික වීර්යයත් යොදමිනි. කායික වීර්යයෙන් සත්‍ය දැකිය නොහැක්කේ කායික වීර්යයත් සමග යෝගාවචරයා ලෞකික සංස්කාර ධර්ම වලින් මතුවූ ක්‍රියාවලියක් අනුගමනය කරන බැවිනි. එම ක්‍රියාව දෘෂ්ඨි සහගත දැනුමේ ම ප්‍රතිඵලයකි. ඉන්ද්‍රියන් හරහා පිළිගත්තා වුත් සාපේක්ෂ වූත් දැනුමෙන් සත්‍ය දැකිය නොහැකිය. මානසික වීර්යයද චින්තනය හෙවත් දැනුමේ ම ප්‍රතිඵලයකි. මානසික වීර්යයෙන් ඔබට අවබෝධය ලැබෙන අතර අවබෝධයෙන් සත්‍ය වැසෙයි. සත්‍ය හෙවත් නිවන් දකිනවා විනා නිවන යනු අවබෝධ කරගත හැකි ධර්මයක් නොවේ. නමුත් සත්‍ය වැසී ගිය කල පෘතග්ජන පුද්ගලයා දැනුමෙන් නිවන් දැකීමට කායික වීර්යයත් මානසික වීර්යයත් යොදයි. එහි අවසාන ප්‍රතිඵලය නම් මරණයයි. එයින් නිදහස් වීමක් නම් නැත.

විවිධ සංස්කෘතින්හි ජීවත් වන ජනයා විවිධ ආගම් අදහන බව අපි දනිමු. ඔවුහු ලෝකයෙහි පවතින ක්‍රියාවලි හොඳ හා නරක ලෙස බෙදාගෙන ජීවත් වෙති. මා මීට පෙර ද සඳහන් කර ඇති පරිදි මෙම ක්‍රියාවන්ගේ හොඳ හෝ නරක තීරණය වන්නේ, තමන් ජීවත් වන රාමුවට සාපේක්ෂව බැවින්, වෙනත් සංස්කෘතියක ජීවත් වන්නෙක් එම හොඳ දේවල් නරක ලෙස ද සමහර නරක දේවල් හොඳ දේවල් ලෙසද පිළිගනී, ලෝකයේ විවිධ ජාතීන් සමග ජීවත් වී ඇති මා හට එම වෙනස මනා ලෙස දැකගත හැකි විය.

මගේ ලිපි පෙළ කියවා අවබෝධ කරගැනීමෙන් ද සත්‍ය දැකිය නොහැකි ය. මා ලියන දේවල් අයිති වන්නේ ද දැනුමටයි. දැනුමෙහි සත්‍යය නැත. සත්‍යය දැනුම අභිබවා ඇති බැවින් ලිවීමට හා දේශනා කිරීමට නොහැකි ය. දැන් ඔබට ගැටලුවකි. එහෙනම් බුදුන් වහන්සේ අවුරුදු 45 ක් ධර්මය දේශනා කළේ නැති ද? ත්‍රිපිඨකයේ අසූහාරදහසක් ධර්මය ලියා ඇති බව අපි දනිමු. ඔබ යම්

දවසක සත්‍යයට පැමිණි පසු මෙම ප්‍රශ්නයට පිළිතුර ඔබටම දැකිය හැක. අපට ගැටලු හෙවත් ප්‍රශ්න පැන නැගී ඇත්තේ ඉගෙන ගත් දැනුමෙන් 'නැති ලෝකයක් ' නිර්මාණය කර ගත් බැවිනි. දේශක තුමන්ලා ඔබේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්නේ ද දෘෂ්ඨිගත දැනුමෙනි. දැනුම තුල ප්‍රශ්නයකට සත්‍ය වූ පිළිතුරක් නැත. දේශකතුමාගේ වැරදි පිළිතුර නිසා ඔබට තවත් ප්‍රශ්න මතුවේ. බුදුන් වහන්සේ ඉන්ද්‍රිය ගෝචර ධර්මයක් දේශනා නොකරණ නමුත් උන්වහන්සේගේ ශ්‍රී මුඛයෙන් පිටවන වචන බොහෝ පුද්ගලයින් තෝරා ගන්නේ ධර්මයක් ලෙස ය. බුදුන් වහන්සේ ඉතා ළඟින් ඇසුරු කළ ආනන්ද තෙරුන් වහන්සේට බුදුන් වහන්සේ පිරිනිවන් පාන තෙක් නිවන් දැකිය නොහැකි වූයේ ඇයි? උන්වහන්සේ ධර්මය ධාරණය කර ගත්තා මිස ධර්මය දුටුවේ නැත. ධාරණය කර ගන්නා විට ධර්මය වැසී යයි. ධාරණය තුළ නිවන නැත. ප්‍රශ්නයක් ඇතිව බුදුන් වහන්සේ හමුවට යන නුවණැති පුද්ගලයාට, උන්වහන්සේ ඔහුගේ ප්‍රශ්නයට පිළිතුරු දෙයි. නුවණැති පුද්ගලයා එම පිළිතුර පිළිනොගනී. පිළිතුර තමා තුළින්ම දකී. දැකීම යනු පිළිගැනීම නොවේ. තමා තුළින්ම සත්‍ය දුටු ඔහු ආපසු එයි. ඔහුට දැන් ප්‍රශ්නයක් නැත. පිළිතුරක් ද නැත. තමන් ඇසුවේ විශ්වයෙහි නැති ප්‍රශ්නයක් බව ඔහු දකී. එය මෝඩ ප්‍රශ්නයකි. අනුවණ පුද්ගලයා බුදුන් වහන්සේගේ පිළිතුර පිළිගනී. ඔහු දැන් ප්‍රශ්නයත් දනී, එයට පිළිතුරත් දනී. ප්‍රශ්නයත් පිළිතුරත් ඇතිව ආපසු එයි. නමුත් ඔහු සත්‍ය දුටුවේ නැත. මේ අය ධර්ම භාණ්ඩාගාරිකලා ය. ඔබ මෙතෙක් සත්‍ය නොදුටුවේ, ඔබ ද ධර්මය පිළිගත් බැවිනි. නුවණැත්තා බුදුන් වහන්සේගෙන් ධර්මය අසා තමන් රැස්කර ගත් දැනුමෙන් ඉවත් වෙයි. ඔහු තමන් දුටු සත්‍යයෙන් පාලනය වෙයි. අනුවණ පුද්ගලයා ධර්මය පිළිගෙන එම ධර්මය ධාරණය කරගෙන එම ධර්මය ද තමන්ගේ දැනුමට එකතු කර ගනී. ඔහු බාහිර සමාදන් වන සීලයෙන් පාලනය වෙයි. තමන් යන දෘෂ්ඨියෙන් ද ඉවත් වූ සත්‍ය දුටු පුද්ගලයාගේ පාලනයට සීලයක් සමාදන් වීමට අවශ්‍ය නැත.

දැනුම නිසා මිනිසා අතීත වර්තමාන හා අනාගත කාල අන්තරයට අසුවී ඇති බව මගේ 'අකාලික විශ්වයෙහි මනසින්

සාදාගත් කාලික භෞතික විද්‍යාව' නැමති ලිපියෙන් පැහැදිළි කළෙමි. මෙම කාලය විශ්වයෙහි නොමැති බවත් කාලය යනු අපි නිර්මාණය කරගත් සංකල්පයක් පමණක් බවත් දැකිය යුතුයග දැනුමෙන් කාලය පිළිගැනීම නිසා අපිට බොහෝ දායාද ලැබී ඇත. අනාගතයේ දී රජ වීමට පවා ඔබ සිහින මවන්නේ මෙම කාලය පිළිගත් බැවිනි. රජකම ප්‍රාර්ථනා කළත් කාලයට අසුවී ඇති අපට, අපි අකමැති වුවත් ප්‍රතික්ෂේප කළ නොහැකි දායාද හතරක් ද උරුම වී ඇත. ඒවා නම් ජාති, ජරා, ව්‍යාධි හා මරණයි.

ජරාවට පත්වීම හෙවත් වයසට යාම අපි අනුන්ගෙන් අසා දැනගත් සංකල්පයකි. කුඩා දරුවා මගේ පියා වයසට ගිහිල්ලා යයි ද. සීයාගේ සම රැලි වැටිලා යයි ද, කියන්නේ නැත. රැලි තිබෙන්නේ ඔබේ මනසේ මිස සීයාගේ ශරීරයේ නොවේ. වර්තමානය පිළිගත් විට ඔබ ලෙඩ රෝග වලින් පෙළෙයි. කාලයට අසු වී නැති කුඩා දරුවාට හා තිරිසන් සත්ත්වයාට ව්‍යාධි නැත. ඔබ ද වර්තමානයෙන් නිදහස් නම් ඔබට ද ව්‍යාධි හෝ ව්‍යාධි නිසා වේදනාවක් හෝ නැත. වේදනාවට හේතුව, අපි කාලය පිළිගැනීමයි. අපට මරණය උරුම වූයේ කෙසේ ද? බලාපොරොත්තු සමග ඔබ අනාගතය පිළිගෙන ඇත. මෙම පිළිගැනීම නිසා ඔබට අනාගතයේ සිදුවන මරණයටද අකමැත්තෙන් හෝ මුහුණ දීමට සිදු වේ. ඔබ ජීවත් වීම පිළිගත් නිසා මරණය ද උරුම වී ඇත. 'ජීවිතය අනියතය, මරණය නියතය' යයි මරණ සති භාවනා වඩන්නේ කාලයෙන් ගිලගත් සත්‍ය නොදුටු පෘතග්ජන පුද්ගලයන් ය. සත්‍ය දුටු තැනැත්තා මරණයෙන් එතෙර වී ඇති බැවින් මරණසති භාවනාව අත්හරී.

අතීත, වර්තමාන හා අනාගත තුන් කාලයට අසුවීම නිසා ඔබට ජරාවත් ව්‍යාධියත් මරණයත් උරුම වී ඇත. මෙම ජරාව ව්‍යාධිය හා මරණය සංකල්ප මිස සත්‍ය නොවේ. මරණය 'සංකල්පයක් පමණක්' යයි මම ඕස්ට්‍රේලියාවේ වෙසෙන බුද්ධිමත් මහත්මයකුට[1] කීවෙමි. එතුමා පෙරලා ප්‍රශ්න කළේ 'ඔබ අඹ ඇටයක් සිටවූ විට එය පැළ වී වර්ධනය වී, ලොකු ගසක් බවට පත් වී, එල දරා අවසානයේ දී මැරී යයි. පණ නැති වස්තු වලට ද උරුම වූ

මෙම මරණයෙන් අපිට ගැලවිය හැකි ද?' යන්නයි. මම එතුමාට පිළිතුරු දුන්නෙමි. අපි අඹ ඇටයක් ගැන කතා කරන්නේ අඹ ඇටය නැමති රූපය මනසේ සාදා ගත් සංකල්පයක් බව නොදැන බාහිර ඇත යන විශ්වාසයෙනි. එහි පැළ වීමක් හා වර්ධනයක් ගැන කතා කරන්නේ අපි සංස්කාර හෙවත් වැරදි ක්‍රියාවලියකට අසු වී ඇති බැවිනි. අඹ ගසෙහි පැවැත්මක් ගැන කතා කරන්නේ අපි නැති කාලයකට අසු වී ඇති බැවිනි. මෙම සියලුම ක්‍රියාවලි අප විසින් තම මනසෙන්ම සාදාගත් සංකල්ප මිස සත්‍ය නොවේ.

දීර්ඝ නිවාඩුවක් ලැබ පසුගිය මාස හතරක කාලයක් මව්බිමෙහි ජීවත් වුණෙමි. බුදු දහම සම්බන්ධයෙන් ලියවී ඇති පොත් හා ප්‍රවෘත්ති පත්‍රවල පළ වූ ලිපි කියවීමි. ඒවා කියවන විට මට හැඟී ගිය එක් කරුණක් නම්, තමන් සත්‍ය දැක ඇතැයි නොකියා කියන බොහෝ දෙනකු මරණය හිස මත තබාගෙන සිටින බවයි. මම නැවත නැවත කියන්නේ මරණය ඇති තැන නිවන ඃසත්‍ය* නම් නැත. නිවනෙහි මරණය ඇත්නම් ඒ නිවනෙන් මට නම් ඇති වැඩක් නැත. බොහෝ දෙනා සිතන්නේ නිවන් අවබෝධ කර ගත් පසු මරණයට පත්වී නැවත නූපදින බවයි. එය මුළාවකි. සත්‍ය නම්, මැරෙන්නට හා උපදින්නට කෙනෙක් නැත. මැරෙන්නේ සිතුවිලි ය, උපදින්නේ සිතුවිලි ය, සමහරු සිතුවිලි වලින් නිදහස් නොවී කෙලෙස් නැති කිරීමට උත්සාහ කරති. නමුත් ඔබ විසින් දැකිය යුතු කරුණක් නම් සිතුවිලි ම කෙලෙස් වන බවයි. තවත් සමහරු උගන්වන්නේ භාවනාවෙන් සිහිය වර්තමානයෙහි පිහිටුවා ගෙන චින්තනයෙන් ඉවත් වන ලෙසයි. වර්තමානය ඇති සෑම විටම අතීතය හා අනාගතය ඇත. සිතුවිලි වලින් තොරව වර්තමානයේ ජීවත් විය නොහැක. එක්කෝ ඔබ තද නින්දේ ය, නැතිනම් ඔබ මරණයට පත්වී ඇත. සිතුවිලි නිර්මාණය වී ඇත්තේ ඉගෙන ගත් දැනුමෙන් බැවින් සිතුවිල්ලක් පහළ වන සෑම විටම ඔබ අතීතයට යයි. තුන් කාලයෙන් නිදහස් වූ බුදුන් වහන්සේලා ද රහතන් වහන්සේලා ද සිතුවිලි වලින් නිදහස් ය. එතුමන්ලාට වර්තමානයක් නැත, ජීවත් වීමක් නැත, මරණයක් ද නැත. පුද්ගල දෘෂ්ඨියෙන් නිදහස් වූ මාර්ගඵල ලාභීන් ද මැරෙන්නේ නැත. මැරෙන්නට කෙනෙක් නැති බැවිනි. මරණය

නැමති දෘෂ්ඨියෙන් ඔවුන් නිදහස් වී ඇත. එවැන්නෝ 'ජීවිතය අනියතය, මරණය නියතය' යනුවෙන් භාවනා කරන්නේ ද නැත.

පටපනුවා තමන් විසින් සාදාගත් කෝෂයට සිරවී සිටින්නාක් මෙන්, මිනිස් සත්වයෝ ද තමන් විසින්ම නිර්මාණය කරගත් දැනුමෙහි සිරවී සිටිති.

*ලංකාවතාර සූත්‍රය*

තමන් විසින් තම මනසින් සාදාගත් ලෝකයෙන් නිදහස් වූ සත්‍ය දුටු ප්‍රඥාවන්තයා පුද පූජා වලින් ද යාච්ඤා වලින් ද භාවනා ඇතුළු සියලුම සිල්ව්‍රත වලින් ද නිදහස් වෙයි.

යම් ගුරුවරයෙක්, යම් ධර්මයක් පිළිගන්නට හෝ විශ්වාස කරන්නට යයි තම අනුගාමිකයින්ට උපදෙස් දෙන්නේ එම ධර්මය සත්‍ය නොවන බැවිනි. සත්‍ය වූ ධර්මයක් දකිනවා විනා පිළිගන්නට හෝ විශ්වාස කරන්නට හෝ අවශ්‍ය නැත.

4

# ධර්ම පහුර හිස තබාගෙන මෝහ ගඟ තරණය කරන්නෝ

මිනිසා සංයෝජන දහයකින් භවයට බැඳී පවතින අතර මෙම බන්ධන නිසා මිනිසාට ජාති ජරා ව්‍යාධි හා මරණය උරුම වී ඇත. මම අසා ඇති පරිදි මෙම දස සංයෝජන නම් සත්ව පුද්ගල දෘෂ්ඨිය, සැකය, සිල් ව්‍රත, ලෝභය, ද්වේශය, කාම රාග, අරූප රාග, මාන, උද්ධච්ඡ සහ අවිද්‍යා වේ.

ආගම් ජාති හා කුල භේදයකින් තොරව පෘතග්ජන කාටත් ජාති ජරා, ව්‍යාධි හා මරණ උරුම වී ඇත. සිදුහත් කුමරුට රජ සැප විඳීමට බාධාවක් වූයේ ද, මෙම ජාති ජරා, ව්‍යාධි හා මරණයි. පංච ඉන්ද්‍රියන් සමග බැඳී ඇති දස සංයෝජන බිඳ දමා සිදුහත් තවුසාණෝ බුද්ධත්වයට පත් වී ජරා ව්‍යාධි හා මරණයෙන් නිදහස් වූහ. පළමු සංයෝජන තුන වන සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය, සැකය හා සිල් ව්‍රත බිඳ දැමූ විට යමෙක් නිවන් මාර්ගයට හෙවත් සත්‍යයේ මාර්ගයට අවතීර්ණ වෙයි. මධ්‍යම ප්‍රතිපදාව නැතහොත් ආර්ය අෂ්ඨාංගික මාර්ගය යනු මෙම සත්‍යයේ මාර්ගයයි.

සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය ඇතුළු සියලුම දෘෂ්ඨි දැනුමේ ඵලයන් ය. දැනුම වැරදි බැවින් එහි ඵලයන් වූ සියලුම දෘෂ්ඨි මිථ්‍යා දෘෂ්ඨි වෙයි. අවබෝධයෙහි සම්මා දෘෂ්ඨියක් නැත. කුඩා ළමයාට අනුන්ගෙන් අසා දැනගත් බාහිර දැනුමක් නැති බැවින් ඔහුට හෝ ඇයට සත්ත්ව පුද්ගල දෘෂ්ඨියක් නැත. ඔහුට හෝ ඇයට මවාගත් ලෝකයක් නොමැති බැවින් එතෙර වීමට ද ලෝකයක් නැත. සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය නැති කුඩා දරුවාට සසරින් එතෙර වීමට ද නොහැක. සසරින් එතෙර වීමට නම් වැරදි දැනුම අප තුළ තිබිය යුතු ය.

සැකය යනු අපව සසරට බැඳ තබන දෙවන සංයෝජනයයි.

ධර්මය කෙරෙහි ඇති සැකය මෙයින් අදහස් කෙරෙයි. සසරින් එතෙර වීමට නම් සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය මෙන් ම ධර්මය කෙරෙහි ඇති සැකය ද ලෝකයෙහි ජීවත් වන අප තුළ තිබිය යුතු ය. සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය නැති කුඩා දරුවාට සත්‍ය දකින්නට නොහැකිවා මෙන්ම ධර්මය කෙරෙහි සැක නැති පුද්ගලයාට ද සසරින් එතෙර වීමට නොහැකි ය. අවාසනාවකට මෙන් නිවන් සොයා යන බොහෝ දෙනකුට තමන් අනුගමනය කරන්නා වූ ධර්ම කෙරෙහි සැකයක් නැත. ඒ අය ධර්මය සැකයකින් තොරවම පිළිගනිති.

සාරාංශ කර කියනවා නම් දස සංයෝජනයන් ගෙන් ලෝකයට බැඳී ඇති මිනිසා සත්‍ය දැකීමට සුදුස්සෙකි. යෝගාවචරයෝ සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය වැරදි දෘෂ්ඨියක් බව පිළිගන්නා නමුත් එය වැරදි දැනුමේම ප්‍රතිඵලයක් බව නොදකිති. එම නිසා අනුන්ගෙන් ඉගෙන ගත් දැනුමෙන් ඉවත් නොවී දැනුම හරහාම සත්ත්ව පුද්ගල දෘෂ්ඨියෙන් නිදහස් වීමට සිල්ව්‍රත රකී, සමාධිය වඩයි, භාවනා කරයි. දැනුමේ වැරදි දකින විට දැනුමෙන් අයින් වී දැනුමේ ම ඵලයක් වූ සත්ත්ව පුද්ගල දෘෂ්ඨියෙන් අයින් වෙනවා විනා කිසිම භාවනාවකින් හෝ කිසිම සීලයකින් සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය බිඳ දැමිය නොහැකි ය. ඇයි? සියලුම භාවනා වලට හා ශීලයට පදනම ද සත්ත්ව පුද්ගල දෘෂ්ඨියෙන් නිර්මාණය කරගත් ධර්ම වන බැවිනි. සක්මන් භාවනාවේ දී 'මම මගේ පාදය ඔසවමි' යයි භාවනා කරන කල, පාදය ඔසවන්නේ 'මම' ය. යෝගාවචරයෝ 'පාදය' ත් පිළිගනිති. 'මම' ත් පිළිගනිති. නමුත් 'බුද්ධ' යනු සියලුම පිළිගත් ධර්ම වලින් නිදහස් වූ තැනකි.

සියලුම පිළිගත් ධර්ම වලින් නිදහස් වී දුක නැති කර ගැනීම මිනිසාට දුෂ්කර වී ඇත්තේ ඇයි? මිනිසාට අවශ්‍යම ධර්මයක් වන තර්කය හා විතර්කය නොමැතිකමයි. ඔබ තර්ක හා විතර්ක වලින් තොරව අන්‍යයන් දේශනා කරන ධර්ම එලෙසම පිළිගනී. ධර්මය විමර්ශනය කරන්නේ නැත. ඔබේ ගුරුවරයා දේශනා කරන ධර්මයන්හි ඇති පරස්පර විරෝධතා දකින්නේ නැත. සත්‍ය දැකීමට ඔබ අනුගමනය කරන්නේ බාහිර නැති රූපයකින්

නිර්මාණය කරගත් වැරදි දැනුමක් බව ඔබ දකින්නේ නැත. මෙම නොදැකීම නිසාත් ධර්මය එලෙසම පිළිගැනීම නිසාත් ඔබට ධර්මය කෙරෙහි සැක පහළ නොවෙයි. තර්කය සහ විතර්කයත් එමගින් පැන නගින්නා වූ සැකයත් නොමැති නම් සත්‍ය පහළ නොවෙයි. නමුත් ඔබේ ගුරුවරයා ඔබට උගන්වන්නේ ධර්මය කෙරෙහි සැක පහළ කර නොගන්නා ලෙසයි. යම් කෙනකු තමන් අනුගමනය කරන්නා වූ ධර්මයෙහි සැක නැතිනම් එයින් අදහස් කරන්නේ ඔහුට හෝ ඇයට තර්කය හා විතර්කය නැති බවයි. තර්කය හා විතර්කය නැති පුද්ගලයා සත්‍යය දැකීමට සුදුසු පුද්ගලයෙක් නොවේ.

නිවනට මාර්ගය නම් ධර්මය අත හැරීම මිස ධර්මය ධාරණය කිරීමවත් එම ධර්මය පිළිපැදීමවත් නොවේ. බුදුන් වහන්සේ ධර්මය පහුරකට උපමා කළේ එබැවිනි. තොටියා ගඟ තරණය කළ පසු පහුර ඔසවාගෙන යන්නේ නැත. පහුර ද හබල ද තොටුපොළේ තබා යයි. එපමණක් ද නොවෙයි, තොටියා ගඟ තරණය කරන විට ද පහුර කර ගසාගෙන යන්නේ නැත. ඔබ මෙතෙක් නොදැක්කේ එයයි. ඔහු පහුර මත නැගී හබල් ගසයි. පහුර අවශ්‍ය වන්නේ තොටියාට ඉඳගෙන යාමට පමණි. ගඟ තරණය කරන්නේ හබලෙන් මිස පහුරෙන් නොවෙයි. බුදුන් වහන්සේ 'පහුර' ධර්මයට උපමා කළ අපූරුව බලන්න. මෙතරම් රසවත් ධර්මයක් බුදුන් වහන්සේ දේශනා කර තිබියදී ඔබ කරන්නේ කුමක් ද? ඉඳගෙන යාමට ඇති ධර්මය නැමති පහුර හිස තබාගෙන, හබළ ද ඉවත දමා, මෝහය නැමති ගඟ තරණය කිරීමට වීර්යය කරයි. ඔබ සැඩ පහරට අසුවී පහුරත් සමගම මුහුදට ගසාගෙන යයි. ගඟෙන් එතෙර වීමක් නම් නැත.

ධර්මය තිබෙන්නේ ලෞකික ලෝකයේ ජීවත් වී මිය යාමට මිස, ඔබ නිර්මාණය කරගත් ලෝකයෙන් එතෙර වීමට නොවේ. පහුරේ ආධාරයෙන් තොටියා ගඟ පහළට ගසාගෙන යනවා විනා ගඟ තරණය කළ නොහැකිවා මෙනි. ගඟ තරණයට හබළ අවශ්‍ය වෙයි. හබලින් කරන්නේ සැඩ පහරට එරෙහිව ඔරුව මෙහෙයවා එහි ගමන් මග වෙනස් කිරීමයි. හබල උපමා කළ

හැක්කේ කවර ධර්මයකටද? ප්‍රඥාවට හෙවත් සම්මා දෘෂ්ඨියට ද? නැත. භවය තරණය කරන තොටියාට තවම ප්‍රඥාව පහළ වී නොමැත. ප්‍රඥාව පහළ වන්නේ ගඟ තරණය කළ පසුවයි. පහුර මත සිටින තොටියාට මිථ්‍යා දෘෂ්ඨිය මිස, සම්මා දෘෂ්ඨියක් නැත. එසේනම් ගමන් මග වෙනස් කරමින් තොටියා තොටුපළ කරා රැගෙන යන මෙම හබල කුමක් ද? මෙම හබල නම් තර්කය හා විතර්කයයි, නැතහොත් සැකයයි. තර්කයෙන් හා විතර්කයෙන් ධර්ම කෙරෙහි සැක උපදී. මෙම සැකයෙන් තොටියාගේ ගමන වෙනස් කරයි. හබල අත නැති ධර්මය පිළිගත් යෝගාවචරයා සැඩ පහරට අසුවී මරණයට හෙවත් මුහුදට ගසාගෙන යයි. හබල නොමැති පහුරෙන් ගඟ තරණය කළ නොහැකිවා මෙන් සැකය නොමැති ධර්මයෙන් මෝහය තරණය කළ නොහැකිය.

ප්‍රඥාව පහල වීමට පෙර කිසිවෙක් 'දුක' යනු කුමක් දැයි නොදනිති, ඔවුහු ලෞකික දුකක් ගැන දේශනා කරති. තිරිසන් සත්ත්වයාට මිනිසාට මෙන් සසර ගමන දුකක් නොවේ. තිරිසන් සත්ත්වයෝ ධර්මය නැමති පහුර ඔසවාගෙන යන්නේ නැත. ඔවුන්ට ඔසවාගෙන යන්නට ධර්මයක් හෝ දැනුමක් නොමැති බැවිනි. මිනිසාට පමණක් ඇති මෙම 'දුක' නම් ධර්මය නැමති පහුර හිස තබාගෙන ගඟ තරණය කිරීම බව ඔබට නොපෙනේ ද? ධර්මය හෙවත් දැනුම පිළිගැනීම මිනිස් සත්ත්වයාට දුකකි. දුකින් නිදහස් වීමට යයි කියමින් අනුගමනය කරන ක්‍රියා මාර්ග වලින් තව තවත් දුකට පත්වෙයි. දුකින් නිදහස් වීමට නම් සියලුම පිළිගත් ධර්ම වලින් නිදහස් විය යුතුය. එක් ධර්මයක් අතහැර තවත් ධර්මයක් අල්ලා ගතහොත් ගමන තවත් දිගු වෙයි, පහුර හිස තබාගෙන සැඩ පහරට අසුව මුහුදට ගසාගෙන යන බුද්ධිමත් ඔබට, පහුර හිසෙන් කරට ගෙන කරින් ජලය මත තබා එය මත නැඟී හබල නිවැරදි අතට මෙහෙය වීමට කල්‍යාණ මිත්‍ර සේවනය උදව් වෙයි.

5

# අකාලික විශ්වය සහ අයින්ස්ටයින් විශ්වය

මෙම ලිපියට පාදක වන්නේ පාසල් ශිෂ්‍යයකු ගේ විද්‍යුත් ලිපියකි. ඔහු ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විද්‍යා ප්‍රදර්ශනයක් නැරඹීමට ගොස් ඇත. එහි අයින්ටයින්ගේ ඉගැන්වීම් සම්බන්ධයෙන් වෙනම අංශයක් තිබී ඇත. 'අකාලික විශ්වයෙහි මනසින් සාදාගත් කාලික භෞතික විද්‍යාව' නැමැති මගේ ලිපිය කියවා ඇති ඔහු භෞතික විද්‍යා ආචාර්යතුමකුගෙන් මගේ ලිපියේ සඳහන් වූ නිරපේක්ෂ විශ්වය ගැන ප්‍රශ්න කර ඇත. එතුමාගේ පිළිතුර වී ඇත්තේ විශ්වය නිරපේක්ෂ නොවන බවයි.

කාලය, දිග හා ස්කන්ධය යාන්ත්‍ර භෞතික විද්‍යාවේ මූලික රාශි බව භෞතික විද්‍යාව ගැන යම් තරමක දැනුමක් ඇති ඔබ දන්නවා ඇත. අයින්ස්ටයින්ගේ සාපේක්ෂතා වාදයට අනුව මෙම මූලික භෞතික රාශීන් එකිනෙකට සාපේක්ෂ වන අතර යම් රාමුවකට සාපේක්ෂව අර්ථ දක්වයි. උදාහරණයක් ලෙස ගමන් කරන වාහනයක වේගය මනින්නේ පොළොවට සාපේක්ෂවය. මෙහිදී පොළොව නතර වී ඇතයි උපකල්පනය කරයි. සියලුම මැනීම් සත්‍ය වන්නේ එම පිළිගත් සාපේක්ෂ රාමුවට සාපේක්ෂව පමණි. මෙම රාමුව නිර්මාණය කර ගත්තේ මිනිසා ය. ශත වර්ෂ ගණනකට පෙර මිනිසා පිළිගත්තේ පොළොව පැතලියි කියා යි. පොළොව වටා ඉර කැරකැවෙනවා කියා ය. තමන්ගේ ඉන්ද්‍රියන්ට ගෝචර වූ එම පිළිගැනීම සත්‍යයක් ද? වර්තමාන පිළිගැනීම අනුව පොළොව ගෝලාකාර යයි ද, පොළොව සූර්යයා වටා කැරකැවෙන්නේ යයි ද, පිළිගනී. මෙම ග්‍රහලෝකයන්ගේ ගමනට ගුරුත්වාකර්ශනය හේතුවන්නේ යයි ද, භෞතික විද්‍යාඥයෝ පිළිගනිති. මෙම වර්තමාන පිළිගැනීම් ද අතීත පිළිගැනීම් මෙන්ම ඉන්ද්‍රිය ගෝචර වූ දැනුමකි. ඉන්ද්‍රිය ගෝචර වූ වර්තමාන පිළිගැනීම සත්‍යයක් ද?

අයින්ස්ටයින්ගේ විශ්වය ද නිර්මාණය වී ඇත්තේ, කාලය පදාර්ථය හා අවකාශය පිළිගැනීමෙනි. පදාර්ථය සෑදී ඇත්තේ පරමාණු වලින් යැයි රසායන විද්‍යාඥයෝ පිළිගනිති. වර්තමාන රසායන විද්‍යාඥයින් පිළිගන්නා 'බෝර්ගේ පරමාණුව' මොඩලයක් පමණි. පරමාණුව අඩුතරමින් ඉන්ද්‍රිය ගෝචරවත් නොවේ. අපට පරමාණුව පියවි ඇසට නොපෙනේ. පරමාණුව පියවි ඇසට පෙනුණොත් කුමක් වේ ද? එවිට අපට වස්තු නොපෙනී යයි. පරමාණුවෙහි දකින්නට දෙයක් නැත. ඉලෙක්ට්‍රෝන යනු වේගයක් පමණි. ප්‍රෝටෝන හා නියුට්‍රෝන එකතු වී සෑදී ඇති න්‍යෂ්ඨියෙහි ඇත්තේ කුමක් ද? පදාර්ථය ද? නැත. එහි ඇත්තේ ශක්තියකි. ශක්තියක් කීවාට එය ශක්තියක් ද නොවේ. මෙම න්‍යෂ්ඨියට දෘෂ්‍ය ආලෝක කිරණ ඇතුළු විද්‍යුත් චුම්බක තරංග විකර්ශනය (පරාවර්තනය) කිරීමේ හැකියාවක් ඇත. වස්තු හෙවත් පදාර්ථ තිබෙනවා ය, පෙනෙනවා ය, යන වැරදී පිළිගැනීමක් අපට ඇත්තේ මෙම විද්‍යුත් චුම්බක තරංග න්‍යෂ්ඨිය මගින් ඇති කරන විකර්ෂණය නිසා ය. අනෙක් අතට මම මෙහි සඳහන් කරන ලද පරමාණුව ද එහි ඇතයි කියන ඉලෙක්ට්‍රෝන ප්‍රෝටෝන හා නියුට්‍රෝන ද බෝර් මොඩලයේ සංකල්ප වෙයි. මොඩලයක් නිර්මාණය කරගන්නේ යම් භෞතික සිද්ධීන් පැහැදිළි කර ගැනීමට ය. යම් දවසක එම පැහැදිළි කිරීම් කළ නොහැකි වූ දාට මොඩලය ඉවත දමයි. අපි නිර්මාණය කරගත් පරමාණුවෙහි හිස් අවකාශය හැර වෙන කිසිවක් නැත. මෙම පරමාණු ඒකරාශි වීමෙන් නිර්මාණය කරගත් අයින්ස්ටයින් විශ්වයේ 'පදාර්ථය' යනු මිත්‍යාවකි.

ඇසෙන් දකින්නේ වස්තු නොවේ නම් අතට අසුවන්නේ කුමක් දැයි එක්තරා පාඨක මහත්මයෙක් මගෙන් අසා තිබුණි. ඔබේ අතට අසුවන වස්තුව මනසේම නිර්මාණයක් බව මම පළමුව කියමි. නමුත් ඔබට මගේ පිළිතුර පැහැදිළි නැත. අතට දැනෙන ස්පර්ශය මොළයේ ක්‍රියාකාරීත්වයකි. මෙතැන සිදුවන්නේත් එකිනෙක වෙනස් වේග දෙකක ක්‍රියාකාරිත්වයක් පමණි. ඔබ පිළිගත් වස්තුවක් නොමැතිව ද වස්තුවක් ඇතැයි යන දැනීම ඇතිවන බව එක් උදාහරණයකින් මම පෙන්වමි. ඔබේ අත් දෙකේ අල්ලෙහි සමාන අග්‍ර පිටතට සිටින සේ චුම්බක දෙකක් අලවා ඇතැයි සිතන්න. දැන් ඔබේ අත් දෙක ක්‍රමයෙන් ළං කරන්න.

චුම්බක දෙකේ සමාන අග්‍ර වල සිදුවන විකර්ෂණය නිසා ඔබේ අත් දෙක අතර යම් දෙයක් 'වස්තුවක්' ඇතැ යි යන හැඟීමක් ඇති වේ. නමුත් ඇත්තෙන්ම අත්දෙක අතර එවැනි කිසිවක් නැත. වස්තුවක් යැයි සිතන යම් දෙයක් ස්පර්ශ කරන විට ද යමක් ඇතයි හැඟෙන්නේ පදාර්ථය හෙවත් වස්තුව නිසා නොව පදාර්ථය ලෙස පිළිගත් ශක්ති විශේෂයේ ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් ලෙසයි. ලෝකය අපගේ මනසින් නිර්මාණය කරගත්තක් මිස සත්‍ය නොවන බව මගේ පෙර ලිපි වලින් පෙන්වා දී ඇත. දැනුමෙන් අන්ධ වූ පෘතග්ජන පුද්ගලයා සිතන්නේ තමන්ගේ දැනුමෙන් ලෝකය අවබෝධ කර ගන්නවා යනුවෙනි. නමුත් ඇත්තටම සිදුවන්නේ තමන් විසින් 'අනුන්ගේ දැනුමකින්' බාහිර නැති ලෝකයක් නිර්මාණය කරගැනීමකි. ලෝකය යනු මිත්‍යාවක් බව බොහෝ දාර්ශනිකයෝ ද දේශනා කරති. නමුත් ඔවුන්ට මෙම මිත්‍යාව දකින්නට නොහැකිය. මෙම දාර්ශනිකයෝ ද මිත්‍යාවෙන් නිදහස් වීමට උත්සාහ කරන්නේ ද මිත්‍යාවක් වූ ලෝකයේ ම ඇති දැනුම උපකාරයෙනි. වර්ණ, ගන්ධ රස, ශබ්ද හා ස්පර්ශ ආදී රූප බාහිර නොමැති අපගේ මනසින් නිර්මාණය කර ගත් රූප ස්කන්ධයන් බව දැකිය යුතු ය. දැනුම හෙවත් පංච උපාදානස්කන්ධයේ පදනම වැරදි රූපයයි.

භෞතික විද්‍යාඥයින් විශ්වය දකින්නට උත්සාහ කරන්නේ ද, තමන් නිර්මාණය කරගත් මනංකල්පිත ලෝකයෙනි. භෞතික විද්‍යාඥයාගේ ලෝකයෙහි හා එමගින් සාදාගත් විශ්වයෙහි කාලය, දිග හා ස්කන්ධය ඇත. අපි දැනට පිළිගන්නා එම විශ්වය භෞතික විද්‍යාඥයාගේ මනසේ සාදාගත් ලෝකයට සාපේක්ෂ වූ විශ්වයකි. වර්තමාන විද්‍යාඥයින් පිළිගන්නේ මෙසේ නිර්මාණය කරගත් අයින්ස්ටයින් විශ්වයයි. අයින්ස්ටයින්ට ඔහු විසින් ම නිර්මාණය කළ විශ්වය කෙරෙහි පසු කාලයේ දී සැක පහළ විය. නමුත් ප ්‍රශ්නය විසඳීමට අවශ්‍ය දැනුම අභිබවා ගිය ප්‍රඥාව පහළ නොවී ය. අයින්ටයින්ගේ විශ්වය ද සාපේක්ෂ වෙයි. සාපේක්ෂ බව අභිබවා යාමට තමන් නිර්මාණය කරගත් දැනුමෙන් නොහැකි ය.

තමන් නිර්මාණය කරගත් දැනුම හරහා කිසිම විද්‍යාඥයකුට විශ්වය දකින්නට හෝ විශ්වයේ උපත සොයන්නට නොහැකි බව

මම කියමි. විශ්වය කාලය ද, දිග ද, ස්කන්ධය ද, අභිබවා යයි. එය පදාර්ථය ඉක්මවා ගිය විශ්වයකි. නිරපේක්ෂ වෙයි. මෙම විශ්වය දකින්නේ වැරදි දැනුම ඉක්මවීමෙන් පමණි. දැනුම හරහා විශ්වයේ උපත සොයන විද්‍යාඥයින්ට සිදුවන්නේ තමන්ගේ කාර්යය ඊළඟ පරම්පරාවට භාර දී මිය යාමටය. කාලය පිළිගත් විද්‍යාඥයා විශ්වයේ උපත සොයයි. නමුත් අකාලික විශ්වයේ උපතක් ද නැත, විපතක් ද නැත. ඇති වන්නට හෝ නැති වන්නට දෙයක් විශ්වයේ නැත.

අපි ඉගෙන ගත් භෞතික විද්‍යාවට අනුව සූර්යයා පායා ඇති දවල් ට පොළොව ආලෝකවත් වී ඇතයි ද, රාත්‍රියට අඳුරු යයි ද, පිළිගනිමු. මෙම පිළිගැනීම සත්‍යයක් ද? ඔබට වීඩියෝ කැමරා ගැන යම් අවබෝධයක් ඇත. නවීන පන්නයේ බොහෝ වීඩියෝ කැමරා වලින් රාත්‍රියේදී ආලෝක ප්‍රභවයත් නොමැතිව වීඩියෝ කළ හැක. මෙම කැමරා අධෝරක්ත කිරණ වලට සංවේදීය. ඝන අන්ධකාරය ඇති විට මෙම කැමරාවකින් බැලූ විට වස්තු ආලෝකවත් ව පැහැදිළිව පෙනේ. අඳුර පහ වූයේ කෙසේ ද? අඳුර පහ වූයේ කැමරාවෙනි. නමුත් කැමරාව ආලෝකය නිපද වූවේ ද නැත. අපේ ඇස ද අධෝරක්ත කිරණ වලට සංවේදී නම් පියවි ඇසින් රාත්‍රියට වස්තු දැකි ය. එවිට අඳුර පහ වන්නේ ඇසේ සහ මොළයේ ක්‍රියාකාරිත්වයෙනි. අඳුර යනු ඔබෙන් බාහිර වූ ගුණයක් නොවේ. එය ඔබ නිර්මාණය කර ගත් ගුණයකි. දවල් ට සූර්යයා පායා ඇති විට පොළොව ආලෝකවත් වී ඇතයි කීමෙහි සත්‍යයක් ද නැත. සූර්යයා ආලෝකයෙහි ඇති දෘෂ්‍ය පරාසයට අයත් ආලෝක කිරණ ඇසට සංවේදී ය. මෙම සංවේදී බව නිසා පොළොව ආලෝකවත්ව පෙනේ. එය ද තමන්ගේ මොළයෙන් නිර්මාණය කරගත්තෙකි. භෞතික විද්‍යාඥයන් පිළිගත් කළු කුහරය පමණක් නොව ඔවුන්ගේ දැනුමෙන් සාදාගත් මුළු විශ්වයම අඳුරු ය. මෙම අඳුරු විශ්වයෙහි අතපතගාන භෞතික විද්‍යාඥයෝ විශ්වයේ රහස් සොයති, දාර්ශනිකයෝ සත්‍ය සොයති, ආගමික ශාස්තෘවරුන් සැනසීම සොයති. අවසානයේ දී මේ සියල්ලෝම හිස් අතින්ම මිය යති. සත්‍ය දැක මරණය අභිබවන්නෙත් විශ්වය දකින්නේත් දැනුමෙන් නිර්මාණය කරගත් සියලුම ධර්ම වැරදි බව දැකීමෙන් පමණි.

වස්තු ඇතැයි පිළිගැනීම කාලයේ ආරම්භයයි. වස්තු ඇතයි පිළිගත් විට කාලයට අසු වී ඇති යෝගාවචරයෝ වස්තු වල නිත්‍ය නොවන බව හෙවත් අනිත්‍යය මනසින් පිළිගනිති. වස්තු හෙවත් දේවල් නැති බව දුටු විට එහි අනිත්‍යය ගැන කතා කරන්නට දෙයක් නැත. දුකට හේතුව දේවල් තියෙනවා ය පුද්ගලයින් ඉන්නවා ය යන දැනුමයි. පුද්ගලයින් හා වස්තු නැති බව දුටු විට දුක ද කෙළවර වෙයි. බුදුන් වහන්සේ දේශනා කළ අනිත්‍යය හා දුක මෙයයි. නමුත් යෝගාවචරයින් අනිත්‍ය ලෙස පිළිගන්නේ ඔවුන් ම නිර්මාණය කර පිළිගත් වස්තුවල සිදුවන විපරිනාමය හෙවත් ජරාවට පත් වීමයි. මෙම අනිත්‍ය යෝගාවචරයාගේ පිළිගැනීමක් මිස සත්‍ය නොවේ. මුලාවට පත් වූ යෝගාවචරයින් තම මනසින්ම රූප කාය නිර්මාණය කරගෙන බාහිර නැති වර්ණ ගන්ධ ශබ්ද රස හා ස්පර්ශ රූප පදනම් කරගත් වස්තු වල 'අනිත්‍යය' සත්‍ය යයි පිළිගනිමින් 'අනිත්‍ය දුක්ඛ අනාත්ම' සිහි කරමින් භාවනා කරති. එම භාවනාවෙන් ම සත්‍ය සොයති. කිසියම් වූ භාවනාවක් යනු වැරදි දැනුමේම ඵලයකි.

කෙලෙස් ප්‍රහීන කළ තැනැත්තා බුද්ධ නම් වෙයි. නමුත්
කෙලෙස් නැවීමෙන් බුද්ධත්වයට පත් නොවෙයි.

6

# සත්‍යය ගවේෂණය හෙවත් ධර්මය අතහැරීම

තමන් විසින්ම නිර්මාණය කරගත් ලෞකික ලෝකයෙන් නිදහස්ව ලෝකෝත්තර සත්‍ය දැකීමට කැමැති වේ නම්, ඒ සඳහා සත්‍ය ගවේෂණය කළ යුතු ය. අනුන් කියන ධර්ම අසා තමන්ගේ බුද්ධියට අනුව පිළිගැනීමෙන් සත්‍ය දැකිය නොහැකි ය. සත්‍ය දකින්නේ සියලු ධර්ම ඉක්ම වීමෙන් වුවත් සත්‍ය ගවේෂණය කිරීමට සිදුවී ඇත්තේ ද, තමන් පිළිගත් ධර්ම හරහා ය. සත්‍ය ගවේෂණයේ ඇති අමාරුකම එයයි. බුදුදහම විලෝපනය වූ පසු එනම් ලෝකය මාර්ගඵල ලාභීන්ගෙන් ශූන්‍ය වූ පසු බොහෝ දාර්ශනිකයෝ සත්‍ය සෙවීමට අපමණ වෙහෙසක් ගනිමින් සිටිති. මෙහි ප්‍රතිඵලයක් ලෙස විවිධ දර්ශන බිහි විය. තමන් අනුගමනය කරන්නා වූ වැරදි දැනුමෙන් නිර්මාණය කරගත් වැරදි චින්තනය හරහාම මෙම සියලු දාර්ශනිකයෝ සත්‍ය සොයා යති.

සාපේක්ෂතාව හෙවත් ද්විත්වය ඉක්මවා යාමෙන් සත්‍ය දැකිය හැකි බව සමහර බුද්ධිමත් දාර්ශනිකයෝ පිළිගත් හ. මෙහි ද්විත්වය යනුවෙන් අදහස් කරන්නේ 'හොඳ නරක' 'පින් පව්' 'කුසල් අකුසල් ' ආදී අන්ත දෙකක් ඇති ධර්මයි. අත්තකිලමතානු යෝගයත් කාමසුඛල්ලිකානු යෝගයත් අයත් වන්නේ ද අන්ත දෙකකින් යුත් ද්විත්වයටයි. සත්‍ය දැකීමට නම් ද්විත්වයට අසුවන ධර්මයන් වූ අත්තකිලමතානුයෝගයෙන් හා කාමසුඛල්ලිකානුයෝගයෙන් නිදහස් විය යුතු බව බුද්ධ දේශනාවේ ද සඳහන් වෙයි.

සියලුම ධර්ම ද්විත්වයට අසුවී ඇති බව නොදන්නා මෙම දාර්ශනිකයෝ ද්විත්වය ඉක්මවා ඇති සත්‍යය සොයන්නේ ද තමන් පිළිගත් ද්විත්වයට අසුවූ ධර්මයෙනි. අපි නිර්මාණය කරගත් දැනුමෙන්, ද්විත්වයට අදාළ ධර්ම හැරුණ කොට තවත් ඉතිරි වන්නට දැනුමක් තිබේදැයි ඔබේම නුවනින් විමසා බැලිය යුතුය. දැනුම හා ද්විත්වය එකිනෙකට බැඳී ඇති වෙන් කල නොහැකි එකම ධර්මයකි. දැනුම නැති තැන ද්විත්වයක් නැත. ද්විත්වය නැති තැන දැනුමක් ද නැත. කුඩා ළමයාට දැනුමක් නැති බැවින් ඔහු හෝ ඇය 'මේ හොඳය මේ නරකය' යනුවෙන් බෙදා වෙන් කරන්නේ නැත. මෙම ද්විත්වයට අසුවන අත්තකිලමතානුයෝගයත් කාමසුඛල්ලිකානුයෝගයත් අන්ත දෙකක් බව දන්නා සත්‍ය ගවේශකයෝ මෙම අන්ත දෙක අතර මැදුම් පිළිවෙතක් සොයති. බොහෝ දෙනෙක් පිළිගන්නේ මැඳුම් පිළිවෙත යනු වැඩි සැපත් නැති වැඩි දුකත් නැති අත්තකිලමතානුයෝගයේත් කාමසුඛල්ලිකානුයෝගයේත් අතර මැදි අවස්ථාවක් බවයි. අත්තකිලමතානුයෝගය හා කාමසුඛල්ලිකානු යෝගය දැනුම තුළම නිර්මාණය කරගත් සාපේක්ෂ ධර්ම බැවින් 'නිරපේක්ෂ වූ' එහි අතරමැදි අවස්ථාවක් නැත. උදාහරණයක් ලෙස ගල් යුගයේ ජීවත් වූ මිනිසාට ලී දඬු එකතු කර සාදාගත් මැස්ස සැප ආසනයකි. අපි සුඛෝපභෝගී යයි සලකන සයන යුරෝපීය ජාතිකයනට සාමාන්‍ය සයනයකි. සැප සහ දුක කාලයෙන් කාලයට දේශයෙන් දේශයට වෙනස් වෙයි. දැනුම පිළිගත් යමෙක් සත්‍ය සෙවීමට යම් පිළිවෙතක් අනුගමනය කරන්නේ නම් එම පිළිවෙත අත්තකිලමතානුයෝගය හෝ කාමසුඛල්ලිකානුයෝගය වෙයි. අන්ත දෙකෙන් තොර වූ මැදිහත් පිළිවෙතක් නැත. වැරදි දැනුමෙහි සම්මා දෘෂ්ඨියක් නැති බැවිනි. සත්‍ය සොයන යෝගාවචරයෝ මෙම අන්ත දෙකම අත්හැර ඇතයි කියමින් එම අන්ත ම අනුගමනය කරන බව ඔවුහු නොදනිත්. තමන්ට පරිහරණයට ආසන හා සයන තිබියදී ඒවා ඉවත දමා මසකට එක් දිනක් හෝ 'බිම වාඩි වීම' 'බිම නිදා ගැනීම' නම් වූ පිළිවෙතක් හෝ ව්‍රතයක් යම් කෙනෙක් සත්‍ය දැකීමට අනුගමනය කරන්නේ නම් එම පිළිවෙත හෝ ව්‍රතය අයිති වන්නේ මැඳුම් පිළිවෙතට ද නැතිනම් අත්තකිලමතානු යෝගයට ද ?

තවත් සමහර දාර්ශනිකයෝ තවදුරටත් තම දැනුම මෙහෙයවා අතීතයෙනුත් අනාගතයෙනුත් ඉවත් වී වර්තමානයේ සිහිය පිහිටුවීමට මානසික වීර්යය යොදමින් එයම සත්‍යයයි පිළිගනිති. තම ජීවිතය වර්තමානයට පමණක් සීමා කරගන්නා ලෙස බුදුන් වහන්සේ දේශනා කර ඇතයි මෙම සත්‍ය ගවේශකයෝ අන් අයට කියා පාති. මෙම දාර්ශනිකයෝ ද, අතීත වර්තමාන හා අනාගත තුන් කාලය ද දැනුම ද පිළිගනිති. ඔවුන් සත්‍ය ලෙස පිළිගන්නේ අතීතය හා අනාගතය අත්හැර වර්තමානයෙහි ජීවත් වීමයි. බුදු කෙනෙක් අතීතය හා අනාගතයෙන් ඉවත් වී වර්තමානයේ සිත පිහිටුවා ගන්නට උපදෙස් දෙන්නේ නැත. ඒ ඇයි? බුදු දහම නම් 'අකාලිකෝ භගවතෝ ධම්මෝ ' යන්නයි. වර්තමානයද කාලයට අසුවෙයි. අනෙක් අතට චින්තනයේ සිටින යෝගාවචරයාට වර්තමානයේ සිත පිහිටුවා ගැනීම කළ හැක්කක් නොවෙයි. යෝගාවචරයා නේවසඤ්ඤා නාසඤ්ඤාවෙන් පසු අඩ නින්දට ද පසුව තද නින්දට ද වැටෙයි.

තමත් සමහරෙක් උපේක්ෂාවෙන් නිවන් සොයති. දෙස් විදෙස් පතල බෞද්ධ ශ්‍රාවකයන් වහන්සේ කෙනෙකුගෙන් කමටහන් ගන්නා ශිෂ්‍යයකු මට එවූ ලිපියක උපේක්ෂාවෙන් සත්‍ය ගවේෂණය කරන්නේ කෙසේ ද යන්න සදහන් කර තිබුණි. එම ක්‍රමය මා මෙහි සදහන් කරන්නේ බොහෝ දෙනෙක් සත්‍ය ගවේෂණයට එම ක්‍රමය අනුගමනය කරන බැවිනි.

ඔහු සඳහන් කර ඇති ආකාරයට ඔහුගේ උපේක්ෂා නිවන් මාර්ගය මෙයයි. ණිඋපේක්ෂාවද ලෞකික ධර්මයක් වුවද (මීට පෙර ලිපියකින් ඔහුට උපේක්ෂාව ලෞකික ධර්මයක් බවත් ලෞකික ධර්ම හරහා සත්‍ය සෙවිය නොහැකි බවත් දන්වා සිටියෙමි) සියලු ධර්ම වලින් නිදහස් වී ලබන පරිනිර්වාණයට අපට පුරුදු කළ යුතු යැයි බුදුන් වහන්සේ පෙන්වා වදාළ එකම ධර්මය උපේක්ෂාව බවයි, මට හැඟෙන්නේ. බුදුන් වහන්සේ දේශනා කළ සියලුම සූත්‍ර වලින් පෙන්වා දෙන්නේ උපේක්ෂාව දියුණු කරන ආකාරය බවයි, එම සූත්‍ර වල තිබෙන දේ භාවිත කිරීමට පුරුදු පුහුණු වන මා හට පෙනෙන්නෙ. නිවනේ උත්තුංග ඵලය වන පරිනිර්වාණ ධාතුව දක්වා ගමන් කරන ප්‍රායෝගික පරීක්ෂණ මාලාව දීර්ගව විස්තර

කෙරෙන මහා සතිපට්ඨාන සූත්‍රයේ අවසානයේ ඵලයට පිවිසෙන්නේ උපේක්ෂාවේ පාරශුද්ධියෙන් බව විස්තර වෙයි. මට පෙනෙන ආකාරයට සියලුම ධර්ම වලින් නිදහස් වන මාර්ගය එයයි. කවදා හෝ දිනක මා ජරාවට පත් වීමත් ව්‍යාධියට පත් වීමත් මරණයට පත් වීමත් මට වැළැක්විය නොහැක. එහෙත් බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන පරිදි මේ මෙහොතේ දී ඔය සියල්ලටම පත් වීම මට වැළැක්විය හැකි ය. ඒ සඳහා මම භාවිතයට ගන්නේ උපේක්ෂාවයි. එය මගේ ජීවිතය නිවා සනසා ගැනීමට බොහෝ සේ පිටිවහලක් වී ඇත.□

මිනිස් සත්ත්වයා නිවන් දකින තෙක් ඒ සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරයි. සිදුහත් තව්සාණෝ සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කළහ. බුදුන් වහන්සේ දේශනා කළ සියලුම ධර්ම ධාරණය කරගත් ආනන්ද තෙරණුවෝ ද බුදුන් පිරිනිවීමෙන් පසු රහත් වීමට වෙර දැරූ ආකාරය ඔබ අසා ඇත. අනෙක් අය ගැන කවර කතා ද? ආනන්ද තෙරණුවෝ අවසන රහත් වූයේ සියලු වීර්යයන් අත්හැරීමෙනි. මා මෙම ලිපියේ මුලින් ද සඳහන් කර ඇති පරිදි කාමසුඛල්ලිකානුයෝගයත් අත්තකිලමතානුයෝගයත් අත්හරින සත්‍ය ගවේශකයෝ, මධ්‍යම ප්‍රතිපදාව මෙම අන්ත දෙක අතර ඇතයි සිතති. ඔවුහු උපේක්ෂාව මධ්‍යම ප්‍රතිපදාව යයි පිළිගෙන, මධ්‍යම ප්‍රතිපදාව යැයි කියමින් උපේක්ෂාව පුරුදු පුහුණු කරති. තවත් සමහර යෝගාවචරයෝ 'මම ලාබයෙන් සතුටු නොවෙම්වා, අලාබයෙන් දුක් නොවෙම්වා' ආදී වශයෙන් මෙනෙහි කරමින් උපේක්ෂා භාවනාව පුරුදු පුහුණු කරති. අන් අයට උගන්වති. උපේක්ෂාව පුරුදු පුහුණු වීමෙන් ධර්ම වලින් නිදහස් වීමට කායික හා මානසික වීර්යය යොදන අයගෙන් මම අසන්නේ උපේක්ෂාවෙන් නිදහස් වන්නේ කවදා ද යන්නයි. බුදු කෙනෙක් ළඟ 'උපේක්ෂාව' නැත. ලාභය හා අලාභය යනු තම මනසින් නිර්මාණය කරගත් මනංකල්පිත වූ ධර්ම බව දකින ප්‍රඥාවන්තයා ලාභයෙන් ද අලාභයෙන් ද නිදහස් වෙයි. උපේක්ෂාවෙන් ද නිදහස් වෙයි.

සියලු ධර්ම වලින් නිදහස් වී සත්‍ය දුටුවෙක් පමණක් සතිපට්ඨාන සූත්‍රය දකී. ලෞකික ලෝකයේ ජීවත් වන්නකුට

සතිපට්ඨාන සූත්‍රයේ ඇති ලෝකෝත්තර ධර්ම තෝරා බේරා ගන්නට නොහැකි ය. ඔවුන් දකින්නේ ලෞකික ධර්ම විනා එහි ඇති ලෝකෝත්තර ධර්මය නොවෙයි. ජරාවද, ව්‍යාධියද, මරණයද, ලෞකික ධර්ම තුළ ඇති පිළිගැනීමකි. යම් කෙනෙක් ජාති ජරා මරණ වලින් නිදහස් වන්නේ මේවා වැරදි ධර්ම බව දැකීමෙනි. මරණය සත්‍ය නම් මරණයෙන් නිදහස් විය නොහැක. සැනසුමට මාර්ගයත් නිවනට මාර්ගයත් යනු දෙකක් මිස එකක් නොවෙයි. ලෞකික ධර්ම පුරුදු පුහුණු කිරීමෙන් යම් කෙනකුට සැනසුම ලැබිය හැක. නමුත් සැනසුම ද කාලයට අසුවී ඇති තාවකාලික ධර්මයකි. නිවන, අතීත වර්තමාන අනාගත යන තුන් කාලයෙන් ම තොරවෙයි. නිවනෙහි සැනසීම නැත. සැනසීම ද ලෞකික ධර්මයකි.

සාපේක්ෂ වූ දැනුමෙහි සත්‍ය නැතයි ද, සත්‍යය යනු දැනුමෙනුත් කාලයෙනුත් ඉක්මවා ගිය ධර්මයක් යැයි ද පිළිගන්නා දාර්ශනිකයෝ ද ලොව සිටිති. 'විමලකීර්ති සූත්‍රය' ආදී ගැඹුරු මහායාන ධර්ම පරිශීලනය කිරීමෙන් මෙම අවබෝධය ඔවුන් ලැබුවද දැනුමේ වැරදි දැක දැනුම ඉක්මවා යන්නට තරම් ඔවුහු ප්‍ර ඥාවන්තයෝ නොවූ හ. අවාසනාවට මෙන් මෙම දාර්ශනිකයන් ද සත්‍ය දැකීමට උත්සාහ කරන්නේ වැරදි දැනුමේ ම ඵලයක් වූ භාවනාවෙනි.

නිවන් දැකීම තමන්ගේ ඒකායන මාර්ගය යැයි තමන්ගේ අනුගාමිකයනට කියමින් දෙව් බ්‍රහ්ම ලෝකවල උප්පත්තිය ලබා සසර සැරිසරන්නට කැමැතිව වත්පිළිවෙත් අනුගමනය කරන යෝගාවචරයෝ ද සිටිති. සිදුහත් තවුසාට අලාර කාලාම උද්දකරාමපුත්‍ර ආදී මෙවැනි ගුරුවරුන්ගෙන් නිදහස් වීමට හැකි විය. ඔබ ලබාගත් මෙම ජීවිතයේදීම සත්‍ය දැකීමට කැමැත්තේ නම් පළමුව ඔබ මෙවැනි ගුරුවරුන්ගෙන් නිදහස් විය යුතුය. මෙවැනි ගුරුවරු හඳුනා ගැනීම පහසු ය. මෙවැන්නෝ දෙව් හා බ්‍රහ්ම ලෝක වර්ණනා කරති. එම ලෝක වල ඉපදෙන්නට ප්‍රාර්ථනා කරන්නැයි උපදෙස් දෙති. සක්විති රජකම ප්‍රාර්ථනා කරති. ධ්‍යාන වඩා එම ධ්‍යාන වලට අනුරූප වූ බ්‍රහ්ම ලෝකවල ඉපදෙන්නට කමටහන් දෙති. දිව්‍ය ලෝක බ්‍රහ්ම ලෝක යනු තම මනසේම

නිර්මාණ බව නොදන්නා මෝහයෙන් මුලා වී ඇති බොහෝ දෙනෙක් දෙව් ලොව හා බ්‍රහ්ම ලොව ඉපදෙන්නට ම ප්‍රාර්ථනා කරති. නමුත් බුදුන් වහන්සේ අනු දැන වදාළේ 'මම භවය මොහොතකටවත් වර්ණනා නොකරමි' යි යනුවෙනි.

එක් පාඨක මහත්මයෙක් මගෙන් අසා තිබුණේ ක්‍රිෂ්ණමූර්ති තුමා දේශනා කරන ලද ධර්මයත් මගේ ලිපිවල ලියා පළකරන ලද ධර්මත් එකම නොවේ ද යන්නයි. තමන් නිර්මාණය කරගත් ලෝකයෙන් ඉවත් වන තෙක් ලෞකික හා ලෝකෝත්තර ධර්ම වල ඇති වෙනස දැකිය නොහැකි ය. දේශනා කරන්නට ලෝකෝත්තර දහමක් නැති බව දකින්නේ සියලුම ධර්ම වලින් නිදහස් වූ විටයි. මම මගේ ලිපි වලින් යම් දෙයක් ලියා ඇත් ද ඒවා වචන හරහා ගත් විට දැනුමටම අයත් වෙයි. එම දැනුමෙන් ද ඔබ නිදහස් විය යුතුය. ක්‍රිෂ්ණමූර්ති තුමා යම් ධර්මයක් ලොවට කියා දී, එම ධර්ම අනුගමනය කිරීමෙන් සත්‍ය අවබෝධ කරගන්නැයි ඔබට උපදෙස් දී ඇත. නමුත් මා විසින් ඔබට කිසිම ධර්මයක් කියා දී නැත. හබල් ගසමින් ගඟ තරණය කරන ඔබට ධර්මය නැමති පහුර අවශ්‍ය වන්නේ ඉදගෙන යාමට පමණි. එවැනි වූ ධර්මය හිස තබාගෙන ගඟ තරණය කරන්නට යන ඔබ දුකට පත්වෙයි.

විවිධ ආකාරයේ දාර්ශනිකයින් තමන් පිළිගත් ධර්මයෙන් සත්‍ය ගවේෂණයේ පරතෙරටම පැමිණිය ද සත්‍යය දැකීමට ඔවුන්ට නොහැකිය. ධර්මය පිළිගන්නා තාක් කල් කොතරම් බුද්ධිමත් වුවද ධර්ම අත් හැරීමට වූ ඥාන පහළ නොවීම ඊට හේතුවයි. ඔවුහු ධර්ම උගුලට අසුවූ ධර්මයේම සිරකරුවන් වන්නා හ. ධර්මය අත්හැරීමට කල්‍යාණ මිත්‍ර සේවනය අවශ්‍යම වෙයි (කල්‍යාණ මිත්‍ර සේවනය යනු පණ්ඩිත සේවනය නොවෙයි). සත්‍ය දැකිය හැක්කේ ධර්ම අත්හැරීමෙන් මිස ධර්මය පිළිගැනීමෙන් නොවන බව මම නැවත නැවත කියමි. නමුත් ප්‍රඥාව පහල වනතෙක් පිළිගත් ධර්මයෙන් නිදහස් විය නොහැකියග දැනුම අභිබවා ගිය සම්මා දෘෂ්ඨිය යනු ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ පළමු මාර්ග අංකය වන්නේය. සම්මා දෘෂ්ඨිය පහළ වීමට පෙර පහළ වන සියලුම සංකල්පනාවන් මිථ්‍යා සංකප්ප වන්නේ ය. නමුත් යෝගාවචරයා සිතන්නේ ඒවා සම්මා සංකප්ප කියා ය. මිථ්‍යා සංකප්පයෙන් ගන්නා සියලුම උත්සාහයන්

මිථ්‍යා වායාමයක්ම වන්නේ ය. එහි අවසාන ඵලය මිථ්‍යා සමාධියක් ම වන්නේ ය. යෝගාවචරයෝ සීලය මුල් කරගෙන භාවනාවෙහි සිහිය පිහිටුවා එම උත්සාහය 'සම්මා වායාම' යයි පිළිගෙන මිථ්‍යා ව්‍යායාමයෙහි ම යෙදෙන්නේ ය. පංචස්කන්ධය හෙවත් දැනුම මුල් කරගෙන එම දැනුමෙන්ම නිර්මාණය කරගත් සංස්කාර ධර්ම පිළිපදිමින් ලෝකයෙන් එතෙර වන්නට පුළුවන්දැයි ඔබ බුද්ධිය මෙහෙයවා බැලිය යුතු ය. මම කියන දේ පිළිගත්තාට වැඩක් නැත.

'සක්මන' වැරදි දැනුමෙන් නිර්මාණය කරගත් සංස්කාර ධර්මයකි. යෝගාවචරයා තම 'පාදය එසවීමෙහි' සිහිය පිහිටුවා ගත්විට 'පාදයත්' 'උඩ සහ යට' ත් 'පොළොව'ත් පිළිගෙන හමාර ය. උඩ සහ යට ආදී ද්විත්වයට අසුවන ධර්ම ඇත්තේ තමන් නිර්මාණය කරගත් ලෝකයෙහි මිස සත්‍යයෙහි නොවේ. යෝගාවචරයා පාදය ඔසවන්නේ පොළොවට සාපේක්ෂව වන අතර, සාපේක්ෂ ධර්ම වලින් නිරපේක්ෂ වූ සත්‍ය දැකිය නොහැකි ය.

බෞද්ධ පොත්පත් හා පත්‍රිකා මුද්‍රණය කර ප්‍රසිද්ධ කිරීමේ දී බුද්ධ දේශනාවන් විකෘති කොට වැරදි අර්ථකථනයන් දීමේ ප්‍රවණතාවන් ඇති බව අන්‍යාගම්කරණ පිළිබඳ සෙවීමේ කොමිසම් සභාව හෙළිදරව් කර ඇති බව 20090316 දින ලක්බිම පුවත් පතෙහි සඳහන් කර තිබුණි. මෙවැනි පැමිණිලි සමාලෝචනය කිරීමට බෞද්ධ ගිහි පැවිදි විද්වත් මණ්ඩලයක් රජය විසින් පත්කළ යුතු බවත් එම මණ්ඩලයේ තීරණය අනුව එවැනි පොත්පත් සංශෝධනය කිරීම හෝ මුද්‍රිත පොත් පත් වෙළඳපොළින් ඉවත් කිරීමට වූ නීතිමය ප්‍රතිපාදන සැලැස්විය යුතු බවත් කොමිසන් සභා වාර්තාව තවදුරටත් පෙන්වා දී ඇත.

බුදුන් වහන්සේ දේශනා කළ ධර්මය දැනුම ඉක්මවා ඇති බැවින්, විකෘති කිරීමට හෝ විනාශ කිරීමට නොහැකි ය. බුදු දහම යටපත් වූ පසු බුදු දහම යයි කියමින් ලෞකික ධර්ම අනුගමනය කරති. එය ලෝක ස්වභාවයි. විවිධ අර්ථ කථන දෙමින් විකෘති කරන්නේ ද, නීති පැනවීමෙන් ආරක්‍ෂා කිරීමට උත්සාහ කරන්නේ ද, එවැනි ලෞකික ධර්ම මිස බුදු දහම නොවෙයි. බුදුවරයෙක් දේශනා කළ ධර්මය තෝරා බේරා ගන්නට ලෞකික ලෝකයේ

ජීවත් වන විද්වත් මඩුල්ලකට හැකිනම් බුදුවරුන් ලොව පහළ වන්නේ කුමකට දැයි මම අනාගාමිකරණ පිළිබඳ සෙවීමේ කොමිසන් සභාවේ සභාපති තුමාගෙන් අසමි.

ප්‍රඥාවන්තයෝ සැප සම්පත් යනු තාවකාලික වූ අස්ථිර දෙයක් බව දැක, එම සැප සම්පත් තමන්ට හැකි පමණින් භුක්ති විඳිති. බාලයෝ සැප සම්පත් තාවකාලික වූ අස්ථිර දෙයක් යයි පිළිගෙන, එම තාවකාලික වූත් අස්ථිර වූත් සැප සම්පත් අතහැර දමා අල්පේච්ඡ ජීවිතයක් ගත කරති.

පෘතග්ජන පුද්ගලයා පංච ඉන්ද්‍රියන් නැමති පොටවල් පහකින් අඹරන ලද කඹයෙන් ධර්මය නැමති කණුවට බැඳී ඇත. මේ බව නොදත් යෝගාවචරයෝ ධර්මයම පිහිට කොටගෙන ලෝකයෙන් එතෙර වීමට වීර්යය දරති. ධර්මයත් ලෝකයත් යනු එකක් බව ඔවුහු නොදනිති. කණුවේ බැඳුන ගවයා එම බැඳීමෙන් නිදහස් වීමට නොහැකිව කණුව වටා කැරකෙන්නාක් මෙන් ධර්මයට බැඳී ඇති යෝගාවචරයෝ ද ලෝකයෙන් නිදහස් විය නොහැකිව සංසාර චක්‍රයෙහි කැරකෙති.

7

# දානය සහ එහි ආනිශංස

දන්දීම හොඳ ක්‍රියාවකි. නමුත් අපි දන්දිය යුත්තේ ඇයි යන ප්‍රශ්නයට ධර්මයෙන් ලැබෙන පිළිතුරු සමාජයේ උන්නතියට කොතරම් දුරට බලපාන්නේ ද? දන්දීමේ ආනිශංස ලෙස, පින් රැස්කර දෙව් මිනිස් ලෝක වල ඉපිද, සැප සම්පත් බුක්ති විඳීමට අවස්ථාව ලැබෙන බව ධර්මයේ උගන්වයි. මෙම ඉගැන්වීම මෙතැනින් අවසන් නොකර කවර නම් කෙනකුට දන් දුන්නොත් මහත්ඵල මහානිසංශ ලැබෙන්නේ දැයි ද කියාදෙයි. උදාහරණයක් ලෙස සිල්වත් වූ ශ්‍රමණයන් ට දෙන දානය දුස්සීල ශ්‍රමණයන් ට දෙන දානයට වඩා මහත් ඵල මහානිසංශ වේ යයි දේශනා කරයි. ඔබගේ දැනුමට අනුව මෙවැනි වූ ධර්ම සමාජයට උගන්වන්නේ සමාජයේ යහපත සඳහාත් ගුණධර්ම වර්ධනය කිරීමටත් ය. මෙම ධර්ම සමාජය විසින් කවර නම් වූ ආකාරයකින් ග්‍රහණය කර ගනී ද?

මැගී අක්කා පේරු දානය රැගෙන පන්සලට යන අතර මගදී සුමනා නංගි හමුවෙයි. සුමනා නංගි අලුත්ම ප්‍රවෘත්තියක් මැගි අක්කාට කියයි. 'අක්කට ආරංචි නැද්ද පන්සලේ හාමුදුරුවෝ ගැන පැතිරිලා තියන කතාව?' යයි ආරම්භ කරමින් පන්සලේ හාමුදුරුවෝ ගැන දීර්ඝ විස්තරයක් කරගෙන යයි. 'අනේ ඇත්ත ද?' කියන මැගී අක්කා 'ඔය දුස්සීල ශ්‍රමණයන්ට දෙන දානයෙන් ඇති පින මොකක්' දැයි කියමින් ආපසු හැරී ගෙදර එයි. දානයේ ආනිශංස හොඳින් ඉගෙන ගත් මැගි අක්කා ගේ ක්‍රියාව නිසා පංසලේ හාමුදුරුවන්ට දානය නැති විය.

දන් දී පින් රැස් කරගන්න යයි ධර්ම දේශනා කළ විට සිදුවන්නේ කුමක් ද? එවිට උපාසක උපාසිකාවෝ පින්තකා ම දන්දෙති. පින්තකා දන්දෙන විට දානය නැමති මහාර්ඝ ගුණය යටපත් වෙයි. පින්තකා දන්දෙන ලංකාවේ වෙසෙන බෞද්ධයින් එම පින තමාටත් තමන්ගේ මළගිය ඤාතීන්ටත් අනුමෝදන් කරති.

'අනිත්‍ය දුක්ඛ අනාත්ම' යයි භාවනා කරන මේ අය තම ඤාතියා මියගිය විට මළගිය තැනැත්තාගේ 'ආත්මයට' පින්දෙති. මට මෙහිදී අකමැත්තෙන් වුවත් කියන්නට කරුණක් ඇත. ඕස්ට්‍රේලියාව නවසීලන්තය ඇමෙරිකාව එංගලන්තය ආදී රටවලට බෞද්ධ හාමුදුරුවරුන් වැඩමවා පංසල් ආරාම සාදා දී වඩා හිඳුවන්නේ ඇයි දැයි ඔබ දන්නවා ද? ධර්මය ඉගෙන ගැනීමට ද? නැත. පින් පිණිස දන්දීමට ය. තම මළ ගිය ඥාතීන්ට පිං අනුමෝදන් කරවීමට ය. දායකයන් මාස් පතා තමන් දායක වූ පන්සලට පේරු දානය වෙන්කර ගන්නේ බොහෝවිට තමන්ගේ මව් හෝ පියා මියගිය දිනට ය. සමහර විට පවුල් කීපයක ඥාතීන් මියගිය දවස එකම දිනයට වැටෙයි. එවිට දායකයන් අතර සිදුවන 'දානපොර' මෙම රටවල සුලබ දෙයකි. එකම දිනයට දානය දීමට දායකයන් පොරකන විට මාසයෙන් වැඩි දින ගණනක් හාමුදුරුවනට දානය නැත. එම දිනයන්ට අදාළ කිසිම දායකයකුගේ ඤාති මරණයක් නැති වීම එයට හේතුවයි. 'අනේ අපිට දනක් දී පිනක් කර මළගිය ඤාතියාට පිං පමුණුවන්නට හාමුදුරුනමක් වත් නැහැනෙ' යි යන අඳෝනා එම රටවල ප්‍රධාන නගරවලින් දුරබැහැරව ජීවත් වන බෞද්ධයින්ගෙන් නිතර අසන්නට ලැබේ.

බුදුන් වහන්සේගේ ශ්‍රාවකයන් වූ ගරුතර සංඝ රත්නය අවුරුදු දෙදහස් පන්සියයකට වඩා වැඩි කාලයක් තුළ ත්‍රිපිටක ධර්මය ආරක්ෂා කර පවත්වාගෙන ආහ. එතුමන්ලා ඒ වෙනුවෙන් කරන ලද සේවය සුළුපටු නොවෙයි. ධර්මය ආරක්ෂා කර පවත්වාගෙන ඒමට සිංහල භාෂාව පමණක් නොව පාළි භාෂාව ද පරතෙරට උන්වහන්සේලා ඉගෙන ගත් හ. දෙමව්පිය නෑදෑ හිතවතුන් අතහැර දමා පැවිදි වූහ. ධර්ම ග්‍රන්ථ ආරක්ෂා කරගැනීමට ජීවිතය පවා පූජා කළහ. මෙසේ ආරක්ෂා කරන ලද ත්‍රිපිටක ධර්ම නිසා දැන් ධර්මය මතු වන්නේ ය. මෙම පොතෙහි එකොලොස් වන පරිච්ඡේදයේ විවෘත කර ඇති චූලකම්ම විභංග සූත්‍රය ඒ සඳහා එක් උදාහරණයක් පමණි. ත්‍රිපිටක ධර්ම ආරක්ෂා කර නොතිබ්ණි නම් එවැනි ධර්ම පහළ වන්නේ නැත. නමුත් සංඝ රත්නයේ වටිනාකම ගිහියන් වන අප වටහා ගෙන ඇත්තේ ඉතාමත් අඩුවෙනි. ඉතාමත් කනගාටුවට කරුණ නම් බොහෝ ගිහියන්ගේ

ආකල්පය වන්නේ සංඝ රත්නය වැඩ සිටින්නේ දන් දී මළගිය ඥාතියාට පිං පැමිණවීමටත්, මතක බණ දේශනා කිරීමටත්, පමණක් ය යන්නයි. මෙය ඉතා අවාසනාවන්ත කරුණකි. කිසිම බෙදීමකින් හා බලාපොරොත්තුවකින් තොරව සංඝරත්නයට ඇප උපස්ථාන කිරීමට ගිහියන් වන අප කැප වී සිටිය යුතුය. එය පිං තකා කරන ක්‍රියාවක් නොවිය යුතු ය.

දානයක් දී එයින් පිනක් බලාපොරොත්තු වන විට ම එම දානයෙන් තමන් බලාපොරොත්තු වන පින නැතී වී යයි. පින් රැස් කිරීමේ චේතනාව මිස දන්දීමේ චේතනාවක් එතැන නැති බැවිනි. පිනට දන්දෙන කිසිම කෙනෙක් නොදන්නා සත්‍ය එයයි. ඔබ මෙතෙක් ජීවිත කාලයට කළේ දන්පින් නම් ඔබ මෙතෙක් දානයක් දී නැත. ලාංකීය ජනතාව ආගන්තුක සත්කාරයට ඉතා ළැදි පිරිසක් ය යන්න ඉතිහාසයද සාක්ෂි දරයි. මෙවැනි වූ යහපත් ගුණාංග ඉතාමත්ම ඛේදජනක ලෙස විනාශ වූයේ දානයේ ආනිශංස ලෙස වැරදි ධර්මයක් ඉගෙන ගත් බැවිණි. එම වැරදි ධර්ම නිසා පින් පිණිසම දන් දෙන බැවිනි. මෙම ධර්ම වලින් තමන්ටත් සමාජයටත් අවැඩක් සිදුවන බව තේරුම් ගැනීමට තරම් වූ තර්ක විතර්ක සහිත වූ බුද්ධිය බොහෝ අයට නැත.

අපේ අයගේ දානය ගිනි පොළියක් බලාපොරොත්තුවෙන් මුදල් තැන්පත් කරනවා වැනි ය. දානය දෙන්නේ මතු උපදිනා ආත්මයක් පාසා එහි පොළිය ලබා ගැනීමේ බලාපොරොත්තුවෙනි. තමන් ඉතිරි කළ යම් මුදලක් ප්‍රදේශයේ ඉන්නා ගිනිපොළී කාරයාට දානය කිරීමෙන් පිනක් සිද්ධ වෙනවා ද? මුදල් ආපසු නොලැබුණත්, එම මුදල් දානය කළේ ගිනි පොලියක් සමග තැන්පත් කළ මුදල ද ආපසු ලබාගැනීමේ චේතනාවෙන් නිසා එම දානයේ පිනක් නැත. එසේම යම් කෙනෙක් පින් නැමති පොළිය බලාපොරොත්තුවෙන් පන්සලේ හාමුදුරුවන්ට දෙන දානයෙන් ද කිසිම පිනක් නොලැබී යන බව ඔබට දැන් පැහැදිලි ද? බොහෝ දෙනෙක් දන් දෙන්නේ හාමුදුරුවන් ට දානය අවශ්‍ය දිනයට නොව තමන්ගේගේ ඥාතියා මියගිය දිනයට ය.

අනාගතයේ ලැබෙන සැප සම්පත් පතා දන්දෙන අය වර්තමානයෙහි සැප සම්පත් භුක්ති නොවිඳින දුප්පතුන් බව ඔබ දන්නවාද? ඔබ රජකම (දැන් කාලයේ හැටියට ජනාධිපති කම) ප ්‍රාර්ථනා කරන්නේ ඔබට රජකම නැති බැවිනි. එසේම යම් කෙනෙක් සැප සම්පත් ප්‍රාර්ථනා කරන්නේ ද ඔහු හෝ ඇය සැප සම්පත් නැති දුප්පතෙක් බැවිනි. යම් කෙනෙක් සැප සම්පත් ප්‍රාර්ථනා කරන විටම තමන් සැපසම්පත් වලින් තොර වූ දුප්පත් පුද්ගලයෙක්ය යන චින්තනය ඔහු හෝ ඇය තුළ පහළ වේ. එහි ප ්‍රතිඵලයක් ලෙස සැප සම්පත් පතා දන්දෙන රටක දුප්පතුන් වැඩි වෙයි. ඔවුන් සැපසම්පත් බුක්ති විඳින්නේ කිසිදිනක ළඟානොවන ආනාගතයේ දී පමණි. අනෙක් අතට ඔබ බලාපොරොත්තු වන සැපසම්පත් ද, මනසේ සාදාගත් මනෝ ලෝකයක් පමණි. සැපසම්පත් යනු මනසින් සාදාගත් වැරදි දෘෂ්ඨියක් බව දකින්නෝ සැපසම්පත් වලින් අංග සම්පූර්ණ වෙති.

දානයේ ආනිශංස ඉතා පැහැදිළි ය. උදාහරණයක් ලෙස හාමුදුරු කෙනකුට දානය ලෙස ආහාරයක් දෙන විට එම ආහාරයෙන් උන්වහන්සේගේ කුසගින්න නිවෙයි. සිවුරු ආදී පිරිකර දන් දුන් විට පන්සලේ හාමුදුරුවන්ට අඳින්නට සිවුරක් ලැබෙයි. ඔබ මෙතෙක් මෙම ආනිශංස නොදුටුවේ ඇයි? ඔබ මෙතෙක් කල් හාමුදුරුවන්ගේ කුසගින්න නිවීමට ආහාර දන් දී නැත. විලි වසා ගැනීමට සිවුරු පූජා කර නැත. ඔබ මෙතෙක් දන් දුන්නේ ඔබටත් ඔබේ මළගිය ඥාතියාටත් පින් පිණිසත් මරණින් මතු දෙව් මිනිස් සැපසම්පත් පිණිසත් පමණි. පිරිකර හා ආහාර ලබාගත් බෞද්ධ සාතෘවරයා ඔබට සත්ධර්මය දේශනා කරයි. එම සත්ධර්මය අසන ඔබ සත්‍යය දකී. දානයෙහි දන් දෙන්නාට ඇති ආනිසංශය එයයි. සත්‍ය දැකීමටත් වඩා තවත් ආනිසංශයක් තිබේ ද? අපේ දරුවන්ට අවශ්‍ය ආහාරපාන හා ඇඳුම් පැළඳුම් සපයා දීම අපගේ යුතුකමක් විනා එය පින් බලාපොරොත්තුවෙන් කරන දෙයක් නොවේ. එසේම තම පන්සලේ වැඩවසන ස්වාමීන් වහන්සේලාට ඇප උපස්ථාන කිරීම ද තමන්ගේ යුතු කමකි. අප කළ යුත්තේ අපේ යුතුකම් ඉටු කිරීම මිස දන්පින් කිරීම නොවේ.

සීලවන්තයාටද දුස්සීල වත්තයාටද තිරිසන් සත්වයාටද බඩගින්න එක හා සමානව වූ පොදු ධර්මයක් බැවින් බෙදීමකින් තොරව දෙන දානය උතුම්ය. දානය යනු අතහැරීමයි. දානය ලබන්නාගේ සිල්වත් බව මැනීමෙන් කරන්නේ දුන් දානයද අල්ලා ගැනීමයි. තමන් ළඟ ඇති ආහාරයෙන් කොටසක් දන්දිය යුත්තේ කුසගින්නේ සිටින තිරිසන් සත්ත්වයාට ද නැතිනම් කුසපිරි ඇති සීලවන්තයාට ද? තම දායක පන්සලේ හාමුදුරුවන්ට ආහාරයක් දානය කිරීමට, තමන්ගේ ඥාතියා මියගොස් මාස තුන හෝ අවුරුද්ද හෝ අවුරුදු දෙක හෝ සම්පූර්ණ වන තෙක් බලා සිටිය යුතු ද? අපි දානමාන ගැනත් එහි ආනිශංස ගැනත් කතා නොකර අපේ යුතුකම් මොනවාද යන්න සොයා එම යුතුකම් ඉටු කළ යුතුය. අනෙක් අතට දානයේ ආනිශංසය, දානය ලබන්නාටත් දෙන්නාටත් ඒ මොහොතේම ලැබෙන බැවින් එම ආනිශංස ගැන දේශනා කිරීමට හෝ ලිවීමට අවශ්‍යය ද? නොපෙනෙන අනාගතයේ ලැබෙන සැපසම්පත් මත බලාපොරොත්තුව තබා තම අනුගාමිකයනට දානය පුරුදු පුහුණු කිරීම යම් සාතෘවරයකුගේ අභිලාසය නම් එම උත්සාහය, බූරුවාගෙන් වැඩගැනීමට උගේ ඉදිරියෙන් කැරට් අලයක් එල්ලනවා වැනි ය. බූරුවා යනු තිරිසනෙකි. නමුත් මිනිසා යනු සත්‍ය දැක සසරින් එතෙර වීමට පැමිණි බුද්ධිමතෙකි.

දන්පින් කරන (පින් පිණිස දන්දෙන) අය වැඩිපුර සිටින ලංකාවේ දුප්පතුන් වැඩිවීමටත් දන්පින් නොකරන (පින් පිණිස දන් නොදෙන) අය සිටින බටහිර රටවල පොහොසත් අය වැඩිවීමටත් හේතුව දැන් ඔබට පැහැදිළි වී ඇතැයි මම සිතමි. බටහිර රටවල ජනයා 'පින' ගැන නොදනිති. නමුත් විවිධ රාජ්‍ය නොවන සංවිධාන වලට මාස්පතා මුදල් හා වෙනත් ද්‍රව්‍ය දන්දෙති. තුන්වන ලෝකයේ රටවල දුප්පත් දරුවනට මාපියෝ වෙති. ඔවුන් එවැනි දේවල් කරන්නේ පිනක් බලාපොරොත්තුවෙන් නොවෙයි.

දානය සැම විටම හොඳ ක්‍රියාවක් ද නොවෙයි. ඔබේ සහෝදරයා අලස පුද්ගලයෙක් පමණක් නොව බේබද්දෙක් ද නම්, මාස්පතා ඔබට ලැබෙන ආදායමෙන් කොටසක් සහෝදරයාට

දානය කිරීම හරි දෙයක් යයි ඔබ සිතනවා ද? ඔබේ ක්‍රියාවෙන් සිදුවන්නේ සහෝදරයා තව තවත් අලස වීමත් මත්පැනට ඇබ්බැහි වීමත් පමණි. බොහෝ මව්පියවරු තමන්ගේ විශ්‍රාම වැටුප දීගතල ගිය තම දරුවන්ගේ සුබ විහරණයට ඔවුන්ට මාස්පතා දන්දෙති. මෙම දන්දීමෙන් වන ආනිශංසය කුමක් ද? රජයෙන් හෝ විශ්‍රාම ගිය මව්පියන්ගෙන් හෝ මාස්පතා සහනාධාර ලබන අය ගේ කැමැත්ත එම සහනාධාර නොකඩවා ලබාගැනීමයි. එම කැමැත්ත ඒ ආකාරයටම සිදුවිය යුතු බැවින් අනුන්ගෙන් ම යැපෙන්නට බලාපොරොත්තු වන්නන්ට ජීවිතයේ කිසිම දාක ආර්ථික දියුණුවක් ඇති වන්නේ නැත. එවැනි ජනතාවක් සිටින රටක ද ආර්ථික දියුණුවක් නැත.

දාන පාරමිතාව පාරමිතා දහයෙන් පළමුවැන්නයිග බොහෝ දේශකයෝ නිවන් දැකීම සඳහා මෙම පාරමිතා පිරිය යුතුබව දේශනා කරතිග මෙහි දාන පාරමිතාව යනු කුමක්දරැ දාන පාරමිතාව සම්පූර්ණ වන්නේ කෙසේදරැ දානය යනු අතහැරීමයිග තමන් ළඟ ඇති සියලු බාහිර දේවල් අතහැර දාන පාරමිතාව සම්පූර්ණ කල නොහැක්කේ අඩුම තරමින් ඇඳිවත හෝ තමන් තුල තබා ගත යුතු බැවිනිග සක්කාය දෘෂ්ඨිය ඇතුළු තියනවාය ඉන්නවාය යන දෘෂ්ඨි නිසා බාහිර යමක් ඇති බව පෘතජන මිනිසා පිළිගනියිග එය තමන් තුල ඇති දැනුමයිග මේ දෘෂ්ඨියෙන් යමෙක් නිදහස් වූ දාට සියලු දෙයින් නිදහස් වෙයි ල දානය සම්පූර්ණ වෙයිග එමනිසා සක්කාය දෘෂ්ඨිය ඇතුළු සියලු දෘෂ්ඨි වලින් නිදහස් වන විට දාන පාරමිතාව සම්පූර්ණ වෙයිග

**8**

# එළුව්‍රත බලුව්‍රත සහ සිල්ව්‍රත

බුදු දහම වචන වලින් විස්තර කළ නොහැකි, වචන ඉක්මවා ගිය ධර්මයකි. බුදු දහම සත්‍ය දහමක් වන්නේ ද එය වචන වලින් තොර බැවිනි. වචන වලින් නිර්මාණය කරන ලද සියලුම ධර්ම වලින් ධර්මාවබෝධය ලැබෙනවා මිස සත්‍ය දැකීමට නොහැකි ය. අවබෝධය යනු අනුන්ගෙන් අසා හෝ පොත්පත් වලින් දැනගත් ධර්මයකි. එම ධර්ම වචන හරඹයක් පමණි. එනිනෙකාට සාපේක්ෂ වූ ධර්ම වෙයි.

ධර්මය දැකීම එකකි, ධර්ම අවබෝධය තව එකකි. දැකීමෙහි පිළිගැනීමක් නොමැති අතර අවබෝධය ලබන්නේ සම්පූර්ණ පිළිගැනීමෙනි. සත්‍යයට මාර්ගය යනු ධර්ම දැකීම මිස ධර්ම අවබෝධය නොවන බැවින්, ධර්මය දැකීමට පාලි ඉගෙන ගැනීම හෝ ත්‍රිපිඨකයට අනුවම වචන වල අර්ථ හැදෑරීම අවශ්‍ය නැත. 'මාර්ගඵල' යනු ධර්මාවබෝධය ඉක්මවා ගිය තැනකි. ධර්මාවබෝධයෙන් ප්‍රඥාව දකින්නට නොහැකිය. ප්‍රඥාව යනු සියලු දැනුම හෙවත් පංචස්කන්ධය ඉක්මවා ගිය තැනකි. එය වචනයෙන් විස්තර කළ නොහැකිය. මාර්ගඵල යනු කුමක්දැයි පැහැදිලි කිරීමට මම උත්සාහ නොකරමි. ඒ 'විස්තර කිරීම' අසන්නාට 'ධර්මාවබෝධයක්' පමණි. එයින් අසන්නා මුළාවට පත් වෙයි. උදාහරණයක් ලෙස කියනවා නම් රහතන් වහන්සේලා සම්පූර්ණයෙන් කෙලෙස් ප්‍රහීන කළ ඇත්තෝ වෙති. මේ බව දන්නා යෝගාවචරයින් කරන්නේ ව්‍රත රකිමින් හා භාවනා කරමින් මනසෙහි ඇති කෙලෙස් තැවීමයි. කෙලෙස් තැවීමේ ප්‍රමාණයට අනුව මෙම යෝගාවචරයෝ රහත් ඵලයට ආසන්න යයි සිතති. 'බුද්ධ' යනු කෙළෙස් ප්‍රහීන කිරීමේ මාර්ගයයි, නමුත් කෙලෙස් තැවීම යනු 'බුද්ධ' මාර්ගය නොවේ. ප්‍රමේය සත්‍ය වුවත් එහි විලෝමය සෑම විටම සත්‍ය නොවන බව ගණිතය ඉගෙන ගන්නා ශිෂ්‍යයින් දන්නවා ඇත. බුදුන් වහන්සේලාට සහ රහතන්

වහන්සේලාට කියා නිම කළ නොහැකි ගුණ සමුදායක් ඇත. නමුත් මෙම ගුණ පෘතග්ජන පුද්ගලයකුගේ මෙන් පුරුදු පුහුණු කළ, 'දැනුමෙන්' මතුවන ගුණ සමුදායක් නොවේ. 'ඉවසීම' අප විසින් පුරුදු කරන යහපත් ගුණාංගයක් නමුත් රහතන් වහන්සේ කෙනෙකුට 'ඉවසීම' නැත. කෙලෙස් සහිත අපි 'මෙත්තා' කරුණා මුදිතා උපේක්ෂා' පුරුදු පුහුණු කරන්නෙමු. මෛත්‍රිය යනු කෙලෙස් සහිත ධර්මයකි. නමුත් රහතන් වහන්සේලාට කෙලෙස් නොමැති බැවින් එතුමන් ලා තුළ මෛත්‍රියක් නැත, කරුණාව ද නැත. කරුණාව ද කෙලෙස් සහිත ධර්ම වෙයි. නමුත් අනෙක් අතින් බැලූ විට, බුදුන් වහන්සේ හෝ රහතන් වහන්සේ කෙනෙකුගේ 'කරුණාව' නැමති ගුණය වචනයෙන් විස්තර කළ නොහැකි තරම් ය. බුදුන් වහන්සේට සතුරෙක් හා මිතුරෙක් නොමැති බැවින් සියල්ලන්ට 'නොබෙදා' මෛත්‍රිය කළ හැක. අපි ළඟ ඇත්තේ 'බෙදන' මෛත්‍රියකි. අපි සතුරාට දිනපතා මෛත්‍රී කරන්නෙමු. නමුත් මියයන තුරුම සතුරා අපේ මනසෙහි ඇත. අප විසින් කළ යුත්තේ සතුරාට මෛත්‍රිය කිරීම නොව සතුරා මරා දැමීමයි (සතුරා මිතුරකු කර ගැනීමයි).

ලෝකයේ සියලුම ධර්ම බිහි වී ඇත්තේ කුඩා කාලයේ සිටම අනුන්ගෙන් ඉගෙන දැනගත් දැනුමෙනි. ජීවිතය පවත්වාගෙන යාමට මහෝපකාරී වුවත් මිනිස් සත්ත්වයාගේ දුකට හේතු වන්නේ ද, මෙම දැනුමයි. රජසැප විඳිමින් සිටි සිදුහත් කුමරුට ද දිගටම රජසැප විඳීමට බාධාවක් වූයේ මෙම ජාති, ජරා, ව්‍යාධි හා මරණ ආදී මෙම දැනුමයි. සිදුහත් කුමාරයා රජකම අතහැර කැලෑ වැදුණේ ජරා ව්‍යාධි හා මරණ නැති තැනක් සොයාගෙන ය. එතුමාණෝ දුක, දුකට හේතුව, දුක නැතිකිරීම හා දුක නැති කිරීමේ මාර්ගය දැක දුක කෙළවර කර ගත් හ.

සත්‍ය දකින්නේ එක් වරකි. නමුත් ඒ සඳහා අනාදිමත් කාලයක සිට මිනිසා සත්‍ය ගවේෂණය කරයි. සිදුහත් තව්සා ද මුලින්ම ආලාරකාලාම උද්දකරාමපුත්ත පස්වග මහණුන් වැනි එදා සිටි පණ්ඩිතයන්ගෙන් ධර්මය ඉගෙන ගත්තේය. මෙම පණ්ඩිතයන්ගෙන් විවිධ වූ ව්‍රත ක්‍රම ඉගෙන ගෙන ඒවා ක්‍රියාත්මක

කළේ ය. මෙම පණ්ඩිත සේවනයෙන් සිදුහත් තව්සාට කාලය ගත විය, උදරයේ සම පිටට ඇලී ගියේ ය. මරණයට ආසන්න වී යන්තම් දිවිගලවා ගත්තේ ය. පණ්ඩිත ඇසුරෙන් මරණයට මග පෑදෙනවා විනා, මරණයෙන් එතෙර වන්නට බැරි බව දැනගත් සිදුහත් තවුසා පණ්ඩිතයන්ගෙන් දුරස් විය. පණ්ඩිතයන් උගැන් වූ ව්‍රත ධර්ම අත්හැර බුද්ධත්වයට පත් විය. අවසානයේ දී බුද්ධත්වයට පැමිණ දේශනා කළේ අත්තකිලමතානුයෝගය (දුෂ්කර ක්‍රියාව) යනු සත්‍ය සොයන්නකු විසින් අත් හළ යුතු ධර්මයක් බවයි. සිදුහත් තව්සාණෝ පණ්ඩිත ඇසුරින් නිදහස් වුවද වර්තමානයේ සත්‍ය දැකීමට ම මිනිස් ලොවට පැමිණ, පණ්ඩිත ඇසුර නිසා විවිධ ව්‍රත ධර්ම අනුගමනය කරමින් දුෂ්කර ක්‍රියා කරන්නෝ සිටිති. බුදුන් වහන්සේ ඉතා පැහැදිළිව දේශනා කර තිබියදීත් බොහෝ සත්‍ය ගවේෂණය කරන්නෝ සිල්ව්‍රත අනුගමනය කරන්නේ ඇයි දැයි ප්‍රශ්නයකි.

'අපි සත්‍ය දැකීමට අනුගමනය කරන්නේ නිවැරදි ව්‍රත ක්‍රම' යයි මෙම ව්‍රත රකින්නෝ කියති. පුද්ගලයන් විසින් විවිධ ව්‍රත ක්‍රම අනුගමනය කරන්නේ ඒවා තමන්ටත් තමන්ගේ සමාජයටත් යහපත් යයි පිළිගන්නා බැවිනි. කිසිම ජන සමාජයක් තමන්ගේ අවබෝධයට අනුව වැරදි ව්‍රතයත් අනුගමනය කරන්නේ නැත. බලු ව්‍රත රකින්නා කියන්නේ ද 'මා අනුගමනය කරන්නේ නිවැරදි ව්‍රතයකි' යන්නයි. ව්‍රතය වැරදි බව තමන් දන්නේ නම් එය අනුගමනය කරන්නේ නැත. බොහෝ ව්‍රත එකම කුලකයකට අයත් වන බැවින් මෙය වැරදි ව්‍රතයකි, මෙය නිවැරදි ව්‍රතයකි, යනුවෙන් ව්‍රත බෙදා වෙන් කළ නොහැකි ය. උදාහරණයක් ලෙස බලු ව්‍රත රකින්නා සැප ආසන සයන ඉවත දමා බිම වාඩිවෙයි. සමහර ව්‍රත රකින්නෝ ද එලෙසම සැප ආසන පැත්තකින් තබා බිම වාඩි වෙති. බල්ලෝ කණකර නොපළඳින බැවින් බලු ව්‍රත රකින්නා කණකර ආභරණ ගලවා පැත්තකින් තබයි. වෙනත් ව්‍රත රකින්නෝ ද එම ව්‍රත රකින විට කණකර ආභරණ වලින් නිදහස් වෙති. බලු ව්‍රත රකින්නා නැටුම්, ගැයුම්, වැයුම් වලින් ඉවත් වෙයි. සමහර ව්‍රත රකින්නෝ ද නැටුම්, ගැයුම් වැයුම් වලින් ඉවත් වෙති. එකම කුලකයකට අයත් වන මෙම සියලු ව්‍රත රකින්නෝ ව්‍රත රැකීම අතින්

සහෝදරයන් වන්නේ එබැවිනි.

ව්‍රත රකින්නාට එම ව්‍රතයෙන් සිදුවන හානිය දකින්නේ බුදුවරයෙක් පමණි. සමහර බුද්ධිමත් ව්‍රත රකින්නන්ට තමන් රකින ව්‍රතය කෙරෙහි සැක උපදී. බුදුන්ගේ කාලයෙහි එළුව්‍රත රකිමින් සිටි බුද්ධිමත් තරුණයා එවැන්නෙකි. ඔහු බුදුන් වෙත පැමිණ ඇසුවේ ඔහුගේ ප්‍රශ්නය නොව ඔහුගේ සහෝදරයාගේ ප්‍රශ්නයයි (ඔහු ව්‍රත රැකීමෙන් සහෝදරයෙක් විනා නෑකමින් සහෝදරයෙක් නොවේ). සහෝදරයා බලු ව්‍රත රකින්නෙකි. 'ස්වාමිනි මගේ සහෝදරයා බල්ලෙක් ලෙස හැසිරෙයි, බල්ලෙක් ලෙස ආහාර ගනී, ඔහුගේ මතු ජීවිතය කුමන ආකාරයක් ගනී' ද? මෙවැනි ප්‍රශ්නයකට බුදුකෙනෙක් පිළිතුරු දෙන්නේ නැත. බුදුකෙනෙක් මෙසේ වන්නේ යයි දේශනා කළොත් එය එසේම වන බැවිණි. මෙම ප්‍රශ්නය අසන්න එපා යයි තුන්වරක්ම බුදුන් වහන්සේ කීවද, නැවත නැවත එම ප්‍රශ්නය ඇසීම නිසා බුදුන් වහන්සේ අවසානයේදී පිළිතුරු දුන් සේක. ව්‍රත රකින්නාට හානියක් නොවන ලෙස උන්වහන්සේ ' යම් කෙනකුගේ කැමැත්ත (බලාපොරොත්තුව) එයනම් තමාගේ කැමැත්ත අනුවම එය සිදුවෙයි' යනුවෙන් පිළිතුරු දුන් සේක. එළුව්‍රත රකින්නා බුදුන් වහන්සේගේ පිළිතුර අසා හඬා වැටුනි. තමන්ටත් සිදුවන්නේ එයම නොවේ දැයි බුද්ධිමත් එළු ව්‍රත රකින්නා දැනගත් බැවිනි. කිසියම් වූ ව්‍රතයක් තමන් රකින්නේ නම්, මෙම ව්‍රතය නිසා තමන් ට අනාගතයේ දී කුමක් සිදුවන්නේ ද යන්න තම තමන්ගේ බුද්ධියෙන් ම විමසා බැලිය යුතු ය. ව්‍රතයක් බොහෝ කාලයක් සමාදන් වීමෙන් එය සංසාර පුරුද්දක් බවට පත්වෙයි. එවැන්නකුගේ මතු ජීවිතය ව්‍රතයට අනුවම හැඩගැසෙයි.

යම්කිසි කෙනෙක් තමන්ට වාඩිවීමට හා නිදාගැනීමට ආසන හා සයන තිබියදී එම ආසන හා සයන ඉවත දමා බිම වාඩිවීම බිම නිදාගැනීම ආදී ව්‍රතයක් අනුගමනය කරන්නේ නම් තම කැමැත්තට අනුවම අනාගත ජීවිතය සකස් වෙයි. ඔවුන්ට කොතරම් මිල මුදල් තිබුණද ආසන හා සයන නොලැබී යයි. තමන්ගේ සරුසාර වූ අස්වැන්න නෙලා ආසන හා සයන මිලදී ගන්නෙමි යි සිතන කල සියලුම අස්වැන්න නියගයෙන් හෝ

ජලයෙන් විනාශ වී යයි. වටිනා කණකර ඇඳුම් ආයිත්තම් ඉවත දමා බාල වර්ගයේ නිර්වර්ණ වූ ඇඳුමක් ඇඳීම යම් කෙනකුගේ කැමැත්ත නම් එයත් ඔහුගේ හෝ ඇයගේ කැමැත්ත අනුවම සිදුවෙයි. මෙම ව්‍රත තමන්ගේ කැමැත්ත බැවින් එහි වරදක් නැත. නමුත් ලෞකික ලෝකයෙහි ජීවත් වන මෙම ව්‍රත රකින්නෝ අනෙක් අය සැප සම්පත් විඳීම දකින විට එම සැප සම්පත් විඳින්නන් කෙරෙහි ද්වේශයක් උපදී. කෙළෙස් සහිත මිනිස් මනසේ ස්වභාවය එයයි. අනෙක් අතට යම් කෙනෙක් ආසන සහ සයන තිබියදී බිම වාඩිවෙනවා නම් බිම නිදා ගන්නවා නම් එවැනි වූ ව්‍රතයක් අත්තකිලමතානු යෝගයක් නොවන්නේ ද? අත්තකිලමතානු යෝගය යනු සත්‍ය සොයන්නකු විසින් අත්හළ යුතු ධර්මයකි.

ව්‍රතයද මිනිස් සත්ත්වයා සසරට බැඳ තබන තවත් සංයෝජනයකි. සියලුම ව්‍රත ධර්ම වල උපත සත්ත්ව පුද්ගල දෘෂ්ඨියයි. යම් කෙනෙක් මම 'උස් වූත් විශාල වූත් ආසනයක නිදා නොගන්නෙමි' යි සමාදන් වූ කල, සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය, උඩයට හා ආසන පිළිගෙන ඇත. 'උස් සයනය' යනු මනසේම නිර්මාණයකි. ඔබේ නිවසේ එක් කාමරයක කොනක ඇඳක් ඇත්නම් එය උස් සයනයකි. නමුත් එම ඇඳ කාමරය පුරාම සම්පූර්ණයෙන් විහිදී ඇත්නම් දැන් අපි කාමරයේ සයනයක් ඇතයි කියන්නේ නැත. සයනය වෙනුවට දැන් එම කාමරය අනෙක් කාමර වලට වඩා ඉහළින් පිහිටා ඇත. කඳුකරයේ පිහිටි නිවෙස් වල සියලුම කාමර එකම මට්ටමේ නැති බව ඔබ දන්නවා ඇත. යම් කෙනෙක් ව්‍රත රකිනවා යයි කරන්නේ තමන්ගේ මනස රවටා ගැනීමකි. 'නැටුම් නොබලමි' යි සමාදන් වුවත් බාහිර බලන්නට නැටුමක් නැත. නැටුම යනු තමන්ගේ මනසේ සාදාගත් සංස්කාර ධර්මයකි. ගැයුම ද, වැයුම ද, මනසින් ම සාදාගත් සංස්කාර ධර්ම වෙයි. මෙම සංස්කාර ධර්ම වලට පදනම වන්නේ වැරදි රූපයයි (වර්ණ, ශබ්ද, ගන්ධ, රස. ස්පර්ශ යනුවෙන් රූප පහකි). දැනුමෙන් සාදාගත් මෙම ධර්ම සත්‍ය නොවේ. මම 'නැටුම් නොබලමි, ගැයුම් වැයුම් නොඅසමි' යයි සමාදන් වීමෙන් යෝගාවචරයා කරන්නේ එම වැරදි සංස්කාර ධර්ම පිළිගැනීමයි. මෙම 'පිළිගැනීම' එම සංස්කාර ධර්ම වලින් නිදහස් වීමට බාධාවක් නොවෙන්නේ ද?

ඇසෙන් රූප නොදැක සත්‍ය දැකිය හැකිද? අනුරාධපුර යුගයේ එක් තෙරුන් වහන්සේ නමක් රහත් වූවේ තමන් වහන්සේ ඉදිරියට පැමිණි තරුණ කාන්තාවකගේ සිනහව දැකීමෙනි. තරුණ කාන්තාවගේ මුතුවන් දත් දෙපළ එම තෙරුන් වහන්සේ විසින් දුටුවේ ඇට සැකිල්ලක් ලෙසිනි. බොහෝ දෙනෙක් සත්‍ය දකින්නට වීර්යය දරන්නේ දෑස් පියාගෙන ය. නමුත් යමෙක් සත්‍ය දකින්නේ ඉන්ද්‍රියන් හොඳින් විවෘතව ඇති විට පමණි.

ව්‍රත සමාදන් වී ධර්මය කරගසාගෙන යාමම මිනිස් සත්ත්වයාට දුකකි. මුළාවට පත් යෝගාවචරයෝ ව්‍රත සමාදන් වීමෙන්ම සත්‍ය සොයති. නමුත් යම් කෙනෙක් සත්‍ය දකින්නේ ඔහු හෝ ඇය මෙතෙක් අනුගමනය කළ ව්‍රත වල වැරදි දැක එම ව්‍රත වලින් නිදහස් වීමෙන් පමණි.

**කතෘ සටහන:** මම මෙම ලිපියේ මාතෘකාවට සඳහන් කර ඇති 'සිල්ව්‍රත' යන්නෙහි තේරුම බොහෝ සත්‍ය සොයා යන්නන් විසින් උත්සාහයෙන් හා වීර්යය දරමින් සමාදන් වන 'ව්‍රත' වෙයිග ලෝකෝත්තර ධර්ම වලට වචන වලින් අර්ථ කථන දිය නොහැක. මෙම ලිපිවල සඳහන් කරන පාරිභාෂික වචන, පොදු ජනතාව විසින් භාවිත කරන වචන විනා ත්‍රිපිටකයේ ඇති තේරුමට අදාළ වචන නොවිය හැක. සත්‍ය දකින්නේ වචන වලින් නොවන බැවින්, එයින් සත්‍ය දැකීමට බාධාවක් නොවේ. නමුත් ධර්මාවබෝධය ලබන්නන් මෙම වචන ත්‍රිපිටකයට අනුවම නිවැරදිව දැනගත යුතුය. නැතිනම් ධර්මාචාර්ය හෝ ශාත්‍රපති උපාධියට පළමුවන පන්තියේ සාමාර්ථය නොලැබී යා හැක.

**9**

# හේතුඵල දහම
# සහ
# තදනින්ද

බුදුන් දවස කෝලිය උපතිස්ස යන මිතුරන් දෙදෙන එක්ව සත්‍ය සොයා ගියහ. මෙම ගමනේ දී, දෙදෙනාගෙන් කවරකුට හෝ සත්‍ය දැනගන්නට ලැබුණොත් තම මිතුරාට ද ඒ බව දැන ගන්නට සැලැස්වීමේ පොරොන්දුවක් මත දෙදෙනා මාර්ග දෙකක යන්නට තීරණය කළෝය. උපතිස්සට, දහවල් ආහාරය වළඳමින් සිටි අස්සජි මහ තෙරුන් වහන්සේ දැකගන්නට ලැබුණේ මේ ගමනේදී ය. ආහාරය වළඳා අවසන් වූ පසු උපතිස්ස තරුණයා අස්සජි මහරහතන් වහන්සේ ඉදිරියට පැමිණ ප්‍රශ්න කළේ, 'ඔබ යම් දහමක් දේශනා කරන කෙනෙක් ද?' යන්නයි. තෙරුන් වහන්සේගේ පිළිතුර වූයේ 'ගෞතම බුදුන් වහන්සේගේ ශ්‍රාවකයකු වන බවයි. උපතිස්ස පෙරළා ප්‍රශ්න කළේ 'එසේ නම් ඔබගේ ගුරුවරයා ඔබ හසුරුවන්නේ කෙසේ ද? ' යන්නයි. උන් වහන්සේ ගාථා පද හතරකින් දේශනා කළේ මෙම ලෝකයේ හසුරුවන්නෙක් නැත, හේතුඵල ධර්මයක් ක්‍රියාත්මක වේය යන්නයි. ගාථාවේ පළමු පද දෙක ඇසූ පමණින්ම උපතිස්ස සත්‍යයේ මාර්ගයට අවතීර්ණ වූයේ ය. ප්‍රඥාව පහල විය ග සෝවාන් වූයේ ය. එම සම්පූර්ණ ගාථාව උපතිස්ස ගෙන් ඇසූ කෝලිය තරුණයා ද සෝවාන් වූයේ ය.

බොහෝ බෞද්ධයින් එක් වරක් නොව කීපවාරයක් මෙම ධර්මය අසා තිබෙන්නට ඇත. නමුත් සත්‍යයේ මාර්ගයට අවතීර්ණ නොවූයේ හේතුඵල ධර්මය දකින්නට අවශ්‍ය වූ පාරමිතා සම්පූර්ණ වී නැති බැවිනි. පාරමිතා ධර්ම වලින් පළමු වැනි පාරමිතාව වූ දාන පාරමිතාව සම්පූර්ණ නොකර සත්‍ය දැකිය නොහැකිය. දානය යනු අතහැරීමයි. අතහැරිය යුත්තේ මොනවාද? දාන පාරමිතාව සම්පූර්ණ කරන්නේ කෙසේ ද? මෙම ප්‍රශ්න වලට යමෙක් පිළිතුරු සොයන්නේ ද තමන් අනුන්ගෙන් අහුලා ගත් දැනුමෙනි. මෙම

ලෝකයෙහි තමන්ට අයිති වස්තු දන් දී දාන පාරමිතාව සම්පූර්ණ කර නිවන් දැකිය හැකි ද? එසේ හැකිනම් නිර්ධනයින් පළමුව නිවන් දකිනවා ඇත. බුද්ධ කාලයේ බොහෝ දෙනෙක් සත්‍ය දුටුවේ සියලු සම්පත් භුක්ති විඳිමින් සිටියදීය. එපමණක් නොව මෙම මාර්ගඵල ලාභීන් තමන් ට ඇති සියලු සැපසම්පත් බුක්ති වින්දෝ ය. අප ජීවත් වන ලෝකය තම තමන්ගේ මනසින් නිර්මාණය කරගත් මනංකල්පිත ලෝක බැවින් එම ලෝකවල වස්තු හෙවත් දේවල් ඇතයි පිළිගැනීම මුළාවකි. අප විසින් අත්හැරිය යුත්තේ අප විසින්ම නිර්මාණය කරගෙන උපාදානය කරගත් පංච ස්කන්ධය මිස අනෙකක් නොවේ. මුළාවක් වූ පංච උපාදානස්කන්ධය අත්හැරෙන විට ඔබ උපාදානය කර ඇති සියලුම ධර්මයන් ඉතිරි නොවීම ක්ෂය වෙයි. පංච ස්කන්ධය උපාදානය කිරීම යනු ධර්මය පිළිගැනීමයි. ධර්ම අවබෝධය ලැබෙන්නේ පංච ස්කන්ධය උපාදානය කිරීමෙනි. දාන පාරමිතාව පිරීමට නම් හේතුඵල ධර්මය අසන්නට පෙර තමන් උපාදානය කර ඇති ධර්ම අත හැරීමට සූදානම තිබිය යුතු ය. යමෙක් යම් ධර්මයක් පිළිගන්නේ හෝ විස්වාස කරන්නේ එම ධර්ම සත්‍ය නොවන බැවිනි. සත්‍ය ධර්මයක් පිළිගැනීමට හෝ විස්වාස කිරීමට අවශ්‍ය නැත. එය දකින ධර්මයකි. පිළිගැනීම හෝ 'විස්වාශය' අත්හැරිය විට පිළිගත් ධර්ම වල සත්‍යතාව පිළිබඳව සැක උපදී. දාන පාරමිතාව පිරීමට උපකාරී වන්නේ ද විතක්කය විචාරය ඇති ඥානවන්තයා තුළ වර්ධනය වන ඉන්ද්‍රිය ධර්ම තුල ඇතිවන සැකයයි.

කෝලිය උපතිස්ස යහළුවන් දෙදෙනා ද සත්ත්ව පුද්ගල ධර්මයක් ම ඇසුවෝය. එම ධර්ම පිළිගත්හ. මෙම ධර්ම ධාරණය කර ඒවා ක්‍රියාත්මක කළහ. නමුත් බොහෝ දෙනකුට නැති තර්කය හා විතර්කය ඔවුන් තුළ තිබුණි. මෙම තර්ක විතර්ක වලින් ඔවුහු පිළිගත් ධර්ම වල පරස්පර විරෝධතා දුට හ. එමනිසා කාලයක් එම ධර්ම හදාරන විට එම ධර්ම කෙරෙහි සැක ඇති විය. 'තමන් හසුරුවන කෙනෙක් ඉන්නවා ද?' 'මෙම හසුරුවන්නා කව්ද?' ආදී වශයෙන් සත්ත්ව පුද්ගල ධර්ම කෙරෙහි සැක ඇති විය. 'ඔබගේ ගුරුවරයා ඔබ හසුරුවන්නේ කෙසේ දැ' යි අස්සජි මහරහතන් වහන්සේගෙන් ඇසුවේ මෙම සැකය සිතෙහි තිබූ නිසාය. තෙරුන්

වහන්සේ ගේ පිළිතුරෙන් උපතිස්ස අවදි විය. මෙතෙක් කල් යටිකුරු ව සිටි ඔහු උඩුකුරු විය. සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය වැරදි දෘෂ්ඨියක් බව දුටුවේ ය. ඉන්ද්‍රිය ධර්මයෙන් නිදහස් විය ල දාන පාරමිතාව සම්පූර්ණ වියග

අස්සජි මහ රහතන් වහන්සේ දේශනා කළ හේතු ඵල ධර්මය කෝලිය උපතිස්ස පිළිගත්තේ නැත. එම ධර්ම පිළිගත්තා නම් දාන පාරමිතාව සම්පූර්ණ වන්නේ නැත. ධර්ම පිළිගැනීම යනු දාන පාරමිතාවට ප්‍රතිවිරුද්ධ වූ ධර්මයකි. සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය පිළිගැනීම එක් අන්තයකි. සත්ත්ව පුද්ගල දෘෂ්ඨියෙන් තොර වූ හේතු ඵල ධර්මය පිළිගැනීම තවත් අන්තයකි. සත්‍ය දැකීමට නම් මෙම අන්ත දෙකම අතහැරිය යුතු ය. සත්‍යයට අන්ත නැත. අන්ත වලින් යුත් සියලුම ධර්ම ලෞකික ධර්ම වෙයි. හේතුඵල ධර්මයද පෘතග්ජනයාට ලෞකික ධර්මයකි. එය ලෝකෝත්තර ධර්මයක් වන්නේ එය දැකිය හැකි නම් පමණි. හේතුඵල ධර්මය දුටු විට එතැන හේතුඵල ධර්මයක් ඉතිරිවන්නේ නැත. යමෙක් සත්‍ය දුටු විට ද දකින්නට සත්‍යයක් නැති බව දකී. පෘතග්ජන පුද්ගලයා නිවන් හඹා යයි. නමුත් යම් කෙනෙක් නිවන් දකී ද ඔහු හෝ ඇය දකින්නට නිවනක් නැති බව දකී. ධර්මය නැමති පහුර තොටුපොලේ තබා යන තොටියා අත කිසිම ධර්මයක් නැත. ආර්ය අෂ්ඨාංගික මාර්ගය හෝ මධ්‍යම ප්‍රතිපදාව හෝ මාර්ගඵල හෝ නිවන හෝ ඔහු අත නැත. ලෝකෝත්තර ධර්ම දකිනවා මිස දැනුම හරහා විස්තර කළ නොහැකිය. බුදුකෙනෙක් නිවනෙහි නැති දේවල් දේශනා කරනවා විනා තියෙන දේවල් දේශනා නොකරන්නේ එබැවිනි. රහතන් වහන්සේ කෙනෙක් අනුගමනය කරන්න යයි බුදුකෙනෙක් දේශනා කරන්නේ නැත. එවිට එය ලෞකික දහමකි, ව්‍රතයකි. පිළිගත් ධර්ම අතැතිව කිසිවකුට 'බුදුන්' ට ළඟාවිය නොහැකිය. අංගුලිමාල කථාවෙන් එය මනාව පැහැදිලි වෙයි. අංගුලිමාල කඩුව අමෝරාගෙන බුදුන් පසුපස එලෙව්වේ ය. ඔහු හැති වැටී මග නතර විය. නමුත් බුදුන් ට කිට්ටු කළ නොහැකි විය. බුදුන් වහන්නේ ශාන්ත ගමනින් වැඩියහ. බුදුන් වහන්සේ ගේ එක් වචනයකින් අංගුලිමාල අත තිබූ කඩුව බිම වැටුණි. අංගුලිමාල 'බුදුන්' ට කිට්ටු කළේ ධර්මය නැමති කඩුව අතහැරිය පසුවයි.

බුදු කෙනෙක් 'එන්න බලන්න' යයි දේශනා කරන්නේ එබැවිනි. දේශනා කරන ඕනෑම ධර්මයක් ලෞකික ධර්ම වන බැවින් 'එන්න මගේ ධර්මය අහන්න' යැයි දේශනා කරන්නේ නැත. ධර්ම පිළිගැනීමෙන් සත්‍ය වැසෙන බැවින් 'ධර්ම පිළිගන්න' යයි දේශනා කරන්නේ ද නැත. බුදුන් දවස එක් සිටුවරයකු බුදුදහම අසා පැහැදී බුදුන් සරණ ගියේ ය. නමුත් කොතරම් බල කළද ඔහුගේ පුත්‍රරත්නය බුදු බණ අසන්නට ගියේ නැත. අවසානයේ පියා උපායක් යොදා, මසුරන් දහසක් දෙන පොරොන්දුව පිට එක් බුද්ධ වචනයක් අසාගෙන එන්නට පුතා බුදුන් සමීපයට යැවීය. 'එක් වචනයක් අසාගෙන ආපසු එමි' යි සිතා පුත්‍රරත්නයද ධර්ම දේශනා කරන ස්ථානයේ කොනකින් වාඩි වූයේය. වචනයක් අසා උන් තැනින් නැගිටින්නට උත්සාහ කරන විටම එම වචනය අමතක වෙයි. දිගටම ධර්මය ඇසුවත් එකදු වචනයක් වත් මතක තබා ගැනීමට නොහැකි විය. නමුත් අවසානයේ දී පුත්‍ර රත්නය සත්‍ය දුටුවේ ය. නමුත් ඔහු සත්‍ය දැකීමට ව්‍රත සමාදන් වූයේත් නැත. භාවනා කළේත් නැත. ධර්මය ධාරණය කළේත් නැත. ධර්මය පිළිපැද්දේත් නැත. ඔහු සෑම වචනයක්ම ඒ මොහොතේම අත්හැරිය බැවින් ධර්මය ඇසුවේත් නැත. නමුත් ඔහු ධර්මය දුටුවේ ය. එය ධර්මයේ ඇති 'ඒහි පස්සිකෝ' 'එන්න බලන්න' ගුණයයි. සත්ධර්මය ශ්‍රවණය කරන විට එම අසන වචනයක් පාසා අත් හැරිය හැකිනම් ධර්මය ශ්‍රවණය කරන අවස්ථාවේදීම දාන පාරමිතාව සම්පූර්ණ වී සත්‍ය දකී. දාන පාරමිතාව සම්පූර්ණ වන්නේ සියලුම නාම ධර්මත් රූප ධර්මත් අත්හැරීමෙන් විනා එවා උපාදානය කිරීමෙන් නොවේ. බොහෝ මතක ශක්තිය ඇති අය ධර්මය ගබඩාකර ගනිති. නමුත් මතක ශක්තිය සත්‍ය දකින්නට උපකාරයක් නොවේ.

තද නින්ද තුළ කරන්නෙක් හෝ කරවන්නෙක් නොමැත. යම් කෙනෙක් තද නින්දේ සිටින විට ලේ ගමන් කිරීමත් ආශ්වාස ප්‍රශ්වාසයත් ශරීරයයෙහි සිදුවන නමුත් එම ක්‍රියා 'තමන් කරනවා' යයි කියන්නේ නැත. එම ධර්ම වලට අයිති කාරයෙක් නැත. එය විශ්ව ධර්මයකි. තද නින්දෙහි පුද්ගලයෙක් ද නැති බැවින් කරන්නෙක් කරවන්නෙක් නැතිව ආශ්වාස ප්‍රශ්වාසය සිදු වෙයි. එය

තද නින්දෙහි ක්‍රියාත්මක වන හේතුඵල ධර්මයයි. මෙම තද නින්දෙහි සිදුවන හේතුඵල ධර්මය යම් කෙනෙකුට දැකිය හැකිනම් තදනින්දෙන් අවදි වෙයි. මෙම අවදිවීමත් සමග සත්‍ය දකී. බුදුන් වහන්සේ මෙම තද නින්ද තුළ ඇති ධර්ම විවෘත කර කාලයාගේ ඇවෑමෙන් එම ධර්ම විලෝපනය විය. මාර්ගඵල ලාභීන්ගෙන් ලෝකය හිස් විය. නැවත තද නින්දෙහි ඇති ධර්ම විවෘත කර වැසී තිබුණ සත්‍යය පළමුවරට ලොවට හෙළිදරව් කළේ මගේ කල්‍යාණ මිත්‍ර, ලොකුගේ සිරිවර්ධන මැතිතුමායි. තද නින්ද නොදැක කිසිම කෙනෙකුට නිවන් දකින්නට නොහැකි බව මම කියමි. සත්‍ය දකින තුරු සියලු දෙනා ඉන්නේ තද නින්දේය. අපි සාමාන්‍යයෙන් අවදි වනවා යැයි කියන්නේ මොළයත් ඉන්ද්‍රියනුත් අතර සිදුවන රසායනික ක්‍රියාකාරීත්වයකටයි. එය නියම අවදිවීම නොවේ. ඉන්ද්‍රියන්ට අවදි වූ විට පුද්ගලයා ආශ්වාස ප්‍රශ්වාසය තමන් කරන්නේ යයි පිළිගනී. එවිට ක්‍රියාත්මක වන්නේ සත්ත්ව පුද්ගල ධර්මයයි. තමන්ට අයිති නැති ආශ්වාස ප්‍රශ්වාසය තමන්ගේ යයි පිළිගන්නා යෝගාවචරයා එය භාවනාවක් ලෙස වඩයි. විශ්ව ධර්මයක් වූ ආශ්වාස ප්‍රශ්වාසය ඉන්ද්‍රියන්ට අවදි වූ පසු තමන්ගේ යැයි උපාදානය කරන බැවින් දර්ශනයට පත්වන තෙක් සියල්ලෝම සොරු වෙති.

එක්තරා ගොවියකුට අයිති ගොන් බානක් ගොවියා නිදි අතරේ යමෙක් සොරා ගත්තේ ය. ගොවියා අවදිවන විට ගොන් බාන නැත. ගොවියා ගොන් බාන සොයා යන විට සොරා හමුවෙයි. දෙදෙනාම ගොන් බානට අයිතිය කියයි. දෙදෙනාගේ කෝලාහලය මහෞෂධ පඬිතුමාට දැන ගන්නට ලැබෙයි. මහෞෂධ පඬිතුමා ගොන් ප්‍රශ්නය විසදයි. ගොන් බානට කන්නට දුන්නේ මොනවා දැයි සොරාගෙන් අසයි. 'මම ඇල් හාලේ බත් දුන්නා' යයි සොරා කියයි. කන්න දුන්නේ මොනවා දැයි ගොවියාගෙන් ඇසූ විට 'මම තණකොළ කන්න දුන්නා' යයි ඔහු කියයි. දැන් කළ යුත්තේ ආහාරයට ගත් දේ වැමෑරීමයි. ගොන් බාන මෙතෙක් කල් ආහාරයට ගෙන තිබෙන්නේ 'තණකොළ' බව දකින්නේ මෙම ආහාර වමාරන විටදී ය. ගොන් බාන ආපසු ගොවියාට බාර දෙයි.

මෙහි ගොවියා නම් හේතු ඵල ධර්මයයි. දර්ශනයට පෙර හේතුඵල ධර්මය ක්‍රියාත්මක වන්නේ තද නින්දෙහි බැවින් ගොවියා සිටින්නේ නිදාගෙන ය. සොරා නම් සත්ත්ව පුද්ගල ධර්මයයි. සත්ත්ව පුද්ගල ධර්ම ක්‍රියාත්මක වන්නේ අවදිව ඇතිවිට චින්තනය තුළයි. ගොන්බාන නම් කායික වීර්යය හා මානසික වීර්යය යි. මෙම සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය නැමති සොරා තමන්ට අයිති නැති කායික වීර්යය, මානසික වීර්යය නැමති ගොන් බාන තමන්ගේ යයි කියයි. තමන්ට අයිති නැති හේතුඵල ධර්මයක් වූ 'ආශ්වාස ප්‍රශ්වාශය' තමන්ගේ යයි පිළිගන්නා යෝගාවචරයෝ ද, එම සොරාගත් ආශ්වාස ප්‍රශ්වාසයෙන්ම සත්‍ය දැකීමට කායික වීර්යය හා මානසික වීර්යය යොදයි. ධර්මයෙන් සත්‍ය සොයන ගවේශකයන්ට ධර්මය නැමති ආහාරය ඇල් හාලේ බත් ය. ධර්මය හිස තබාගෙන යන්නේ එබැවිනි. සොරා නියම ගොවියා නොවන බැවින් ඔහුගේ සී සෑමෙහි සහ වැපිරීමෙහි අවසානයක් නැත. මෙම කන්නයේත් වපුරා ඊළඟ කන්නයත් වපුරන්නට බලාපොරොත්තු වෙයි. දෙව් මිනිස් සැපෙන් සෑහීමකට පත්නොවී සක්විති රජකම ද ප්‍රාර්ථනා කරන්නේ එබැවිනි. මේ අතර ගොවියා අවදි වෙයි. එනම් හේතුඵල ධර්මය දකී. එය ඉන්ද්‍රියන් අභිබවා අවදි වීමකි. මෙම අවදි වීම සිදුවන්නේ සංසාරයටම එක් වරකි. හේතුඵල ධර්මය දකින මෙහොතේ, එනම් සත්‍ය දකින මොහොතේ ගොන් බාන නැත. කායික හා මානසික වීර්යය, නැමති ගොන්බානත් සමග සත්‍ය දැකිය නොහැක. සත්‍ය දකින මොහොතේ සියලුම ධර්ම වලින් නිදහස් බැවින් කායික වීර්යයක් හෝ මානසික වීර්යයක් එතැන නැත. නමුත් තවමත් කෙළෙස් තුරන් වී නොමැති බැවින් අවදි වූ පසු ගොන් බාන සොයාගෙන යයි. මෙතෙක් මනසට ගත් ධර්මය නැමති ආහාරය තණකොළ බව ගොවියා දකී. සත්‍යය දුටු පසු ඕනෑම කෙනෙකුට ධර්ම වමාරන්නට සිදුවන නිසා තමන් මෙතෙක් ආහාරයට ගෙන ඇත්තේ ඇල් හාලේ බත් නොව තණකොළ බව තමන්ටම දැකිය හැක. මා කියන්නක් පිළීගැනීමට අවශ්‍ය නැත.

**10**

# කර්මය සහ දෙවියන් වහන්සේගේ කැමැත්ත

එක්තරා සහෝදරයන් දෙදෙනකුට පිය උරුමයෙන් පැවැත ආ නගර මධ්‍යයේ පිහිටි වටිනා ඉඩමක් අයිතිව තිබුණි. මෙම සහෝදරයන් දෙදෙන තරමක විරසකයකින් පසු විය. එක් සහෝදරයෙක් තමන්ට අයිති ඉඩම් කොටසේ සිනමා ශාලාවක් සෑදීමට ආරම්භ කර අර්ධයක් පමණ එහි වැඩ කටයුතු අවසන් කරන විට අනෙක් සහෝදරයා කළේ, එම ඉඩමේ ම ඔහුට අයිති කොටසේ පන්සලක් සාදා එය සඟසතු කිරීමයි. බලපවත්නා නීතිය අනුව පන්සලක් ආසන්නයේ සිනමා ශාලාවක් පවත්වා ගෙන යාම තහනම් ය. එම නීතිය මත අනෙක් සහොදරයාට සිනමා ශාලාවේ වැඩකටයුතු අතරමග නවතා දැමීමට සිදුවූ අතර නටබුන් වූ ගොඩනැගිල්ල එම නගරයේ තවමත් දක්නට ලැබෙයි. පන්සලක් සාදා සඟසතු කිරීම මහත්ඵල මහානිසංශ දෙන ක්‍රියාවකි. නමුත් දෙවැනි සහෝදරයා පන්සල සාදා සඟසතු කළේ ඔහුගේ සහෝදරයාගෙන් පලිගැනීමේ චේතනාවෙනි. ඔහුට අවශ්‍ය වූයේ සහෝදරයාගේ ආදායම් මාර්ග ඇහිරීමයි. එකම ක්‍රියාව විවිධ චේතනා වලින් කළ හැක. උදාහරණයක් ලෙස ලංකාවේ බෞද්ධයින් දන්දෙන්නේ පින් ලබා ගැනීමේ චේතනාවෙනි. එතැන දන්දීමේ පරමාර්ථයක් නැත. වැදගත් වන්නේ ක්‍රියාව ද, නැතිනම් චේතනාවද?

කර්ම විෂයය අචින්ත යැයි බුද්ධ දේශනාවේ සදහන් වෙයි. මෙම අචින්ත වූ කර්ම විෂය නොදැක එක් එක් ශාස්තෘවරුන් දේශනා කරන කර්ම විෂයය පිළිබද ධර්ම පිළිගැනීම නිසා සත්ත්වයා මහත් වූ දුකට පත්වෙයි. මෙම ධර්ම පිළිගැනීම ම කරුමයක් වෙයි. කර්ම විෂයය දකින්නට ඉතා දුෂ්කර වූ ධර්මයකි. නමුත් කර්මය දැක කර්මයෙන් නිදහස් වීමට ඔබට ද හැකියාව ඇත.

බුදුදහම ගැඹුරට හැදෑරූ බොහෝ දෙනකුගේ පිළිගැනීම නම් 'කර්මය' යනු අකුසල හෝ කුසල චේතනාවෙන් කරන ලද ක්‍රියා බවත් එහි 'විපාකය' යනු එම ක්‍රියා නිසා තමන්ට ලැබුණ දායාද බවත් ය. 'චේතනාහං භික්ඛවේ කම්මං වදාමි' යන බුදු වදන ඔවුන් තේරුම් ගන්නේ නරක චේතනාවෙන් අකුසල කර්ම කරන බවත් හොඳ චේතනාවෙන් කුසල කර්ම කරන බවත් ය. බොහෝ දෙනෙක් දේශනා කරන්නේ අතීතයේ කරන ලද කර්මවලට වර්තමානයේ හෝ අනාගතයේ එහි විපාක විඳීමට සිදුවන බවත් වර්තමානයේ කරන ලද කර්මවලට විපාක අනාගතයේ ලැබෙන බවත් ය. බුදුන් පහළ වීමට පෙරද ජනයා මෙම කර්ම සහ කර්ම ඵල මේ ආකාරයටම පිළිගත්හ. දැනුත් බෞද්ධයන් පමණක් නොව හින්දුන් ඇතුළු බොහෝ ජනයා කර්ම සහ කර්ම ඵල පිළිගනිති. ක්‍රිස්තියානි ධර්මයෙහි මෙය දෙවියන්ගේ කැමැත්ත වෙයි. මෙම පිළිගත් කර්ම සහ කර්ම ඵල බුදුන්ගේ දහමක් දැයි විමසා බැලිය යුතු ය. යම් කෙනකුට කර්මයෙන් නිදහස් වීමට නම් මෙම කර්මය යනු කුමක් දැයි දැකිය යුතුය. ඒ සඳහා කළ යුත්තේ කර්ම සහ කර්ම ඵල පිළිබඳ ගවේෂණයක යෙදීමයි. කර්මය විමර්ශනය කර බැලීමයි.

මහාභූත වල විවිධත්වයක් ඇත. ආපෝ තේජෝ වායෝ පඨවි ලෙස හඳුන්වනු ලබන මහාභූත එකක් අනෙක ගිලගෙන පවතී. මහාභූත යනු පදාර්ථය නොවේ. ඇසෙන් මහාභූත තබා වස්තුවක්වත් දකින්කට නොහැකිය. උදාහරණයකින් කියනවානම් අපි ඇසෙන් වස්තු දකින්නේ අන්ධයා සැරයටියෙන් වස්තුවක් දකින ආකාරයටයි. අන්ධයා සැරයටියෙන් පුටුව දකී. අපි ඇසෙන් පුටුව දකිමු. නමුත් එක් අයෙක් වත් පුටුව දැක නැත. වර්ණ ගන්ධ රස ශබ්ද හා ස්පර් රූපයෝ මහාභූත වල නැත. මෙම සියලුම රූප මනසෙන්ම අප විසින් සාදාගත් රූප ස්කන්ධයන් ය. මහාභූත වල නැතිවීමත් ඇති වීමත් එකවර සිදුවන අතර නැති වී ඇති වන්නේ මුලින් තිබූ මහාභූත වල සංකලනය නොවේ. මෙම එකවර සිදුවන ඇතිවීම හා නැතිවීම හෙවත් 'යමකය' හැරුණකොට කිසිම ආකාරයක ක්‍රියාවක් විශ්වයෙහි සිදුවන්නේ නැත (යමකය යනු ක්‍රියාවක් නොවෙයි). නමුත් ලෝකයෙහි විවිධ වූ ක්‍රියා සිදුවේ යයි අපි පිළිගන්නෙමු. පෘතග්ජන පුද්ගලයා මෙම ලෝකයත්, ලෝකයෙහි සිදුවන ක්‍රියාත්, තමන්ගේ මනසින් සාදාගත්තක් බව නොදනී. මෙම

මහ පොළොවෙහිත් වෙනත් ග්‍රහලෝකවලත් මිනිස් වාස නැති ප්‍රදේශ ඇත. එම ප්‍රදේශවල මහා විශාල භූමිකම්පා ඇතිවී මහා වෙනස් වීම් සිදුවේ. 'මෙම විනාශය' කිසිවකුගේ කර්ම විපාකයක් වන්නේ නැත. මුහුදේ සිදුවන විශාල භූමි කම්පාවකින් අලුත් දූපතක් මතු වී කාලයාගේ ඇවෑමෙන් එහි ගස්කොළන් වැවී අවසානයේදී එම දූපත මනුෂ්‍ය ජනාවාසයක් වෙයි. දේව ධර්මය අනුව මෙම දෙවියන් වහන්සේ ගේ ක්‍රියාවකි. පරිණාමවාදයට අනුව එය ලෝකයේ සිදුවන පරිනාම ක්‍රියාවලියකි. බුදුදහමට අනුව 'භූමි කම්පාව' නම් වූ ක්‍රියාවක් නැත. නමුත් අපි ක්‍රියාව පිළිගන්නෙමු. මෙම ක්‍රියාවට කර්මය ඈඳෙන්නේ කෙසේ ද? ඒ සඳහා භූමිකම්පාවක් වීමට ම උවමනා නැත. යමකුගේ තම කුඩා නිවසට ගසක් කඩා වැටී නිවස විනාශ වූ විට එය ගෙහිමියාට අකුසල කර්මයක් ඵල දීමක් යයි කර්මවාදීහු කියති. දෙවියන් වහන්සේගේ කැමත්ත යයි දේවවාදීහු කියති. සමහර කට පාඩම් කිරීමට දක්ෂ ශිෂ්‍යයින් විභාග ඉතා හොඳින් සමත් වී උපාධි ලබාගන්නා විට එය පෙර ජාතියක කරන ලද හොඳ කර්මයක විපාකයක් යැයි කියති. නමුත් මෙම ශිෂ්‍යයාට හොඳ මතක ශක්තියක් ඇති නමුත් විමර්ශනාත්මක බුද්ධියක් නැති බැවින් රැකියාවක් නොමැතිව සිටින විට එය අකුසල කර්මයක විපාකයකි. කටපාඩම් කිරීමට දක්ෂතාවක් නැති නමුත් විමර්ශනාත්මක බුද්ධිය ඇති අනෙක් ශිෂ්‍යයා පාසල් ගමන අතර මග නතර කරන්නේ පෙර කරන ලද අකුසල කර්මයක විපාක වශයෙනි. මොහු වැඩිහිටියකු වී දේශපාලනයට සම්බන්ධ වී ඇමතිවරයකු වන විට එය කුසල කර්මයකි. තමන්ගේ 'මරණය' ට කිසිවකු කැමති නැත. නමුත් 'මරණය' කුසල අකුසල කර්ම භේදයකින් තොරව සියලු පෘතග්ජන පුද්ගලයාට පොදු වූ ධර්මතාවයකි.

ඉහත උදාහරණ කිහිපය මා විසින් ඉදිරිපත් කරන ලද්දේ කර්මය යනු කුමක් දැයි දැකීමට යම් තරමක හෝ පදනමක් දමා ගැනීමටයි. කර්ම සහ කර්ම ඵල දේශනා කර, සියල්ල සිදුවන්නේ කර්මයෙන් නොවේ යයි ද, මෙම කර්මඵල වාදීහු දේශනා කරති. දේව ධර්මවාදීහු ද මීට ම සමාන්තර වූ ධර්මයක් උගන්වති. මහ මුහුද මැද භූමිකම්පාවක් ඇති වී රටක් නිර්මාණය වී එහි මිනිස් වාස ඇති වන විට එය දෙවියන් වහන්සේ ගේ කැමැත්ත යැයි

කියති. ජනාවාස වූ නගරයක් භූමිකම්පාවකින් විනාශ වන විට එය සාතන් 'යක්ෂයාගේ' ගේ වැඩක් යයි කියති. නමුත් මෙම විනාශ වූ නගරය මත නවීන පන්නයේ දියුණු අලුත් නගරයක් නිර්මාණය වන විට එය දෙවියන් වහන්සේ ගේ ක්‍රියාවකි.

කර්ම සහ කර්ම ඵල පිළිගන්නා විට එතැන ඇත්තේ සත්ත්ව පුද්ගල ධර්මයකි. පෙර කර්මය කළේ ද ඔබය. එහි විපාක විඳින්නේ ද ඔබය 'නමුත් එම ක්‍රියාව ඔබ කළා යයි දන්නේ ද නැත'. එතැන 'මම' සහ 'කාලය' පිළිගනී. නමුත් බුදුදහම සත්ත්ව පුද්ගල දෘෂ්ඨියෙන් ද කාලයෙන් ද තොරය. සත්‍ය තුළ මෙවැනි පරස්පර විරෝධී ධර්ම තිබෙන්නට නොහැකි ය. චේතනාහං භික්කවේ කම්මං වදාමි (මහණෙනි චේතනාවම කර්මය වේ යයි මම කියමි) යයි දේශනා කළ ද කර්මයෙහි කිසිම ක්‍රියාවක සම්බන්ධයක් දක්වා නැත. කුසල කර්ම අකුසල කර්ම සහ කර්මඵල බුදුන් පහළ වීමටත් පෙර සිට තිබූ ධර්ම වෙයි.

බුදුන් වහන්සේ දේශනා කළ 'කර්මය' සත්ත්ව පුද්ගල දෘෂ්ඨයෙන් හා ක්‍රියාවෙන් තොර වෙයි. කර්ම කරන්නෙක් හෝ විපාක විඳින්නෙක් ගැන බුදුන් වහන්සේ දේශනා කර නැත (කර්මස්ස කාරකෝ නත්ති විපාකස්සක වේදකෝ). තද නිද්දේ සිටින විට කිසිම කෙනෙක් කර්ම කරන්නේ නැත. එතැන විපාක විඳින්නෙක් ද නැත. තද නින්දේදී සිදුවන ආශ්වාස ප්‍රශ්වාසය කර්මයක් නොවේ. බුදු දහම විලෝපනය වූ පසු 'කර්මය සහ කර්ම ඵල' පළමු වරට විවෘත කරන ලද්දේ මගේ කල්‍යාණ මිත්‍ර එස් ලොකුගේ සිරිවර්ධන මැතිතුමා විසිනි. කර්ම යෝනි හෙවත් කර්මයේ උපත කුමක් ද? තද නින්දෙහි නැති කර්මය, තද නින්දෙන් ඉන්ද්‍රියන්ට අවදිවන විටම උපදී. මෙම ධර්මය මෙතැනින් නොනැවතී, උප්පත්තිය ලැබූ කර්මය තමන්ගේ යහළුවෙක් කරගනී (කම්ම බන්දු). ත්‍රිපිටකධාරීන් 'කම්මබන්දු' නැමති ධර්මය පැහැදිළි කරන්නේ 'කර්මය තමන්ගේ යහළුවෙකි' යනුවෙනුයි. එය වැරදි ධර්මයකි. කර්මය යනු තමන්ගේ යහළුවෙක් නොවේ. තමා විසින් කර්මය තම යහළුවෙක් කරගනී. ධර්ම පිළිගැනීම නිසා මෙය සිදුවෙයි. කර්මය තමන්ගේ දායාදයක් නොවෙයි. නමුත් එය තමන්ගේ දායාදයක් කරගනී (කම්ම දායාදෝ). එම කර්මය

තමන්ගේ පිළිසරණක් කරගනී (කම්ම පටිසරණෝ). ඉන්ද්‍රියන්ට අවදි වූ පුද්ගලයා කර්මය තමාගේ යහළුවෙක් කරගෙන දායාදයක් කරගෙන එය තමන්ගේ කර්මයක් යයි පිළිගනී.

තද නින්දේදී ක්‍රියාත්මක වන්නේ හේතුඵල ධර්මයකි. මෙම හේතුඵල ධර්මයෙහි කර්මයක් නැත. තද නින්දෙන් අවදි වූ විට ද හේතුඵල ධර්මයම ක්‍රියාත්මක වෙයි. නමුත් ධර්ම පිළිගත් පුද්ගලයා එය හේතුඵල ධර්මයක් යයි දකින්නේ නැත. ධර්ම පිළිගත් සත්ත්වයා පිළිගන්නේ සත්ත්ව පුද්ගල ධර්මයකි. එම නිසා ලෝකයේ සිදුවන හේතුඵල ධර්මය 'කර්මය' ලෙස තමන් භාර ගනී. එක් අවස්ථාවකදී එය අකුසල කර්මයකි. තවත් අවස්ථාවක දී එම ක්‍රියාවම කුසල කර්මයකි. තම නිවස ජල ගැල්මකින් විනාශ වූ විට අයිති කරුවාට එය අකුසල කර්මයකි. පරණ වූ නිවස වෙනුවට අලුත් නිවසක් ලැබෙන බැවින් එම නිවසම රක්‍ෂණය කර තිබුණි නම්, 'නිවස විනාශ වීම' කුසල කර්මයකි.

කර්මය සහ එහි විපාකය යනු 'ඊතිය' හෙවත් වර්තමානය පිළිගත් පුද්ගලයාට එක විට සිදුවන නාම ධර්ම දෙකකි. එය අතීතයේ කරන ලද ක්‍රියාවක් හෝ අනාගතයේ විපාක දෙන්නක් හෝ නොවෙයි. පෘතග්ජන පුද්ගලයා අවිද්‍යාව හෙවත් නොදන්නා කම නිසා සංස්ඛාර ධර්ම 'ක්‍රියා' පිළිගනී. තද නින්දේ සිටින විට සංස්කාර ධර්ම ක්‍රියාත්මක නොවන බැවින් එතැන කර්මයක් නැත. සංස්කාර ධර්ම තමන් පිළිගත් විට එම ධර්ම තමන්ට කර්මයක් වෙයි. කර්මයට මුල් වන්නේ චේතනාවයි. කර්මය කුසල හෝ අකුසල කර්මයක් ලෙස තොරා බේරා ගන්නේ තම චින්තනයෙනි. තමන් විසින් ම නිර්මාණය කරගත් සංස්කාර ධර්මයන්ට චේතනාව මුල් වෙයි. එවිට එය කර්මයක් වෙයි. සංස්කාර ධර්ම වලින් නිදහස් වූ විට එතැන චේතනාවක් නැත, කර්මයක් ද නැත. 'චේතනාහං භික්ඛවේ කම්මං වදාමි' යයි බුදුන් වහන්සේ දේශනා කළේ එබැවිනි. එය කර්මයේ උපතයි (කර්ම යෝනි).

යම් පුද්ගලයෙක් සඟවා තිබූ රත්තරන් ගුලියක් සොරෙක් ගනී. නමුත් එහි අයිති කරුවා එය නොදැන ම යම්

දවසක සමාදානයෙන් මියයන්නේ යයි සිතමු. එම සොරාගේ ක්‍රියාව අයිති කරුවාට කර්මයක් වූයේ නැත. එය කර්මයක් වන්නේ ඔහු එය දැනගත්තොත් පමණි. චේතනාව නොමැතිව කර්මයක් නැත. දැන ගැනීම නිසා දුක්වෙයි, හඬා වැලපෙයි, හෘද රෝග ආදී ලෙඩ සෑදී අකාලයේ මියයයි. ලෝකයේ සිදුවන හේතුඵල ධර්මය කර්මයක් කරගන්නේ සංස්කාර ධර්ම පිළිගත් තමන් විසිනි.

කර්ම විපාකය කුමක් ද? 'බලාපොරොත්තුව' විපාකය වෙයි. තමන් පිළිගත් ක්‍රියාව තමන්ට සතුටින් බාරගත හැකිනම් එය හොඳ විපාකයකි. තමන් අසතුටින් බාරගතහොත් එය නරක විපාකයකි. සමහර විට නරක විපාකයෙන් අනාගතයේ දී ඉතා හොද ප තිඵලයක් ලැබීමටද පුළුවන. උදාහරණයක් ලෙස ඔබ විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලැබීමට බලාපොරොත්තුව සිටි අයෙක් නම්, උසස් පෙළ විභාගය සමත් නොවීම නරක විපාකයකි. නමුත් ඊට පසු සුළුවෙන් පටන් ගන්නා ඔබේ ව්‍යාපාරය වැඩි දියුණු වී එය විශාල ව්‍යාපාරයක් වන විට ඔබත් සමග පාසල් ගිය ඔබේ උපාධිධාරී යහළුවා ඔබ යටතේ රැකියාව කරන විට 'විභාගය සමත් නොවීම' හොඳ විපාකයකි. ලෝකයේ සිදුවන සංස්කාර ධර්ම තමන්ගේ බලාපොරොත්තු සමග සම්බන්ධ වීම කර්ම විපාකයයි.

කර්මය සහ එහි විපාකය යනු තමන් ඉගෙන ගත් ධර්ම වලින් තමන්ම නිර්මාණය කරගන්නකි. එය සත්‍යයක් නොවේ. එම නිසා කර්ම සහ කර්ම විපාකයෙන් ද තමන් ට නිදහස් විය හැක (කර්මය සත්‍යයක් නම් එයින් නිදහස් විය නොහැක). එය පෙර කරන ලද කර්මයක් හෝ දෙවියන් වහන්සේ ගේ කැමැත්ත යයි හෝ පිළිගෙන අත්දෙක හකුළුවාගෙන සිටිය යුතු නැත. අවාසනාවකට කරුණ නම්, කර්ම වලින් නිදහස් වීමට හැකියාව තිබියදීත් ඒ බව නොදැන, කර්ම සහ කර්ම විපාක ලෙස සත්ත්ව පුද්ගල ධර්මයක් පිළිගත් කර්ම වාදීන් බුදුන් වහන්සේටත් කර්මය පැටවීමයි. චින්තනයෙන් ද මනසින් ද නිදහස් වූ බුදුන් වහන්සේ සියලුම කර්ම වලින් නිදහස් ය. නමුත් ධර්මයෙන් මුළාවට පත් වූ බොහෝ දෙනෙක් බුදුන් වහන්සේටත් කර්ම විපාක දුන්නා යයි කියති. කර්ම සහ එහි විපාක ඇත්තේ ධර්මය හිස තබාගෙන යන පෘතග්ජන පුද්ගලයාටය. ධර්ම පහුර අත හැරිය විට එතැන

කර්මයක් හෝ කර්ම විපාකයක් නැත. ධර්මය පිළිගැනීම ම කර්මය වෙයි.

කර්ම සහ කර්මඵල වලින් නිදහස් වන්නේ කෙසේ ද? බොහෝ දෙනෙක් තමන්ට සිදුවන යම් කර්ම ඵලයක් දෙස උපේක්ෂාවෙන් බලා 'මෙය ලෝක ධර්ම වල ස්වභාවය' හෝ දෙවියන්ගේ කැමැත්ත යයි පිළිගෙන යම් තරමකට සැනසීමක් ලබාගනී. නමුත් එය කර්මයෙන් නිදහස් වීමක් නොවේ. කර්මයෙන් නිදහස් වීමට නම් කර්මයේ උපත 'කර්ම යෝනි' දැකිය යුතුය. තද නින්දෙහි නොතිබූ කර්මයක්, අවදිවන විට තමන්ට ලැබුණේ කෙසේ ද? ක්‍රියාව හෙවත් සංස්කාර පිළිගත් නිසා නොවේ ද? තමන් පිළිගත් සියලු ධර්ම ද, රූප වේදනා සඤ්ඥා සංස්කාර විඤ්ඤාණ ආදී පංච උපාදානස්කන්ධයේ ම ප්‍රතිඵලයකි. ධර්ම අත්හරින තෙක් පංච උපාදානස්කන්ධයෙන් නිදහස් විය නොහැකිය. කර්මයෙන් නිදහස් විය නොහැකිය. පිළිගත් ධර්ම වලින් නිදහස් වන විට කර්මයෙන් ද. දෙවියන් වහන්සේ ගේ කැමැත්තෙන් ද, නිදහස් වෙයි. ධර්ම පිළිගත් විට සංසාරයෙහි තමන් කරන ලද කර්ම වල සීමාවක් නොමැති බැවින් කොයි මොහොතේ භයානක කර්මයක් විපාක දේ දැයි තමන් දන්නේ නැත. දෙවියන් වහන්සේ ගේ කැමැත්ත කොයි ආකාරයේ වේදැයි තමන් දන්නේත් නැත. කර්මයට හෝ දෙවියන්ගේ කැමැත්තට ඉඩදෙනවාද, නැතිනම් කර්මය හා දෙවියන්ගේ කැමැත්තක අභිබවා ගිය සත්‍ය දකිනවාද යන්න තම තමන්ටම තීරණය කළ හැක.

11

# චූලකම්ම විභංග සූත්‍රය

බුදුන් වහන්සේ දේශනා කළ චූලකම්ම විභංග සූත්‍රය මම දකින්නේ කෙසේද, එම දකින ආකාරයට මෙහි සඳහන් කරමි. චූලකම්ම විභංග සූත්‍රයෙහි සඳහන් වන්නේ පුද්ගලයන්ගේ දක්නට ලැබෙන විවිධ ලක්‍ෂණ වලට හේතු කවරේදැයි තෝදෙය්‍ය බමුණාගේ පුත් තරුණ තෝදෙය්‍ය හෙවත් සුබ නම් වූ මානවකයා ඇසූ ප්‍රශ්න 14 කට බුදුන් වහන්සේ දුන් පිළිතුරුයි. මෙම ප්‍රශ්න මා විසින් උපුටා ගන්නා ලද්දේ 'අපට නොපෙනෙන ලෝකය3' නැමති ලංකාදීප ඉරිදා සංග්‍රහයේ පළවූ ලිපියෙනි. බොහෝ සූත්‍ර මෙන් චූලකම්ම විභංග සූත්‍රයද රහත් ඵලය දක්වාම ධර්මය විස්තර කර ඇත. තරුණ තෝදෙය්‍ය ප්‍රශ්න 14 ක් නැගුවේ ඇයි යන ප්‍රශ්නයට පිළිතුරත් 14 වැනි ප්‍රශ්නයෙන් පසු ප්‍රශ්න කිරීම අවසන් කළේ ඇයි යන්නටත් පිළිතුරු ද මෙම සූත්‍රය අවසානයේදී ඔබට ලැබෙනු ඇත. මෙම ප්‍රශ්න 14, මාර්ග ඵල සමග සම්බන්ධ වන ආකාරය ආශ්චර්යමත් ය. මෙම ධර්ම විවෘත කිරීමෙන්, ගිහියන්ට දේශනා කළේ ද නිවන් මාර්ගයටම යොමු වූ ලෝකෝත්තර ධර්ම ම බව ඔබට දැකිය හැක (නමුත් බොහෝ ත්‍රිපිටකධාරීන් මෙම සූත්‍රය විස්තර කරන්නේ සමාජයේ හොඳ නරක කියාදෙන ලෞකික ධර්මයක් ලෙසයි). මට මෙම ධර්මය පහළ වූයේ වෙසක් පසලොස්වක පොහෝ දිනට එළිවන ජාමයේ දී ය. මෙවැනි ධර්ම පහල වන්නේ එම ධර්ම දකින පිරිස් ද ලොව පහළ වී ඇති බැවිනි.

'බුද්ධ' යනු සියලුම ලෞකික ධර්ම ඉක්මවූ තැනකි. ලෞකික ධර්ම ඉක්මවූ විට ලෝකෝත්තර දහමක් දකින්නට නොමැති බැවින් 'බුද්ධත්වය' සියලුම ධර්ම සහ සියලු දැනුම ඉක්මවයි. ධර්ම ඉගෙන ගන්නා තරුණයින්ට තමන් ඉගෙන ගන්නා වූ ධර්ම පිළිබඳ ගැටලු පැනනගින බැවින්, බොහෝවිට බුදුන් කරා පැමිණ ධර්මය පිළිබඳ ප්‍රශ්න කරන්නේ තරුණයෙකි. තරුණයා යම් ධර්මයක් සොයා යන්නෙකි. ඔවුන් ධර්ම කෙලින්ම පිළිගන්නේ නැත. මේ

නිසා තරුණයා සමාජයෙහි කලහකාරී පුද්ගලයකි. ඔහු සොයන්නෙකි. වැඩිමහල්ලා ධර්මයෙන් පිරිපුන් බැවින් ඔවුන් තුළ තමන් පිළිගත් ධර්ම කෙරෙහි ප්‍රශ්නයක් සැකයක් නැත. තමන් පිළිගත් ධර්ම බුදුදහමට පටහැනි බැවින් ඔවුහු බුදු දහමට එරෙහි වෙති, බුදුන් කරා පැමිණෙන්නේ නැත. නමුත් ධර්ම කෙරෙහි සැක පහළ කරගත් තරුණයෝ බුදුන් කරා පැමිණ ප්‍රශ්න කරති. ප්‍රශ්නයට පිළිතුරු ලෙස, බුදු කෙනෙක් ලෞකික ධර්මයක් දේශනා කරන්නේ නැත. එයට හේතුව සියලු ලෞකික ධර්ම අසත්‍ය වන බැවිනි. බුදුකෙනෙක් අසත්‍ය වූ ධර්මයක් දේශනා කරන්නේ නැත. සත්‍යය වචන හරහා දේශනා කිරීමට නොහැකි නමුත් තෝදෙය්‍ය වැනි තරුණයන් ට බුදුන් වහන්සේ ගේ පිළිතුර අමෘතයකි. ඔවුහු එම පිළිතුර අසා සත්‍යය දකිති, මාර්ග ඵල ලබති. මෙහි තරුණයා යනු ධර්මයෙන් තරුණයකු මිස වයසින් තරුණයකු නොවේ. වැඩිමහල්ලා නම් ධර්මයෙන් මහල්ලෙකි. හැට වයස් පිරුණද අසූ වයස් පිරුණද තර්කය හා විතර්කය ඇත්නම් ඔහු තරුණයකි.

ලෞකික ධර්ම ඉගෙන තිබූ තෝදෙය්‍ය මරණය ද පිළිගෙන තිබුණි. සිදුහත් කුමරු ගිහිගෙය අත්හැර යාමට එක් හේතුවක් වූයේද මරණය දැකීමයි. එතුමා මරණය නැති තැනක් සොයා ගියහ. තොදෙය්‍යටද කොතරම් සැපසම්පත් තිබුණද ජීවත් වීමට ඇති කාලය ඉතා අල්ප බව දැනගෙන සිටියේ ය. එය ඔහුට බිය ගෙන දෙන කරුණක් විය. තෝදෙය්‍ය ප්‍රශ්න 14 කුත් සමග බුදුන් හමුවට ගියේ නැත. ඔහුට තිබුනේ එක් ප්‍රශ්නයකි. එනම් තමන් අල්ප ආයුෂ ඇතිව මිය යන්නේ ඇයි ද යන්නයි. පළමු ප්‍රශ්නයට ලැබුණ පිළිතුරත් සමග දෙවන ප්‍රශ්නය පැනනැගෙයි. පහත දැක්වෙන්නේ තෝදෙය්‍ය අසන ලද ප්‍රශ්නත් ඒවාට බුදුන් වහන්සේ දෙන ලද පිළිතුරුත් ය.

1 සමහර පුද්ගලයින් අඩු වයසින් මරණයට පත්වන්නට හේතුව කුමක් ද යන්න ඔහුගේ පළමු ප්‍රශ්නයයි. අල්ප ආයුෂව මියයන්නේ කවර නම් වූ කෙනෙක් ද? මරණය පිළිගත් ලෞකික ලෝකයෙහි ජීවත්වන සියළු දෙනා අල්ප ආයුෂව මියයයි, කිසිවකු දීර්ඝායුෂ ලබන්නේ නැත. වයසට යන විට ආයුෂ කෙටි වන්නේ ය.

අවුරුදු අසූවක් ජීවත් වූ පුද්ගලයාට තව අවුරුද්දක් ජීවත් වීමට තමන්ට ආයුෂ තිබේදැයි තමන් දන්නේ නැත. ඔහු හෝ ඇය අවුරුදු සියයක් වන තෙක් ජීවත් වුවද සැමදා ජීවත් වන්නේ මරණය බලාපොරොත්තුවෙනි. මෙම 'මරණය' නිසා ජීවත් වන්නට විනෝද වන්නට කාලයක් ඉතිරිවන්නේ නැත. අනෙක් අතට අවුරුදු සියයක් නොව දාහක් ජීවත් වුවද මරණ බිය තුරන් වන්නේ ද නැත. සමහරු මට දැන් ජීවත් වුණා ඇති යැයි කියති. නමුත් එසේ කියන්නේ ජීවත් වීමේ ආශාව අත්හැර නොවේ. එයට ලෙඩරෝග ආදී වෙනත් හේතු බලපායි. ජීවත් වූ කාලය වැඩිවන තරමට අල්ප ආයුෂව මැරෙන්නට සිදුවේ. ජීවත් වූ කාලය අතීතයෙහි මියගොස් ඇත. වර්තමානයේ යමෙක් ජීවත් වන්නේ නැත. එය අතීතයෙනුත් අනාගතයෙනුත් වැසී පවතී. ආයුෂ යනු කාලය පිළිගත් පෘතග්ජනයාට අනාගතයේ දී ජීවත් වන්නට ඇති කාලය පමණි. එය ඉතා අල්පය.

බුදුදහම අනුව සිතුවිලි මැරෙනවා උපදිනවා විනා පුද්ගලයෙක් මැරෙන්නේ වත් උපදින්නේවත් නැත. සිතුවිල්ලක ආයුෂ ක්‍ෂණයකි. අපි පුද්ගලයකුගේ මරණයක් ගැන කථා කරන්නේ පුද්ගල දෘෂ්ඨිය පිළිගත් බැවිනි. මෙම පුද්ගල මරණය දැනුම හෙවත් පංච ස්කන්ධය පිළිගත් නිසා මිනිසාට උරුම වූ දායාදයකි. මරණය පිළිගත් නිසා පුද්ගලයින් අඩු වයසින් මරණයට පත් වෙයි. මාර්ග ඵලයකට නොපැමිණි සියලුම පෘතග්ජන පුද්ගලයෝ අල්ප ආයුෂව මිය යති. මෙම ධර්මය ඇසූ තෝදෙය්‍ය **සෝවාන් මාර්ගයට** පිළිපන් හ.

2 යම්කෙනකු දීර්ඝායුෂ ලබන්නේ කෙසේ දැයි යන ප්‍රශ්නය ඔහුට මතු විය. බුදුන්ගේ පිළිතුර වූයේ යමෙක් දීර්ඝායුෂ ලබන්නට කැමැත්තේ නම් 'මැරීම' අත්හැරිය යුතුය යන්නයි. උපදින්නේ මැරෙන්නේ සිතුවිලිය. මෙම සිතුවිලි නිර්මාණය වන්නේ සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය ඇතුළු සියලුම දෘෂ්ඨි හෙවත් දැනුම පිළිගත් බැවිනි. පුද්ගල දෘෂ්ඨියෙන් නිදහස් වීමට නම් පිළිගත් සියලුම ධර්ම අතහැරිය යුතුය. ධර්ම අතහැරෙන්නේ එම ධර්ම වල වැරදි දැකීමෙන් පමණි. පුද්ගල ධර්ම අත්හැරිය විට මැරෙන්නට

උපදින්නට කෙනෙක් නැත. දීර්ඝායුෂ ලබයි. මෙම ධර්මය ඇසූ තරුණ තෝදෙය්‍ය **සෝවාන් ඵලයට** පත් විය. සෝවාන් ඵලයට පත් වූ අයෙක් මැරෙන්නේ නැත. තෝදෙය්‍ය මරණයෙන් නිදහස් විය. සෝවාන් ඵලයට පත්වනතෙක් දීර්ගායුෂ ලබන්නෙක් නැත. දීර්ගායුෂ ලබන පෘතග්ජන පුද්ගලයෙක් ලොව නැත.

මෙම දේශනාවේ වැදගත් වන තවත් කරුණක් නම් සෝවාන් පුද්ගලයා මරණයෙන් නිදහස් වීමයි. අවාසනාවකට මෙන් විවිධ වූ සීල භාවනා අනුගමනය කරමින් සෝවාන් ඵලයට පත් වූ යයි කියන බොහෝ දෙනෙක් මරණසති භාවනාව ද වඩති. ලංකාවේ ප්‍රසිද්ධ ස්වාමීන් වහන්සේ නමක් විසින් රචිත මරණ සති භාවනා ක්‍රමයක් බුදුසරණ පත්‍රයේ පලවී තිබෙනු මම දුටුවෙමි. එම මරණ සති භාවනාවේ 'බුදුන් වහන්සේ ඇතුළු රහතන් වහන්සේ ලා ද පිරිනිවන් පෑ සේක, මාර්ගඵල ලාභීහුද මියයති' යනුවෙන් සඳහන් කර තිබුණි. මෙම ධර්ම පිළිගත් අනුගාමිකයෝ මරණය හිස තබාගෙනම යති. සෝවාන් ඵලයෙහි 'මරණය නැත' යි කීම පිළිගැනීමක් නොවේ. යමෙක් සොවාන් ඵලයට පත් වූ විට එය තමන් ම දකී.

3 තෝදෙය්‍ය සෝවාන් ඵලයට පැමිණ මරණයෙන් නිදහස් වුවද ලෙඩ රෝග වලින් නිදහස් වූයේ නැත. සැප පහසුකම් ඇති අය පවා සෞඛ්‍ය සම්පන්න භාවයෙන් දුර්වල වන්නේ ඇයි දැයි තුන්වැනිව ප්‍රශ්න කළේ එබැවිනි. සෑම ශරීරයක්ම විපරිනාමයට පත්වන අතර ලෙඩ රෝග ද මෙම විපරිනාමයේ කොටසකි. සෝවාන් ඵලයේදී සත්ත්ව පුද්ගල දෘෂ්ඨියෙන් නිදහස් නිසා සත්ත්වයා මරන්නේ නැත. නමුත් සත්ත්වයාට හිංසා පීඩා කරයි. එනම් විපරිනාමයට පත්වන ශරීරය උපාදානය කරයි. එම නිසා සොවාන් ඵලයේ දී ද සියලු පෘතග්ජනයෝ සෞඛ්‍ය සම්පන්න භාවයෙන් දුර්වලය. ලෙඩ රෝග සෑදේ. සෝවාන් ඵලයේදී ද කෙලෙස් ඇත. මෙම කෙලෙස් නිසා සෝවාන් ඵල ලාභියාද ලෙඩ වෙයි.

4 එසේනම් ලෙඩ රෝග වලින් නිදහස් වූ තැනක් ද තිබිය

යුතු ය. නිරෝගීව බව ලබාගන්නේ කෙසේ දැයි ඔහු ප්‍රශ්න කළේය. 'මට කිසිම දිනක ලෙඩ සෑදී නැත. දැනුත් නැත. අනාගතයේදීත් රෝගයක් සෑදෙන්නේ නැත' යනුවෙන් උදම් ඇනිය හැකි කිසියම් පෘතග්ජන පුද්ගලයෙක් මේ ලෝකයෙහි සිටී ද? (එවැනි පුද්ගලයෙක් නැතයි මම ඔබට අභියෝග කරමි). නමුත් ලෙඩ රෝග වලින් නිදහස් විය හැකි මාර්ගයක් ඇත. මෙය **සකෘදාගාමි මාර්ගයයි**. සකෘදාගාමි මාර්ගයෙහි ලෝබය හා ද්වේශය ප්‍රහීන වන බැවින් ලෙඩරෝග වලින්ද නිදහස් වීම ද, ඒ සමගම සිදුවෙයි.

5 සමහර කෙනෙකුට අප්‍රසන්න වූ රූප ස්වභාවයක් ඇතිවීමට හේතු කවරේද? යන්න තෝදෙය්‍යගේ ඊළඟ ප්‍රශ්නයයි. බාහිර ලෝකයේ අප්‍රසන්න හෝ ප්‍රසන්න හෝ පුද්ගලයින් නැති බැවින් බුදුකෙනෙත් අප්‍රසන්න පුද්ගලයෙක් දකින්නේ නැත. ඔබ තුළ ද්වේෂය, වෛරය, ක්‍රෝධය වැනි වූ කෙලෙස් ඇති බැවින් බාහිර පුද්ගලයන් අප්‍රසන්න ලෙස ඔබට පෙනේ (මෙම ඔබට තරමක් දකින්නට අපහසු ධර්මයකි). සකෘදාගාමි මාර්ගයෙහි ද මෙම ද්වේශය ක්‍රෝධය වැනි කෙලෙස් අඩුවක් නැතිවම පවතී. මෙම කෙලෙස් නිසා සකෘදාගාමි මාර්ගයේ ගමන් කරන්නා ද, 'මේ ප්‍රසන්න පුද්ගලයෙකි, මේ අප්‍රසන්න පුද්ගලයෙකි' යනුවෙන් පුද්ගලයින් තම මනසින් වෙන් කරයි (නමුත් පුද්ගල දෘෂ්ඨික් එහි නැත). ලෙඩ රෝග වලින් නිදහස් වුවද, සකෘදාගාමි මාර්ගයේ සිටි තෝදෙය්‍ය අප්‍රසන්න රූපයක් දුටුවේ ඔහු තුළ තවමත් ද්වේශය ඇති බැවිනි. අප්‍රසන්න බව යනු ඔබ තුළ ඇති ද්වේශය නිසා ඔබ විසින් ම නිර්මාණය කරගත් නාම ධර්මයකි.

6 තෝදෙය්‍යගේ ඊළඟ ප්‍රශ්නය වූයේ ප්‍රසන්න වූ රූප සම්පත්තියක් ලැබීමට හේතු කවරේද ? යන්නයි. ප්‍රසන්න වූ රූප සම්පත්තියක් ඇතිවීමට නම් ද්වේශය ක්‍රෝධය වැනි කෙලෙස් තුනී විය යුතුය. **සකෘදාගාමී ඵලයේ** දී මෙම කෙලෙස් තුනී වීම සිදු වේ. සකෘදාගාමියා අප්‍රසන්න පුද්ගලයන් දකින්නේ නැත. ප්‍රසන්න වූ පෘතග්ජන පුද්ගලයෙක් ද ලොව නැත (එවැනි පුද්ගලයෙක් ලොව සිටීනම් මම ඔහුට අභියෝග කරමි).

7 සකෘදාගාමි ඵලයේ දී ද මිනිසා සම්පූර්ණ නොවෙයි. එමනිසා 'නිවට නියාලු ස්වභාව' නැමති මානසික ධර්මය තෝදෙයා‍ය තුළ තිබුණි. ඔහු ඒ ගැන ප්‍රශ්න කළේ එබැවිනි. යම්කෙනකුට නිවට නියාළු ස්වභාවයක් ඇති වන්නේ තමන්ට 'ධනයෙන්' ආදී අඩුපාඩු ඇති විටයි. අසරණ වූ විටයි. තමන් ට අඩුපාඩු ඇති විට අනුන්ගේ සම්පත් කෙරෙහි ඇළුම් කරයි. ඒවාට ඊර්ෂ්‍යා කරයි. සකෘදාගාමි ඵලයෙහි ප්‍රසන්න රූප සම්පත්තියක් තිබුණ ද මෙම සම්පත් හීනකම පවතී. එමනිසා අනුන්ට අයත් බාහිර සම්පත් කෙරෙහි ඇළුම් කරයි. එම සම්පත් තමන්ට අයිති කරගන්නට උත්සාහ ගනී. නිවට නියාලු ස්වභාව ඇතිව ජීවත් වන්නේ එබැවිනි. ඊර්ෂ්‍යාව වැනි කෙලෙස් සකෘදාගාමි ඵලයේදීත් නැති වන්නේ නැත.

සෑම පෘතග්ජන පුද්ගලයාටම ඊර්ෂ්‍යාව ඇත. 'මට අනුන්ගේ සම්පත් කෙරෙහි ඊර්ෂ්‍යාවක් නැත' යයි කීම ද, එය බොරුවකි. පෙරදිග අපි සෑම විටම ඊර්ෂ්‍යාව වසාගන්නට, සඟවා ගන්නට උත්සාහ කරන්නෙමු. නමුත් බටහිර ජාතීන් එසේ නැත. 'ඔබේ දියුණුවට මට ඊර්ෂ්‍යායි' යයි බටහිර ජාතීහු මූණටම කියති. අසන්නා එයින් සතුටු වෙයි. ඊර්ෂ්‍යාව වසාගැනීමට තැත් කිරීමෙන් එය තවතවත් වර්ධනය වෙයි.

8 එසේනම් ආනුභාව සම්පන්නව ජීවත් වන්නේ කෙසේද? **අනාගාමී මාර්ගයේ** දී අනුන්ගේ සම්පත් කෙරෙහි ඇති වන ඊර්ෂ්‍යාව ප්‍රහීන වෙයි. අනුන්ගේ සම්පත් වලට ඇළුම් කරන්නේ වත් ඊර්ෂ්‍යාව කරන්නේ වත් නැත. එබැවින් ආනුභාව සම්පන්නව ජීවත් වෙයි. යම් පුද්ගලයෙක් අනාගාමී මාර්ගයට පෙර ආනුභාව සම්පන්න වන්නේ නැත. යම් පෘතග්ජන පුද්ගලයෙක් වර්තමානයේ ආනුභාව සම්පන්නව ජීවත් විය හැක. නමුත් අනාගතයේ දී අසරණ වී නිවට නියාළු බවට පත්විය හැක.

9 සමහරු දිවා රෑ වෙහෙස වුණත් ජීවිතය පවත්වා ගෙන යෑමට අවශ්‍ය ධනයක් ගොඩනගා ගැනීමට නොහැකි වන්නේ ඇයි දැයි තෝදෙය්‍ය බුදුන් වහන්සේගෙන් ප්‍රශ්න කළේ ය. අනාගාමී

මාර්ගයෙහි ඊර්ෂ්‍යායාව වැනි කෙලෙස් ධර්ම ප්‍රහීන කරන නමුත් ධන සම්පත් වලින් තවම සම්පූර්ණ නැත. ධන සම්පත් වලට ඇළුම් කරයි. එම නිසා ධනය රැස් කිරීමට වෙහෙස වෙයි. අනාගාමි මාර්ගයෙහි මාර්ගඵල ලාභියා දානයට හෙවත් අතහැරීමට තවම කැමති නැති වීම එයට හේතුවයි.

10 සමහරු ඉතා අඩු වෙහෙසකින් මහත් ධන සම්පත් ගොඩ නගා ගන්නේ කෙසේ ද? අඩු වෙහෙසකින් ධන සම්පත් ගොඩ නගා ගන්නේ **අනාගාමී ඵලයේ** දී ය. අනාගාමී ඵලයත් සමග මාර්ග ඵල ලාභියාට ධන සම්පත් වලින් අනූන වෙයි. ඉපැයීමට වඩා අතහැරීමට මුල් තැන දෙයි. අනාගාමි ඵලය දාන පාරමිතාව සම්පූර්ණ කරන මාර්ගයට අවතීර්ණව ඇත. සියලු ධන සම්පත් තමන් ට ඇති බැවින් ධන සම්පත් ඉපයීමට වෙහෙසක් නොගනී.

11 සමහරු සමාජයේ පහත් යැයි සම්මත පවුල් වල ඉපදී මදි පුංචිකම්වලට පාත්‍ර වෙන්නේ ඇයි? යමෙක් අනාගාමී ඵලයට පැමිණියද මාන උද්දච්ච අවිද්‍යා නම් වූ බන්ධන වලින් තවමත් නිදහස් වී නැත. මාර්ග ඵල ලාභියා තුළ තවමත් මානය ඇත. මානය යනු මැනීමයි. ජාති, ආගම්, නිකාය, කුල ආදී බෙදීම් තමන් තුළ ඇති වන්නේ මෙම මානය නිසා ය. තමන්ගෙන් බාහිර ජාති, ආගම්, කුල වලට වෙන් කරගත් පුද්ගලයෝ නැත. පහත් හා උසස් කුල නැත, උසස් හා පහත් ජාතීන් නැත. තමන් උසස් කුලයක හෝ පහත් කුලයක යයි හංවඩු ගසාගන්නේ තමන් විසිනි. තමන් තුල ඇති මානය නැමති කෙලෙස් නිසා මෙම බෙදා වෙන්කර ගැනීම සිදුවේ. ඉතිහාසය සමාජ අධ්‍යයනය වැනි කලා විෂයයන් ඉගෙන ගත් අය අතර මෙම භේද වැඩිපුර දක්නට ලැබෙයි. තමන් ළඟ මානය ඇති තරමට තමන්ට අනුන්ගේ මදි පුංචිකම් වලට පාත්‍ර වෙන්නට සිදු වෙයි. මදිපුංචිකම් වලට පාත්‍ර වන්නේ සමාජයේ ඇති උස් පහත් කම් ඉගෙන ගත් පසුවය. නමුත් සියලු දෙනා දැනගත යුතු කරුණක් නම් අනාගාමි ඵලයට පැමිණියද මානයෙන් නිදහස් නොවන බවයි.

12 සමහරු උසස් යැයි සම්මත පවුල්වල ගරුබුහුමන්

ලබමින් ජීවත්වෙන්නේ ඇයි? ගරු බුහුමන් ලැබීමට නම් මානයෙන් නිදහස් විය යුතුය. මානයෙන් නිදහස් වන විට මදිපුංචි කම් වලට පාත්‍ර වන්නේ නැත. මානයෙන් නිදහස් වන්නේ **අරහත් මාර්ගයේ** දීය.

13 කෙනෙකු ප්‍රඥාවෙන් හීන වීමට හේතු කවරේ ද? අරහත් මාර්ගයෙහි අවිද්‍යාව තවමත් ඇත. මෙම අවිද්‍යාව නිසා අරහත් මාර්ග ලාභියා ද ප්‍රඥාවෙන් හීන වෙයි. ප්‍රඥාව සම්පූර්ණ වන්නේ දැනුමෙන් සම්පූර්ණයෙන් නිදහස් වූ විට පමණි. අරහත් මාර්ගඵල ලාභියා ද දැනුමෙන් යැපෙයි.

බුදු දහමේ 'අවිද්‍යා' යන්නෙහි තේරුම 'විද්‍යා ශාස්ත්‍ර ඉගෙන ගනිමින් දැනුම දියුණු නොකිරීම' යන්න නොව විද්‍යා ශාස්ත්‍ර ඉගෙන ගනිමින් දැනුම දියුණු කිරීමයි. විද්‍යා ශාස්ත්‍ර ඉගෙනමින් දැනුම දියුණු කිරීම සමාජයෙහි ජීවත් වීමට උපකාරීවෙයි. නමුත් සසරින් එතෙර වීමට නම් දැනුමේ වැරදි දැක එයින් ඉවත් විය යුතුය. 'විද්‍යාව' පහළවන්නේ මෙතෙක් ඉගෙන ගත් විද්‍යා ශාස්ත්‍ර ධර්ම ආදිය වැරදි බව දැක එම ධර්ම අත්හැරීමෙනි. අරහත් මාර්ගයෙහි ද තවමත් අවිද්‍යාව ඇත.

14. කෙනකු ප්‍රඥාවන්ත වීමට හේතු කවරේද? අවිද්‍යාව ප ුහීන කිරීමෙන් හෙවත් විද්‍යාව පහළ කරගැනීමෙන් ප්‍රඥාව සම්පූර්ණ වී විසි දෙවන ඥානය පහළ වෙයි. මෙය **අරහත් ඵලයයි.** අරහත් ඵලයේ දී ප්‍රඥාව සම්පූර්ණ වෙයි. සියලුම ධර්ම වලින් නිදහස් වෙයි. ගඟ තරණය කළ තොටියා පහුර තොටුපොලේ තබා යන්නාක් මෙන් මෝහය නැමති ගඟෙන් එතෙර වූ අරහත්ඵල ලාභියා ද ධර්මය නැමති පහුර අතහරී.

දහහතර වැනි ප්‍රශ්නයට බුදුන්ගෙන් පිළිතුරු ලැබෙන විට තෝදෙය්‍ය තරුණයා අරහත් ඵලයට පත්වෙයි. අරහත් ඵලයේ දී තවදුරටත් අහන්නට ප්‍රශ්නයක් ඉතිරි නොවෙයි. ප්‍රශ්න කිරීම අවසන් කරයි. මෙම සූත්‍රයේ සඳහන් වන ආකාරයට

සෘණාත්මක ලක්ෂණ හතක් හා ධනාත්මක ලක්ෂණ හතක් මාර්ගඵල ලාභියාට එක් එක් අවස්ථා වලදී ඇත. සියලුම සෘණාත්මක ලක්ෂණ පෘතග්ජන පුද්ගලයාට ද පොදුය. නමුත් මෙහි සඳහන් කළ කිසිම ධනාත්මක ලක්ෂණයක් පෘතග්ජන පුද්ගලයාට නැත. මෙම ධනාත්මක ලක්ෂණ පෘතග්ජනයාට ඇත්නම් ලෝකෝත්තර සුවයක් කුමට ද?

මෙම සූත්‍රය, මාර්ගඵල ලාභියාගේ කෙලෙස් එක් එක් අවස්ථාවේදී ප්‍රහීන වන ආකාරය පෙන්වා දෙයි. මාර්ගඵල ලාභියා සත්ත්ව පුද්ගල දෘෂ්ඨියෙන් තොර බැවින් කායික විර්යය හා මානසික වීර්යය යොදා කෙලෙස් ප්‍රහීන කරන්නට උත්සාහ කරන්නේ නැත. බොහෝ යෝගාවචරයින් කෙලෙස් තැවීමට කායික හා මානසික වීය යොදයි. නමුත් මාර්ගඵල ලාභියා තුළ ද කෙලෙස් අඩුවක් නැතිවම පවතී. කෙලෙස් නැති කිරීමට වීර්යය කළ යුතු නැත. ඔබ විසින් දැකිය යුත්තේ කෙලෙස් වලට අයිති කාරයෙක් නැති බවයි. අනෙක් අතට කෙලෙස් නැති කිරීමට වීර්යය දරන විට සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය තවදුරටත් තර වෙයි, තවතවත් උපාදානය කරයි. එයින් මිදීමක් නම් නැත. සත්‍ය සොයන්නෝ සංසාරයෙහි කල්ප ගණන් සැරිසරන්නේ මෙම කායික හා මානසික වීර්යය නිසාවෙනි. නිවන් දැකීමට කැමැත්තන් මෙම වීර්යය අත්හැරිය යුතු ය.

# 12

# ගැල්කරුවන් බිහිකරන තක්සලාව

බෞද්ධ සාහිත්‍යයේ එන අංගුලිමාලගේ කතාව බෞද්ධ අබෞද්ධ බොහෝ දෙනෙක් අසා ඇත. 'අංගුලිමාල' යනු පටබැඳුණු නමකි. ඔහුගේ නියම නම 'අහිංසක'යි. මෙම අහිංසක ද ශිල්ප ඉගෙන ගැනීමට තක්සලාවට ගියේ ය. අහිංසක දක්ෂ සිසුවෙකි. එමනිසා දිසාපාමොක් ආචාර්ය තුමා ද ඔහුගේ බිරිඳ ද මෙම දක්ෂ සිසුවාට ආදරය කළෝ ය. මෙම ආදර සැලකිලි ඉවසන්නට නොහැකි වූ අහිංසකගේ මිතුරු කැළ අහිංසකට විරුද්ධව බොරු චෝදනා එල්ල කළහ. අහිංසක සහ ගුරු බිරිඳ අතර නොහොබිනා සම්බන්ධයක් ඇති බව කියා ගුරුවරයා තුළ ගෝලයා කෙරෙහි ඇති හොඳ හිත බිඳ දැමුවෝ ය. අවසානයේ දී ශිල්ප නිමා කළ අහිංසක අතට කඩුවක් දී ගුරු පඬුරු වශයෙන් මිනිසුන් දහසක් මරා එන්නැයි ගුරුවරයා ගෝලයාට අණ කළේ ය. ගුරුවරයාගේ අණ පරිදි අහිංසක මිනී මැරීම ආරම්භ කළ අතර පළමුව ගාණක් මිම්මක් නොමැතිව මිනිසුන් මැරීය. පසුව මරන ලද මිනිසුන්ගේ ඇඟිලි කපා එකිනෙකට අමුණා මාලයක් සේ කරේ දමා ගත්තේ ය. මේ නිසා අංගුලිමාල යයි නම පටබැඳුණි. අංගුලිමාල ඇඟිලි නමසිය අනූ නවයක් සම්පූර්ණ කර 'අද දින මගේ පියා හෝ මව් හෝ හමු වුවද ඔහු හෝ ඇය මරා දහස සම්පූර්ණ කරගන්නෙමි' යි සිතා උන් කල, සාන්ත ගමනින් වඩින බුදුන් වහන්සේ ඇස ගැසුණි. 'බුදුන් මරා දහස සම්පූර්ණ කරගන්නෙමි' යි සිතා බුදුන් පසු එළෙව්වද අංගුලිමාලට බුදුන්ට කිට්ටු වන්නට නොහැකි විය. හති වැටී නතර වූ අංගුලිමාල සාන්ත ගමනින් වඩින බුදුන් අමතා 'මහණ නතර වනු' යයි අණ කළේ ය. බුදුන් වහන්සේ පෙරලා පිළිතුරු දෙමින් 'මම නතර වී ඇත, ඔබ නතර වන්න' යි කී සේක. අංගුලිමාල ප්‍රශ්නයකට මැදි වුණි. අත ඇති කඩුව බිම වැටුණි.

බුදු සසුනේ පැවිදි වූ අංගුලිමාල පසුව රහත් වූයේ ය. 'අනේ හැබෑටම මිනිසුන් දහසක් මැරූ අංගුලිමාලත් රහත් වුණානෙ' යි කියමින් අපි සතුටු වන්නෙමු. අංගුලිමාල පිරිත සජ්ඣායනා කර මව්වරුන්ගේ විලිරුදාව සමනය කරන්නෙමු. නමුත් අපි අංගුලිමාල පිරිත හා අංගුලිමාල කතාවෙහි ඇති ධර්මය නොදුටුවෙමු. අපත් දර්ශනය නොදකින්නේ නම්, රහත් නොවන්නේ නම්, අංගුලිමාලගේ රහත් වීමෙන් අපට ඇති ඵලය එම ධර්ම ඉගෙන උපාධි සමත් වීම පමණි. බාහිර ලෝකය මනසින් සාදාගත්තක් බැවින් සත්‍ය දැකීමට නම් මෙම කතා වලින් පෙන්වන අභ්‍යන්තර ධර්මය කුමක්දැයි බැලිය යුතුය. මෙම කතා තමා තුළින් බැලූ විට එතැන සත්ත්ව පුද්ගල දෘෂ්ඨියක් නැත. එය සියලුම දෘෂ්ඨී වලින් නිදහස් වීමේ මාර්ගයයි. අංගුලිමාල කතාවද අප මනසෙහිම සිදුවන කතාන්දරයයි. දෘෂ්ඨී වලින් තොර එම කතන්දරය කුමක් දැයි බලමු.

තක්සලාව නම් පංච ඉන්ද්‍රියන්ය. පංච ඉන්ද්‍රියන් නැමති තක්සලාව පාලනය කරන දිසාපාමොක් ආචාර්යතුමා නම් තණ්හාවයි. බුදුන් දැක නිවන් දකින තෙක් මෝක්ෂයට යන පාර (දිසාපාමොක්) අසා දැනගන්නේ තණ්හාවෙනි (නමුත් තණ්හාව හරි මාර්ගය කියා දෙන්නේ නැත). තක්සලාවට ඇතුළු වන අහිංසක නම් ප්‍රභාශ්වර මනසයි. ශිල්ප ඉගෙන ගැනීමට පෙර සියලු දරුවෝ අහිංසකයෝ වෙති. ඔවුන් සතුන් මැරීම, සොරකම් කිරීම ආදී කිසිම පාපකර්මයක් නොකරති. ඔවුන් බෙදීමකින් තොරව සියලු සත්ත්වයන්ට මෛත්‍රිය කරති. කරුණාව දක්වති (නමුත් මෛත්‍රී භාවනාව නොවඩති). අහිංසකට තක්සලාවට යාමට උවමනාවක් නැත. මෙම උවමනාව ඇත්තේ දෙමව්පියන්ටය. දෙමව්පියෝ නම් නාම ධර්ම හා රූප ධර්මයි. පංච ඉන්ද්‍රිය නැමති තක්සලාවේ තණ්හාව නැමති ආචාර්ය තුමාගෙන් අකුරු ඉගෙන ගත් ප්‍රභාශ්වර මනස නැමති අහිංසක තක්සලාවෙන් පිටවන විට ගුරුතුමාගෙන් පංච උපාදානස්කන්ධය නැමති කඩුව අතට ලැබෙයි. කඩුව අතැති අහිංසක තවදුරටත් ප්‍රභාශ්වර මනස නොවෙයි. මෙම පංච උපාදානස්කන්ධය කුමක් ද? අපි තක්සලාවෙන් විද්‍යා ශිල්ප, විවිද දර්ශන හා ආගම් ඉගෙන ගන්නෙමු. මෙම සියලුම දැනුම සත්ත්ව පුද්ගල දෘෂ්ඨියට යටත් ය, හොඳ නරක පව් පින් ආදී ද්විත්වයට

යටත්ය, කාලයට යටත් ය. සත්ත්ව පුද්ගල දෘෂ්ඨියෙන් තොරවූද, කාලයෙන් තොරවූද, ධර්මයක් තක්සලාවේ උගන්වන්නේ නැත. තක්සලාවෙන් පිටවන අහිංසකයෝ මිථ්‍යා දෘෂ්ඨිම පිළිගනිති. සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය නිසා උත්පත්තිය සහ මරණය පිළිගනිති. පංච ඉන්ද්‍රියන් හරහා ලබාගත් සියලුම දැනුම් සම්භාරය අනෙකක් නොව පංච උපාදානස්කන්ධයයි. අහිංසකට දිසාපාමොක් ආචාර්ය තුමාගෙන් ලැබුණ කඩුව නම් විද්‍යා ශිල්ප, විවිධ දර්ශන හා ආගම් ආදී දැනුම මිස වෙන කවරක් ද?

දිසාපාමොක් ඇදුරු තුමා මිනිසුන් දහසක් මරන්නට අහිංසකට අණ කළේ ය. මෙහි 'දහස' නම් කුමක් ද? මෙම ප ්‍රශ්නයට පිළිතුරු සෙවීමට පෙර අපි තක්සලාවෙන් පිටවන ඇදුරුතුමාගේ හොඳහිත දිනාගත් අනෙක් ශිෂ්‍යයින් කරන්නේ කුමක් දැයි බලමු. තක්සලාවෙන් පිටවන කුමාරවරුන්ගේ ජීවිකාව 'ගැල් පන්සියයක' බඩු පටවාගෙන වෙළදාමේ යාම බව බෞද්ධ සාහිත්‍ය හා ජාතක කතා යම් තරමකට ඉගෙනගෙන ඇති ඔබ දන්නවා ඇත. සෑම විටම මෙම සිටු කුමාරවරුන් ගැල් පන්සියයකම බඩු පටවාගෙන වෙළදාමේ යන්නෝ ය. මෙම සෑම ගැලකටම ගොන් දෙන්නා බැගින් බැඳ ඇත. මෙම ගැල් පන්සියය කුමක් ද? ගොන් දෙන්නා යනු කවරෙක් ද?

පෘතග්ජන පුද්ගලයා රූප, වේදනා, සඤ්ඤා. සංඛාර විඤ්ඤාණ නැමති පංචස්කන්ධය උපාදානය කරයි. වර්ණ ගන්ධ ශබ්ද රස ස්පර්ෂ ආදී රූප ස්කන්ධ පහකි. මේ ආකරයටම වේදනා ස්කන්ධ පහකි. සඤ්ඤා සංඛාර විඤ්ඤාණ ස්කන්ධ ද පහ බැගින් ඇත. සියලු ස්කන්ධයන්ගේ එකතුව විසිපහකි (5x5=25). පංචස්කන්ධය උපාදානය කරන විට ලොකික ඤාණ 20 ක් පහළ වෙයි. පෘතග්ජන පුද්ගලයා මෙම ඤාණ 20 න් විසිපස් වැදෑරුම් පංච ස්කන්ධය ප්‍රයෝජනයට ගනිමින් ජීවිකාව කරගෙන යයි. විසිවරක් විසිපහ පන්සියයකි. එමනිසා ගැල් පන්සියයක බඩු පටවාගෙන වෙළදාමේ යාම තක්සලාවෙන් පිටවන කුමාරවරන්ගේ ජීවිකාව වෙයි. ගොන් බාන නම් කායික වීර්යය හා මානසික වීර්යයයි. කායික වීර්යය හා මානසික වීර්යය නැමති ගොන්

බානෙන් ධර්ම නැමති ගැල් ඇදගෙන යයි.

පංච ස්කන්ධය උපාදානය කර සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය පිළිගත් පෘතග්ජන පුද්ගලයා තුළ ලෞකික ධර්ම 500 ක් ඇති බව ඔබ දැන් දනී. සත්‍ය දකින්නට නම් 'පුද්ගලයා' යනු නාම රූප දෙකක එකතුවක් ලෙස දැකිය යුතුය (නමුත් නාම රූප ද ලෞකික ධර්ම වෙයි). පන්සියයක් වූ සත්ත්ව පුද්ගල ධර්ම නාම ධර්ම හා රූප ධර්ම ලෙස ගත්විට දහසක් වෙයි $(500 \times 2 = 1000)$. ලෞකික ලෝකයෙන් එතෙර වීමට නම් මෙම දහසක් වූ ලෞකික ධර්ම මරා දැමිය යුතුය. දහසක් මරා ගුරු පූජාව පවත්වන්නට දිසාපාමොක් ඇදුරු තුමා අණ කරන්නේ එබැවිනි. අහිංසක කුමරු මිනිසුන් මරා ඇඟිලි කපා ගස්බෙන ආදී ස්ථාන වල සඟවා තබයි. එවා සතුන් කා දමයි. නැතහොත් ඔහුට සැඟවූ තැන අමතක වෙයි. තක්සලාවෙන් ඉගෙන ගත් ලෞකික ධර්ම හිස තබාගෙන අහිංසකට දහස සම්පූර්ණ කරගැනීමට නොහැකි විය. ධර්මය නැමති කඩුවෙන් දහසක් වූ ලෞකික ධර්ම මරා දැමිය නොහැකිය. ලෞකික ධර්ම පිළිගෙන ලෞකික ධර්ම මරා දැමීමට නොහැකි බව බුද්ධිමත් අහිංසක දුටුවේ ය. එමනිසා කපන ලද ඇඟිලි මාලයක් සේ අමුණා කරේ දමා ගත්තේය. අහිංසක කුමරු අංගුලිමාල විය. දැන් අංගුලිමාල මරණය හිස තබාගෙන යන්නේ නැත. ඔහු මරණය කරේ තබාගෙන යයි. බුදුන් දැක මරණයෙන් නිදහස් වීමට නම් පළමුව මරණය හිසෙන් කරට ගත යුතුය. ඒ සඳහා තර්කය හා විතර්කය උදව් වෙයි. කිසාගෝතමී කතාවෙන් ද මීට සමාන ධර්මයක් අපට කියා දෙයි. කිසාගෝතමී බුදුන් හමුවට ගියේ මළ දරුවා කරතබාගෙන ය. මළ දරුවා කරතබාගෙන 'අබ මිටේ' ධර්මය ඇසූ පඨාචාරාව සත්‍ය දුටුවා ය (වර්තමානයේ සිටින කිසාගෝතමීහු තවමත් මළ දරුවන් හිසමත තබාගෙනම යති). මරණය කරට ගත්තද දහස සම්පූර්ණ කිරීමට අංගුලිමාලට නොහැකි විය. මව හෝ පියා මරා දහස සම්පූර්ණ කරන්නට ඔහු මග බලා ඉන්නේ එබැවිනි. ධර්මයට අනුව 'මව් හා පියා' යනු 'නාම ධර්ම හා රූප ධර්ම' යි. බුදුන් නොදැක සත්ත්ව පුද්ගල දෘෂ්ඨියෙන් නිදහස් විය නොහැක. ඔහු සාන්ත ගමනින් වඩින බුදුන් දකී. ඔහු බුදුන් පසුපස ද එළවයි. නමුත් දැනුම නැමති කඩුව අතැතිව බුදුන්ට

ළඟාවිය නොහැක. ඔහු හති වැටී අතර මග නතර වෙයි. බුදුන්ගේ එක් වචනයකින් තම අතැති කඩුව බිම වැටෙයි. බුදුන් දැක බුද්ධ වචනය අසා අත ඇති කඩුව බිම තැබීමත් සමග අංගුලිමාල මරණයද කරෙන් බිම තබයි. පසුව රහත් වූ අංගුලිමාල ආර්ය මාර්ගයට පැමිණි පසු සතෙක් දුටුවේත් නැත. සතෙක් මැරුවේත් නැත. එය අංගුලිමාල පිරිතයි. ඔහු දහසක් වූ ධර්ම මරා ආර්ය මාර්ගයට පැමිණියේ ය.

තක්සලාවෙන් පිටවන අංගුලිමාල ආර්ය මාර්ගයට පැමිණෙන්නේ තණ්හාව නැමති ආචාර්යතුමාගේ ගුරු සිත රිදවීමෙනි. මෙම ධර්මය බාහිරින් ගත්විටද ගැලපෙයි. ගැල් පන්සියක බඩු පටවාගෙන වෙළදාමේ යන්නට ධර්ම කියා දුන් තක්සලාවේ ආචාර්යතුමා කායික වීර්යය, මානසික වීර්යය නැමති ගොන් බාන ගැලෙන් ලිහා දමා උන් නිදහස් කර හරිනවාට කැමති නැත. අවුරුදු හයක් දුෂ්කර ක්‍රියා කළ සිදුහත් තව්සා සියලු ගුරුවරුන් හැර ගියේ ගුරු සිත රිදවීමෙනි. ගුරුසිත රිදවූ සිදුහත් තවුසා අවසානයේ බුදු විය. මෙම ලිපිය කියවන ඔබ අවුරුදු කීයක් දුෂ්කර ක්‍රියා කළා දැයි මම නොදනිමි. අනෙක් අතට තක්සලාවේ උගන්වන ද්විත්වයට අයත් සාපේක්ෂ ධර්ම නිසා ලෝකයේ යුද කෝලාහල වලින් අඩුවක් නැත. උදාහරණයක් ලෙස 'ඔබ නිර්දනයෙක් යයි ද අනෙකා දනපතියෙක්' යැයි ද තක්සලාවේ ආචාර්ය තුමා උගන්වයි. එතැනින් නොනැවතී දනපතියා භංග කරන්නට ද උගන්වයි. නිර්දනයාත් දනපතියාත් තමන්ගේ මනසින් සාදා ගත්තක් බව නොදන්නා කඩුව අතැති අහිංසකයෝ දනපතියා විනාශ කර ධනය පැහැර ගන්නට ගොස් තමාම විනාශ කර ගනිති. දනපතියාට ද්වේශ කරන ඔවුහු කිසිම දිනක දනයෙන් සම්පූර්ණ නොවෙති. දිසාපාමොක් ආචාර්ය තුමා 'ඔබ සුළු ජාතියේ යයි ද අනෙකා මහා ජාතියේ යයි' ද උගන්වා ඇති බැවින් මහා ජාතියට ද්වේෂ කරයි. මහා ජාතිය විනාශ කරන්නට ගොස් තමන්ම විනාශ කරගනි. මහා ජාතියක් හෝ සුළු ජාතියක් විශ්වයේ නොමැති බව දකින තෙක් තක්සලාවෙන් පිටවන කුමාරවරු එකිනෙකා මරාගනිති.

මෙම මරා ගැනීම නවතින්නේ දැනුම නැමති කඩුව අතහැර බුදුන්ට කිට්ටු වීමෙන් පමණි. නමුත් වර්තමානයේ ජීවත් වන බොහෝ දෙනෙක් කඩුව අමෝරාගෙන මරණය හිසමත තබාගෙනම බුදුන් පසුපස හඹා යයි. හතිවැටුණද ඔවුන්ගේ ගමනෙහි නතර වීමක් නම් නැත. මොවුහු තවමත් ඇඟිලි දහස සම්පූර්ණ කර ගත නොහැකිව සංසාරයේ සැරිසරති. බුදුන් ට කිට්ටු වීමට නම් පළමුව කපන ලද ඇඟිලි වලින් මාලයක් සාදා කරේ දමා ගත යුතු ය (හිසෙහි ඇති ධර්මය කරට ගත යුතුය). දෙවනුව නතර විය යුතු ය (කායික වීර්යය හා මානසික වීර්යය අත්හළ යුතුය). මෙවැනි වූ අංගුලිමාල කෙනෙකුට බුදුන්ගේ එක් වචනයක් අසා තම අත ඇති දැනුම නැමති කඩුව බිම දමා බුදුන්ට ආසන්න විය හැක. එසේ නැතිව අසූහාරදහසක් ධර්මස්කන්ධය පිළිගත්ත ද බුදුන්ට කිට්ටු විය නොහැක. අහිංසකලා තක්සලාවට ඇතුළු නොකර අංගුලිමාලලා බිහි නොවූයේ නම් සත්‍ය දකින්නෝ ලෝකයට බිහිවන්නේ ද නැත. නමුත් ආචාර්ය තුමාගේ හොඳහිත තබාගෙන, තක්සලාවෙන් පිටවූ කුමාරවරු තවමත් ගැල් පන්සියයක බඩු පටවාගෙන වෙළදාමේ යති. බුදු දහම යනු තක්සලාවෙන් උපාධි ලබා ගැල්කරුවන් බිහිකරන ආගමක් හෝ විද්‍යාවක් හෝ දර්ශනයක් හෝ නොවේ.

සිත උපාදානය කරගත් යෝගාවචරයා තමන්ගේ යයි පිළිගත් සිත දියුණු කිරීමට විවිධ වූ භාවනා ක්‍රම අනුගමනය කරයි. සිතෙන් නිදහස් වූ සෝවාන් ලාභියාට දියුණු කරන්නට සිතක් නොමැති බැවින් භාවනාව අත්හරී.

**13**

# පංච උපාදානස්කන්ධය දැනුම සහ වසුරු කඳ

බුද්ධ කාලයේ බොහෝ පිරිස් සත්‍ය දුටුවේ, බුදුන් වහන්සේගෙන් වචන කීපයක් පමණක් ශ්‍රවණය කිරීමෙනි. ඔවුන් සත්‍ය දැකීමට කිසිම සීලයක් සමාදන් වූයේ නැත. සමාධියක පිහිටියේ නැත. සමථ හෝ විදර්ශනා හෝ භාවනා ක්‍රමයක් අනුගමනය කළේ ද නැත. ධර්මය පිළිගත්තේ ද නැත. ධර්මයට අනුව හැසිරුණේත් නැත.

බුදු සමයේ පළමු අවුරුදු 20 ක කාලයේදී බිහිවූ තරම් රහතන් වහන්සේ ලා ඊටපසු බිහි වූයේ නැත. එක්තරා ශ්‍රාවකයෙක් බුදුන් වහන්සේ ගෙන් මේ ගැන ප්‍රශ්න කළ විට බුදුන් වහන්සේගේ පිළිතුර වූයේ, දැන් මිනිසුන්ගේ බුදු දහම පිළිබඳ දැනුම වැඩි වී ඇති බවයි. බොහෝ කාලයක් ධර්මය අසා එම ධර්ම ධාරණය කිරීම මීට හේතුවයි. මහායාන ධර්මයක් වන බුද්ධ සූත්‍රයේ බුදුන් වහන්සේ හා සුභූති මහ රහතන් වහන්සේ අතර සංවාදයක් ගැන සදහන් වෙයි. එහිදී බුදුන් වහන්සේ ප්‍රශ්න කරන්නේ 'සුභූති, මම මෙපමණ කාලයක් මගේ ශ්‍රාවකයන්ට යම් ධර්මයක් දේශනා කර තිබේ ද?' යන්නයි. සුභූති මහරහතන් වහන්සේගේ පිළිතුර වූයේ 'මගේ ප්‍ර ඥාවට අනුව නම් ඔබ වහන්සේ මෙතෙක් කාලයක් කිසිම ධර්මයක් කිසිවකුට දේශනා කර නැත' යන්නයි. බුදුන් වහන්සේ තුන් වරක් සාදුකාර දී 'ඔබ නිවැරදි' යයි පැවසූ හ. බුදුන් වහන්සේගේ ධර්මය තක්සලාවෙන් ගැල් කරුවන් බිහිකරන ධර්මයක් නොවන බව මගේ 'ගැල්කරුවන් බිහිකරන තක්සලාව' නැමති ලිපියේ ද පැහැදිලි කර ඇත.

තක්සලාවෙන් ලබන අවබෝධය දැනුමට සාපේක්ෂ වෙයි.

දැනුම සෑම විටම වැරදි බැවින් සත්ත්වයා දැනුමෙන් සැමවිටම වැරදි අවබෝධයක් ලබයි. අවබෝධය නිවනට මග නොවෙයි. අවබෝධය දැනුමට සාපේක්ෂ බව පුංචි උදාරණයකින් පෙන්වමි. පාසල් යන අවධියේ තමන්ට වඩා බාල අය රැවටීමට ඔවුන්ගෙන් 'පුළුන් රාත්තලද යකඩ රාත්තලද වැඩියෙන් බර?' යයි ප්‍රශ්න කරයි. පුළුන් සැහැල්ලු බැවින් කුඩා ළමුයි එකවරම යකඩ රාත්තල වැඩියෙන් බරයයි කියති. නමුත් දෙවර්ගයම රාත්තල බැගින් ඇති නිසා දෙකම එකම බර යයි වැඩිමහල් දරුවෝ අවබෝධ කරගනිති. මෙම දරුවන් පරස්පර පිළිතුරු දෙන්නේ ඔවුන්ගේ දැනුමට අනුවය. නමුත් මෙම සියලු දරුවන්ගේ දැනුමත් අවබෝධයත් වැරදිය. උඩුකුරු තෙරපුම ගැන දැනුම ඇති අපොස සාමාන්‍ය පෙළට ඉගෙන ගන්නා දරුවෝ යකඩ හා පුළුන් මත වාතය මගින් උඩුකුරු තෙරපුමක් ඇති කරන බව දනිති (ජලය මත වස්තුවක් පාවෙන්නේ මෙම උඩුකුරු තෙරපුම නිසයි). පුළුන් ප්‍රමාණයෙන් 'පරිමාවෙන්' විශාල බැවින් පුළුන් මත යකඩයට සාපේක්ෂව වැඩි උඩුකුරු තෙරපුමක් ඇති කරයි. එම නිසා පුළුන් රාත්තලෙහි කිරනවාට වඩා වැඩි බරකින් යුත්තය. එමනිසා දරුවාගේ සාමාන්‍ය පෙළ අවබෝධයට අනුව පුළුන් රාත්තල යකඩ රාත්තලට වඩා බරින් වැඩිය.

ගුරුත්වාකර්ෂණය ගැන තවදුරටත් ඉගෙන ගන්නා විට කන්දක් මුදුනේ දී අඩු ගුරුත්වාකර්ෂණයක් ඇති නිසා, කන්ද මුදුනේ දී වස්තු සැහැල්ලු බැවින් රාත්තලකට වැඩි පදාර්ථ ප්‍රමාණයක් අවශ්‍ය බව දරුවා දැන ගනී. ඒ අනුව කන්ද මුදුනේදී බර කිරන ලද යකඩ රාත්තලෙහි කඳු පාමුල කිරන ලද පුළුන් රාත්තලට වඩා වැඩි පදාර්ථ ප්‍රමාණයක් ඇත. මෙම සියලුම අවබෝධයන්ට පදනම වන්නේ පදාර්ථ තිබෙනවා ය යන පිළිගැනීමයි. පදාර්ථයක් විශ්වයේ නැතිනම් පිළිතුර කුමක් වියහැකි ද? එම පිළිතුර සත්‍යය ද? පදාර්ථය නැතයි යන දැනුමද පිළිගැනීමකි.

බුදුන් වහන්සේ කිසිම ධර්මයක් දේශනා නොකළ නමුත් තක්සලාවේ ගුරුවරු 'බුදුන් වහන්සේ දේශනා කළ ධර්මය 'මේ යැයි' යම් ධර්මයක් දේශනා කරති. 'ඇත' යන්නත් 'නැත'

යන්නත් අන්ත දෙකකි. බාහිර වස්තු තියෙනවා යයි අපි පිළිගනිමු. එය එක් අන්තයකි. බාහිර වස්තුවක් නැතැයි කී විට එය තවත් අන්තයකි. දේවල් තිබෙනවාය, පුද්ගලයින් ඉන්නවාය යයි පිළිගැනීම දෘෂ්ඨියකි. දේවල් නැත, පුද්ගලයින් නැත යයි පිළිගැනීම ද තවත් දෘෂ්ඨියකි. සත්‍ය දැකීමට නම් මෙම සියලුම දෘෂ්ඨි වලින් නිදහස් විය යුතුය. ඔබ ඉදිරියේ කරත්තයක් ඇතැයි සිතන්න. මෙම කරත්තයේ රෝද, බෝන් ලීය ආදිය ගලවා ඉවත් කළ විට තවදුරටත් කරත්තයක් නැත. කරත්තය නැති වූවාට දැන් රෝද දෙකක් ඇත. රෝද දෙකෙහි ඇති පට්ටම් ගරාදි ගලවා ඉවත් කළ විට රෝදය නැත. නමුත් ගරාදි හා පට්ටම් ඇත. මෙම ලී ගරාදි ලිපේ දමා දැවූ විට ගරාදි නැත. නමුත් වාතයට එක් වූ කාබන්ඩයොක්සයිඩ් වායුව ඇත. මෙම වායුව ගස්කොළන් මගින් උරාගෙන ප්‍රභාසංස්ලේශණ ක්‍රියාවලියෙන් ගස් වර්ධනය වෙයි. දැන් කාබන්ඩයොක්සයිඩ් වායුව නැත, නමුත් ගස් ඇත. වඩුවා මෙම ගස් කපා එම ගස්වලින් කරත්තයක් සාදයි. දැන් ගස නැත, නමුත් කරත්තය ඇත. කරත්තයේ රෝද ඇඳි සහ පට්ටම් ගැලවූ පසු කරත්තය නැතයි යෝගාවචරයෝ පිළිගත්තද, තවම වඩුවා සිටින බැවින් වඩුවා නැවත කරත්තය සාදයි. වඩුවා සිටින තාක්කල් සංසාර චක්‍රයට අසු වී ඇති යෝගාවචරයාට ඉන් නිදහස් වීමක් නම් නැත.

ඕනෑම කුඩා සෛලයක හෝ අණුවක පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා යන ක්ෂුද්‍රාෂ්ටකයන්ගෙන් සමන්විත වී ඇති බව ත්‍රිපිටකධාරීහු පිළිගනිති. මෙම අෂ්ටකයන්ගෙන් පඨවි, ආපෝ, තේජෝ, වායෝ යනු මහා භූත වන අතර වර්ණ, ගන්ධ, රස, ඕජා යනු රූප ස්කන්ධ හතරකි (පස් වැන්න නම් ශබ්දයයි). ඇසෙන් වර්ණයද, කනෙන් ශබ්දයද, නාසයෙන් ගන්ධයද, දිවෙන් රසයද, ශරීරයෙන් ඕජාවද, ග්‍රහණය කරගන්නේ යයි අපි පිළිගන්නෙමු. රූප ස්කන්ධය පංච ස්කන්ධයේ පළමු වැන්නයි. තණ්හාව ආදී කෙලෙස් හේතුකොටගෙන රූප වේදනා සඤ්ඤා සංඛාර සහ විඥාන නැමති පංච ස්කන්ධය මිනිස් සත්ත්වයා විසින් උපාදානය කරයි. වර්ණ, ගන්ධ, රස, ඕජා යනු මහා භූත වල අන්තර්ගතයක් ද, පංච ස්කන්ධයේ අන්තර්ගතයක් ද, එම ධර්ම දෙකේම අන්තර්ගතයක්ද, එසේත් නැත්නම් එම ධර්ම

දෙකෙන් කිසිවක අන්තර්ගතයක් නොවේ ද, යන ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරක් නොලබා මෙම පටලවා ගත් ධර්ම වලින් නිදහස් නොවී සත්‍ය දැකිය නොහැකි ය.

පංච උපාදානස්කන්ධය ගැන බුදුන් වහන්සේ විවිධ අවස්ථා වලදී දේශනා කර ඇති ධර්ම ත්‍රිපිටකයේ සඳහන් වෙයි (මෙම ලියුම්කරු ත්‍රිපිටකය හදාරා හෝ පාලි භාෂාව ඉගෙනගෙන හෝ නැත). සාරාංශ කර කියනවා නම් පංච උපාදාන ස්කන්ධය දුකක් බව (සංඛිත්තේන පංච උපාදානස්කන්ධා දුක්ඛා) බුදුන් වහන්සේ දේශනා කර ඇත. මරණයට හේතුව ද, පංච ස්කන්ධය උපාදානය කිරීමයි. පංච උපාදානස්කන්ධය තමන් තුළ ඇති නාම පර්වතයක් බව තවත් අවස්ථාවක දී දේශනා කර ඇත.

පංච ස්කන්ධය රූප ධර්මයක් ද නැති නම් නාම 'අරූප' ධර්මයක් ද? ත්‍රිපිටකධාරීන් කල්පනා කරන්නේ රූප ස්කන්ධය රූප ධර්මයක් බවත් වේදනා සඤ්ඤා සංඛාර විඥාන යන ඉතිරි ස්කන්ධ අරූප ධර්ම බවයි. ත්‍රිපිටකධාරීන් බාහිර වර්ණ ගන්ධ ශබ්ද රස ස්පර්ශ ආදී රූප ඇති බව පිළිගනී. මහාභූත වලට මෙම පිළිගත් රූප ධර්ම ද එකතු කර ක්ෂුද්‍රාෂ්ටකයක් නිර්මාණය කරගෙන ඇත්තේ ද එබැවිනි. මෙම ක්ෂුද්‍රාෂ්ටකය ද තම මනසින් සාදාගත් මනංකල්පිතයක් පමණි. එයද තක්සලාවේ ධර්මයකි. රූප ස්කන්ධය ඇත්තේ තමන්ගෙන් බාහිර නම්, සත්‍ය දැකීමට අපට නිදහස් වීමට තවත් ඉතිරිව ඇත්තේ වේදනා සඤ්ඤා සංඛාර විඥාන යන චතුර් ස්කන්ධයන් පමණි. එය එසේනම් බුදුන් වහන්සේ 'සංඛිත්තේන පංච උපාදානස්කන්ධා දුක්ඛා' යයි දේශනා කළේ ඇයි?

'භෞතික විද්‍යාවේ අසත්‍ය පදනම හෙවත් මනසින් සාදාගත් ලෝකය' නැමති මගේ පළමු ලිපියෙන් සියලුම රූප බාහිර දක්නට නොමැති, තමන්ගේ මනසින් ම සාදාගත් ධර්ම බව මම පෙන්වා දුනිමි. මෙම ධර්ම තමන් තුළින්ම දැකිය යුතුය. දෘෂ්‍ය ආලෝකය වස්තුවක් මත පතනය වී එයින් කොටසක් පරාවර්තනය වී ඉන් ඉතා සුළු කිරණ ප්‍රමාණයක් ඇසේ කාචය හරහා ඇසට ඇතුළු වී

දෘෂ්ඨි විතානයේ ප්‍රතිබිම්භයක් සාදයි. දෘෂ්ඨි විතානයෙන් එහාට ආලෝක කිරණය ගමන් කරන්නේ නැත. ස්නායු දිගේ මොළයට ගමන් කරන්නේ කම්පනයක් පමණි. මෙම කම්පනය නිසා මොළයේ යම් තැනක ජීව ක්‍රියාවක් ඇති වේ. 'වර්ණය' යනු මෙම ජීව ක්‍රියාවේ ප්‍රතිඵලයකි. ඇස කරා ගමන් කරන දෘෂ්‍ය ආලෝකයේ කිසිම වර්ණයක් නැත. වර්ණය නිර්මාණය කරගන්නේ මොළයෙනි. එබැවින් එය අරූප ධර්මයකි. අපි බාහිර ඇති වර්ණයක් ඇසෙන් දකිනවා යයි පිළිගෙන මෙම වර්ණ රූපය බාහිර වස්තුවේ ඇතයි පිළිගන්නෙමු. එය මිනිස් සත්ත්වයාගේ මුළාවයි, අවිද්‍යාවයි. ආහාර දිව මත ස්පර්ෂ වන විට ආහාරයේ ඇති විවිධ රසායනික ද්‍රව්‍ය දිවේ ඇති රස අංකුර උත්ජේදනය කරයි. රස අංකුර වලට සම්බන්ධ වී ඇති ස්නායු මගින් මෙම උත්ජේදනය සඥාවක් ලෙස මොළය කරා ගමන් කර මොළයේ යම් ස්ථානයක යම් ජීව ක්‍රියාවක් ඇති කරයි. මෙම ක්‍රියාවලිය නිසා රස නැමති අරූප ධර්මය උපදී. 'රස' යනු මොළයේ උපදින අරූප ධර්ම විනා ආහාර වල රසක් තිබුනේ වත් මෙම රස, ස්නායු දිගේ මොළයට ගමන් කළේ වත් නැත. තක්සලාවේ ඉගෙන ගත් දැනුමෙන් මෙම සත්‍ය දකින්නට බැරි බැවින් බාහිර රසයක් ඇතැයි පිළිගනිති. ගන්ධයද ඕජාවද එසේමයි. බාහිර වස්තුවක්ද නැත, එහි වර්ණයක් ගන්ධයක් රසයක් හෝ ඕජා ද නැත. එමනිසා ක්‍ෂුද්‍රාෂ්ටකය යනු මුළාවකි. මුළාවෙන් යම් දවසක නිදහස් විය හැක. නමුත් 'රූපය' සත්‍යයක් නම් එයින් නිදහස් විය නොහැක. චින්තනයෙන් උපාදානය කළ රූප වේදනා සඥා සංඛාර විඥාන නැමති පංච ස්කන්ධයම අරූප ධර්මයකි.

පංච ස්කන්ධය හා පංච උපාදානස්කන්ධය යනු බුදුන්ගේ දහමක් හෝ වෙනත් බමුණු ධර්මයක් හෝ නොව. තමන් තුළ ඇති දහමකි. තමන් තුළ ඇති ධර්මය තමන්ම දකිනවා විනා බාහිර කෙනකුගෙන් අසා පිළිගැනීමෙන් සත්‍ය දකින්නට නොහැකිය. මෙම ධර්ම දැකීමට මානසික වීර්යයක් දැරීමට අවශ්‍යය ද නැත. සත්‍ය දුටු පසු ප්‍රඥාව පහල වන අතර ප්‍රඥාව සම්පූර්ණ වන ප්‍රමාණයට අනුව මෙම ධර්ම තමන් තුළින් ම පහළ වෙයි. ප්‍රඥාව පහළ වීමට පෙර කළ යුත්තේ ධර්ම තමන්ට හැකි පමණින් දකිනවා

මිස අවබෝධ කරගැනීම හෝ පිළිගැනීම හෝ නොවේ.

තක්සලාවේ විභාග සමත් කිරීමට පංච ස්කන්ධය හා පංච උපාදානස්කන්ධය වැනි ධර්ම ශිෂ්‍යයෝ ඉගෙන ගනිති. නමුත් තක්සලාවෙන් පිටවූ ඔවුන් මරණයෙන් නිදහස් වූයේ නැත. තමන් තුළම ඇති මෙම ධර්ම, තක්සලාවට නොගොස්, තමන් තුළින්ම දැක, ඔබට සසරින් එතෙර විය හැක. සුනීතගේ කතාන්දරය මෙයට හොඳම උදාහරණයයි. සුනීත තක්සලාවට ගියේ නැත. ඔහු කලේ කසළ ශෝධක රැකියාවයි. ඔහු වසුරු කද කරතබාගෙන තම රැකියාව කරගෙන ගියේ ය. තක්සලාවෙන් පිටවූ කුමාරවරු වසුරු කද රැගෙන යන සුනීතට ඔච්චම් කරති. උසුළු විහිළු කරති. කුමාරවරුන්ගේ සමච්චලයට පත්වන සුනීත කුමාරවරුන් ගැන මෙසේ සිතයි. 'මම වසුරු කද කර තබාගෙන යමි. වසුරු කද හිස තබාගෙන යන මේ කුමාරවරු (වසුරු කද කර තබාගෙන යන) මට සමච්චල් කරන්නේ ය. සුනීතට වසුරු කද ගැන හොඳ දැනීමක් තිබුණි. තර්කය හා විතර්කය ඔහු තුළ තිබුණි. සියලු පෘතග්ජනයෝ වසුරු කද හිස තබාගෙන යන්නෝ බව ඔහු දැනගෙන සිටියේ ය. සුනීත වසුරු කද කරට ගත්තේ ය. බුදුන් වහන්සේ මුණ ගැසෙන විට සුනීත සිටියේ වසුරු කද කර තබාගෙන ය. 'සුනීත ඔබ කැමති ද වසුරු කද බිම තබන්න' යයි බුදුන් වහන්සේ ඇසූ සැනින්ම සුනීත වසුරු කද බිම තැබුවේ ය. වසුරු කද බිම තැබූ සුනීත රහත් විය. මෙම වසුරු කද නම් කුමක් ද? එය අනෙකක් නොව පංච උපාදානස්කන්ධය හෙවත් පිළිගත් දැනුමයි. බුදුන් මුණ ගැසෙන විට සුනීත දැනුම නැමති වසුරු කද කරතබාගෙන සිටියේ ය. වර්තමානයේ සිටින සුනීතලා තවමත් වසුරු කද හිසමත තබාගෙනම යති. ඔවුහු පංච උපාදානස්කන්ධය දුකක් බව තක්සලාවෙන් ඉගෙන ගෙන ඇත. නමුත් මෙම පංචඋපාදාන ස්කන්ධය යනු තමන් පිළිගත් දැනුම බව නොදනිති. දැනුම නැමති 'වසුරු' වලට ඇල්හාලේ බත් යයි රැවටෙන බැවින්, දහසක් බුදුවරු මුණගැසුන ද බොහෝ දෙනෙක් වසුරු කද කරට ගෙන බිම තබන්නට සූදානම් නැත.

රහත් වූ පසු තවදුරටත් රැකියාවක් කරන්නේ නැති බැවින්

සුනීත රහතන් වහන්සේ කර මත තිබූ බාහිර වසුරු කද ද බිම තැබුවේ ය (බාහිර ඇසෙන් දකින මෙම වසුරු කද අප විසින් නිර්මාණය කරගත්තකි). කුඩා කාලයේ සිට ඉගෙන ගත් සියලුම දැනුම වසුරු ලෙස දකින බැවින් රහත් ඵලයේ දී පංච ස්කන්ධය උපාදානය කරන්නේ නැත.

තක්සලාවට නොගිය සුනීත තුළ පංච ස්කන්ධයවත් පංච උපාදානස්කන්ධයවත් වචන වලින් ඉගෙන ඒ පිළිබඳ දැනුමක් තිබුණේ නැත. නමුත් ඇස කණ නාසය දිව ශරීරය නම් වූ පංච ඉන්ද්‍රියන් පිටතට යොමුකර ගොඩනගාගත් මෙම පංච උපාදානස්කන්ධය හෙවත් දැනුම 'වසුරු' බව ඔහු දැනගෙන සිටියේ ය. පංච උපාදානස්කන්ධය ගැන නිබන්ධන ලියා තක්සලාවෙන් උපාධි සමත් වූවෝ පංච උපාදානස්කන්ධය වසුරු බව නොදැන, (ඇල් හාලේ බත් යයි සිතා) තවමත් එම ධර්ම හිසමත තබාගෙනම යති.

---

ලාභය අලාභය ආදී අෂ්ඨලෝක ධර්ම සත්‍ය යයි පිළිගත් භාවනා වඩන පෘතග්ජන යෝගාවචරයා 'මම ලාභය නිසා සතුටු නොවෙම්වා, අලාභය නිසා දුක් නොවෙම්වා' ආදී වශයෙන් මෙනෙහි කරමින් උපේක්ෂාව පුරුදු පුහුණු කරයි. ලාභය හා අලාභය යනු තම මනසින් නිර්මාණය කරගත් මනංකල්පිත වූ ධර්ම බව දකින ප්‍රඥාවන්තයා ලාභයෙන් ද අලාභයෙන් ද නිදහස් වෙයි. උපේක්ෂාවෙන් ද නිදහස් වෙයි.

**14**

# අනිත්‍ය දුක්ඛ අනාත්ම

සියලුම ආගමික ගුරුවරු ධර්ම ප්‍රචාරණයට පෙර තම ගුරුවරුන්ගෙන් ද, බයිබලය ත්‍රිපිටකය ආදී ධර්ම ග්‍රන්ථ පරිශීලනයෙන් ද, ධර්මය ඉගෙන ගනිති. යම් පමණකට ධර්මය ඉගෙන ගත් පසු එම ධර්ම ග්‍රන්ථ ද පරිශීලනය කරමින් තමන් ඉගෙන ගත් ධර්මය අන් අයට ද උගන්වති. නමුත් බුදු දහම එසේ නොවෙයි. තමන් තුළ පැන නගින ප්‍රශ්න වලට පිළිතුරු සොයා බුදුන් වහන්සේ හමුවට යන ප්‍රඥාවන්තයා බුදුන්ගේ පිළිතුරෙන් සත්‍ය දකී. මෙසේ සත්‍ය දුටු රහතන් වහන්සේලා එකල පහළ වූහ. රහතන් වහන්සේලා බුදුන් වහන්සේ ගෙන් ධර්මය ඉගෙන ගත්තේ නැත. බුදුන් වහන්සේලාත් රහතන් වහන්සේලාත් මෝහය නැමති ගඟෙන් එතෙර වූ විට, ධර්මය නැමති පහුර තොටුපලේ තබා යන බැවින්, ඉගෙන ගන්නට හෝ දේශනා කරන්නට ධර්මයක් එතුමන්ලා ළඟ නැත. බුදු දහම යනු ඉගෙන ගන්නා හෝ පිළිපදින හෝ ධර්මයක් නොවන බව නොදන්නා සත්‍ය ගවේශකයෝ ගුරුන් සොයා ගොස් ධර්ම ඉගෙන ගනිති. එම ධර්ම පිළිගෙන, අනුගමනය කර, ලෞකික ලෝකයේ සමාදානයෙන් ජීවත් වී මිය යති. නමුත් මරණයෙන් එතෙර නොවෙති.

අනිත්‍ය දුක්ඛ අනාත්ම භාවනාවක් ලෙස මෙනෙහි කිරීමට පෙර අනිත්‍ය දුක්ඛ අනාත්ම යනු කුමක් දැයි යෝගාවචරයා තක්සලාවේ ගුරුතුමාගෙන් ඉගෙන ගනී. ශබ්දකෝෂයෙන් වචනයක තේරුම සොයන්නාක් මෙන් අනිත්‍යය දුක්ඛ අනාත්ම පැහැදිළි කරගැනීමට යම් කෙනෙක් පරිහරණය කරන්නේත් වචනයි. එම වචන ද පැහැදිළි කර තේරුම් කර දෙන්නේ වෙනත් වචන වලිනි. අවසන මෙම සියලුම තේරුම් ද කුඩා කාලයේ සිට අනුන්ගෙන් අසා දැනගත් වචන සමූහයක එකතුවක් පමණි. මෙම අනුන්ගෙන් අසා ධර්ම ඉගෙන ගැනීමේ ක්‍රියාවලියට 'ධර්ම අවබෝධය' යයි අපි කියමු. යම් කෙනෙක් ධර්මාවබෝධය ලබන්නේ දැනුමෙනි. දැනුමේ

පදනම පංච උපාදාන ස්කන්ධයයි. එමනිසා සත්‍ය අවබෝධය හා නිවන් අවබෝධය ද ලෞකික ධර්ම වෙයි. මෙම ලෞකික ධර්ම ඉක්මවන්නේ සත්‍ය දැකීමෙන් (නිවන් දැකීමෙන්) පමණි.

යෝගාවචරයා අනිත්‍ය දුක්ඛ අනාත්ම මෙනෙහි කරමින් විදර්ශනාවට ගන්නේ තමන් දුටු අනිත්‍යයක් හෝ දුකක් හෝ අනාත්මයක් ගැන නොව තමන් විසින් ගුරුවරයාගෙන් අසා පිළිගත් අනිත්‍ය දුක්ඛ අනාත්මයකි. මෙය ගුරුවරයාට සාපේක්ෂ වන අතර සියලුම සාපේක්ෂ ධර්ම පංච උපාදාන ස්කන්ධයෙන් ගොඩනගා ගත් ලෞකික ධර්ම වෙයි. ලෝකෝත්තර සුවය ලබන්නට කැමැත්තෝ සියලුම සාපේක්ෂ ධර්ම වලින් නිදහස් විය යුතු ය. දැන් අපි මෙම අනිත්‍ය දුක්ඛ අනාත්ම ධර්ම එකිනෙක ගෙන සත්‍ය ගවේෂණයක යෙදෙමු.

**අනිත්‍ය**

බොහෝ යෝගාවචරයෝ තමන්ගේ ශරීරයේ හෝ බාහිර වස්තු වල අනිත්‍ය මෙනෙහි කරති. කෙස් ගස් වල ද (කේෂා) දත් වලද (දන්තා) ඇට වල ද අනිත්‍ය මෙනෙහි කරති. තරුණ කාලයේ නීල වර්ණව තිබූ තමන්ගේ කෙස් කළඹ වර්තමානයේ සුදු පැහැ වී ඇති බව දැක අනිත්‍ය සිහි කරති. අතීතයේ තිබූ සුදුවන් දත්පෙළ දුර්වර්ණ වී තිබෙනු දැක අනිත්‍ය සිහි කරති. තමන් ඉදිරියේ තබා ඇති ඇට සැකිල්ලක් මෙනෙහි කර තමන්ට වන්නේත් මේ ටිකම නොවේ දැයි අනිත්‍ය මෙනෙහි කරති. නමුත් මේ කිසිවකු අනිත්‍ය දුටුවේ නැත. මරණයෙන් නිදහස් වූයේත් නැත. සුදුකෙස් කළු වූයේත් නැත. මෙම කිසිම යෝගාවචරයෙක් නොදකින ලද කරුණක් නම් කෙස් කළඹෙහි වර්ණයත් දත් පෙළේ වර්ණයත් තමන් විසින් ගොඩනගාගත් පංච උපාදාන ස්කන්ධයේ රූප ස්කන්ධය බවයි. යෝගාවචරයා මෙම රූපය බාහිර ඇතයි පිළිගත්තද වර්ණ රූපය තමන් විසින්ම තම මනසේ ම නිර්මාණය කරගත්තකි. යෝගාවචරයා මෙනෙහි කරන්නේ තමන් නිර්මාණය කරගත් කෙස් දත් ආදියේ අනිත්‍යයයි. මෙම අනිත්‍ය සත්‍යයක් ද?

අනිත්‍ය යනු ලෞකික වූත් චිත්ත චෛතසික වූත්

ධර්මයකි. චින්තනයෙන් නිර්මාණය කරගත්තකි. මිනිස් සත්ත්වයා තමන්ගේ ඉන්ද්‍රියන් බාහිරට යොමු කර වර්ණ ගන්ධ රස ශබ්ද හා ස්පර්ශ රූප බාහිර ඇතැයි සිතා බාහිර රූපයක් පිළිගනිති. මෙම රූපය යනු චිත්ත චෛතසිකයක්ම බැවින් රූපයේ අනිත්‍ය යනු චින්තනයේම අනිත්‍යයයි. මොහොතකට පෙර බිරින්දෑගේ හිසෙහි තිබූ කෙස්ගස යනු ස්වාමිපුරුෂයා විසින් සිප ගන්නා වූ වස්තුවකි. මොහොතකට පසු පුරුෂයාගේ බත් පිගානෙහි ඇති එම කෙස් ගසම දැන් පිළිකුල් සහගත වස්තුවකි. මොහොතක කාලයකදී වෙනස් වූයේ කෙස් ගස ද නැතිනම් ස්වාමි පුරුෂයාගේ මනස ද? ඔබ මෙතෙක් කල් දුටුවේ බාහිර ඇති කෙස් ගසේ අනිත්‍ය මිස මනසේ අනිත්‍ය නොවේ.

බාහිර ඇති කෙනෙක් දෙස ඇඟිල්ල යොමුකර එයා දැන් වෙනස් වෙලා යයි අපි කියන්නෙමු. මෙම වෙනස් වීම ඇත්තේ බාහිර පුද්ගලයා තුළ ද නැතිනම් ඔබ තුළ ද? මොහොතකට පෙර ඔබ ඉතාමත් සැප පුටුවක වාඩි විය. දැන් ඔබ එහාට මෙහාට ඇඹරෙයි. දැන් පුටුව සැප නැත. වෙනස් වූයේ පුටුවද ඔබේ මනසද? බාහිර ඇති සැප පුටුවද මනසේ නිර්මාණයකි. මනස වෙනස් වන විට සැප පුටුවද වෙනස් වෙයි. ඔබ කුඩා කාලයේ ඔබේ බත් පතෙහි බත් එළවළු මාළු ආදිය තිබෙන්නට ඇත. නමුත් කාබෝහයිඩ්‍රේට් ප්‍රෝටීන් තිබුණේ නැත. ඔබ තරුණ කාලයේ ආහාරයට ගත් බත් පතෙහි කාබෝහයිඩ්‍රේට් ප්‍රෝටීන් තිබුණ ද කොලෙස්ටෙරෝල් තිබුණේ නැත. වර්ථමානයේ දී බත් පතෙහි කොලෙස්ටෙරෝල් ද ඇත. නිත්‍ය නොවූයේ බත් පත ද නැතිනම් ඔබේ මනස ද? සෑම ක්ෂණයක් පාසා වෙනස් වන්නේ කුමක් ද? බාහිර ඇතැයි පිළිගත් වස්තුව හෝ පුද්ගලයා ද නැතිනම් තමන් පිළිගත් ධර්ම ද? පංච ස්කන්ධය උපාදානය කරන තරමට ලෝකය වෙනස් වෙයි. අනිත්‍ය යනු චිත්ත චෛතසික ධර්මයකි. ධර්ම ඉක්මවා ගිය විට එතැන අනිත්‍යයක් නැත. නිත්‍ය බවක් ද නැත. නිත්‍ය හා අනිත්‍ය යනු ලෞකික ධර්ම තුළ ඇති අන්ත දෙකකි. සත්‍යයෙහි මෙවැනි අන්ත නැත. බාහිර රූප වල අනිත්‍ය මෙනෙහි කරන තරමට ලෞකික ධර්ම වලටත් පංච උපාදානස්කන්ධයටත් වැඩි වැඩියෙන් ඇලෙයි. බුදුන් වහන්සේ දේශනා කළේ

'අනිච්චාවත සංඛාරා' යනුවෙනි. 'අනිච්චාවත රූපං' යනුවෙන් දේශනා කළේ නැත. මෙම සංස්කාරයෝ මනසේම පිළිගැනීමකි. කෙස් ගසේ අනිත්‍ය සොයන්නෝ මෙය දැකිය යුතු ය.

## දුක්ඛ

බුද්ධ දේශනාවට අනුව ජාති ජරා ව්‍යාධි මරණ මිනිස් සත්ත්වයාට දුකකි. රූප වේදනා සඥා සංඛාර විඥාන නම් වූ ස්කන්ධයන්ගේ පහල වීමත්, ඇස කණ නාසය දිව ශරීරය නම් වූ ආයතන වල ප්‍රතිලාභයත්, ජාති නම් වෙයි. ජරා ව්‍යාධි මරණ යනු මිනිස් සත්ත්වයා පිළිගත් ධර්ම වෙයි. මෙම සියලුම ධර්ම වලට හේතුව පංච උපාදාන ස්කන්ධයයි.

දුකට හේතුව තණ්හාව බව දන්නා යෝගාවචරයා කායික හා මානසික වීර්යය යොදා තණ්හාව නැති කිරීමට උත්සාහ කරයි. කායික හා මානසික වීර්යයෙන් තණ්හාව යම් තරමකට යටපත් කළ හැකි වුවද, තණ්හාව මුලිනුපුටා දැමිය නොහැකිය. මානසික වීර්යයෙන් තණ්හාව නැති කිරීමේ ක්‍රියාව මනසේ ප්‍රයෝගයකි. මනසේ මෙම ප්‍රයෝගය නිසා තණ්හාව කල්ප ගණනක් වැජඹෙයි. එමනිසා මානසික වීර්යයෙන් තණ්හාව යටපත් කිරීමට දරන උත්සාහය තණ්හාවෙන් නිදහස් වීමට බාධාවකි. තණ්හාවට හේතුව නැතිකරන තෙක් තණ්හාවෙන් නිදහස් විය නොහැකිය. තණ්හාවට හේතුව වේදනාවයි (වේදනා පච්චයා තණ්හා). වේදනාවට හේතුව ඵස්සයයි (ඵස්ස පච්චයා වේදනා). අවසානයේ දී බැලූ විට මෙම සියලුම චිත්ත චෛතසික ධර්ම වලට හේතුව අවිද්‍යාවයි. අවාසනාවකට මෙන් බොහෝ සත්‍ය ගවේශකයෝ සත්‍ය සොයන්නේ අවිද්‍යාවෙන් ම නිර්මාණය කරගත් සංස්කාර ධර්මත්, වීර්යයත්, පදනම් කරගෙන ය. දුකට හේතුව යනු තමන් පිළිගත් ධර්ම 'පංච උපාදාන ස්කන්ධය' බව දකින තෙක් දුකෙන් නිදහස් වීමට නොහැකි බව මම කියමි. මිනිසාට විපරිනාමය (වෙනස් වීම) දුකකි. විපරිනාමයට හේතුව තමන් පිළිගත් ධර්මයයි. ජරාව හා මරණය යනු පිළිගැනීමකි.

පංචස්කන්ධය උපාදානය කිරීම දුකක් වන බැවින් 'දුක' යනු

සත්‍යයක් නොවේ. එමනිසා යම්කෙනෙකුට පංච උපාදාන ස්කන්ධය අත්හැර දුකෙන් නිදහස් විය හැක. ඒ සඳහා මාර්ගයක් ඇත්නම් එම මාර්ගය ලෞකික ධර්ම ඉක්මවා ගිය මාර්ගයක් විය යුතු ය. මෙම මාර්ගය ක්‍රියා මාර්ගයක් නොවිය යුතුය. මම එසේ කියන්නේ ඇයි? ක්‍රියාව සංස්ඛාර ධර්මයකි. සංස්ඛාර ධර්ම යනු සත්‍ය දැකීම සදහා අප විසින් අතහැරිය යුතු පංච උපාදාන ස්කන්ධයේ එක් උපාදාන ස්කන්ධයකි. ශීලය රැකීමට යෝගාවචරයා කායික හා මානසික වීර්යය යොදයි. එනම් එය ක්‍රියාමාර්ගයකි. එමනිසා ශීලය යනු සංස්ඛාර ධර්මයකි. මෙම ශීලය නැමති ලෞකික ධර්මය පෙරටු කොටගෙන සමාධිය වඩා ලොකෝත්තර ධර්මයක් වූ ප්‍රඥාව වැඩිය නොහැකිය. සංස්ඛාර ධර්ම කාලයට අසු වී ඇත (නමුත් බුදු දහම අකාලිකය). බාහිර ශීලය හා සමාධිය ලෞකික ධර්ම වෙයි. මෙම ලෞකික ධර්ම වලින් සත්‍ය සොයන යෝගාවචරයෝ ලෞකික සමාධියෙන් නතර වෙති.

ප්‍රඥාව යනු 'බුද්ධ' මිස අනෙකක් නොවෙයි. යම් කෙනෙක් ප්‍රඥාව දකීද, කාලපරතරයකින් තොරවම ශීලයත් සමාධියත් පිහිටයි. එය කායික හා මානසික වීර්යයකින් ලබා ගන්නා දෙයක් නොවෙයි. මෙම ප්‍රඥාව දකින්නේ සියලුම ධර්ම ඉක්ම වීමෙන් පමණි.

බුදුදහමට අනුව, පළමුව කළ යුත්තේ ප්‍රඥාව (සත්‍ය) දැකීමයි. සියලුම ලෞකික දර්ම ඉක්ම වීමෙන් ප්‍රඥාව දකී. ප්‍රඥාව, සංස්ඛාර ධර්මයෝ ද විඥානය ද ඉක්මවා ඇත. එම නිසා අපට ලෞකික ප්‍රඥාවක් ගැන කතා කිරීමට නොහැකිය. යම් කෙනෙක් ප්‍රඥාව දකී ද, එම දකින ප්‍රමාණයට නිත්‍ය ශීලයත් නිත්‍ය සමාධියත් වීර්යයකින් තොරව තමන් තුළ පිහිටයි. බාහිර ශීලයෙන් සමාධිය වඩන ලද නැන්දම්මාගේ සමාධිය ලේලිය සමග පොර අල්ලන විට බිදෙයි. ප්‍රඥාවෙන් සමාධිගත වූ නැන්දම්මා ද ලේලිය සමග පොර අල්ලයි. නමුත් සමාධිය බිදෙන්නේ නැත.

**අනාත්ම**

බුදුන් කාලයේ පහළ වී සිටි ආත්ම වාදීන් ද අනාත්ම වාදීන් ද බුදුන් හමුවට පැමිණ තමන්ගේ වාද ස්ථිර කරගැනීමට බුදුන්ගෙන් ප්‍රශ්න නැගූ හ. අනාත්ම වාදයත් ආත්ම වාදයත් යනු සත්ත්ව පුද්ගල ධර්ම වල ඇති අන්ත දෙකකි. එක් කොටසක් එක් අන්තයක් පිළිගනිති. තව කොටසක් අනෙක් අන්තය පිළිගනිති. සියලුම දෘෂ්ඨී වලින් නිදහස් ව සත්‍ය දුටුවිට එතැන ආත්මයක් හෝ අනාත්මයක් නැත. පංච ඉන්ද්‍රියන්ගේ ක්‍රියාකාරිත්වය ආත්ම හෝ අනාත්ම වන්නේ නැත. සත්ත්වයෙක් නැති තැන ආත්මයක් හෝ අනාත්මයක් ගැන කතා කරන්නට දෙයක් නැත. අනිත්‍ය දුක්ඛ අනාත්ම මෙනෙහි කරමින් භාවනා කරන, මෙම සත්‍ය ගවේශකයෝම යම්කෙනෙක් මියගිය විට මියගිය තැනැත්තාගේ ආත්මයට ද පින් දෙති. ලෞකික ධර්ම වල ඇති ආශ්චර්යය එයයි.

බුදු දහම සියලු අන්ත වලින් තොර වූ දැනුම ඉක්මවා ගිය දහමකි. ආත්ම වාද හා අනාත්ම වාද ආදී, තක්සලාවෙන් ඉගෙන ගත් 'දහසක්' ධර්ම මරා දමන තෙක්, 'අනාත්මය මෙනෙහි කිරීමෙන්' ආත්මයෙන් නිදහස් විය නොහැකිය. උදාහරණයකින් පෙන්වනවා නම් ජාතිය ගැන හෝ කුලය ගැන හෝ ඉගෙන ගත් යම් වැඩිහිටියෙක්, 'මම ජාති වාදියෙක් හෝ කුල වාදියෙක් නොවේ' යයි කීවොත් එය බොරුවකි. ජාතිය ගැනත් කුලය ගැනත් ඉගෙන ගත් ඕනෑම පුද්ගලයකු තුළ අඩු වැඩි වශයෙන් ජාතිවාදයත් කුලවාදයත් ඇත. ඉගෙන ගත් පසු, පෘතග්ජන පුද්ගලයා ට ජාතියෙන් ද. කුලයෙන් ද, නිදහස් විය නොහැක. ආත්මය ගැන ඉගෙන ගත් කෙනෙකුට ද 'අනාත්මය' මෙනෙහි කරන තරමට ආත්මයම මතුව එයි. කොතරම් අනාත්මය සිහි කළද, තමන්ගේ 'ආත්මය' සුවපත් කරගැනීමට විවිධ පුද පූජා වන්දනා මාන ක්‍රම මිනිස් සත්ත්වයා අනුගමනය කරන්නේ එබැවිනි. මෙම ජාති කුල ආදී ද්විත්වයට අයත් ධර්ම ඉගෙනීම නිසා, පෘතග්ජන පුද්ගලයෝ ගහ ගනිති. මරා ගනිති. බුද්ධිමතුන් විසින් ඉහළින් පිළිගන්නා තක්සලාවේ උගන්වන ධර්ම වල ඇති එක් භයානක පැත්තක් නම් එයයි.

**කතෘ සටහනඃ** මගේ ලිපි වල බොහෝ තැන්හි 'බුදුන් වහන්සේලා

සහ රහතන් වහන්සේලා ළඟ දේශනා කරන්නට ධර්මයක් නැතයි ද උන්වහන්සේලා ධර්මය දේශනා කරන්නේ නැතයි' ද යනුවෙන් සඳහන් කර ඇත. නමුත් මෙම ධර්ම දකින්නට හැකි වන්නේ සත්‍ය දුටු කෙනෙකුට පමණි. එම නිසා මෙම ලිපි කියවන බොහෝ පෘතග්ජනයෝ මා විසින් විවෘත කරන ධර්මයට පමණක් නොව මට ද එරෙහි වන්නාහ. මගේ 'අනිත්‍ය දුක්ඛ අනාත්ම' ලිපිය කියවා එහි සඳහන් වූ 'රහතන් වහන්සේ ලා බුදුන් වහන්සේ ගෙන් ධර්මය ඉගෙන ගත්තේ නැත. බුදුන් වහන්සේලාත් රහතන් වහන්සේලාත් මෝහය නැමති ගඟෙන් එතෙර වූ විට, ධර්මය නැමති පහුර තොටුපලේ තබා යන බැවින්, ඉගෙන ගන්නට හෝ දේශනා කරන්නට ධර්මයක් එතුමන්ලා ළඟ නැත.' යන පාඨයට එරෙහි වූ එක් පාඨක මහත්මයෙක් මට අනතුරු අඟවා තිබුණේ බුදු දහම විකෘති කරන මට යහතින් ජීවත් වීමට ඉඩ නොදෙන බවයි. මෙම පාඨයෙහි සඳහන් ධර්මය මහායාන සූත්‍රයක් වන 'බුද්ධ සූත්‍රයේ' හෙවත් 'ප්‍රඥා සූත්‍රයේ' ඇති බුදුන් වහන්සේගේ ධර්මයක් බව බොහෝ බෞද්ධ පඬිවරු නොදනිති.

බුදුන් වහන්නේ යම් කෙනෙක් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දුන් සේක. ප්‍රශ්නය ඇසූ තැනැත්තා එම ප්‍රශ්නයෙන් සත්‍ය දකී. සත්‍ය දකින ලද ඔහු බුදුන් වහන්සේ දේශනා කළ කිසිම ධර්මයක් පිළිගත්තේ නැත, අනුගමනය කළේ ද නැත. බුදුන් වහන්සේ ගේ ධර්මය වචන වලින් විස්තර කළ නොහැකිය. නමුත් වචන වලින් විස්තර නොකර කිසිම ධර්මයක් දේශනා කළ නොහැකිය. සත්‍ය දැකීම යනු ඒහි පස්සිකෝ ගුණයකි. එය අනුගමනය කිරීමක් හෝ පිළිගැනීමක් හෝ නොවෙයි. 'බුදුන් වහන්සේ ධර්මය දේශනා කළේ නැතයි' යන්නෙහි තේරුම 'බුදුන් වහන්සේ නිශ්ශබ්දව සිටියා' යන්න නොවෙයි.

15

# පංච උපාදානස්කන්ධය සහ විදර්ශනාව

පංච ස්කන්ධය හා පංච උපාදානස්කන්ධය ආදී ධර්ම බමුණන්ගෙන් ඉගෙන ගත් තරුණයෝ එම ධර්ම කෙරෙහි සැක පහළ වී බුදුන් කරා පැමිණ ඒ ගැන ප්‍රශ්න කරති. බුදුන් වහන්සේ ඔවුනට පිළිතුරු දෙති. මෙම 'ප්‍රශ්න' 'පිළිතුරු' සංවාදයෙන් තරුණයෝ සත්‍ය දකිති. නමුත් බුදුන් වහන්සේගේ පිළිතුරු අසා ප්‍රඥාව පහළ නොවූ ලෞකික ධර්ම නොඉක්මවූ කෙනෙකු, බමුණු ධර්ම වලත් බුදුන් වහන්සේගේ පිළිතුරු වලත් වෙනසක් නොදකිති. මෙහි ප්‍රතිඵලයක් ලෙස, බුදු දහම විලෝපනය වූ පසු කාලයාගේ ඇවෑමෙන් 'බමුණු ධර්ම' බුදු දහම යයි පිළිගනිති. පිළිගැනීමකින් තොරව යම් ධර්මයක් දැකිය හැකි නම්, යම් කෙනෙකුට විලෝපනය වූ සත්‍ය දහම නැවත විවෘත කරගත හැක. මගේ ලිපි, ඒ සදහා මගපෙන්වීමක් පමණි.

රූප වේදනා සඥා සංඛාර විඥාන යනුවෙන් ස්කන්ධ පහකි. වර්ණ ශබ්ද ගන්ධ රස ස්පර්ශ යනුවෙන් රූප ස්කන්ධ පහකි. මේ ආකාරටම වේදනා ස්කන්ධ පහකි. සඥා සංඛාර විඥාන ද ස්කන්ධ පහ බැගින් ඇත. වර්ණ රූපය යනු කුමක් ද? මෙතැන රූපය වන්නේ වර්ණයයි. මෙම වර්ණය බාහිර වස්තුවල නැති බවත්, එය තමන් තුළ මනසේ සාදාගන්නා වර්ණයක් බවත්, මගේ මීට පෙර ලිපිවලින් පෙන්වා දී ඇත. වර්ණ රූපය යනු ඇසවත්, ඇසට පෙනෙන දෙයවත් නොව ඇසත් ආලෝක කිරණයත් මනත් සම්බන්ධ වීමෙන් නිර්මාණය වන නාම රූපයකි. ශබ්ද රූපය ගත් විට ද එතැන රූපය වන්නේ ශබ්දයයි. බාහිර වස්තුවකින් පැන නගින්නේ ශබ්දයක් නොව කම්පනයකි. මෙම කම්පනය වාතය හරහා කන් බෙරය කරා ගමන් කර කන්බෙරය ද කම්පනය වෙයි. කම්පනයකට සංඛ්‍යාතයක් ඇත. මෙම කම්පන සංඛ්‍යාතය අපට ඇසෙන පරාසයේ ඇත්නම් කණේ සිට මොළය කරා ස්නායු දිගේ මෙම කම්පනය සඥාවක් ලෙස ගමන් කරයි. මොළයේ යම් තැනක

ඇති වන ජීව ක්‍රියාවලිය හේතුකොටගෙන ශබ්දය හට ගනී. රස රූපයද ගන්ධ රූපයද ස්පර්ෂ රූපයද මොළය තුලම හට ගනී. මෙම වර්ණ ශබ්ද රස ගන්ධ හා ස්පර්ෂ රූප යනු මනසෙහි හටගන්නක් බැවින් චිත්ත චෛතසික වෙයි. එම නිසා රූපය යනු නාම ධර්මයකි. පංච උපාදාන ස්කන්ධයම නාම පර්වතයකි.

හේතු ප්‍රත්‍ය ධර්මයක් වන පටිච්ච සමුප්පාදයේ 'විඥාන පච්චයා නාමරූප, නාමරූප පච්චයා සලායතන' යනුවෙන් නාමරූප ගැන සඳහන් වෙයි. හේතුඵල වශයෙන් ක්‍රියාත්මක වන අනෙක් ධර්ම වන අවිද්‍යා, සංඛාර, විඥාන, වේදනා, තණ්හා, උපාදාන, භව, ජාති යනු නාම ධර්ම වෙයි. පටිච්ච සමුප්පාදයෙන් අපට කියා දෙන්නේ තමන් තුළ සිදුවන්නා වූ චිත්ත චෛතසික ධර්මයක් මිස තමන්ගෙන් බාහිර වස්තුවල සිදුවන ධර්මයක් නොවේ. නාමරූපයන් හි 'රූපය' යනු නාම නොවන ධර්මයක් නම් පටිච්ච සමුප්පාදයේ එන හේතු ප්‍රත්‍ය දහම චිත්ත චෛතසික (නාම) ධර්මයක් වන්නේ කෙසේ ද?

වේදනාව යනු කුමක් ද? මනසෙහි ඇතිවන රූප ධර්මයට අනුරූප ව ස්නායු වල ක්‍රියාකාරීත්වයක් ඇති වෙයි. එය රූපයට ප ්‍රතික්‍රියා දැක්වීමකි. අලුත උපන් දරුවකුට මදුරුවෙක් දෂ්ඨ කළ විට දරුවා එයට ප්‍රතිචාරයක් දක්වයි. නමුත් දරුවාට තවම වේදනාවක් නැත. ප්‍රතිචාරය වේදනාව නොවෙයි. පරිගණක දැනුම උපයෝගී කරගෙන උෂ්ණත්වයට ප්‍රතිචාර දක්වන යම් උපාංගයක් නිර්මාණය කළ හැක. මෙවැනි උපාංගයකට ගිනි දැල්ලක් ආසන්න කළ විට උපාංගය ගිනි දැල්ලෙන් ඉවතට චලනය වෙයි. නමුත් උපාංගය සම්බන්ධ කර ඇති පරිගණකයට චින්තනයක් නැත. පංච ඉන්ද්‍රියන් 'මන' සමග ඇති සම්බන්ධය නොමැතිව වේදනාව ඇති නොවෙයි. මෙම වේදනාවෙන් යටපත්ව තිබූ තණ්හාව නැමති කෙලෙස් මතුවෙයි. පටිච්ච සමුප්පාදයේ 'වේදනා පච්චයා තණ්හා' යයි සඳහන් ව ඇත්තේ එබැවිනි. තණ්හාව නැමති කෙලෙස් මතුවන විට වේදනාව උපාදානය කරයි.

විවිධ වර්ණ රූප වලින් විවිධ වේදනා ඇති වෙයි. මේ

ආකාරයට විවිධ ශබ්ද රූප. ගන්ධ රූප, රස රූප හා ස්පර්ශ රූප වලින් ද විවිධ වේදනා ඇතිවෙයි. මෙම වේදනාවන් වෙන් වෙන්ව හඳුනා ගැනීමේ හැකියාව යනු සංඥාවයි. මෙම හැකියාව තිරිසන් සත්ත්වයාට ද ඇත.

දැන් අපි කුඩා දරුවා තුල සංස්බාර ධර්ම ගොඩ නැගෙන්නේ කෙසේ දැයි බලමු. සංඥා හෙවත් විවිධ වේදනාවන්හි වෙනස දරුවා විසින් හඳුනා ගැනීම නිසා ඔහු තුළ මෙම වේදනා කුමක් දැයි කුතුහලයක් උපදී. මේ කාලය වන විට දරුවා වැඩිහිටියන්ගෙන් ප්‍රශ්න කිරීමට ආරම්භ කරන අවධියයි. වර්ණ ගන්ධ රස ආදී රූප, මනසෙහිම ඇති වූ ධර්ම වුවත්, දරුවා වැඩිහිටියන්ගෙන් ඉගෙන ගන්නේ (රතුපාට මල, කාක්කාගේ හඬ, ආදී වශයෙන්) බාහිර ඇති රූපයි. මෙම වැරදි ඉගෙනීමත් සමග දරුවා තමන් තුළ සිදුවන හේතු ප්‍රත්‍ය නොදැක ඒ වෙනුවට බාහිර යම් දෙයක් ඇතයි පිළිගැනීමක් ඇති වෙයි. මෙය අවිද්‍යාවයි. අවිද්‍යාව නිසා ක්‍රම ක්‍රමයෙන් දරුවා තුළ සංස්බාර ධර්ම පහල වෙයි (අවිද්‍යා පච්චයා සංබාරා). දරුවා බාහිර ලෝකයක් නිර්මාණය කරගනී. මෙය දැනුමේ ආරම්භයයි. තණ්හාව නිසා සංස්බාර උපාදානය කරයි. මෙහි සංස්බාර නම් තමන් විසින්ම නිර්මාණය කරගත් ලෝකයයි. බොහෝ විට මෙය 'සංස්බාර ලෝකය' ලෙස හඳුන්වයි. මෙම ලෝකයෙහි තිබෙන සංස්බාර ධර්ම මොනවාද? කාලයත්, උඩයට ඇත ළඟ ආදී ද්විත්වයත්, හොඳනරක ආදී ක්‍රියාත් මෙම සංස්බාර ධර්ම වෙයි. රූප වේදනා සඥා යන ස්කන්ධ තුන උපාදානය කිරීමෙන් පමණක් ලෝකයක් නිර්මාණය වන්නේ නැත. ලෝකය නිර්මාණය වන්නේ අනුන්ගෙන් අසා දැනගැනීමෙනි (අවිද්‍යාවෙනි).

සංස්බාර වලින් විඥානය පහළ වෙයි (සංබාර පච්චයා විඥාන). විඥානය යනු කුමක් ද? සංස්බාර ධර්ම උපාදානය කිරීම නිසා මිනිසා අතීත වර්තමාන අනාගත කාලයට අසුවී ඇත. උඩයට හොඳනරක ආදී ද්විත්වයට අසු වී ඇත. මෙය විඥානයයි. විඥානය යනු කුමක්දැයි යන්නට දියහැකි තවත් කෙටි පිළිතුරක් නම්, අනුන්ගෙන් අසා ගත් දැනුම පිළිගැනීමයි. කුඩා ළමයකු තුළ ඇති

වන පංච උපාදානස්කන්ධය එතරම් ප්‍රබල නැත. වයසත් සමග. ධර්ම ඉගෙන ගන්නා විට පංච ස්කන්ධය වඩ වඩාත් ප්‍රබලව උපාදානය කරයි. මෙම ධර්ම නිසා මිනිසා සක්කාය දෘෂ්ඨී, විචිකිච්චා, සීල ව්‍රත ආදී බන්ධන දහයකින් බැඳෙයි. එමනිසා, ජරා මරණ ශෝක පරිදේව උපායාස (දැඩි වෙහෙස) නම් වූ ධර්ම මිනිස් සත්ත්වයාට උරුම වෙයි.

දරුවා තුල පංච උපාදානස්කන්ධය ගොඩනැගීමත්, දැනුම ගොඩ නැගීමත්, යනු දෙකක් නොව එකකි. මෙම ධර්ම දෙකටම හේතු වන්නේ අවිද්‍යාවයි. දැනුම මූලික වන ඕනෑම ධර්මයක් අවිද්‍යාවේ ම ඵලයකි. අපිට ඇති අවිද්‍යාව කුමක්ද යන්න දකින තෙක් කොතරම් ධර්ම ඉගෙන ගත්තද ලෞකික ලෝකයෙන් එතෙර විය නොහැක. අවිද්‍යාව නම් ඇත්ත ඇති සැටියෙන් නොදැකීම යයි අපි හඳුන්වමු. නමුත් ඉන්ද්‍රියගෙන් ඇත්ත ඇති සැටියෙන් දැකීමට නොහැකි ය. වර්ණ ශබ්ද ගන්ධ රස ස්පර්ශ ආදී පංච රූප මොළයෙහි ඇතිවන නාම ධර්මයකි. නමුත් අපි බාහිර වස්තු පිළිගෙන එම වස්තුවල වර්ණ ඇතයි ද, ගන්ධ ඇතයි ද, රස ඇතයි ද, පිළිගෙන ඇත. තමන්ගේ අභ්‍යන්තරයේ සිදුවන හේතු ප්‍රත්‍ය ධර්මය වෙනුවට අපි පිළිගන්නේ බාහිර අප විසින්ම ගොඩනගා ගත් ලෝකයකි. මෙය අවිද්‍යාව නොවේ ද? අවිද්‍යාවේ ම පදනම වූ සියලුම ආගම් දර්ශන විද්‍යා ඉගෙන ගන්නා තරමට පංච ස්කන්ධය දැඩිව උපාදානය කරයි. එමනිසා අවිද්‍යාවෙන් නිදහස් වීමේ මාර්ගය නම් ධර්ම අතහැරීමයි. නමුත් අවිද්‍යාව යනු 'නොදන්නා කම' යැයි සිතන පෘතග්ජන පුද්ගලයා සිතන්නේ, වැඩි වැඩියෙන් සූත්‍ර ඉගෙන ඒවා අවබෝධ කරගෙන, භාවනා ක්‍රම ඉගෙන, පන්සිල් අටසිල් ආදී ධර්ම ඉගෙන, ධර්ම සම්පූර්ණ කර අවිද්‍යාවෙන් නිදහස් විය හැකි බවයි. එම පිළිගැනීම ම අවිද්‍යාව බව ඔවුහූ නොදනිති.

පෘතග්ජන පුද්ගලයගේ දැනුම නිර්මාණය වී ඇත්තේ තමන්ගේ පංච ඉන්ද්‍රියන් පිටතට යොමු කිරීමෙනි. එමනිසා වර්ණය ශබ්දය රසය ගන්ධය හා ස්පර්ශය ලබන්නේ පිටතිනි. බුදුන් වහන්සේගේ දේශනාවට අනුව මෙම රූප ධර්ම තමන් තුළම නිර්මාණය වන්නාවූ විඥානය පෙරටු කොටගත් ධර්මයක් බව ත

ත්‍රිපිටකය ඉතා ගැඹුරින් ගවේෂණය කරන්නෙකුට දැකිය හැකි ය. මේ සඳහා තමන්ගේ ඉන්ද්‍රියන් තමන් තුළට යොමු කර තමන් තුළ සිදුවන හේතු ප්‍රත්‍ය ධර්මය බැලිය යුතුය. මෙම බැලීම යනු විදර්ශනාවයි. මෙනෙහි කිරීම විදර්ශනාව නොවෙයි. නමුත් බොහෝ දෙනෙක් විදර්ශනා වැඩිම ලෙස කරන්නේ තමන් ඉගෙන ගත් ගැඹුරු ධර්ම මෙනෙහි කිරීමයි. ඉගෙන ගත් ධර්ම මෙනෙහි කිරීමේ දී සත්ත්වයා පංච ස්කන්ධය උපාදානය කරයි. සත්‍ය දැකීමට යම්කෙනෙක් ධර්ම උපයෝගී කරගනී ද, ඒ තරමටම ඔහු හෝ ඇය පංච උපාදානස්කන්ධය උපාදානය කරයි. විදර්ශනා වඩන්නන් නොදන්නා කරුණ එයයි. යෝගාවචරයා ඔහුගේ විදර්ශනාවේ දී, මෙනෙහි කරන්නේ අනුන්ගෙන් අසා තමන් විසින් පිළිගත් ධර්මයි. එය තම ගුරුවරයාගෙන් අසා දැනගත් ධර්මයක් විය හැක. සමහර විට ගුරුවරයාගේ විදර්ශනාවෙන් ඵලයක් නැති වූ කල එම ගුරුවරයා අතහැර වෙනත් ගුරුවරයෙක් සොයා යයි. යෝගාවචරයන් මෙනෙහි කරන්නේ ලෞකික ධර්ම මිස ලෝකෝත්තර ධර්මයක් නොවේ. ලෝකෝත්තර ධර්මයක් චින්තනය හරහා මෙනෙහි කළ නොහැකිය. ඔබ මෙතෙක් මෙනෙහි කළේ පංච උපාදාන ස්කන්ධයේ 'රූප ස්කන්ධය' රූප ධර්මයක් ලෙස නම්, එය වැරදි මෙනෙහි කිරීමකි. මෙම ලිපියෙන් රූප ස්කන්ධය යනු තමන්ගේම මනස තුළ නිර්මාණය කරගන්නා වූ ධර්මයක් බව පෙන්වා දුනිමි. මගේ පෙන්වා දීම පිළිගෙන එම ධර්මය මෙනෙහි කිරීමෙන් සත්‍ය දකින්නට හැකියයි සිතනවානම් එයත් මුළාවකි. පංච ස්කන්ධය කුමණ ආකාරකට පැහැදිලි කලද එය ලෞකික ධර්මයකි. ලෞකික ධර්ම මෙනෙහි කර ලෝකෝත්තර සත්‍ය දැකිය හැකි ද? නමුත් විදර්ශනාවෙන් කරන්නේ ධර්ම දැකීම විනා මෙනෙහි කිරීම නොවෙයි. 'ධර්ම දැකීම' යන්න බොහෝ දෙනකු නොදන්නා ධර්මයකි. එය ධර්ම අවබෝධය නොවෙයි. දහම් ගුණයක් වන 'ඒහි පස්සිකො' යන්නෙහි තේරුම ඇවිත් බලන්න (දකින්න) විනා ඇවිත් පිළිගන්න නොවෙයි. ධර්ම පිළිගන්නා විට එම ධර්ම උපාදානය කරයි. නමුත් ධර්ම දකින විට ධර්ම අත හැරෙයි. දාන පාරමිතාව සම්පූර්ණ වෙයි. ධර්ම දැකීම අකාලිකව බලාපොරොත්තුවකින් තොරව ම සිදු වෙයි. ධර්ම මෙනෙහි කිරීමෙන් සිදුවන්නේ අතහැරීම නොව අල්ලා ගැනීමකි. තවතවත්

එකතු කරගනී. විදර්ශනාව යනු භාවනාවක් නොවේ. විදර්ශනාවට සිත එක්තැන් කිරීම හෝ ශක්තිමත් කිරීම හෝ පිරිසිදු කිරීම හෝ අවශ්‍ය නැත. එවැනි ක්‍රියා කලින් සිදුවන්නේ සිත දැඩිව උපාදානය කිරීමයි.

පංච උපාදානස්කන්ධය නැති තැන සිතක් නැත. සිත දියුණු කිරීමත්, පංච ස්කන්ධය උපාදානය කිරීමත්, එකිනෙකට සමාන්තර වූ ධර්ම දෙකකි. බුදුන් පිරිනිවන් පෑ පසු, ආනන්ද තෙරුන් වහන්සේ විවිධ ක්‍රම උපයෝගී කරගනිමින් රහත් වීමට වෙර දැරූ සැටිත්, නමුත් එම කිසිම ක්‍රමයකින් තමන්ගේ අභිමතාර්ථය ඉටුකරගැනීමට නොහැකි වූ සැටිත්, ඔබ අසා ඇත. ආනන්ද තෙරුන් වහන්සේ අවසානයේදී රහත් වූයේ සියලුම කායික හා මානසික වීර්යයන් අතහැරිය පසුවයි. ධර්ම දකින්නේ සිත එක්තැන් කිරීමෙන් හෝ දියුණු කිරීමෙන් නොව සිත අත හැරීමෙනි. පට පණුවා තමන් විසින්ම සාදාගත් කෝෂයට වී සිටින්නාක් මෙන්, ධර්මයෙන් සත්‍ය සොයන්නෝ ද දැනුම නැමති කෝෂය තුළ සිරවී සිටිති.

සත්‍ය දකින්නේ ධර්ම පිළිගැනීමෙන් නොව අත්හැරීමෙන් බැවින් ධර්ම දේශකයා මාර්ගඵල ලාභියෙක් ද නැද්ද යන වග ධර්මය අසන්නාට ප්‍රශ්නයක් වන්නේ නැත.

# 16

# චුල්ල පන්තක සහ මහා පන්තක

මහා පන්තක යනු බුද්ධ කාලයේ බුදුන් වහන්සේගේ සාසනයේ පැවිදි වී සිටි බුද්ධ ශ්‍රාවකයෙකි. මෙම ශ්‍රාවකයන් වහන්සේගේ බාල සහෝදරයකු වූ චුල්ල පන්තක ද වැඩිමහල් සහෝදරයා යටතේ බුදු සසුනේ පැවිදි විය. මහා පන්තක ගුරු තෙමේ තම ගෝළ චුල්ල පන්තකට පද හතරකින් යුත් ගාථාවක් කියා දී එය කට පාඩම් කිරීමට උපදෙස් දුන්නේ ය. සතියක් ගත වුවද චුල්ල පන්තකට ගාථාව කට පාඩම් කරගැනීමට නොහැකි විය. මෙයින් උරණ වූ මහා පන්තක තෙමේ තම සහෝදර ගෝළයාට සිවුරු හැර යන්නට නියෝග කළේය. මෙම නියෝගය නිසා සිත් තැවුලට පත් චුල්ල පන්තක හඬමින් පන්සල් දොරටුව අසල වී සිටින විට බුදුන් වහන්සේට මුණ ගැසිණි. කටයුතු කාරණා ඇසීමෙන් පසු බුදුන් වහන්සේ චුල්ල පන්තක තෙරුන් වහන්සේ සනසා ඔහු අතට සුදු රෙදි කැබැල්ලක් දී 'රාජෝ හරණං (කෙලෙස් හරිමි)' යයි කියමින් රෙදි කැබැල්ල පිරිමැදීමට උපදෙස් දුන් හ. පන්සලේ කොනකට ගිය චුල්ල පන්තක 'කෙලෙස් හරිමි කෙලෙස් හරිමි' යයි මතුරමින් රෙදි කැබැල්ල පරිමැද්දේ ය. ටික වේලාවක් යන විට චුල්ල පන්තක දුටුවේ රෙදි කැබැල්ල කිලිටි වී ඇති බවයි. එම දැකීමත් සමග චුල්ල පන්තක රහත් විය.

චුල්ල පන්තක තෙරුන් වහන්සේ රහත් වන විට දහවල් දාන වේලාව ද ආසන්න වී තිබුණි. එදින එම ආරාමයට දානයකට ආරාධනයක් ද තිබුණි. චුල්ල පන්තක උදයේම නෙරපා දමා තිබූ බැවින් චුල්ල පන්තක රහතන් වහන්සේ ආරාධනාවකින් තොරවම දානයට වැඩියහ. එදින දානයෙන් පසු ධර්ම දේශනාව පවත්වන ලද්දේ චුල්ල පන්තක රහතන් වහන්සේ විසිනි.

මහා පන්තක හා චුල්ල පන්තක සහෝදරයන් දෙදෙනාගේ කතාව ඔබට මෙතෙක් ඔබ නොඇසූ දහමක් කියා දෙයි. මෙතෙක්

කාලයක් බොහෝ දෙනෙක් දැන සිටියේ තම ගුරුවරයා කියන ධර්ම අසා ඒවා පිළිගෙන ධාරණය කරගෙන නිවන් දැකීමේ මාර්ගයයි. මෙම මාර්ගය තුළ සත්‍ය ගවේශකයා කායික හා මානසික වීර්යය යොදා ශීල සමාධි ප්‍රඥා වඩයි. අනුන්ගෙන් අසා ධර්ම පිළිගන්නට ම පුරුදු වී ඇති මෙම සත්‍ය ගවේශකයන්ට 'ධර්ම දැකීම' යන්න කුමක් ද යන්න ප්‍රහේලිකාවකි.

මහා පන්තක තෙරුන් වහන්සේ ධර්මය ධාරණය කළ අයෙකි. ධර්මධර භික්ෂුවකි. ගුරුවරයෙකි. ආනන්ද තෙරුන් වහන්සේ ද කොසොල් රජතුමා ද එවැනි ධර්මය ධාරණය කරගත්, බුදුන් කල විසූ දෙදෙනෙකි. ආනන්ද තෙරුන් වහන්සේ බුදුන් පිරිනිවන් පෑ පසු මෙම ධාරණය කරගත් සියලුම ධර්ම වලින් නිදහස් වී රහත් විය. ශ්‍රවණය කළ ධර්ම ධාරණය කරගත් කොසොල් රජතුමා කාලයට අසු වී සංසාරයේ තවමත් සැරි සරයි. තමන් යටතේ පැවිදි වූ තම සහෝදරයා ද ධර්ම ධරයෙක් කිරීම මහා පන්තකගේ ද අභිප්‍රාය විය. සතියක් ගතවීත් එක ධර්ම ගාථාවක් කටපාඩම් කිරීමට නොහැකි වූ තම සහෝදරයා සමග කෝප වී ඔහු එලවා දැමුවේ එබැවිනි. ධර්මය ඉගෙනගෙන කට පාඩමින් ධාරණය කරගන්නට බැරි ශිෂ්‍යයකුයෙන් තක්සලාවේ ගුරුවරයාට ඵලක් නැත. ගුරුවරයා ශිෂ්‍යයින් බිහි කරන්නේ තමන් පිළිගත්තා වූ ධර්ම චිරාත් කාලයක් පවත්වාගෙන ගෙන යාමටයි. තක්සලාවේ කාර්යය එයයි. මහා පන්තකලාගේ කාර්යය ලෝකයේ ද්විත්වයට අසුවන හොද සහ නරක ආදී ධර්මෙ මතු පරපුරට කියා දීමයි. නමුත් ජාති ජරා ව්‍යාධි මරණ වලින් නිදහස් නොවූ මහා පන්තකලාට සසරින් එතෙර වීමක් නැත.

ධර්මය ධාරණය කරගත නොහැකි වූ චුල්ල පන්තක තක්සලාවෙන් පිටමං කරයි. තක්සලාවෙන් පිටමං කළ අයට පමණක් බුදුන් මුණ ගැසෙයි. කායික වීර්යය හා මානසික වීර්යය යොදා කෙලෙස් වලින් නිදහස් වීම, එකල සිටි ආගමික ශාස්තෘවරුන්ගේ ද උගැන්වීම විය. බුදුන් වහන්සේ චුල්ල පන්තකට දුන් කමටහන ද කායික මානසික වීර්යය යොදා කෙලෙස් නැති කිරීමේ භාවනාව යයි කෙනකුට සිතෙන්නට පුළුවන. නමුත්

බුදුන් වහන්සේ චුල්ල පන්තක අතට සුදුරෙදි කැබැල්ලක් ද දුන් හ. 'රාජෝ හරණං රාජෝ හරණං' යැයි මෙනෙහි කරමින් සුදු රෙදි කැබැල්ල පිරිමදිමින් චුල්ල පන්තක කෙලෙස් හැරීමට පටන් ගත්තේය. මෙම මෙනෙහි කිරීම එදා සිට අද දක්වා යෝගාවචරයින් විසින් කරනු ලබන භාවනාවකි. ඔවුන් සිත තුළ ඇති කෙලෙස් වලට හේතුව අවිද්‍යාව බව නොදැන අවිද්‍යාවෙහිම ගිලී කෙලෙස් නැති කිරීමට සිත ම උදව් කරගනී. මෙනෙහි කිරීම යනු විදර්ශනාවක් නොවේ. චුල්ල පන්තක රෙදි කැබැල්ල පිරිමදින විට තම අත ඇති දහඩියට එය කිලුටු වූ හැටි ඔහු දුටුවේය. එය විදර්ශනාවයි. විදර්ශනාව යනු දැකීමයි. ඔහු දුටුවේ කුමක් ද? කායික හා මානසික වීර්යය යොදා කෙලෙස් නැති කිරීමට වීර්යය දරන විට තවතවත් සිත කෙලෙස් වලින් කිලුටු වන බව ඔහු දුටුවේ ය. කායික හා මානසික වීර්යයෙන් කෙලෙස් වලින් නිදහස් වීමට නොහැකි බව ඔහු දුටුවේ ය. මෙම දැකීමෙන් හෙවත් විදර්ශනාවෙන් චුල්ල පන්තක කෙලෙස් වලින් නිදහන් වී රහත් විය. නමුත් බොහෝ සත්‍ය ගවේශකයෝ සත්‍ය හෙවත් නිවන යනු දැකීමක් බව නොදනිති. එමනිසා තමන් තුළ ඇති කෙලෙස් වලින් නිදහස් වීමට ධර්ම පිළිගෙන එම ධර්ම අනුවම හැසිරෙයි. කායික හා මානසික වීර්යය යොදයි. එක් අතකින් මෙම සත්‍ය ගවේශකයෝ පංච උපාදාන ස්කන්ධයෙන් නිදහස් වීමක් ගැන දේශනා කරයි. අනෙක් අතට පංච ස්කන්ධයම උපාදානය කිරීමෙන් සත්‍ය දැකීමට වීර්යය කරයි.

ධම්ම පදයේ යමක වග්ගයේ පළමු හා දෙවන ගාථා වලින් විස්තර කරන පරිදි සිතේ ඇතිවන ධර්ම වලට මනසම පෙරටු කර ගන්නේ ය. මනසම ශ්‍රේෂ්ඨ කොට පවත්නේය. ඒ නිසා යමෙක් නරක සිතින් යමක් කරයි නම්, කරත්තය අදින ගොනාගේ පයට අනුව යන රෝදය මෙන් ඔහු පසුපස දුක ලුහුබඳී. යමෙක් හොඳ සිතින් යමක් කරයි නම්, තමන් පසුපස එන සෙවණැල්ල මෙන් සැප ඔහු පසුපස ලුහුබඳී. මෙම ගාථා දෙකෙන් ම අපට පෙන්වා දෙන්නේ මනසේ ඇති ප්‍රබල බවත් එම ප්‍රබල බවෙහි ඇති භයානක කමත් ය. තමන් විසින් කරනු ලබන හොඳ හෝ නරක හෝ ක්‍රියා නිසා සැප දුක දෙකම තමන් පසුපස ලුහුබඳී. මෙම සැප හා දුක

දෙකම කාලයට අසුවී ඇති බැවින් තාවකාලිකය. සැප ලබන්නෙක් සැමදා එම සැප ලබන්නට බැරි බව දනී. එය ම දුකක් වෙයි. යම් කෙනෙක් ලෙඩ රෝග වලින් ද, ජරාවට පත්වීමෙන් ද, මරණයෙන් ද, නිදහස් නැති නම් ඔහුට එතැන සැපක් තිබේ ද? මිනිසාට බාහිර සැප සම්පත් කොතරම් ලැබුණත් සෑහීමකට පත්නොවන බැවින් සැප සම්පත් වැඩිවන තරමට දුක ද වැඩිවෙයි. බුදු දහමට අනුව 'සැප දුක' දෙකම දුකකි. එම නිසා මෙම ගාථා දෙකෙන් ම අපට කියාදෙන ධර්මය නම්, සිතත් මනසත් පෙරටු කොටගත් ධර්ම නිසා 'දුක' තමන් පසුපස ලුහුබඳින බවයි. මහා පන්තකලා සිත ශ්‍රේෂ්ඨ කොට ගත් ධර්මයම උපාදානය කරන බැවින් ඔවුන් පසුපස දුකම ලුහුබඳී. සිතෙහි මනසෙහි ස්වභාවය දැක මනසෙන් නිදහස් වූ චුල්ල පන්තකලා පමණක් දුකෙන් නිදහස් වෙති. චුල්ල පන්තකලා පසුපස දුක සැප ලුහුබඳින්නේ නැත. රහතන් වහන්සේලා සැප දුක යන අන්ත දෙකෙන්ම නිදහස් ය.

ධර්මධර මහා පන්තකලා ධර්ම පිළිගෙන එම ධර්මම ගුරු කොට පංච ස්කන්ධය උපාදානය කරගනිමින් සසර සැරි සරති. ඔවුන්ට සසරින් ගැලවීමක් නැත. චුල්ල පන්තකලා ධර්මය දැක ධර්මයෙන් නිදහස් වී සසරින් නිදහස් වෙති. සියලුම ආගම් දර්ශන හා විද්‍යාවන් ලෞකික ධර්ම වලට යටත් වන බැවින් ගෞතම බුදුන් වහන්සේ කිසිම ආගමක් හෝ දර්ශනයක් හෝ විද්‍යාවක් හෝ දේශනා නොකළ බව චුල්ලපන්තකලා දකිත්. බුදුන් වහන්සේ අන් අයගේ ප්‍රශ්න වලට පිළිතුරු දෙන්නේ පිළිගත් ධර්ම වලින් නොවන බවත් දැනුම ඉක්මවා ගිය බුදු කෙනෙක් ළඟ කිසිම පිළිගත් ධර්මයක් නැති බවත් චුල්ලපන්තකලා දකිත්.

චුල්ලපන්තක රහත් වීමට පෙර බුදුන් වහන්සේ ගෙන් ඉගෙන ගත්තේ වචන දෙකක් පමණි. ඊට පෙර ඔහුගේ සහෝදරයාගෙන් අසාගත් ගාථාවද මතකයේ නොතිබුණි. එදින දානයට වැඩි චුල්ල පන්තක රහතන් වහන්සේ දේශනා කළ ධර්මය ඉගෙන ගත්තේ කාගෙන් ද? එම ධර්මය තමන් තුළින් ම මතු වූ ධර්මයක් විනා බුදුන් වහන්සේගෙන් ඉගෙන ගත් ධර්මයක් නොවේ. රහතන් වහන්සේලා ධර්මය අත්හැර දමති. ප්‍රඥාව පහළ වූ පසු

විශ්ව දහමක් වූ ලෝකෝත්තර දහම පහළ වෙයි. 'බුද්ධ' ඕනෑම කාලයක අකාලිකව වැඩ වසන බැවින් කාලයෙන් එතෙර වූ ඕනෑම කෙනෙකුට බුදුන් දැක නිවන් දැකි ය හැක. සත්‍ය දුටු විට ධර්ම අවබෝධයෙන් ද නිදහස් වෙයි.

සිදුහත් තවුසා අවුරුදු හයක් තරම් වූ දීර්ඝ කාලයක් තිස්සේ ආලාර කාලාම පස්වග මහනුන් ආදී එදා සිටි පණ්ඩිතයන්ගෙන් ධර්ම ඉගෙනිමින් උත්සාහයෙන් ධර්ම දියුණු කළේ ය. එම පණ්ඩිතයන් ද, ඔවුන් උගැන් වූ සියලු ධර්ම ද, අතහැර සිදුහත් තවුසාණෝ බුද්ධත්වයට පත් වූහ. උන්වහන්සේ අවුරුදු හයක දීර්ඝ කාලයක් උත්සාහයෙන් හා වීර්යයයෙන් දියුණු කරගත් ධර්ම අතහැරියහ. නමුත් බොහෝ දෙනෙක් පිළිගන්නේ සිදුහත් තවුසා උත්සාහයෙන් හා වීර්යයෙන් දියුණු කරගත් ධර්ම වලින් බුද්ධත්වයට පත් වූ බවයි. බුද්ධත්වයට පත් සිදුහත් තවුසාණෝ ශ්‍රාවකයන්ට දේශනා කළේ තමන් වහන්සේ සත්‍ය සෙවීමට අනුගමනය කළ හය අවුරුදු දුෂ්කර ක්‍රියාව සත්‍ය සොයන්නන් විසින් අත්හළ යුතු බවයි. බුදුන් වහන්සේ තම ශ්‍රාවයන්ට දුෂ්කර ක්‍රියා කරන්නට උපදෙස් දුන්නේ නැත. නමුත් ලෝකය පුරා වෙසෙන බොහෝ බෞද්ධයෝ සත්‍ය සෙවීමට දුෂ්කර ක්‍රියාවම අනුගමනය කරති. ඔවුහු තවමත් කායික හා මානසික වීර්යයයෙන් ම සත්‍ය සොයන ධර්මධර මහා පන්තකලා ය.

17

# අත්තාහි අත්තනෝ නාථෝ

'අත්තාහි අත්තනො නාථො, කොහී නාතෝ පරෝසියා' යන බුදු වදන බොහෝ බෞද්ධයින් විසින් මෙනෙහි කරන ධර්මයකි. මෙම ධර්ම පාඨයේ සිංහල තේරුම නම්, 'තමන්ට තමන්ගේ පිහිටවත් නැති කල අන් සරණක් හෝ පිහිටක් කවරේ ද?' යන්නයි. මෙම ධර්මය මේ ආකාරයට සිහිපත් කරන බෞද්ධ පඬිවරුන් 'තමන්ගේ පිහිට තමාම' යයි ධර්මයක් ද දේශනා කරති. එසේම තවත් තැනක 'බුද්ධ ධම්ම සංඝ සරණ හැර අන් සරණක් කවරේ ද?' යනුවෙනුත් මෙම බෞද්ධ පඬිවරුම දේශනා කරති. මෙම ධර්ම වදන් තුනම එකිනෙකට පරස්පර විරෝධී ධර්ම වෙයි. මම මුලින් සඳහන් කළ 'අත්තාහි අත්තනෝ නාථෝ' යන වදන බුදුන් වහන්සේ ගේ ධර්මයක් නම්, අනෙක් ධර්ම බුදුන් වහන්සේගේ ධර්ම නොවිය යුතුය. මෙම ධර්ම නිවැරදිව තෝරා බේරා නොගෙන ධර්ම පටලවා ගෙන සත්‍ය දැකිය හැකිදැයි තම තමන්ගෙන් ම ප්‍රශ්න කරගන්නවා හැර අන් සරණක් නැත.

බෞද්ධයෝ දිනපතා බුදුන් දහම් සඟුන් සරණ යති. ඔවුන්ගේ බලාපොරොත්තුව ද මරණයත්, මරණයෙන් පසු යහපත් ජීවිතයත් ය. බොහෝ දෙනෙක් බුදුන් දහම් සඟුන් සරණ යන්නේ අනාගත සැප සම්පත් සඳහාත් මරණින් මතු ජීවිතයේ සුබ සිද්ධිය සඳහාත් ය. රැකියාවට හෝ ඉගෙනීමට යාමට පෙර බෞද්ධ ඔබ බුදුන් සරණ යන්නේ ඇයි දැයි ඔබෙන් ම අසා බලන්න. ඔබ පාසල් ශිෂ්‍යයකු නම් විභාග දිනයේදී වෙනදාට වඩා වැඩි භක්තියකින් යුත්තව බුදුන් සරණ යන්නේ ඇයි දැයි මොහොතක් සිතා බලන්න. බෞද්ධයා බුදුන් සරණ යන්නේ තම ලෞකික ජීවිතය සැපවත් කරගැනීමට නොවේ ද?

මම බුදුන් සරණ යන්නේ, ලෞකික සැප සම්පත් සඳහා නොව ලෝකෝත්තර සුවය සඳහා යයි තව කෙනෙකුට කියන්නට පුළුවන. නමුත් ගැටලුව වී ඇත්තේ මෙසේ කියා ගන්නෝ ද

මියයන තෙක් බුද්ධ ධම්ම සංඝ සරණ යාමට බලාපොරොත්තු වීමයි. බෞද්ධයාගේ කාර්යය විය යුත්තේ සඟ සරණ යාම ද, නැතිනම් සත්‍ය දැක 'සංඝ' ලෙස හඳුන්වන්නා වූ බුදුන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වීම ද? 'භව දුකට වෙදාණෝ' යනු බුදුන් වහන්සේට අන්වර්ථ නාමයකි. නමුත් බාහිරින් බුදු කෙනෙක් පහල වී ඔබේ භව දුක සුවපත් කරන තෙක් බලා සිටින්නේ නම් එය මුළාවකි.

බුදුන් කල කිසිවකු බුද්ධ ධම්ම සංඝ සරණ පැතුවේ වත් සරණ ගියේ වත් නැත. ඔවුහු බුදුන් දුටහ. බුදුන්ගේ ධර්මය දුටහ. බුදුන් දැක බුදුන්ගේ ධර්මය දැක බුදුන් වහන්සේගේ ශ්‍රාවකයෝ වූහ. එසේ නැතිව ඔවුහු 'සංඝ' සරණ ගියේ නැත. සැරියුත් මුගලන් ආදී ශ්‍රාවකයන් මාර්ග ඵල ලැබුවේ බුද්ධ ධම්ම සරණ යෑමෙන් නොවේ. ඔවුහු බුදුන්ගේ ධර්මය දැක සත්‍ය දුටහ. බුදු කෙනෙක් තමන් සරණ යන්න යයි ද, තමන්ගේ ධර්මය සරණ යන්න යයි ද, දේශනා කරන්නේ නැත. එවැනි වූ දේශනයක් යම් කෙනෙක් කරන්නේ නම් ඔහු බුදු කෙනෙක් නොවෙයි. එවැනි ධර්මයක් බුදු දහම නොවන්නේ, එවැනි ධර්ම 'ඒහි පස්සිකෝ' නැමති ධර්ම ගුණයට පටහැනි බව බැවිණි. බුදු දහම කාලයට යටවී විලෝපනය වූ පසු සත්‍ය ගවේශකයෝ බුද්ධ ධම්ම සංඝ දැකීම වෙනුවට සරණ යාම, නිවන් දැකීමේ එකම පිළිසරණ කරගනිති.

ධර්මධර ගුරුවරයා 'තමන්ගේ පිහිට තමා' යයි, දේශනා කළ ද ලෞකික ලෝකයෙන් නිදහස් වීමට තමන්ට තමන්ගෙන් පිහිටක් තිබේ ද? බොහෝ යෝගාවචරයෝ තමන්ගේ පිහිටෙන් සත්‍ය හෙවත් නිවන් දකින්නට කායික හා මානසික වීර්යය යොදති. තමන්ගේ පිහිටෙන් සත්‍ය සොයන විට තමන් යන සංකල්පය තවදුරටත් තහවුරු වෙයි. එමගින් සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය තවතවත් ඉස්මතු වෙයි. තමන්ගේ පිහිටෙන් සත්‍ය දුටු අයෙක් අතීතයේ පහළ වූයේ නැත, වර්තමානයේත් පහළ වී නැත, අනාගතයේ පහළ වන්නේත් නැත. සිදුහත් තවුසා අනුන්ගේ පිහිටෙන් සහ තමන්ගේ පිහිටෙන් සත්‍ය සොයන්නට අවුරුදු 6 ක් දුෂ්කර ක්‍රියා කළේ ය. තමන් යන සංකල්පයෙන් නිදහස් වන තෙක් කිසි කෙනෙකුට සත්‍ය

දැකිය නොහැකි ය. බුදුන් වහන්සේ 'අත්තාහි අත්තනෝ නාථෝ' යයි දේශනා කළේ එබැවිනි. පන්සිල් අටසිල් ආදී සිල් සමාදන් වෙමින්, භාවනා කරමින්, තමන්ගේ පිහිටෙන් සත්‍ය සොයන අය මෙම බුදු වදන ගැන නැවත සිතා බැලිය යුතුය.

'කොහි නාතෝ පරෝසියා' යන බුදු වදනට අනුව තමන්ට තමන්ගේ පිහිටවත් නැති කල අන් පිහිටක් කවරේ ද? මෛත්‍රී බෝධිසත්වයෝ තව්තිසා දිව්‍යලෝකයෙන් චුත වී මිනිස් ලෝකයේ ඉපිද බුද්ධත්වයට පත් වූ පසු උන් වහන්සේගේ සරණින් නිවන් දකින්නට බලා සිටින අය, මෙම ධර්ම පාඨයේ කියවෙන ධර්මය දැකිය යුතු ය. බාහිර බුදු කෙනෙක් සරණ යෑමෙන් හෝ ධර්මය සරණ යෑමෙන් හෝ තමන්ට සත්‍ය දැකිය හැකි දැයි විමසා බැලිය යුතුය.

'අත්තාහි අත්තනො නාථො, කොහි නාථො පරෝසියා' යන බුදුවදන දකින යම් කෙනෙක් බාහිර බුද්ධ ධම්ම හෝ සංඝ සරණක් සොයන්නේ නැත. බුදු කෙනෙක් දේශනා කරන්නේ 'එන්න ධර්ම දකින්න (ඒහි පස්සිකෝ)' යනුවෙනි. ධර්ම දැකීම යනු 'සරණ යාම' නොවෙයි. අන් සරණක් සොයන්නෝ තමනුත් අනුනුත් ඉන්නවා යයි පිළිගනිති. එම නිසා මෙම සරණ අත්හරින තෙක් සත්‍ය දකින්නට නොහැකි ය. බුදුන් දැකීම යනු එකකි, බුදුන් සරණ යාම යනු තව එකකි. බුද්ධ ධම්ම හා සංඝ දැකීමෙන් එම ධර්ම වලින් නිදහස් වෙයි. යමෙක් බුද්ධ ධම්ම හා සංඝ සරණ යාමෙන් එම ධර්ම දැඩිව උපාදානය කරයි. උපාදානය සත්‍ය දැකීමට බාධාවකි.

---

බුද්ධ, ධම්ම. සංඝ යන ත්‍රිවිධ රත්නය ද ලෞකික ධර්මයෝ වෙති. බුදුන් දැක නිවන් දකින්නෝ බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයම අතහරිති.

**18**

# අන්තරාභවය ගන්ධබ්බයා සහ කාලය

බුදුන් වහන්සේගේ ධර්මය කාලය ඉක්මවා ගිය බැවින් කාලය පිළිගත් පෘතග්ජන පුද්ගලයන්ට 'බුද්ධ' හෝ 'බුදු දහම' හෝ දකින්නට නොහැකිය. මේ නිසා ඔවුහු බුදු දහම යයි පොත් පත්වල ලියා ඇති කරුණු තමන්ගේ දැනුමට අනුව පිළිගනිති. යමෙක් සම්මුති මරණයට පත් වූ පසු අවසාන චුති චිත්තයත් නැවත ජීවිතයක ප්‍රතිසංධියත් අතර කාලපරතරයක් ඇති බව පෘතග්ජන පුද්ගලයා පිළිගන්නේ කාලය නැමති මිථ්‍යාවට අසුවී ඇති බැවිනි. මෙම කාල පරතරය විස්තර කිරීමට ඔවුහූ අන්තරා භවය සහ ගන්ධබ්බ යන වචන භාවිත කරති. ථෙරවාදීන්ගේ මතය නම්, චුතියත් සමගම ප්‍රතිසංධිය සිදුවන බවයි. කලින් භවයේ මරණයට පත් වීමත් වර්තමාන භවයේ උපත ලැබීමත් අතර කාලය අන්තරා භවය යැයි අනෙකුත් වාදීහු පිළිගනිති.

කිසියම් වූ වාදයක් හෝ පිළිගැනීමක් යනු බුදු දහම නොවේ. බුදු දහමෙහි වාදයක් හෝ පිළිගැනීමක් නැත. 'පිළිගැනීම' සත්‍ය නොවන්නේ පිළිගැනීම යනු පංච ස්කන්ධය උපාදානය කිරීමක් වන බැවිනි. එය තුල කාලය පවතී. දින මාස වර්ෂ වලින් හඳුන්වනු ලබන කාලය චින්තනයේ නිර්මාණයක් මිස සත්‍ය නොවෙයි. චුතියත් ප්‍රතිසංධියත් එකවර සිදුවන ධර්මතා දෙකක් වුවත් කාලය පිළිගත් පුද්ගලයාට මෙම එකවර සිදුවන ධර්මතා දැකිය නොහැකි බැවින් චුතියත් ප්‍රතිසංධියත් අතර කාල පරතරයක් ඇතයි පිළිගනිති. කාලයත් සත්ත්වයාත් පිළිගත් ධර්මධර පඩිවරුන් මරණින් මතු පැවැත්මක් ද පිළිගන්නා බැවින්, මරණයත් නැවත උත්පත්තියත් අතර පරතරය ඔවුන්ට විසඳාගත නොහැකි

උභතෝකෝටික ප්‍රශ්නයකි. මේ නිසා විවිධ වාද බිහි වූහ. කාලය අභිබවා සත්‍ය දකිනතෙක් මෙම වාදයන්හි පැටලෙන පඬිවරුන්ගෙන් සමහරෙක් අන්තරා භවය පිළිගනිති, සමහරෙක් අන්තරාභවය පිළිනොගනිති. මෙම දෙකම අන්ත දෙකකි.

උප්පත්තියෙන් මරණයෙන් හා කාලයෙන් නිදහස් වූ සත්‍ය දුටුවා වූ යමෙක් අන්තරා භවයෙන් ද ගන්ධබ්බයාගෙන් ද නිදහස් වෙයි. මෙම ධර්මතා පංච උපාදානස්කන්ධය පිළිගත් සත්වයා තුල ඇතිකර ගත් මනකල්පිත ධර්මයෝ වෙති. සත්‍ය නම්, උපදින්නට හා මැරෙන්නට කෙනෙක් නැත. උපදින්නට හා මැරෙන්නට කෙනෙක් නැති කල අන්තරා භවයක් කොයින් ද? භවය නම් ඇස කණ නාසය දිව ශරීරය නම් වූ ඉන්ද්‍රියන්ගේ ක්‍රියාකාරිත්වයම මිස අනෙකක් නොවෙයි. මෙම ඉන්ද්‍රියන් ක්‍රියාත්මක වන්නේ චින්තනය ඇති විටයි. තද නින්දට පත් වූ විට චින්තනයෙන් ද වර්තමාන කාලයෙන් ද තාවකාලිකව නිදහස් වෙයි. තද නින්දට පෙර අවසන් චින්තනයක් ඇත. මෙය තද නින්දට පෙර ඇතිවන චුති චිත්තයයි. තද නින්දෙන් අවදි වන විට අලුත් සිතුවිල්ලක් හට ගනී. තද නින්දට පෙර අවසන් සිතුවිල්ලත් නින්දෙන් අවදි වූ පසු ඇතිවන නව සිතුවිල්ලත් අතර කාල පරතරයක් තිබේ ද? මෙම කාල පරතරය ඇත්තේ අවදිව සිටින කාලය පිළිගත් පුද්ගලයා තුළ පමණි. තද නින්දෙහි සිටින්නාට වර්තමාන කාලයක් නැත. අතීතය යනු මොළයේ ගබඩා කරගත් මතකයයි. අනාගතය යනු තමන් තුළ ඇති බලාපොරොත්තු වෙයි. රාත්‍රියේම නිදාගත් ඔබ රාත්‍රියේම අවදි වුවහොත් කොපමණ කාලයක් තමන් නිදාගත්තේ දැයි තමන් දන්නේ නැත. නමුත් අවදි වූ පසු ඔර්ලෝසුව බලා තද නින්දේ සිටි කාලය ද, තමන්ගේ ජීවිත කාලයට එකතු කර ගනී. ඔබගේ ඥාතියා අවුරුදු අසූවක් ආයු වළඳා මියගියේ යයි කීවද, ඔබේ ඥාතියා, තද නින්දේ සිටි කාලය වැළඳුවේ නැත. තද නින්ද යනු එක්තරා ආකාරයක මරණයකි. තද නින්දේ දී හා මරණයේ දී, චින්තනයෙන් හා කාලයෙන් තාවකාලිකව නිදහස් වෙයි. චින්තනය නොමැති තැන කාලයක් නොමැති බැවිනි. එමනිසා චුතිය ප්‍රතිසංධිය ආදී විවිධ නම් වලින් හඳුන්වන මෙම මරණය හා උප්පත්තිය අතර කාලපරතරයක් නැත. මෙම 'උත්පත්තිය හා මරණය' සැම

මොහොතකම, එක් සිතුවිල්ලක් මැරී තව සිතුවිල්ලක් උපදින විට ද සිදුවෙයි. බොහෝ ධර්මධාරීන් 'සිතුවිලි' මරණයත් 'සම්මුති' මරණයත් යනු දෙකක් වශයෙන් පැහැදිළි කළද, එම 'සිතුවිලි' මරණයත් 'සම්මුති' මරණයත් යනු දෙකක් නොව එකකි.

මනසත් චින්තනයත් පිළිගත් මිනිස් සත්ත්වයා ට විවිධ වූ මානසික රෝග ඇත. තම තමන් ජීවත් වන සංස්කෘතියට අදාළ විශ්වාශ හා පිළිගැනීම් මත පදනම් වූ මෙම මානසික රෝග ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වෙයි. උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකාවට විශේෂ වූ පරල වීම වැනි මානසික රෝග වෙනත් රටවල දක්නට නැත. පරල වීම හෙවත් ආවේශ වීම ලෙස හඳුන්වන මානසික රෝගය බොහෝ දෙනෙක් සිතන්නේ වරමක් ලෙසය (මම මනෝ වෛද්‍ය විද්‍යාව හදාරා නොමැති බැවින් මෙම මානසික රෝගයේ විද්‍යාත්මක නාමය නොදනිමි). මෙම රෝගීන් ඔවුන්ටත් නොදැනීම ඔවුන්ගේ යටිසිත ක්‍රියාත්මක වී නන්දෙඩවන විට (ගන්ධබ්බයා ලෙස පෙනී සිටින) මියගිය ඥාතීහූ ආවේශ වන්නේ යයි ධර්මධාරීහු කියති. මෙම මනෝ විකාර බුදුදහමට ද ඈඳා ගනිති.

'ක්‍රියාව' යනු සංස්ඛාර ධර්මයකි. තමන් පිළිගත් සියලු ක්‍රියා ඇත්තේ තමන් ජීවත්ව සිටින තාක් පමණි. තද නින්දේ සිටින විට ද ජීවත් වීමක් නොමැති අතර තමන් විසින් කරනු ලබන කිසිම ක්‍රියාකාරකමක් එහි නැත (ආශ්වාස හා ප්‍රශ්වාසය තද නින්ද තුළ ඇති නමුත් එය තමන් කරන දෙයක් නොවෙයි). තද නින්දේදී වත් තමන්ට කළ නොහැකි ක්‍රියාකාරකම් මරණයට පත් වූ පසු කරන්නේ කෙසේ ද? තමන්ගේ ළඟම ඥාතියෙක් මිය ගිය විට ඥාතියාට ඇති බැඳීම නිසා ඔහුගේ හෝ ඇයගේ 'මරණය' තමන් ට පිළිගැනීමට අපහසු බව සත්‍යයකි. තම ඥාතියාගේ මරණය පිළිගැනීමට ඇති අපහසුව නිසා මරණයෙන් පසුව ද ඔහුගේ හෝ ඇයගේ ජීවත් වීමක් අපේක්ෂා කිරීම ස්වභාවිකය. මේ නිසා අන්ධානුකරණයට ලක් වූ පුද්ගලයෝ මළවුන් කථා කරන තැන් සොයා යති. පරල වූ රෝගී පුද්ගලයාගේ යටිසිත ක්‍රියාත්මක වන විට, එම ක්‍රියාත්මක වීම, රෝගී පුද්ගලයා හරහා මළගිය ඥාතියාගේ

ගන්ධබ්බයා කථා කරන්නේ යයි නිගමනයට බසින සමහර බෞද්ධ ස්වාමීන් වහන්සේලා එමගින් ගන්ධබ්බයෙක් සිටින්නේ යයි යන උන්වහන්සේලාගේ මත ඔප්පු කිරීමට උත්සාහ කරති. මෙම මළවුන්ගේ කථා බුදු දහමට ද එකතු කරති. මානසික රෝග තමන්ගේ ජීවත් වීමේ මාර්ගයක් ලෙස සකස් කර ගත් බොහෝ දෙනෙක් මෙම ධර්ම බුදුදහම යයි ඉහළින්ම පිළිගනිති. පරල වන මානසික රෝගියකුට නිද්‍රාවට පත් වී බුදු දහම දේශනා කළ හැකිනම් බුදුකෙනෙක් ලොව පහළ වන්නේ කුමකට දැයි මම පාඨක ඔබෙන් අසමි.

බුදු කෙනෙක් දකින්නේ තිපරි වට්ටයක් (ඒතං තිපරි වට්ටං) මිස සතෙක් පුද්ගලයෙක් නොවෙයි. සත්ත්ව පුද්ගල දහමක් පිළිගත් විට එතැන ඇත්තේ මිථ්‍යා දෘෂ්ඨියකි. මිථ්‍යා දෘෂ්ඨියෙන් පැහැදිලි කරන ඕනෑම ධර්මයක් යනු මිථ්‍යා දෘෂ්ඨික ධර්මයකි. සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය පිළිගෙන විස්තර කරන, මරණින් මතු ගන්ධබ්බයාගේ ක්‍රියාකාරකම් ද මිත්‍යා දෘෂ්ඨික ධර්ම විනා සම්මා දෘෂ්ඨිය වන්නේ කෙසේ ද?

19

# සිත එකඟ කරගැනීම ආදී පුහුණු කිරීම් දරුවන්ට සුදුසුද?

කුඩා කාලයේ සිට දරුවකු තුළ සිදුවන දැනුම වර්ධනය වීමත් චින්තනය වර්ධනය වීමත් එකිනෙකට සමගාමී වූ මානසික ක්‍රියාවලි දෙකකි. දැනුමත් සමග ක්‍රම ක්‍රමයෙන් දරුවා බාහිර ලෝකයක් මනසේ ගොඩනගා ගනී. මෙම බාහිර ලෝකයත් සමග ගොඩනැගෙන චින්තනයම තව තවත් දැනුම එකතු කර ගැනීමට ප්‍රයෝජනවත් වෙයි. ළමයා වැඩිහිටියකු බවට පත් වී ලෝකයෙහි ජීවත් වීමට පමණක් නොව තමන් ගොඩනගාගත් ලෝකය වැරදි බව දැක, ලෝකයෙන් නිදහස් වීමට ද, මෙම දැනුමත් චින්තනයත් අත්‍යවශ්‍ය වෙයි. බාහිර ලෝකයට නිරාවරණය වීමත්, චින්තනය ගොඩනැගීමත්, නොමැතිව දරුවකුගේ මොළය වර්ධනය වීමක් සිදුවන්නේ නැත. තමන් විසින්ම ගොඩනගා ගත් ලෝකයෙහි පැන නගින්නාවූ ගැටලු වලට මුහුණ දෙන්නේ කෙසේ ද, යන්න ඉගෙන ගැනීමට මෙම චින්තනය මහෝපකාරී වෙයි. බාහිර ප්‍රශ්න වලට මුහුණ දෙන විට චින්තනය තවදුරටත් වර්ධනය වෙයි. ළමයාගේ පෞරුෂ වර්ධනයට මෙය ඉතා පිටුවහලක් වෙයි. මෙම වර්ධනයත් සමග දරුවා ලෝකය ඉතා හොඳින් ග්‍රහණය කරගනියි. මෙවැනි පරිසරයක වැඩෙන දරුවා පරිසරය සමග හොඳින් ගැටී මනා පෞරුෂයකින් යුත් වැඩිහිටියකු සමාජයට බිහිවෙයි. නමුත් වැඩිහිටි අපි දැනගත යුතු කරුණක් නම් මෙවැනි බුද්ධිමත් දරුවකු සෑම විටම කීකරු සංවර දරුවකු නොවිය හැක. බොහෝ විට දරුවා දෙමව්පියන්ගේත් ගුරුවරුන්ගේත් දෝෂාරෝපණයට ලක්විය හැක.

බොහෝදෙනා සිතන්නේ යම් භාවනාමය පුහුණුවක් මගින් එකඟ කරගත් සිතම සාර්ථක ජීවිතයකට මග පාදන බවයි. වැඩිහිටියකුට නම්, නිවැරදිව කරන මෙම පුහුණුවෙන් තමන්ගේ ජීවිතයට සැනසීමක් ලබාගත හැක. ලෙඩ රෝග වලින් යම්

තරමකින් නිදහස් විය හැක. බොහෝ දෙනෙක් මේ ආකාරයට වර්තමානයේ සිහිය පිහිටුවා සැනසීම සොයති. නමුත් සැනසීම යනු නිවන නොවෙයි. මානසික පුහුණුව වැරදි පැත්තට යොමු වුවහොත් එය මානසික අවපාතයට ද හේතු විය හැක. සිතුවිලි වලින් තොර බැවින් තිරිසන් සත්ත්වයා තුළ සැනසීම ඇත. සිතුවිලි පාලනය කර මිනිස් සත්ත්වයාට ද යම් තරමක සැනසීමක් ලැබිය හැක. ලෝකයෙහි ජීවත් වීමට අවශ්‍ය දැනුමෙන් සම්පූර්ණ වූ වැඩිහිටියාට සැනසීම සඳහා සිත එකඟ කරගැනීම වරදක් නැත. නමුත් දරුවා තවම දැනුමෙන් පිරිපුන් වී නොමැති බැවින්, සිත එකඟ කරගැනීමට පුරුදු පුහුණු කිරීම, දරුවකුගේ මානසික වර්ධනයට කුමන ආකාරයට බලපාන්නේ ද යන්න විමර්ශනයට භාජන කළ යුතු කරුණකි. හොඳ නරක ආදී ගුණධර්ම පුරුදු පුහුණු කිරීමටත් ඉගෙනීම දියුණු කිරීමටත් සිත එකඟ කරගැනීමට වැඩිහිටියන් විසින් දරුවෝ පුරුදු පුහුණු කෙරෙති. පොත්පත් සහ සිසු සටහන් මතක තබා ගැනීමට කරනු ලබන මෙම විවිධ වූ පුහුණු මගින් දරුවාගේ මනස එක් එල්ලයක් කරා යොමු වී දෙමව්පියන් බලාපොරොත්තු වන කඩඉම් විභාග ඉතා උසස් ලෙස සමත් වී ජීවිත අභිමතාර්ථයන් ඉටුකර ගත හැක. නමුත් කුඩා දරුවාගේ මෙම පුහුණුවෙන් මතකය දියුණු වනවා විනා, තර්කය හා විතර්කය වැඩි දියුණු නොවෙයි. සිතුවිලි එක් අරමුණකට යොමු කිරීමට කරන පුහුණුව, සිතුවිලි වල වර්ධනයට බාධාවක් වෙයි. මෙම පුහුණුව ලැබුවෝ යම් කෙනෙකුගේ උපදෙස් මත යම් දෙයක් කිරීමට සමර්ථයෝ වෙති. නමුත් තමන්ගේ බුද්ධිය මෙහෙයවා යමක් කිරීමට අසමර්ථයෝ වෙති. එයට හේතුව බුද්ධිය මෙහෙයවා යමක් කිරීමට මනා ලෙස වර්ධනය වූ චින්තනයක් අවශ්‍ය බැවිනි. මොවුහු පුරුදු පුහුණු වීමෙන් කඩඉම් විභාග සමත් වී උසස් අධ්‍යාපනයට ද ඇතුළුව උපාධි සමත් වී සමාජයේ ඉහළින් පිළිගත් රැකියා වල නිරත වෙති. නමුත් බොහෝ විට සේවාදායකයන් මොවුන්ගේ සේවයෙන් අපහසුතා වලට පත්වෙති. මේ බව තේරුම් ගත් බටහිර ලෝකය වෛද්‍ය විද්‍යාව වැනි වෘත්තීන්ට තෝරාගැනීමේදී කටපාඩම් කර විභාග සමත් වීමේ දක්ෂතාවට වඩා ශිෂ්‍යන්ගේ ඇති වෙනත් දක්ෂතාවන් කෙරෙහි ද අවධානය යොමු කරනු ලබයි.

දරුවාගේ මොළය වර්ධනය වී, තර්කය හා විතර්කය දියුණු වන තෙක් සිත එකඟ කරගැනීමේ පුහුණුව ළමා මනසට යෝග්‍ය නොවෙයි. ළමයාට අවශ්‍ය වන්නේ එකඟ කර ගත් සිතක් නොව පුළුල් ලෙස ව්‍යාප්ත වූ ක්‍රියාශීලී තර්කානුකූල සිතකි. ලෝකය හඳුනා ගැනීමට මෙවැනි තර්කානුකූල සිතක් දරුවාට අවශ්‍යය ය. සමාජයෙන් පැනනැගෙන ප්‍රශ්න වලට පිළිතුරු සෙවීමට ඉවහල් වනුයේ තර්කානුකූල සිතකි. මෙය විවාදයට පත් විය යුතු විෂය ක්ෂේත්‍රයකි. සිත එකඟ කරගැනීමට කරනු ලබන පුහුණු වලින් සිදුවන්නේ දරුවාගේ මනසට අනර්ථයකි. එය බුද්ධි වර්ධනයට බාධාවකි. අවාසනාවට මෙන් මෙම අනර්ථය දකිනවා වෙනුවට බොහෝ දෙනෙක් දකින්නේ එම පුහුණුව යහපත් දෙයක් ලෙසයි. අප විසින් කළ යුත්තේ දරුවාගේ බුද්ධිය වර්ධනය වන ආකාරයේ අධ්‍යාපනයක් ලබාදීමත් විවිධ ක්‍රියාකාරකම් වල දරුවා යෙදවීමත් ය. මෙම ක්‍රියාකාරකම් 'දරුවා මූලික' විය යුතුය. උදාහරණයක් ලෙස, දරුවා තමන්ගේ පාපැදියේ යම් දෝෂයක් හඳුනාගෙන එය නිවැරදි කිරීමට උත්සාහ කරන විට මෙම උත්සාහයෙන් දරුවාගේ සිතුවිලි විවිධ දිශාවලට ගමන් කරයි. දරුවාගේ උත්සාහයට ඉඩ දී මව්පියන් කළ යුත්තේ ඔහුට හෝ ඇයට උදව් කිරීමයි. දරුවාගේ මෙම ක්‍රියාව පොත් දහසක් කඩපාඩම් කරවන වාට වඩා අගනේ ය. මානසික වර්ධනයට ඉවහල් වන්නේ විවිධ දිශාවන්ට ගමන් කරන ක්‍රියාශීලී සිත ද, නැතිනම් එක් අරමුණක් කරා යොමු වූ තැන්පත් කරගත් සිත ද?

දරුවකුගේ චින්තන වර්ධනයට ශාරීරික අංග චලනය ඉතා වැදගත් වෙයි. ස්නායු වර්ධනයටත් මොළයේ ශෛල වර්ධනයටත් මෙම අංග චලනය මනා සේ වැදගත් වෙයි. මේ බව අවබෝධ කර නොගත් දෙමව්පියන්, අධ්‍යාපනය ලබන දරුවාගේ මනස පොතපතට පමණක් යොමුකරනවා මිස ගෙදරදොර සුළු ක ්‍රියාකාරකම් වල යෙදීමටවත් ඉඩ නොදෙයි. අලි පැටවෙක් ගැන සිතා බලන්න. තිරිසන් සත්තු පවා උන්ගේ ළමා කාලයේ දී බොහෝ කෙලි සෙල්ලම් කරති. බුද්ධි වර්ධනයට එය වැදගත් වන බැවින් ස්වභාව ධර්මයා විසින් එය දායාද කර ඇත. ස්වභාවිකවම දරුවාගේ තිබූ මෙම කෙලි සෙල්ලම නැති කළේ කවුද? මෙය ඉතා

අවාසනාවන්ත කරුණකි. වැඩිහිටි ඔබ මීට වගකිව යුතු ය.

මීට අවුරුදු 30 කට පමණ පෙර මා විසින් කියවූ ශ්‍රී ලංකාවේ පත්‍රයක පළ වූ ප්‍රවෘත්තියක් ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. ඉහළ මට්ටමේ අධ්‍යාපනයක් ලැබූ තරුණ දෙමව්පිය යුවලකට සිටියේ එකම කුඩා දරුවෙකි. දෙදෙනාම රැකියාවට යන බැවින් දරුවා බලා ගැනීම ගෘහ සේවිකාවකට බාර කළේ ය. දරුවා ලොකු මහත් වන විට දරුවාගේ මානසික වර්ධනය ගැන මෙම දෙමව්පියන්ට සැක ඇති විය. මනෝ වෛද්‍යවරයකුට පෙන්වූ විට වෛද්‍යවරයාගේ නිගමනය වූයේ දරුවාගේ බුද්ධි වර්ධනයේ අඩුපාඩුවක් (free mature) වී ඇති බවයි. බුද්ධිමත් මව්පිය දෙදෙනකුගේ දරුවා මේ තත්ත්වයට පත් වූයේ කෙසේ ද? හේතු යාමේදී ඔවුන් දැනගත්තේ කුමක් ද? දරුවා බලාගත් සේවිකාවට පෙම්වතෙක් සිට ඇත. මව්පිය යුවළ ගෙදර නැති දවල් කාලයේ දී මෙම පෙම්වතා නිවසට පැමිණෙයි. පෙම්වතා සමග ගත කිරීමට අවශ්‍ය කාලය සොයාගැනීමට සේවිකාව කළේ කුමක් ද? ඇය දරුවා ටයරයක තැබුවේ ය. මේ ක්‍රියාව නිසා දරුවාගේ ශාරීරික චලනයන්ට බාධා ඇතිවිය. මනෝ වෛද්‍යවරයාගේ නිගමනය වූයේ ශාරීරික අංග චලනයේ සිදු වූ අඩුපාඩුව දරුවාගේ මන්ද බුද්ධික භාවයට හේතු වූ බවයි. තම දරුවාට 'ශාරීරික සංවරය' පුරුදු පුහුණු කරන දෙමව්පියන්, තමන්ගේ කාර්යයන් ගැන දෙවරක් සිතා බැලිය යුතු කාලය දැන් එළැඹ ඇත. සමහර දෙමව්පියන් තම දරුවන්ට ඔවුන්ගේ කෑම බීම ගැනීම, ඇඳුමක් සෝදා ගැනීම, ආදී සුළු කාර්යයක් පවා කර ගැනීමට ඉඩ නොදෙයි. මෙම දෙමව්පියන්ගේ බලාපොරොත්තුව අංග විකල වූ දරුවන් ලෝකයට දායාද කිරීම ද?

අපේ ලාංකීය මනෝ වෛද්‍යවරු මීට දශක හතරකට පමණ පෙර සිටම ශාරිරික අංග චලනය දරුවකුගේ බුද්ධි වර්ධනයට ඉවහල් වන බව දැනගෙන සිටියහ. මාස කීපයකට පෙර බීබීසී (BBC) යේ වූ ප්‍රවෘත්තියකින් මා දුටුවේ, ඇමෙරිකාවේ විශ්වවිද්‍යාලයක් (University of Chicago) මගින් ශාරීරික අංග චලනය (Gestures) බුද්ධි වර්ධනයට හේතුවන බව

පර්යේෂණාත්මකව පෙන්වා ඇති බවයි. (Gestures develop infant speech:news.bbc.co.uk/go/pr/fr//2/hi/uk_news/education / 7887446.stm). බටහිර ලෝකය මේ සම්බන්ධයෙන් පර්යේෂණ ආරම්භ කර ඇත්තේ දැන් ය.

දැනුමෙන් තොර වූ තිරිසන් සත්ත්වයා තමන්ට අවශ්‍ය පරිදි මනා ලෙස පුරුදු පුහුණු කර ගත හැක. සතුන් පුහුණු කරන ආකාරයටම තම දරුවන් පුහුණු කිරීම සුදුසු ද? දරුවන් විවිධ කාර්යයන් සඳහා පුහුණු කිරීමේදී දෙමව්පියන්ගේ අඥානකම නිසා දරුවන් විනාශ මුඛයට යා හැකි අවස්ථා ද ඇත. නවසීලන්තය අධික සීතල රටක් බැවින් සෑම නිවසකම බුමුතුරුණු අතුරා ඇත. ළමයින්ගෙන් මෙම බුමුතුරුණු ආරක්ෂා කරගැනීම ඉතාමත් අපහසු කාර්යයකි. එයට හේතුව නම් දරුවන් විසින් විවිධ බීම වර්ග බුමුතුරුණු මත හැලීමයි. දරුවන් විසින් කරනු ලබන මෙම ක්‍රියාවලිය වැළැක්වීමට දෙමව්පියෝ විවිධ උපක්‍රම යොදති. දිනක් මම මිතුරකුගේ නිවසට ගිය විට, ලංකාවේ සුප්‍රසිද්ධ වෛද්‍ය යුවලක් හා ඔවුන්ගේ කුඩා පුතු ද පැමිණ සිටියහ. මගේ මිතුරා ඔවුන්ට කොකාකෝලා වලින් සත්කාර කළේය. කුඩා පුතු කොකා කෝලා වීදුරුව අතට ගත් සැනින් ඔහු කළේ කුමක්ද? බීම වීදුරුව රැගෙන මුළුතැන්ගෙට දිව ගියේ ය. ඔහු හිටගෙන ම කොකා කෝලා වීදුරුව එක හුස්මට බී ආපසු පැමිණ වාඩි විය. මට මෙය ප්‍රහේලිකාවක් විය. මම මේ ගැන දරුවාගේ දෙමව්පියන්ගෙන් ප්‍රශ්න කෙළෙමි. එවිට ඔවුන් කීවේ දරුවාගෙන් බුමුතුරුණු බේරාගැනීමට ඔහු එලෙස පුරුදු කර ඇති බවයි (මුළුතැන් ගෙයි බුමුතුරුණු අතුරා නැත). දරුවා අතින් බීම වර්ග විසිරීම වැළැක්වීමට එම වෛද්‍ය දෙමව්පියන් විසින් දරුවාට දුන් පුහුණුවත් දරුවා හොඳින් පුහුණු වී ඇති ආකාරය දුටු මගේ මිතුරා ද එම ක්‍රියාව ප්‍රශංසා මුඛයෙන් අනුමත කළේය.

මෙම දරුවාගේ ක්‍රියාවත් පුහුණු කරන ලද සුරතල් සත්ත්වයකුගේ ක්‍රියාවත් අතර වෙනසක් මම නම් නොදුටුවෙමි. හොඳ යයි සම්මත මෙවැනි පුහුණු වලින් අවසානයට සිදුවන්නේ කුමක් ද? මෙම දරුවා වැඩිහිටියකු බවට පත්වන විට මෙම පුහුණුව

නිසා ඇති වූ මානසික ආතතියෙන් නිදහස් වන්නේ කෙසේ ද? මෙවැනි පුහුණු වලින් දරුවාගේ තර්කන බුද්ධිය වර්ධනය වෙයිද නැතිනම් හීන වෙයිද යන්න ඔබම සිතා බලන්න. මෙවැනි පුහුණු වලින් දරුවාගේ මානසික වර්ධනයට හානි නොපැමිණෙන්නේ ද?

වැඩිහිටියා යම් තරමකට දැනුමෙන් පොහොසත් බැවින් යම් ක්‍රියාවකට පුහුණු වන විට ඔහු හෝ ඇය තම විෂයය සම්බන්ධ දැනුමත් තර්කය හා විතර්කයත් තම පුහුණුවට යොදාගනී. වැඩිහිටියකු යම් වෘත්තියකට පුහුණු කරන ආකාරයට දරුවන් පුහුණු කිරීම ද සුදුසු නොවෙයි. දරුවන්ගේ ශාරීරික හා මානසික වර්ධනය ගැන පර්යේෂණයක නිරත වූ පර්යේෂකයකු නිවුන් දරුවන් දෙදෙනකු තෝරාගෙන ඉන් එක් දරුවකුට කුඩා කාලයේ සිටම පඩි නැගීමට පුහුණු කළේය. අනෙක් දරුවා සාමාන්‍ය ලෙස වැඩෙන්නට ඉඩ සැලැස්වීය. අවසානයේ දී ඔවුන්ගේ නියමිත වයස පැමිණි විට දරුවෝ දෙදෙනාම එක සමාන හැකියාවකින් යුතුව පඩි නැග්ගහ. බාහිරෙන් දෙන පුහුණුව දරුවාගේ හැකියාවන් වර්ධනයට පිටුවහලක් නොවන බව පර්යේෂකයාගේ නිගමනය විය. වැදගත් වන්නේ ඔවුන්ගේම උත්සාහයෙන් කරන ක්‍රියාකාරකම් ය.

එකඟ කරගත් සිතක් ඇති විට, පොත්පත්වල ඇති දේ කටපාඩම් කරගැනීමට එමගින් පහසුවක් විය හැක. නමුත් ඉගෙනීම යනු කටපාඩම් කිරීම නොවේ (නමුත් අවාසනාවකට මෙන්, ගොවියා තම වී ගබඩා කිරීමට වී බිස්සක් යොදාගන්නා මෙන් තමන්ට ගබඩා කරගැනීමට නොහැකි වූ දැනුම ගබඩා කිරීමට තම දරුවන් යොදා ගනී). තර්කය හා විතර්කය නැති තැන අධ්‍යාපනයත් නැත. නමුත් අපි අපේ දරුවන්ට (විශේෂයෙන් වැඩිහිටියන් සමග) තර්ක කිරීමට ඉඩ නොදෙන්නෙමු. ඔවුන්ගේ නොවැඩුන සිත් එකඟ කරගැනීමට පුරුදු පුහුණු කිරීමෙන් තර්කය හා විතර්කයට හානි පැමිණෙයි. යමෙක් අධ්‍යාපනය ලබන්නේ තම චින්තනය හෙවත් සිතුවිලි උපකාරයෙනි. මෙම සිතුවිලි එක් අරමුණකට බැඳ තැබීමෙන් දරුවාට මනා අධ්‍යාපනයක් ලැබිය හැකි ද?

සිත එකඟ කරගැනීමට පුරුදු පුහුණු කළ දරුවෝ

දෙමව්පියන්ට කීකරු වෙති, සමාජයෙහි ඉතා යහපත් දරුවන් ලෙස හැසිරෙති, විභාග හොඳින් සමත් වී සමාජයේ හොඳ නම දිනා ගනිති. නමුත් ඔවුහු සමාජයට මනා සේ නිරාවරණය වී නැති බැවින් සමාජයෙන් පැනනගින ගැටලු වලට මුහුණ දීමට අවශ්‍ය තර්ක විතර්ක ඥානය ඔවුන් තුළ වර්ධනය වී නැත. මෙවැනි දරුවෝ ඉතාමත් සුළු ප්‍රශ්නයකදී සැළෙති, සියදිවි නසා ගැනීමට පෙළඹෙති.

**කර්තෘ සටහන:** 'පන්සිල් සහ ළමා මනස' නම් වූ මගේ ලිපියක් ලංකාදීප ඉරිදා සංග්‍රහයේ පල විය. එය විවේචනයට ලක් වූ ලිපියකි. මෙම ලිපියෙන් මවිසින් පාඨකයාගෙන් ප්‍රශ්න කළේ, සතුන් මැරීම, කාමයෙහි වරදවා හැසිරීම, සොරකම් කිරීම වැනි වැඩිහිටියනට පමණක් සීමා වූ ධර්ම දරුවන්ට ඉගැන්වීම සුදුසු ද යන්නයි. දරුවන් මෙම දුෂ්චරිත වලින් වැළැක්වීමට ඔවුන් සමාදන් කරවන විට, මෙම ධර්ම පළමුව ඔවුන්ට ඉගැන්විය යුතුය. උදාහරණයක් ලෙස සතුන් මරන්නට එපා යයි උගන්වන විට 'සතුන් මැරීම' දරුවා ගේ මනසෙහි මුල් බැසගන්නවා ඇත. සතුන් මරන්නට එපා යයි ඉගැන්වීම වෙනුවට මම යෝජනා කළේ සතුන්ට ආදරය කරන්නට කියා දීම සුදුසු බවයි. මගේ එම ලිපියට ලැබුණ විවේචන වලට පිළිතුරු වශයෙන් ලංකාදීපයට මා විසින් ලියන ලද තවත් ලිපියක එක් ඡේදයක් මෙහි ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. දරුවන් සිටින දෙමව්පියන් ට මෙය වැදගත් වේ යැයි මම සිතමි.

"සතුන් මැරීම, කාමයෙහි වරදවා හැසිරීම ආදී (වැඩිහිටියනට පමණක් සීමා වූ) ධර්ම පමණක් නොව ගණිතය විද්‍යාව ආදී විෂය කරුණුද නියමිත වයස සම්පූර්ණ වීමට පෙර උගැන්වීම සුදුසු නැත. අනාගතයේ ඉගෙනීමට ඇති විෂය කරුණු දැන්ම උගන්වා තම දරුවා උගතකු කිරීම සමහර දෙමව්පියන්ට ඇති රෝගයකි. අධ්‍යාපන මනෝ විද්‍යාව ගැන හසරක් නොදන්නා ඔවුහු ටියුෂන් ගුරුවරු ලවා තම දරුවාට විෂයයන් පොවති. මෙම විෂයයන් දරා ගැනීමට දරුවාගේ නොමේරූ මොළයට හැකියාවක් නැත. ඉගෙන ගත් වචන වල මතකය පමණක් ඇති මෙවැනි

දරුවන්ට විමර්ශනාත්මක චින්තනයක් නැත. මෙවැනි දරුවන් නැවත පුනරුත්තාපනය කිරීම ඉතා අපහසු බව අත්දැකීමෙන් මම දනිමි. මෙම දරුවන් වැඩිහිටියන් වූ විට ජීවිතය පවත්වාගෙන යාමට අවශ්‍ය චින්තනයවිචාරය ඔවුන්ට නැතිව යයි. මනස මේරීමට පෙර පස්පව් වැනි ධර්ම ඉගැන්වීම කවර ආකාරයකට ඔවුන්ගේ මනසට බලපාන්නේද යන්නත් වැඩිහිටියන් වූ පසු ඔවුන්ගේ චර්යාවන්ට එම ධර්ම කෙසේ බලපාන්නේ ද යන්නත් කිසිම අධ්‍යාපන විශාරදයකු මෙතෙක් පර්යේෂණ කර නැත. දැන් එළඹ ඇත්තේ අධ්‍යාපන මනෝ විශේෂඥයින්ට ඒ සඳහා අවදි විය යුතු කාලයයි. මෙය සුළුකොට තැකිය යුතු කරුණක් නොවේ.”

20

# අරංන්තලාවෙන් මතුකරන ලෝකෝත්තර දහම

ගෞතම බුදුන් වහන්සේගේන් අවුරුදු දෙදහස් පන්සියයකට පසු ලංකාදීපයේ සිදුවූ සිද්ධි දාමයක් ඇසුරින් තමන් තුළ සිදුවන්නාවූ සත්ත්ව පුද්ගල දෘෂ්ඨියෙන් තොර වූ හේතුඵල දහම මෙම ලිපියෙන් මම එළිදරව් කරමි. පළමුව තමන්ගෙන් බාහිර සිදුවූ තමන් පිළිගත් සත්ත්ව පුද්ගල දහම ද දෙවනුව තමන් තුළ සිදුවන හේතුඵල දහම ද මෙම ලිපියෙන් විස්තර කරයි.

ගෞතම බුදුන් වහන්සේ පිරිනිවන් පා වසර දෙදහස් පන්සියක් ගිය තැන ලංකාදීපයේ බෙදුම්වාදී යුද්ධයක් පැනනැග්ගේ ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අරන්තලාව නම් වූ ග්‍රාමයේ දී සාමනේර හිමිවරු 30 නමක් මෙම බෙදුම්වාදීන් අතින් මැරුම් කෑහ. එම හිමිවරුන් අතර සිටි බුද්ධසාර නම් හිමිනමට ජීවත් වීමේ වාසනාව ඉතිරි වූ නමුත් වෙඩි වැදීම නිසා ඔත්පල විය. සතුරු සේනාව යුද ප්‍රකාශ කළහ. ලංකාදීපයේ මරණ බිය පැතිරෙන්නට විය. අරන්තලාව සතුරු සේනාව යටතට පත්විය. අරංතලාව වල්බිහි විය. දිවිගලවා ගත් බුද්ධසාර හිමිනම ලංකදීපයේ වැසියනට අමතක විය.

ලංකාදීපය විනාශ කරන්නට පැමිණි බෙදුම්වාදී සතුරු සේනාවට අසල්වැසි රාජ්‍යයක් වූ ඉන්දියාව උදව් කළේය. සතුරු සේනාව ඉන්දියාවෙහි හැදී වැඩී වර්ධනය වූහ. අන්තිමේ දී ලංකාදීපය එවකට පාලනය කළ ජනාධිපති තුමා ඉන්දියාවත් සමග එකතුව සතුරු සේනාව සමග ගිවිසුමක් ඇති කරගත්තේය. නමුත් සතුරු සේනාවෝ ගිවිසුම ඉරා දැමූහ. බල සම්පන්න වූ ඉන්දියන් හමුදාවට ද බෙදුම්වාදීන් යුද ප්‍රකාශ කළහ. ඉන්දියන් හමුදාවට ද සතුරු සේනාව විනාශ කළ නොහැකි විය. මෙම සතුරු සේනාව

එවකට ඉන්දියාවේ රජකළ පාලකයා ද මරා දැමීය. ලංකාදීපයේ යුද හමුදාවේ යුද සේනාංක හතරක් සතුරු සේනාංක වටකර පහර දුන්නද සතුරු සේනාව විනාශ නොවීය. අනතුරුව යුද සේනාංක හයක් යොදා පහර දුන්නද ඔවුන් විනාශ කළ නොහැකි විය. අරන්තලාවේ සාමනේර වරුන් ඝාතනය කර අවුරුදු විස්සක කාලයක් ගත විය. මෙම කාලයේදී නායකයින් පස්දෙනෙක් ලංකාදීපය පාලනය කළහ. ප්‍රභාකරන් නම් වූ සතුරු සේනාවේ නායකයා ලංකාදීපයේ කොටසක් බලහත්කාරයෙන් පාලනය කළේය. විසි අවුරුදු කාලයේදී සතුරු සේනාව සමග යුද වැදීම් ද සාම ගිවිසුම් ද අතොරක් නැතිව ඇති විය. ප්‍රභාකරන් සාම ගිවිසුම් ඉරා දමයි. මෙම විසි අවුරුදු කාලයේදී ලංකාදීපය පාලනය කළ පාලකයෝ තිදෙනෙක් මරණයට පත් වී විසි අවුරුදු පාලන කාලයට පසු එක් පුරුෂ පාලකයෙක් ද එක් ස්ත්‍රී පාලකයෙක් ද ඉතිරි විය. විසි අවුරු කාලය අවසානයේ කරුණා නම් වූ ප්‍රභාකරන්ගේ එක් ප්‍රබල සෙනෙවියෙක් ඔහුගෙන් ඉවත් විය. ඔහු ප්‍රභාකරන්ට එරෙහි විය.

මෙවැනි වකවානුවකදී මහින්ද නම් මහා බලසම්පන්න ජනාධිපති කෙනෙක් ලංකාදීපයේ පාලනය බාරගත්තේය. එතුමා ත්‍රිවිධ හමුදාවේ පාලනයට ඔහුගේ සහෝදර වූ ගෝඨාභය පත් කළේය. ත්‍රිවිධ හමුදාවට දක්ෂ හමුදාපතිවරු තිදෙනෙක් පත් කළේය. මේ අතර සතුරු සේනාව අවසාන සාම ගිවිසුමද ඉරාදමා මාවිල්ආරු සොරොව්ව වසා දමා ජල සැපයුම නතර කළහ. ජලය නොමැතිව ගොවීන් ගේ ගොවිතැන් පාළු විය. බීමට පවා ජලය නොමැති විය. රට පාලනය කළ මහින්ද ජනාධිපතිතුමා සතුරු සේනාව එලවා දමා ගොවියාට ජලය නැවත ලබාදීමට යුද හමුදාවට නියෝග කළේය. දින හතකින් යුද හමුදාව මාවිල් ආරු සොරොව්ව අල්ලා ගත්හ. සටන එතැනින් නොනැවතුණි. සතුරා සම්පූර්ණයෙන්ම විනාශ කර මිස සටන නොනවතිමියි අදිටන් කරගත් මහින්ද ජනාධිපති තෙමේ සටන නොනවත්වාම ගෙන ගියේය. කරුණා නම් වූ සෙනෙවියාගේ සහයද සතුරු සේනාව විනාශ කිරීමේ සටනට නොඅඩුව ලැබුණි.

අරන්තලාවේ සාමනේර ඝාතනයෙන් විසි වසරකට පසු බෙදුම්වාදී සතුරු සේනාව ලංකාදීපයේ නැගෙනහිර දිස්ත්‍රික්කයෙන් එලවා දමනු ලැබීය. ගුවන් හමුදාවත් නාවික හමුදාවත් යුද හමුදාවේ උපකාරයට පැමිණියේය. සතුරු හමුදාව සම්පූර්ණයෙන් විනාශ කළ නොහැකි යැයි විරුද්ධ පාක්ෂිකයෝ කීහ. නමුත් මහින්ද ජනාධිපතිතුමාත් ත්‍රිවිධ හමුදාවත් එක තීරණයක් ගෙන සටන අවසානය දක්වා ගෙන ගියහ. විසි එක්වන වසරේදී යුද හමුදාව මෙහෙයුම් සඳහා සේනාංක පහක් සහ කාර්ය සාධක බලකා තුනක් සමග බළසේනා අටක් මෙහෙයුම් සඳහා එක් කරන ලදි.

අවසාන සටන සිදුවන විට ජාත්‍යන්තර බලපෑම් එල්ල විය. ඇමෙරිකාවත් එංගලන්තයත් නොර්වේ රාජ්‍යයත් ශ්‍රී ලංකාද්වීපය ත්‍රස්තවාදීන්ගේ නිදහස් කර ගැනීමේ භාරධූර කාර්යය වැළැක්වීමට අපමණ වෙහෙසක් ගත්හ. අරන්තලාවේ භික්ෂු ඝාතනය සිදුවී අවුරුදු 22 ක් සපිරෙන විට ලංකාදීපය සම්පූර්ණයෙන්ම සතුරන්ගෙන් ගලවා ගත්හ. වැසියෝ ජයපැන් බිවූහ. මහින්ද ජනාධිපතිතුමා ලංකාදීපයේ පළාත් නවයෙහි දාගැබ් 9 ක් සාදන බවට ප්‍රතිඥාවක් දුන්නේ ය.

මෙම අරන්තලාවේ කථාවෙන් අපට කියා දෙන්නේ තමන් තුළ සිදුවන්නා වූ අභ්‍යන්තර ධර්මයකි. මෙහි අරන්තලාව නම් ප්‍රභාස්වර මනසයි. සාමනේර වරුන් නම් දැනුමෙන් තොරව මනසෙහි පවත්නා ගුණ ධර්මයි. කුඩා ළමයාගේ ප්‍රභාස්වර මනසෙහි බාහිරෙන් නූගන්වන ලද්දා වූ ගුණ සමුදාය නම් එයයි. ප්‍රභාකරන් නම් තණ්හාවයි. ඔහුගේ හමුදාව නම් කෙලෙස් ය. යටපත් ව තිබූ කෙලෙස් මතු වන්නේ බාහිර දැනුමත් සමගයි. මෙම දැනුමත් සමග මතුවන කෙලෙස් වලින් උප්පත්තියෙන් කුඩා ළමයා ළඟ තිබූ ගුණ මරා දමයි. තන්හාව නැමති ප්‍රභාකරන්ගේ කෙලෙස් නැමති හමුදාව සාමනේර හිමිවරු නැමති ගුණ මරා දැමූ හ. නමුත් බුද්ධ සාර හෙවත් බුද්ධ අංකුරයට හානි පැමිණුන ද නොමැරී බේරෙයි. කෙලෙස් වලින් බුද්ධ අංකුරය යටපත් වෙයි. රටවැසියනට බුද්ධ සාර අමතක වෙයි. අරන්තලාව හෙවත් ප්‍රභාශ්වර මනස කෙලෙස් වලින් වල් වැදෙයි.

අවුරුදු විස්සකදී පාලකයින් පස් දෙනෙක් වීර්යය දැරුව ද සතුරු සේනාව විනාශ කළ නොහැකි විය. මෙහි අවුරුදු විස්ස නම් ලෞකික ඥාන විස්සයි. පාලකයින් පස් දෙනා නම් ඉන්ද්‍රියන් පහයි. මෙම ඉන්ද්‍රියන් පහ නැමති පාලකයන් තණ්හාව නැමති සතුරාගෙන් ලංකාදීපය බේරාගැනීමට වීර්යය දරන්නේ තණ්හාව සමග ගිවිසුම් ඇති කරගැනීමෙනි. සත්‍ය දකින්නට පෙර සියලු සත්‍ය ගවේශකයෝද සත්‍ය දකින්නට ගුරුහරුකම් ගන්නේ තණ්හාව නැමති ගුරුවරයාගෙනි. ඔවුහු තණ්හාව සමග ගිවිසුම් ඇති කර ගනිති. නමුත් තණ්හාව ඉන්ද්‍රියන් පහ රවටයි. ලෞකික ඥාන 20 න් සත්‍ය දකින්නට නොහැකි බව මෙයින් පෙන්වයි. මුලින් තිබූ හමුදා සේනාංක 4 නම් මෙත්තා. කරුණා. මුදිතා උපේක්ෂා නම් වූ සතර බ්‍රහ්ම විහරණයයි. සතර බ්‍රහ්ම විහරණයෙන් සත්‍ය දකින්නට නොහැකි ය. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා බුදු දහම නොවන බව මෙයින් පෙන්වයි. යුද සේනාංක 6 නම් ඇස, කණ, නාසය දිව, ශරීරය හා මන නම් වූ 6 ඉන්ද්‍රියයයි. සය ඉන්ද්‍රියන් ගෙන් ද සත්‍ය දැකීමට නොහැකිය.

අසල්වැසි මහා රාජ්‍ය වූ ඉන්දියාව හා එහි පාලකයා නම් සිතත් සිතුවිලිත් ය. සිතෙහි තණ්හාව ඇතුළු සියලුම කෙලෙස් වැඩෙයි. සතුරු සේනාව හැදී වැඩී වර්ධනය වූයේ ඉන්දියාව නැමති සිත තුළයි. සිතුවිලි තණ්හාවට උදව් කරයි. නමුත් පසුව ඉන්දියාව ද සතුරාට එරෙහි වෙයි. සත්‍ය දකින තෙක් තන්හාව ඇතුළු කෙලෙස් නැති කරන්නට වීර්යය දරන්නේ සිතෙනි. නමුත් තණ්හාවට අවශ්‍ය තමන්ට සිතැඟි පරිදි චිරාත් කාලයක් පාලනය ගෙනයාමටයි. ඒ සඳහා තණ්හාව නැමති ප්‍රභාකරන් සිතුවිලි නැමති රජීව් ගාන්ධි මරා දමයි. කායික හා මානසික වීර්යය යොදමින් සිතුවිලි වලින් තොර වීමට යෝගාවචරයෝ ද නාසඥා නේවසඥාව දක්වා සිතුවිලි පාලනය කරමින් ධ්‍යාන වඩති. මෙම ධ්‍යාන වැඩීම තණ්හාවේ වැඩක් බවවත් යෝගාවචරයෝ නොදනිති. ධ්‍යාන වඩන තරමට තණ්හාවට දීර්ඝ කාලයක් සුවසේ වාසය කළ හැක. ධ්‍යාන ලබා බ්‍රශ්ම ලෝක වල කල්ප ගණන් සැරිසරන බැවින් නැවත සත්‍ය දැක තණ්හාව නැති කිරීමට බොහෝ කාලයක් ගත වෙයි. ධ්‍යාන වැඩීම යනු තණ්හාවට ආ වැඩීමක් බවත් නිවනට මග

නොවන බවත් මෙම ධර්මයෙන් කියා දෙයි. සතුරු නායකයාගෙන් ඉවත් වූ කරුණා නම් සැකයයි. ඔහුට තම තණ්හාව නැමති නායකයා ගැන සැක ඇති විය. නමුත් කරුණාට ද ප්‍රභාකරන් විනාශ කළ නොහැකි විය. සැකයයෙන් ද නිවන් දැකිය නොහැකිය. නමුත් ලෞකික ධර්ම වලින් නිදහස් වීමට සැකය උපකාරී වෙයි.

අවුරුදු විස්සකදී පාලකයින් පස් දෙනකුට ඉන්දියාවේ උදව් ඇතිව සතුරු සේනාව විනාශ කිරීමට නොහැකි විය. එයින් අදහස් වන්නේ ලෞකික ඥාණ වලින් ද ඇස කණ නාසය දිව, ශරීරය ආදී ඉන්ද්‍රියන් උපකාරයෙන් ද සත්‍ය දැකිය නොහැකි බවයි. අවුරුදු විස්සකට පසුත් ජීවත් වන හිටපු පුරුෂ පාලකයා හා ස්ත්‍රී පාලිකාව නම් නාම රූප දෙකයි. ප්‍රඥාව පහළ වන්නේ නාම රූප දෙක ඉක්මවීමෙනි. ජල පිපාසය නම් ලෝකෝත්තර ධර්ම පිපාසයයි. මාවිල් ආරු සොරොව්ව බේරාගෙන ජල ප්‍රශ්නය විසඳීම නම් සෝවාන් මාර්ගයයි.

විසිවන වසර අවසාන මානුෂික මෙහෙයුමේ ආරම්භයයි. එය විසිඑක්වන ඥාණය පහළ වීමයි. ලෞකික දැනුම ඉක්මවූ වූ විසිඑක්වන ඥාණය පහළ වන්නේ ප්‍රඥාවෙනි. මෙහි ප්‍රඥාව නම් අවුරුදු 20 කට පසු පහළ වූ මහින්ද ජනාධිපති තුමයි. ජයග්‍රහණය සඳහා අභීතව ක්‍රියාකළ යුද හමුදා සේනාංක අට නම් ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. යුධ හමුදා සේනාංක අට දක්වා වැඩිකරන තෙක් සතුරා විනාශ කළ නොහැකි විය. කෙලෙස් නැමති සතුරා පරාජය කළ හැක්කේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙන් පමණි. රහත් ඵලයේදී ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙන් ද නිදහස් වෙයි. ජනාධිපති තුමාට සටන අවසානය කරාගෙන යාම සඳහා යුග පුරුෂයින් අට දෙනකුගේ උපකාරය ලැබුණි. මෙම පුරුෂයින් අට දෙනා නම් සෝවාන් මාර්ගය සෝවාන් ඵලය ආදී වශයෙන් වූ ලෝකෝත්තර මාර්ග හා ඵලයන් ය.

විසි දෙවන වසර නම් විසි එක්වන ඥානය සම්පූර්ණ වීමෙන් පහළ වන විසි දෙවන ඥාණයයි. විසි දෙවන ඥාණයෙන් තන්හාව ඇතුළු සියලු කෙලෙස් ඉතිරි නොවීම විනාශ

වෙයි. අරන්තලාවේ සාමනේර ඝාතනය සිදු වී අවුරුදු විසිදෙකකට පසු ප්‍රභාකරන් ඇතුළු සියලුම සතුරන් විනාශ වී ලංකාදීපය එක්සේසත් විය. අවසාන සටනේදී සටන නැවත්වීමට වෙර දැරූ රටවල් තුන නම් තන්හා රතී රගා නම් වූ මර දූවරු තිදෙනායි. රහත් ඵලය ලබන්නේ ඤාණ විසි දෙකම සම්පූර්ණ වීමෙන් පසුවයි. මහින්ද ජනාධිපති තුමා සාදා නිමකරන්නට ප්‍රතිඥා දුන් ස්ථූප නවය නම් නව අරහාදී බුදු ගුණයි.

වර්තමානයේ අපේ කාලයේ සිදුවූ අරංතලාවේ කථාවෙන් රහත් ඵලය දක්වාම ධර්ම විවෘත කරන බැවින් ලංකාදීපයේ අනාගතයේ දී රහතන් වහන්සේලා බිහිවන්නේ ය. 20080827 දින ලංකාදීප ඉරිදා පුවත් පතෙහි පළවූ (අකාලික විශ්වයෙහි මනසින් සාදාගත් කාලික භෞතික විද්‍යාව) නැමති ලිපියෙන් උපුටා ගත් කොටසක් මෙහි පළකිරීමට කැමැත්තෙමි. (කාලය පදාර්ථය හා පුද්ගලයින් පිළිගෙන චින්තනයෙන් නිර්මාණය කර ගත් භෞතික විද්‍යාව ඇතුළු සියලු විද්‍යාවන් ද දර්ශන ද ආගම් ද අභිබවා මිනිසා දැන් ප්‍රඥාව අබියසට පැමිණ ඇත. තව අවුරුදු කීපයකින් ආරම්භ වන ඒ ප්‍රඥා යුගය මිනිසාගේ ස්වර්ණමය යුගය වේ). ශ්‍රී ලංකාදීපයේ එම ස්වර්ණමය යුගය වැඩි ඈතක නොවෙයි.

තමන්ගෙන් බාහිර සිදුවන සත්ත්ව පුද්ගල ධර්මය පිළිගත් විට කර්මයට ද කර්ම ඵලයට ද අසුවන මිනිස් සත්ත්වයා එතැනින් නොනැවතී තමන් පිළිගත් පුද්ගලයන් සමග වෛරය ද ක්‍රෝධය ද ඇති කරගනී. මෙම වෛරය ඇතිවූයේ ජාතීන් අතර නම් අවසානයේ දී මෙම වෛරය යුද්ධයකට පෙරළෙයි. ජාති වෛරය ඇති සියලු දෙනාම යුද්ධය නිසා දුකට පත්වෙති. මෙම ධර්ම සියල්ලටම හේතුව අවිද්‍යාව නිසා පහළ වූ සංස්කාර ධර්මයි. සංස්කාර යනු පිළිගැනීමක් විනා සත්‍ය නොවන බැවින්, බාහිර පිළිගැනීම වෙනුවට තමන් තුළ සිදුවන්නා වූ හේතුඵල ධර්මය දැකිය හැකිනම් වෛරය සංසිඳී දුකෙන් ද නිදහස් විය හැක. දශක දෙක හමාරකදී තමන්ගේ සිතට වද දුන් බාහිර පිළිගත් යුද්ධය යනු රහත් ඵලය දක්වා ධර්ම කියාදෙන තමන් තුළ සිදුවන සත්ත්ව පුද්ගල දෘෂ්ඨියෙන් තොර වූ හේතු ඵල ධර්මය ම නොවේ ද? තමන්

තුල හේතුඵල දහමක් ක්‍රියාත්මක වන එම ධර්ම සත්ත්ව පුද්ගල දහමක් ලෙස පිළිගැනීම නිසා පුද්ගලයා කර්මයටද කර්ම ඵලයටද අසු වී සසර ගමන දුකක් කර ගනී. යුද්ධයෙන් සිදුවූ තුවාල වලින් තවමත් වේදනා විඳින අයට එම වේදනා වලින් නිදහස් වීමටත් ජාතියක් ලෙස යම් කෙනෙකුට ඇති වෛරය සංසිඳුවා ගැනීමටත් සත්ත්ව පුද්ගල දෘෂ්ඨියෙන් තොර වූ සත්‍යය දැකීම එකම විසඳුමයි.

රූප, වේදනා, සඥා, සංස්ඛාර සහ විඥාන යනු පංචස්කන්ධය බවත් මෙම පංචස්කන්ධය උපාදානය කිරීම (දැඩිව අල්ලා ගැනීම) දුකට හේතුවන බවත් ධර්මධාරීහු දනිති. නමුත් පංච උපාදානස්කන්ධය යනු තමන් විසින් ම අනුන්ගෙන් අසා දැනගත් දැනුම් සම්භාරය බව මේ කිසිවෙක් නොදනිති, නොදකිති. එමනිසා ඔවුහු අතහැරිය යුතු දැනුම ම උපාදානය කරමින්, දැනුමෙන් නිර්මාණය කරගත් ධර්මය ම පෙරටු කොට ගෙන ඒ තුලින් ම සත්‍ය සොයති.

# ප්‍රශ්න සහ පිළිතුරු

**මෙහි** දැක්වෙන්නේ පේරාදෙණියේ ඉන්දික විතාරණ විසින් මා වෙත යොමු කරන ලද ප්‍රශ්න සහ ඒවාට පිළිතුරුත් ය.

**ප්‍රශ්නයඃ සත්‍ය හෙවත් නිවන් දැකීමේ ක්‍රියාමාර්ගය කුමක් ද?**

සත්‍ය හෙවත් නිවන් දැකීමට මාර්ගයක් ඇත. නමුත් එය ක්‍රියාමාර්ගයක් නොවේ. බොහෝ සත්‍ය ගවේශකයින් නොදන්නා කරුණ එයයි. නිවන් මාර්ගය ක්‍රියාවෙන් තොර වෙයි. බුදුන් වහන්සේ 'ක්‍රියාව' නම් වූ සංස්ඛාර ධර්මය කෙසෙල් කඳකට උපමා කළහ. එහි හරයක් නැත. එමනිසා 'නිවන' පුරුදු පුහුණු කිරීමෙන් හරයක් නැති ක්‍රියා පටිපාටියකින් අවබෝධ කරගත නොහැක. මෙය දැකීමකි. සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය ඇතුළු සියලු දෘෂ්ඨි වලින් නිදහස් වූවකි. භාවනා වැනි ක්‍රියා පිළිවෙළකින් සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය තව තවත් තහවුරු වනවා මිස එය නැති නොවේ. ඔබ වටා ඇති ඔබගේ මව්පිය දූදරු ඇතුළු ලෝකය, ඔබ විසින් ඔබේ මනසේ සාදාගත් මනකල්පිත ලෝකයක් බව ඔබ දැකිය යුතුය. නමුත් පිළිනොගන්න. සත්‍ය දේශනා කිරීමට හෝ ලිවීමට නොහැකිය. නමුත් බුදුකෙනෙක් නිශ්ශබ්දව සිටියොත් සත්‍ය දැකීමට උපන් ඔබ වැන්නන්ට සත්‍ය නොලැබී යයි. බුදුකෙනෙක් දේශනා කරන දේ පිළිනොගන්න. වචන පිළිගැනීමෙන් සත්‍ය වැසී යයි. නිවන ඔබ තුළම ඇති අතර ඔබේ දැනුමෙන් එය වැසී ඇත. ඔබේ තද නින්ද ගැන මොහොතක් සිතා බලන්න. එතැන දුකක් තිබේ ද? තද නින්ද දැනුමෙන් ද කාලයෙන් ද තොර වෙයි. නමුත් ඔබ කිසිවක් දන්නේ ද නැත. තද නින්දෙන් ඉන්ද්‍රියන්ට අවදි වීම අවිද්‍යාවයි. ඔබ තද නින්දෙන් ඉන්ද්‍රියන් අභිබවා අවදි විය යුතුය. එවිට මෝහයෙන් නිදහස් වෙයි. ඔබ තවමත් ඉන්නේ තද නින්දේය. ඔබගේ කෙළෙස් ඔබට මහා බරකි. ඇයි ? ඔබ කෙළෙස් හිස මත තබාගෙන සිටින බැවිනි. කෙලෙස් තැවීමට උත්සාහ නොකරන්න. කෙළෙස් තැවීමෙන් 'මම' යන සංකල්පය තවදුරටත් තහවුරු වෙයි. සත්‍ය වැසෙයි.

මාර්ගඵල ලාභියාටද කෙළෙස් ඇත. නමුත් ඔහු හෝ ඇය එම කෙළෙස් තමන්ගේ යයි බාරගන්නේ නැත. කෙළෙස් බරින් නිදහස් ය.

**ප්‍රශ්නයඃ පුනරුත්පත්තිය ගැන පිරිසිදු බුද්ධ දේශනය කුමක්ද?**

පුනරුත්පත්තියක් ගැන අපි කථා කරන්නේ අපි සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය පිළිගත් බැවිනි, පුද්ගලයාගේ මරණය පිළිගත් බැවිනි. එය ලෞකික ධර්මයකි. පුනරුත්පත්තියක් ඇතයි කීවොත් එය එක් අන්තයකි. පුනරුත්පත්තිය නැතයි කීවොත් එය අනෙක් අන්තයයි.

**ප්‍රශ්නයඃඔබ ප්‍රකාශ කරන ආකාරයට ආශ්වාස/ප්‍රාශ්වාස කරවන්නෙක් නැති වුවත් අප අවදිව සිටින විට හුස්මට බලපෑමක් කිරීමට පුද්ගලයකුට හැකියාවක් තිබේද? උදාඃ හුස්ම නතර කරගෙන සිටීම.**

මෙහිදීද ඔබ පුද්ගලයා පිළිගෙන ඔහුගේ හැකියාවක් ගැන කථා කරයි. ආශ්වාස/ප්‍රාශ්වාසය පමණක් නොවෙයි, මිනිසා විසින් කරනු ලබන කොපමණ දේවල් මේ ලෝකයේ තිබේ ද? අවදිව ඇති විට කරනු ලබන මේ සියලු ක්‍රියා මනසේ ම නිර්මාණ වෙයි. සංස්බාර ලෙස හඳුන්වන්නේ මෙම ධර්මයි. අවිද්‍යාව නිසා අපි විසින් ඇති කරගන්නා සංස්බාර ධර්ම සත්‍ය නොවේ.

**ප්‍රශ්නයඃ ඇසට පෙනෙන්නේ ද්‍රව්‍ය නොවේ නම් අතට හසුවන්නේ මොනවාදැයි අසා තිබූ ප්‍රශ්නයට ඔබතුමා ලබාදී තිබූ උත්තරය පැටලිලි සහිතයි. උදාහරණ මදි බව හැඟේ. එය තවදුරටත් පහදා දෙන්න.**

එක් තටුවක් පමණක් ඇති විදුලි පංකාවක් ඇතයි සිතන්න. මෙම පංකාව ඉතා සෙමින් කැරකැවෙන විට පංකාවට යන්තමින් අත තබන්න. වරින් වර තටුව අතේ ස්පර්ශ වන විට ඔබට එම ස්පර්ශය දැනෙයි. දැන් පංකාවේ වේගය ක්‍රමයෙන් වැඩි කරන්න. එවිට ඉතා කුඩා කාලපරතරයකින් යුත්තව තටුව අතේ ස්පර්ශ වනු දැනෙයි. පංකාවේ වේගය තවත් වැඩි කළ විට පංකාව අතේ ස්පර්ශ නොවන අවස්ථාවක් නොදැනෙයි. නමුත් පංකාවේ කුඩා තටුව හැර අනෙක් ප්‍රදේශය හිස් අවකාශයයි. නමුත් හිස් අවකාශයක් ඇතයි අතට නොදැනෙයි. වරද කාගේ ද? පංකාවේ ද, ඔබේ මනසේ ද?

**ප්‍රශ්නයඃ තද නින්ද සහ මරණය අතර ඇති වෙනස පහදා දෙන්න.**

අවදිව ඇති විට තමන් විසින්ම සාදාගත් ලෝකයෙහි තමන් ජීවත් වෙයි. සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය නිසා තමන් විශ්වයෙන් වෙන්වෙයි. තද නින්දට ගිය විට තමන් යන දෘෂ්ඨිය නොමැති බැවින් විශ්වය සමග එකතු වෙයි. විශ්ව ධර්මයක් වූ ආශ්වාස ප ශ්වාසයත් ලේ ගමන් කිරීමත් එතැන ඇත. ශාරීරික මරණයෙන් සිදුවන්නේ ද එයමයි. පුද්ගල දෘෂ්ඨියෙන් වෙන්කර ගත් තමන් නැවත විශ්වයට එකතු වෙයි. විශ්ව ධර්මයක් වූ ආස්වාස ප්‍රශ්වාසය ද එතැනත් ඇත. ඔබ නිදාගත් විට ආස්වාස ප්‍රශ්වාසයත් ලේ ගමන් කිරීමත් දක්නට ඇති බැවින් ඔබේ ඥාතීන් අඬන්නේ නැත. පසුදා ඇහැරෙන බව ඔවුහු දනිති. මැරුණ පසු ඥාතීන් මළගිය ඥාතියාට පින්දෙයි. පාංශු කූලය දෙයි. තද නින්දේ සිටින කෙනාට පිං පමුණු වන්නේ නැත. වෙනස එයයි. නමුත් අවාසනාවකට කරුණ නම් බොහෝ බෞද්ධ ශාස්තෲවරුන්ගේ දේශනා අනුව යමෙක් මැරුණ පසු ප්‍රේතයන් භූතයන් වී ඉපිද ඥාතීන්ට කරදර කරයි. මෙවැනි උගැන්වීම් වලින් සිදුවන්නේ කුමක් ද? මෙම ධර්ම අසන දුර්වල සිත් ඇති (විශේෂයෙන් ගැහැනු අයට) මළගිය ප්‍රාණකාරයෝ ආරූඪ වෙති. ප්‍රතිසන්ධි විඥානය යනු කුමක් දැයි පැහැදිලි කිරීමට මළගිය ප්‍රාණකාරයා ආරූඪ වූ සිද්ධියක් ගැන පළ වූ බුදු දහම සම්බන්ධ ලිපියක් මම දිටිමි. බුදු දහමේ ඇති ගැඹුරු ධර්ම පැහැදිළි කිරීමට මෙවැනි මළගිය ඥාතීන් ආරූඪ වීම් ආදී ධර්ම බෞද්ධ පඬිවරු

දේශනා කරන විට, මෙම ප්‍රේත ධර්ම හා භූත ධර්ම අසන්නෝ සත්ත්ව පුද්ගල දෘෂ්ඨියෙන් තොර වූ බුදු දහමයට එරෙහි වෙති. මළගිය ප්‍රාණකාරයා ආරූඪ වීම යනු කුමක් ද? ඉතා දුර්වල සිත් ඇති පුද්ගලයන්ගේ යටිසිත තමන්ටත් නොදැනුවත්වම ක්‍රියාත්මක වීම මෙම ආරූඪයයි. බුද්ධිමත් මනෝ වෛද්‍යවරුන් මෙම වැරදි මත පිළිබඳව පුවත් පත් වල ලිපි පළකරති. නමුත් මෙම වටිනා ලිපි කියවන බොහෝ පාඨකයන්ට එවා බීරි අලින්ට වෙන ගායනා කරනවා වැනි ය. බුදුන් වහන්සේගේ ධර්ම යයි පවසමින් පතුරුවා හරින ප්‍රේත ධර්ම ම පාඨකයන් තුළ ඉස්මතු වෙයි.

**ප්‍රශනයඃසත්‍ය මෙනෙහි කිරීම භාවනාවක් නොවේද? එසේ නම් ඔබත් භාවනා කරන්නෙක් නොවේද?**

සත්‍ය දකිනවා විනා එහි මෙනෙහි කිරීමක් නැත. යම් කෙනෙක් භාවනා කරන්නේ චින්තනය පිළිගත් බැවිනි. සත්‍ය දුටු පසු චින්තනය අත හැරෙන බැවින් භාවනා කර වැඩි දියුණු කරන්නට දෙයක් තමන් තුළ නැත. සත්‍ය දකින්ට පෙර යෝගාවචරයෝ තමනුත් තමන්ගේ චින්තනයත් පිළිගෙන ඇති බැවින් ඔවුන් තමන්ගේ යයි පිළිගත් චින්තනය දියුණු කිරීමට භාවනා කරති. එහි වරදක් නැත. නමුත් යම්කෙනෙක් සත්‍ය දකීද, ඔහු හෝ ඇය චින්තනයෙන් නිදහස් වන බැවින් මාර්ගඵල ලාභියා භාවනා කරන්නේ නැත. මාර්ගඵල ලාභියා භාවනා කරන්නේ නැතයි මා කිවූ බස අසා භාවනාව අත්හැරියාට මාර්ගඵල ලබන්නේ ද නැත. ලෝකයේ වෙසෙන භාවනා කරන්නාටත් භාවනා නොකරන්නාටත් සත්‍ය දකින තෙක් නිවන නැත.

භාවනාවකින් හෝ වෙනත් ක්‍රමයකින් සිතුවිලි දියුණු කිරීම හෝ තාවකාලිකව යටපත් කිරීම හෝ හැක. නමුත් සිතුවිලි වලින් නිදහස් විය හැක්කේ සත්‍ය දැකීමෙන් පමණි. මෙම නිදහස් වීම යනු සිතුවිලි මරා දැමීම (නැති කිරීම) නොවෙයි. සත්ත්ව පුද්ගල දෘෂ්ඨියෙන් නිදහස් බැවින් සිතුවිලි තමන්ගේ යයි උපාදානය කරන්නේ නැත.

**ප්‍රශ්නයඃබුදු දහමේ සදහන් අට්ඨ සමාපත්තියට ට සමවැදීම සහ ඔබ විග්‍රහ කරන තද නින්ද දැකීම අතර සමාන කමක් නැද්ද?**

මම ත්‍රිපිටකය හදාරා හෝ පාලි භාෂාව ඉගෙන ගෙන නැති බැවින් අට්ඨ සමාපත්ති ගැන අවබෝධයක් නැත්තෙමි. ඔබට ඒ ගැන යම් විස්තරයක් කළ හැකිනම් ඒ ගැන යමක් කිව හැකි ය. නමුත් එකක් නම් මට කිව හැක. සියලුම භාවනා කරන්නෝ නේවසඥා නාසඥාවෙන් පසු තද නින්දට වැටෙති. තද නින්ද තුළ භාවනාවක් නැත. තද නින්ද දැකීම යනු තද නින්දෙන් අවදි වීමයි. මෙය ඉන්ද්‍රියන් ඉක්මවා අවදි වීමකි. තද නින්දෙන් අවදි වූවකුට තවදුරටත් භාවනාවෙන් ඇති ඵලය කුමක් ද?

**ප්‍රශ්නයඃදෙවියෝ/භූතයෝ යනුවෙන් ජීවි කොටස් සිටිත්ද?**

දෙවියෝ භූතයෝ යැයි කොටසක් සිටිති. ඔවුන් සිටින්නේ ඔබ නිර්මාණය කරගත් මනෝ ලෝකයේ හෙවත් සංස්කාර ලෝකයේ ය.

**ප්‍රශ්නයඃ පංචේන්ද්‍රිය උපයෝගි කරගෙන අප අරමුණු ලබා ගන්නා ආකාරය ඔබතුමා විස්තර කර තිබුණා. එනම් ශබ්දය යම් ස්ථානයකින් පිටවෙන ආකාරයත් එය මොළය දක්වා ගමන් කරන ආකාරයත් පිළිබඳවත්. නමුත් බුදු දහමට අනුව එම අවස්ථාවට විඥාණය සම්බන්ද නොවුන හොත් අරමුණු පංචේන්ද්‍රියට ගෝචර නොවන බවයි, මා අසා ඇත්තේ. ඔබ කියන ආකාරයට කණ හොඳින් ඇසෙන පුද්ගලයකුට ශබ්දයක් විඥානයේ උදව්වකින් තොරව ඇසිය යුතු බවද? අප මෙසේ සිතමුඃ කණ හොඳින් ඇසෙන නමුත් වෙන යම් කල්පනාවක සිටින කෙනෙකුට විශාල ශබ්දයක් නෑසීමට ඔබ කියන ආකාරයට හේතුව කුමක්ද ?**

පටිච්ච සමුප්පාදය අනුව කණ සහ මනස සමග ඇති සම්බන්ධතාව,

සළායතනයන්ගේ සම්බන්ධතාවත් නොමැතිව ශබ්දයක් නොඇසෙයි. එක් ඉන්ද්‍රියක් ඇරෙන විට අනෙක් ඉන්ද්‍රියන් වැසෙයි. එම නිසා යම් කල්පනාවක සිටින කෙනෙකුට විශාල ශබ්දයක් නෑසීමට හේතුව මන සම්බන්ධ නොවීමයි. තද නින්දේ ඇති විටද ඉන්ද්‍රියන් හා මන අතර සම්බන්ධය තාවකාලිකව විසන්ධි වෙයි.

**ප්‍රශ්නයවිඥානය ඔබ අර්ථ දක්වන්නේ කෙසේද ?**

බොහෝ දෙනෙක් අර්ථ දක්වන්නේ විඥානය යන්න ඉතා ගැඹුරු ධර්මයක් ලෙසයි. ඔවුහු විඥානය යනු ශක්ති විශේෂයක් යැයි දේශනා කරති. නමුත් ඔවුන්ට මෙම ශක්තිය විස්තර කළ නොහැකි ය. විඥානය ගැඹුරු ධර්මයක් නොවෙයි. විඥානය නම් අවිද්‍යාවෙන් ගොඩනගාගත් දැනුමයි. අවිද්‍යා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඥාන ලෙසයි, පටිච්ච පමුප්පාදයේ දක්වා තිබෙන්නේ. පංච ඉන්ද්‍රියන් පිටතට යොමුකර ලෝකය නිර්මාණය කරගැනීම අවිද්‍යාව වෙයි. මෙම වැරදි ලෝකය පිළිගැනීම විඥානයයි.

**ප්‍රශ්නයඃ ඔබ සංස්ඛාර ලෙස හඳුන්වන්නේ බුදුදහමේ සඳහන් අවිද්‍යාව නිසා ඇතිවන සංස්ඛාරය මද?**

ඔව්. නමුත් බුදුදහම ඉගෙන ගත් පෘතග්ජන පුද්ගලයාට සංස්ඛාර දැකිය නොහැකිය. සංස්ඛාර යනු අපගේ ඉන්ද්‍රියන් පිටතට යොමු කර නිර්මාණය කරගත් ලෝකයයි. මෙය වැරදි ලෝකයකි. සංස්ඛාර දුටු යම් කෙනෙකුට ත්‍රිපිටකයෙන් ලෝකෝත්තර ධර්ම මතුකර ගත හැක. සංස්ඛාර ලෝකයෙන් නිදහස් වූ එවැන්නෙක් තවදුරටත් ත ්‍රිපිටක ධාරියෙක් නොවෙයි. බෞද්ධයෙක් ද නොවෙයි. සත්‍ය දුටු යමෙක් 'මම බෞද්ධයෙක් වෙමි' යයි කියන්නේ නැත.

**ප්‍රශ්නයඃ පඨවි ආපෝ, තේජෝ, වායෝ ආකාශ නමින් බුදුදහමේ මහා භූත 5ක් ගැන විස්තර කරයි. විශ්වයේ පවතින සියලුම ද්‍රව්‍ය**

**සෑදී ඇත්තේ මෙම මහා භූත 5 න් බව පවසයි. ඔබේ අදහස කුමක්ද?**

විශ්වයේ පවතින සියලුම දේවල් සෑදී ඇත්තේ මහා භූත වලින් යයි ඔබට අවශ්‍ය නම් පැවසිය හැක. නමුත් පඨවි ආපෝ තේජෝ වායෝ ආකාශ යනු ද්‍රව්‍ය නොවෙයි. මෙම මහා භූත වලින් නිර්මාණය වී ඇත්තේ ද ද්‍රව්‍ය නොවෙයි. අපගේ ඉන්ද්‍රියයන් වලට ගෝචර වන ආකාරයට අපි ද්‍රව්‍ය යැයි කියමු. ඉන්ද්‍රියයන් වලින් ග්‍රහණය කරගන්නේ මොනවා ද? වර්ණ ගන්ධ රස ශබ්ද ස්පර්ශය නොවේ ද? මෙම සියලුම රූපයන් සාදාගන්නේ ද මනසින් නම් අපට පෙනෙන්නේ මනසේම නිර්මාණයක් නොවේ ද? රුධිර පීඩනය මැනීමට පීඩන මානය භාවිත කරයි. පීඩන මානයෙන් පෙන්වන්නේ රුධිර පීඩනය ද? ඉන්ද්‍රියයන් වලින් හා මනසින් විශ්වය ග්‍රහණය කරගත නොහැකිය.

**ප්‍රශ්නයඃපටිච්ච සමුප්පාද ධර්මය (හේතු පල දහම) ගැන ඔබේ අදහස් දැන ගැණීමට සතුටුයි.**

පටිච්ච සමුප්පාදය දේශනා කිරීමට තවම කාලය නොවෙයි. එය ඉතාමත් ගැඹුරුය. එම ධර්ම දකින්නෝ තවමත් විරලය. ධර්ම නොදැක අවබෝධ කර ගත්තාට පලක් නැත. 'පංච ස්කන්ධය සහ විදර්ශනාව' ලිපිය කියවීමෙන් පටිච්ච සමුප්පාද ධර්මය ඔබට යම් තරමකට දැකිය හැකිය. යම් ධර්මයක් දකින්නට ප්‍රඥාව ඇති අය බිහිවන විට ධර්ම පහළ වෙයි.

**ප්‍රශ්නයඃ අස්සජි මහරහතන් වහන්සේ උපතිස්ස තරුණයාට දේශනා කළේ හේතුපල දහම මිස තද නින්දක් ගැන නෙවෙයි නේද? නමුත් ඔබ කියන අකාරයට තද නින්ද නොදැක කිසිවකුටවත් නිවන් දැකීමට නොහැක, පැහැදලි කරන්න.**

පෘතග්ජන පුද්ගලයා අවදිව ඇති විට සත්ත්ව පුද්ගල දහම ම පිළිගන්නා බැවින් අවදිව ඇති විට හේතුඵල දහම දකින්නට නම් තමන් තුළ ඇති සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය දැකි ය යුතු ය. තමන්ට සත්ත්ව පුද්ගල දෘෂ්ඨියක් නැතයි පිළිගත්තාට වැඩක් නැත. නමුත් තද නින්දෙහි යම් කෙනෙක් සිටින විට එතැන කිසිම සත්ත්ව පුද්ගල දෘෂ්ඨියක් නැත. එම තද නින්දෙහි සිදුවන සත්ත්ව පුද්ගල දෘෂ්ඨියෙන් තොර වූ හේතු ඵල ධර්මය දැකිය හැකිනම් තද නින්දෙන් අවදි වෙයි (මෙම අවදිවීම ඉන්ද්‍රියයන්ට අවදිවීම නොවෙයි). තද නින්ද දැකීම යනු එයයි. සෝවාන් ඵලයට පැමිණීමත්, තද නින්ද දැකීමත්, එක වර සිදුවෙන ධර්ම දෙකකි. එම නිසා, තද නින්ද නොදැක කිසිවකුටවත් නිවන් දැකීමට නොහැක.

**ප්‍රශ්නයඃ තද නින්දේදී මිනිස්සු ගොරවති, එහා මෙහා පෙරලෙති, හීන දකිති.**

තද නින්දේදී හීන දකින්නේ නැත. ගෙරවීමත්, එහා මෙහා පෙරලීම සිදුවුවත් එය තමන් කරනවා යයි කියන්නේ නැත. එය පුද්ගල දෘෂ්ඨියෙන් තොරව සිදුවෙයි.

**ප්‍රශ්නයඃ සෑම දිනකම සියලුම සත්තු තද නින්දට පිවිසෙති. එසේනම් සියලුම සත්ත්වයෝ දිනකට එකවරක් බැගින් නිවන් දැක ආපසු මනෝ ලෝකයට පිවිසේද?**

තද නින්ද යනු නිවන නොවෙයි. නිවන යනු තද නින්දෙන් අවදි වීමයි. එය සිදුවන්නේ සංසාරයටම එක්වරකි. නැවත තද නින්දක් නැත.

**ප්‍රශ්නයඃ රස නිපදවෙන්නේ මොළයේම මිස, බාහිරින් ගන්නා ද්‍රව්‍ය වල රස නොමැති බවක් ඔබ පවසයි. එසේනම් මස් කන විට වෙන රසකුත් එළවළු කනවිට වෙන රසකුත් දැනෙන්නේ ඇයි?**

**එසේම විවිධ ලෙඩ සඳහා විවිධ බෙහෙත් තිබෙන්නේ ඇයි? අනවශ්‍යයි නේද?**

මස් සහ එළවළු වල වෙනස හඳුනා ගන්නේ තමන් විසිනි. රූප වේදනා සඥා සංඛාර විඥාන නම් වූ පංච ස්කන්ධය උපාදානය කිරීමෙන් මෙම වෙනස හඳුනා ගනී. කුඩා ළමයකුට මස් සහ එළවළු වෙන වෙනම දුන් විට ඔහුට හඳුනා ගැනීමට නොහැකිය. හඳුනා ගන්නේ එම වෙනස දැනගත් විට පමණි. මස් තිබෙන්නේත් ඔබේ මනසේ ය. එළවළු තිබෙන්නේත් ඔබේ මනසේ ය. රස තිබෙන්නේත් ඔබේ මනසේ ය. විවිධ බෙහෙත් වලින් විවිධ ජීවක්‍රියා ශරීරයෙහි සිදුවෙයි. ශරීරයේ ලෙඩක් ඇත්නම් නියම බෙහෙත් ගත් විට සුවවෙයි.

**ප්‍රශ්නයඃඔබ සිතන ආකාරයට බුදුන් වහන්සේ කියා කෙනෙක් සිටියාද ?**

බුදුන් වහන්සේ කෙනෙක් සිටියා යැයි කීවොත් එය නිවැරදි පිළිතුරක් නොවෙයි. බුදුන් වහන්සේ කෙනෙක් සිටියේ නැතයි කීවොත් එයත් නිවැරදි පිළිතුරක් නොවෙයි. මෙම දෙකම අන්ත වෙයි. බුදුන් වහන්සේ කෙනෙක් සිටියා යයි කීවොත් තව බොහෝ අතුරු ප්‍රශ්න පැන නගී. බුදුන් වහන්සේ පුද්ගලයෙක් ද? පුද්ගලයෙක් නොවේ ද? අතීතයේ වැඩ සිටි බුදුන් වහන්සේ ට කුමක් වූයේ ද? ආදී වශයෙන්. බුද්ධ යනු ප්‍රඥාවයි. එතැන ඇතිවීමක් හා නැති වීමක් නැත. 'බුද්ධ' සෑම කලකදීම වැඩ සිටියි. බුදු කෙනෙක් තමන් තුළින් ම දකිනවා විනා බාහිරෙන් සොයාගත නොහැකිය. ඔබ බාහිර බුදු කෙනෙක් හඳුනා ගන්නේ කෙසේ ද? බුදුන් වැඩ ඉන්නේ තමන් තුළ ය. 'බුද්ධ' යනු කෙනෙක්, පුද්ගලයෙක් නොවෙයි.

සාමාන්‍යයෙන් බෞද්ධ අබෞද්ධ සියලු දෙනා 'බුද්ධ' විවිධ වචන යොදා ගෞරව අර්ථයෙන් හඳුන්වති. මෙහි පලවන ලිපි වලද 'බුදුන් වහන්සේ ' යනුවෙන් 'බුද්ධ' හඳුන්වා දී ඇත. නමුත් මම ඔබෙන්

ඉල්ලා සිටින්නේ මෙම වචන සත්ත්ව පුද්ගල දෘෂ්ඨියට නොගන්නා ලෙසයි.

**ප්‍රශ්නයඃඅද අපට ඇසෙන ධර්මය එතුමාගේම දේශනාද?**

බාහිරෙන් ඇසෙන ධර්මයක් හෝ ලියා ඇති ධර්මයක් හෝ බුදුදහම නොවෙයි. යම් ධර්මයක් බුදුන් වහන්සේගේ ධර්මයක් වන්නේ එම ධර්මය තමන්ට දැකිය හැකිනම් පමණි. දකින ධර්මය යනු බාහිර බුදු කෙනකුගෙන් අසා දැන ගන්නා ධර්මයක් නොවෙයි. බුදුන් වහන්සේ 'තිලෝගුරු' ලෙස හැඳින්වුවද, 'බුද්ධ' යනු ගුරුවරයෙක් නොවෙයි. ගුරුවරයෙක් ධර්ම උගන්වයි. නමුත් බුදු කෙනෙක් ධර්මය උගන්වන්නේ නැත. ධර්මය දුටු විට සියලුම ධර්ම වලින් තමන් නිදහස් වෙයි. තමන් තුළ ඇති ප්‍රශ්නයෙන් ද එයට ලැබුණ පිළිතුරෙන් ද නිදහස් වෙයි.

**ප්‍රශ්නයඃ ආචාර්ය ඒබ්‍රහිම් ටී කොවූර්, මහාචාර්ය කාලෝ ෆොන්සේකා, ආචාර්ය අදිකාරම් වැනි භෞතිකවාදීන් ගැන ඔබේ අදහස කුමක්ද?.**

ලෞකික ලෝකයේ පැවැත්මට ලෞකික ධර්ම අවශ්‍යයි. එවැන්නෝ ද අනෙක් අය මෙන් ලෞකික ධර්මයක් ම දේශනා කරති. පැවැත්මට එවැනි ධර්ම ඉතා වැදගත් වෙයි. ආචාර්ය ඒබ්‍රහම් ටී කොවූර් වැනි භෞතික වාදීහු ලෝකය මානසික රෝගීන්ගෙන් ගලවා ගැනීමට විශාල මෙහෙයක් කරති. එම නිසා මෙතුමන්ලා එක් අතකින් මනෝ වෛද්‍යවරු ය. ආපෝ, තේජෝ, වායෝ, පඨවි නම් වූ සතර මහා භූතයෝ හැර වෙන භූතයෙක් විශ්වයේ නැත. නමුත් භූතයන් ප්‍රේතයන් ආරූඪ වීම් ආදී ධර්ම, බෞද්ධ පඬිවරුන් තම ශ්‍රාවකයන්ට උගන්වයි. බෞද්ධ පඬිවරුන්ගේ උගැන්වීම අනුව තමන්ගේ ඥාතියෙක් මියගිය විට ප්‍රේතයන් ලෙස ඉපිද පවුලේ කෙනෙකුට ආරූඪ වෙයි, කරදර කරයි. මෙම ධර්ම ඉගෙන ගෙන මනස විකෘති කරගත් මානසික

රෝගී අය භෞතික වාදීන් විසින් සුවපත් කරනු ලබයි. භෞතික වාදය ද අනෙක් වාද මෙන් ලෞකික ධර්මයකි. උදාහරණයක් ලෙස කොවුර්ගේ උගැන්වීම අනුව ඔහු පුනරුප්පත්තිය ප්‍රතික්ෂේප කරයි. බෞද්ධ පඬිවරු පුනරුත්පත්තිය පිළිගනිති. නමුත් බුදු දහමට අනුව මෙම පිළිගැනීමත් නොපිළිගැනීමත් අන්ත දෙකකි. බුදුදහමට අන්ත නැත. කොවුර්ගේ හේතුවාදය යනු සත්‍යයට මග නොවෙයි (හේතුවාදය පමණක් නොව කිසිම වාදයක් හෝ ධර්මයක් සත්‍යයට මග නොවෙයි). නමුත් මෙම භෞතිකවාදීහු නිරවුල් මනසක් නොමැති මානසික රෝගීන් සුවපත් කරති. සුවපත් වූ මෙවන් අයකුට කල්‍යාණ මිත්‍රයෙක් මුණගැසීමෙන් සත්‍ය දැකිය හැක. නමුත් භූත හා ප්‍රේත ලෝක පිළිගෙන ඒවායෙහිම ජීවත් වන්නන්ට මෙතුමන්ලාගේ දේශනා වහ කදුරු මෙනි. දුර්වල මනසක් ඇති ඔවුන්ට තම මළගිය ඥාතීහු ආරුඪ වෙති. එයින් ලැබෙන ප ්‍රසිද්ධියත් ආදායමත් නිසා ආරූඪයෙන් නිදහස් වන්නට ඔවුන් කැමති නැත.

**ප්‍රශ්නයඃපුනරුප්පත්තිය අන්තවාදයක් යැයි පවසන ඔබ සංසාරයක් ගැන කතා කරයි. මොකක්ද මේ ඔබ අදහස් කරන සංසාරය?**

සංසාරය නම් කාලය පිළිගැනීමයි. කාලයෙන් ගිලගත් සත්ත්වයෝ සංසාරයෙහි සැරිසරති. සත්‍ය දුටු විට කාලයෙන් ද සසරින් ද නිදහස් වෙති.

***ගාල්ල ප්‍රදේශයේ ඔබ වැනිම අදහස් දරන්නෙක් (ලොකුගේ සිරිවර්ධන මහතා) ගැන ඔබ දන්නවාද? මා ඔහුගේ දේශනා වලට සවන් දී ඇත. ඔහු කියන්නේත් ඔබේ ධර්මයමද? (ඔහුත් තද නින්ද ගැන පවසයි)***

සිරිවර්ධන ලොකුගේ මැතිතුමා මගේ කල්‍යාණ මිත්‍ර ගුරුවරයායි. පළමු වරට 'තද නින්ද' ගැන විවෘත කළේ එතුමායි. එය මම

මගේ ලිපියේ ද සඳහන් කළ ද, ලිපිය දීර්ග බැවින් ලංකාදීප පුවත් පත එම කොටස් ඉවත් කර තිබුණි. මා සදහන් කර තිබූ ආකාරයට එය මෙසේ යි.

බුදුන් වහන්සේ මෙම තද නින්දෙහි ඇති ධර්ම විවෘත කර කාලයාගේ ඇවෑමෙන් එම ධර්ම විලෝපනය විය. මාර්ගඵල ලාභීන්ගෙන් ලෝකය හිස් විය. නැවත තද නින්දෙහි ඇති ධර්ම විවෘත කර වැසී තිබුන සත්‍යය පළමුවරට ලොවට හෙළිදරව් කළේ මගේ කල්‍යාණ මිත්‍ර, එස් ලොකුගේ මැතිතුමායි.

**ප්‍රශ්නයඃඔබතුමාට මෙම අවබෝධය ලැබුණේ කෙසේද? කවදාද? (තනිවමද, තවකෙනෙකුගේ උදව් ඇතිවද)**

මෙහි 'අවබෝධය' යන්නත් 'සත්‍ය දැකීම' යන්නත් එකිනෙකට ප ්‍රතිවිරුද්ධ තේරුම් දෙන වචන දෙකකි. අවබෝධය ලබන්නේ දැනුමෙනි. අවබෝධය නිවනට හෝ සත්‍යයට මග නොවෙයි. නිවනට මග නම් දැනුමෙන් නිදහස් වීමයි. එය පුරබුද්ධ හෙවත් ප ්‍රබුද්ධත්වය යයි අවශ්‍ය නම් කිව හැක. මම ලොකුගේ සිරිවර්ධන මහතාගේ ධර්මය 'ලංකාවට පැමිණි වීඩියෝ කර' එකම ධර්මය නැවත නැවත ඇසුවෙමි. එම ධර්මය ඇසීමට පෙර, මම අසා තිබූ ධර්ම කෙරෙහි සැක ඇති වී තිබුණි. මම පංච සීලයද භාවනාව ද අතහැර තිබුණි. නමුත් සැකය තිබුණි. එක් වරම සැකය පහ විය. යටිකරු වී සිටි මම උඩුකුරු විය. මරණයෙන් නිදහස් විය. මුළාවෙන් නිදහස් විය. මෙය සිදුවූයේ 2002 දී මම නවසීලන්තයේ සිටින විටදීය. සිරිවර්ධන ලොකුගේ මැතිතුමාගේ ධර්මය ගැඹුරුය. බුදුදහම සරල වන්නේ නැත. වෙබ් අඩවි හරහා මම ලෝකය පුරා සත්‍ය දැක ඇතයි කියන අය ගැන අසා ඇත්තෙමි. නමුත් මම එක් දෙයක් කියමි. මෙම වර්තමාන කාලයේ දී විලෝපනය වූ බුදු දහම නැවත විවෘත කළේ ලොකුගේ සිරිවර්ධන මැතිතුමායි. පළමු වරට විවෘත කළ වෙන අයෙක් නැත. මම එය පැහැදිලිවම කියමි.

ලෝකයේ බොහෝ අධ්‍යාත්මික ගුරුවරු (spiritual teachers) සිටිති. මෙම ගුරුවරු තම අනුගාමිකයින්ට නිවනට පිවිසෙන මාර්ගය කියා දෙති. අනුගාමිකයෝ මෙම ගුරුවරුන්ගේ මාර්ගය ක්‍රියාවට නංවමින් නිවනට පිවිසෙන්නට වෙර දරති. නමුත් සිරිවර්ධන ලොකුගේ මහතා ආධ්‍යාත්මික ගුරුවරයෙක් නොවෙයි. එතුමාගේ ධර්මය ඇසූ මම එතුමාගේ අනුගාමිකයෙක් ද නොවෙමි (නමුත් සාම්ප්‍රදායිකව මම සිරිවර්ධන ලොකුගේ මහතා මගේ ගුරුදේවයන් යයි සඳහන් කර ඇත). ගුරුවරයකුගේ කාර්යය අනුගාමිකයාට අවබෝධය ලබාදීමයි. අනුගාමිකයා ගුරුවරයා කියා දුන් ධර්මය අනුගමනය කරයි. මම සිරිවර්ධන ලොකුගේ මහතා දේශනා කළ කිසිම ධර්මයක් පිළිගත්තේ නැත, අනුගමනය කළේ ද නැත.

**ප්‍රශ්නයඃඔබ විවාහකද? විවාහක නම් ඔබේ විවාහ ජීවිතය සාර්ථකද? කියා ඔබේ බිරිඳගෙන් ඇසුවොත් ඇයගේ පිළිතුර කුමක් වේවිද? (මා එසේ අසන්නේ ධර්මයට නැඹුරු කමක් දක්වන බොහෝ අය විවාහ ජීවිතය අසාර්ථක කරගෙන ඇති නිසාය).**

ඔබ නිවැරදියි. බුදු දහම කුමක් දැයි නොදැන මං මුළා වූ බොහෝ දෙනෙක් බුදු දහම යැයි කියමින් යම් ධර්මයක් අනුගමනය කරනවා පමණක් නොව තමන්ගේ විවාහ ජීවිතයද අසාර්ථක කරගනිති. මාර්ගඵල පැත්තෙන් ගත් විට අනාගාමි ඵලය තෙක් ගිහි ජීවිතයෙහි කිසිම ප්‍රශ්නයක් නැතිව තම ජීවිතය ගත කළ හැකි බව වත් මේ අය නොදැනීම අවාසනාවකි. අපි ඉතාමත් සාර්ථක විවාහ ජීවිතයක් ගත කරන්නෙමු. සත්‍ය දැකීමෙන් විවාහ ජීවිතය ඉතාමත් සාර්ථක වෙයි. පංච උපාදානස්කන්ධය පිළිගෙන දැනුමෙන් සත්‍ය සොයන යෝගාවචරයාට පන්සිල් අටසිල් දස සිල් ආදී සිල් ව්‍රත හා භාවනා ක්‍රම අනුගමනය කිරීමට ජීවිතයෙන් වැඩි කාලයක් ගත වෙයි. මේ නිසා බොහෝ විට අනුන්ගෙන් යැපෙන්නට ද සිදු වෙයි, අඹු දරුවන් සමග එකට ජීවත් වීමට කාලය නැතිවෙයි. බොහෝ විට විවාහ ජීවිතය අසාර්ථක වෙයි. සත්‍ය දුටුවිට එවැනි ව්‍රත සහ භාවනා සඳහා වැය වන කාලය ඉතිරි වෙයි. අඹු දරුවන් සමග එකට ජීවත් වීමට කාලය ඇත. නිවස අතහැර වනගත වීමට අවශ්‍ය

නොවෙයි.

**ප්‍රශ්නයඃඔබ අදහස් කරන ආකාරයට පිරිසිදු බුදුදහම වෙනස් වුණේ කොතනින්ද ? ලංකාවට පිරිසිදු බුදුදහම ආවාද?**

මාර්ගඵල ලාභින් නැතිව ගිය කල බුදු දහම විලෝපනය වෙයි. එයට කිසිවකුට දොස් කියන්නට නොහැකියි.

**ප්‍රශ්නයඃඔබ අදහස්කරන 'මන' යනු 'සිත' ද 'මොළය'ද?**

'මන' යනු සිතවත් මොළයවත් නොවෙයි. එය විශ්ව ශක්තියකි. මන යනු පවතින හෝ නොපවතින ධර්මයක් ද නොවෙයි. මන පිහිටන ස්ථානයක් නැත. එහි ගමන් කිරීමක් නැත. කාලය දුර යන භෞතික ගුණ වලින් තොර වෙයි.

**ප්‍රශ්නයඃසිත යනු කුමක්ද? ශරීරයෙහි පවතින දෙයක්ද? නැත්නම් හේතූන් නිසා ඇතිවන හේතු නැතිවූ තැන නැතිවන දෙයක්ද?**

සිතත් සිතුවිලිත් නිර්මාණය වන්නේ අවිද්‍යාව නිසා පහළ වූ සංස්කාර ධර්ම නිසයි. සංස්කාර ධර්ම වලින් නිදහස් වන විට සිතෙන් ද නිදහස් වෙයි. අවිද්‍යාව ඇතිතාක් කල් සිතෙන් නිදහස් නොවෙයි. නමුත් බොහෝ යෝගාවචරයෝ අවිද්‍යාව එලෙසම තිබියදී මානසික වීර්යය යොදා සිතෙන් නිදහස් වීමට භාවනා කරති.

**ප්‍රශ්නයඃමරණ මොහොතේ ශරීරයෙන් යම් දෙයක් (සිත) පිටවීමට තිබේද? නැතිනම් එතනම නැතිවෙනවාද (පහන් දැල්ල නිවුණා සේ)?**

එහෙම පිටවෙන දෙයක් නැත. ඇත ළග ආදී දිග නැමති භෞතික රාශි යනු අපි දැනුමෙන් නිර්මාණය කරගත්තකි. සත්‍යයට ඇත ළග, එක් තැනක සිට තවත් තැනකට ගමන් කිරීමක් නැත. මැරුණ තැනම උපදී. මරණය හා උපත අතර කාලපරතරයක් නැත.

මවිසින් මෑතකදී කියවූ ලංකාවේ සුප්‍රසිද්ධ ස්වාමින් වහන්සේ කෙනෙකුගේ නමින් පලවූ ලිපියක දුටුවේ, මරණින් පසු පංච උපාදානස්කන්ධය ශරීරයෙන් පිටව යන බවත් එසේ පිටවන විට ශරීරයේ යම් රූප කොටස් ද රැගෙන යන බවත් ය. මෙම ක්‍රියාවලියෙන්, ජීවත්ව සිටියා වූ තැනැත්තාගේ රූපකායට සමාන වූ රූපකායක් ඇති ගන්ධබ්බයෙක් නිර්මාණය වන බවද එම ලිපියේ සඳහන් කර තිබුණි.

රූප, වේදනා, සංඥා, සංඛාර, විඥාන නම් වූ පංච ස්කන්ධය උපාදානය කිරීම නිසා පංච උපාදානස්කන්ධයක් මිනිස් සත්ත්වයා විසින් නිර්මාණය කරගෙන ඇත. පංච ස්කන්ධය උපාදානය කරන්නේ සත්ත්වයා විසිනි. සත්ත්වයෙක් නැති තැන පංච උපාදානස්කන්ධයක් නැත. බොහෝ බෞද්ධ පඬිවරු 'මමෙක් නැත, සත්ත්වයෙක් නැත', ඒ වෙනුවට පංච උපාදානස්කන්ධයක් ඇත යයි කියමින් සත්ත්ව පුද්ගල දෘෂ්ඨියෙන් නිදහස් වීමට උත්සාහ දරති. නමුත් බුද්ධිමත් ඔබ දැකිය යුතු ධර්මයක් නම් පංච උපාදානස්කන්ධයම සත්ත්වයා වන බවයි. තම ඉන්ද්‍රියන් මනසත් සමග ඇති සම්බන්ධයෙන් රූප වේදනා සංඥා සංඛාර විඥාන නම් වූ පංච උපාදානස්කන්ධය, සත්ත්වයා විසින් නිර්මාණය කරගනී. සලායතනයන්හි ප්‍රතිලාභය (ඇස කණ නාසය දිව ශරීරය මනත් සමග ඇති සම්බන්ධය) නොමැති තැන පංච උපාදානස්කන්ධයක් නැත. යමෙක් මරණයට පත් වූ පසු තවදුරටත් පංච ස්කන්ධය උපාදානය කරයිද? බොහෝ බෞද්ධ පඬිවරුන්ගේ දේශනා අනුව පංච උපාදානස්කන්ධය මරණින් මතු ද පවතී. ඔබේ තද නින්දේදීවත් දක්නට නැති සංස්කාර ලෝකය මරණින් පසු ක්‍රියාත්මක වන්නේ කෙසේ ද?

**ප්‍රශ්නයඃ සසර සරන පුද්ගලයාට සිත හෙවත් විඥානය පුද්ගලයාගෙන් පුද්ගලයා ට අනන්‍ය වෙන්නේ කෙසේද ?**

පුද්ගලයා තුල ඇති බලාපොරොත්තු නිසා ඔහු හෝ ඇය සසර සැරි සරයි. පුද්ගල දෘෂ්ඨිය නිසා තමනුත් අනුනුත් පිළිගෙන තමන් අන් අයගෙන් වෙන් කරගනී. ලෝකය තමන් විසින්ම නිර්මාණය කරගත්තක් බැවින් පුද්ගලයෝ දෙදෙනෙක් ලෝක දෙකක ජීවත් වෙති. එමනිසා විඥානය පුද්ගලයාගෙන් පුද්ගලයාට අනන්‍ය වෙයි. නමුත් සත්‍යයෙහි විඥානය නොමැති බැවින් බෙදා වෙන් කරගත් සත්ත්වයෝ හෝ පුද්ගලයෝ නැත.

**ප්‍රශ්නයඃ ඔහුත් නොවේ, ඔහු නොවන්නේත් නොවේ, යනුවෙන් බුදුදහමේ පුද්ගලයා ගැන ප්‍රකාශයක් මා අසා ඇත. එය පහදා දෙන්න.**

එම ප්‍රකාශයෙන් කියන ධර්මය නම් කෙනෙක් නොවන බවයි.

**ප්‍රශ්නයඃපිං පව් කියා දෙයක් තිබේද ?**

පිං පව් යනු දැනුම මිස අන් කවරක් නොවේ. ඒවා සංස්ඛාර ධර්ම වෙයි. බුදුන් වහන්සේ සංස්ඛාර ධර්ම කෙසෙල් කඳකට උපමා කළහ. කෙසෙල් කඳෙහි හරයක් දකින්නට නොමැත.

**ප්‍රශ්නයඃ සද්ධර්මය නොදුටු කෙනෙකුගේ සිතට මරණයෙන් පසු කුමක් වේවිද ? දිගටම පවතීද ?**

සිත පංච උපාදානස්කන්ධයේ ඵලයකි. අතීත වර්තමාන අනාගත කාලයට අසුවී ඇත. මරණයෙන් සිදුවන්නේ තමන් නිර්මාණය

කරගත් සිතෙන් තාවකාලිකව නිදහස් වී විශ්වයට එකතු වීමයි. මරණයෙහි වර්තමාන කාලය නැත. ජීවත්ව සිටින විටද සිත දිගටම පවතින්නේ නැත. ජීවිතය අවසානයේදී අපි මරණය යයි පිළිගත් සංස්කාර ධර්මය ජීවත්ව සිටින විට ද සිතුවිලි දෙකක් අතර සිදුවෙයි. සිතෙහි පවත්නා වේගවත් බව නිසා මෙම මරණය නොපෙනෙයි. මොහොතින් මොහොත උපදින සිතුවිලි මැරී තව සිතුවිල්ලක් උපදී. මරණයෙන් පසු ද එයම සිදු වේ. සිතුවිල්ලක් දෙකක් අතර සිදුවන මරණයත් සම්මුති මරණයත් අතර වෙනසක් නැත. සම්මුති මරණයේ දී ද අවසාන සිතුවිල්ල මැරී තව සිතුවිල්ලක් කාලපරතරයකින් තොරවම උපදී. මැරුණ තැනම උපදී (මෙහි ඉපදීම යනු මව් කුසින් ඉපදීම නොවෙයි). බුදු කෙනෙක් මව් කුසින් ඉපදීමක් ගැන දේශනා නොකරයි.

**ප්‍රශ්නයඃප්‍රඥාවන්තයින් ඇති විට ධර්ම ඉබේ පහළ වෙනවා යැයි ඔබ පවසන දේ පැහැදිලි මදි.**

විශ්වයේ සිදුවන්නේ හේතු ඵල දහමක් විනා සත්ත්ව පුද්ගල දහමක් නොවෙයි. ධර්ම ඉබේ පහළ වන්නේ නැත. එතැන සිදුවන්නේ හේතු ඵල දහමකි. යම් කෙනෙක් අසන ප්‍රශ්නයකට බුදු කෙනෙක් පිළිතුරු දෙයි. ප්‍රඥාවන්තයින්ට ධර්ම කෙරෙහි ඇති සැකය නිසා ප ්‍රශ්න පැන නගී. එමනිසා ප්‍රඥාවන්තයින් ඇති විට ධර්ම පහළ වෙයි. ධර්මය සැකයකින් තොරවම පිළිගන්නා අය පමණක් ඇතිවිට බුදුකෙනෙක් සිටිය ද ධර්ම පහළ වීමක් නැත.

**ප්‍රශ්නයඃ බුදුකෙනෙක් බාහිරින් හඳුනා ගන්න දෙතිස් මහා පුරුෂ ලක්ෂණ තියෙනවා නේද?**

බුද්ධ හෙවත් ප්‍රඥාවට ශරීරයක් නැත. බුදුකෙනෙක් තිස්එක් තලයම ඉක්මවා ඇත. දෙතිස් මහා පුරුෂ ලක්ෂණ නම් එයයි.

**ප්‍රශ්නයඃ අන්තිම මාර්ගඵල ලාභියා නැතිවූ දින ලෝක විනාශය වන බව මා අසා ඇත. නමුත් ඔබ කියන්නේ මාර්ගඵල ලාභීන් නැතිව තිබී නැවත ලොකුගේ මහතාගෙන් ආරම්භ වූ බවයි. එසේනම් මා වැරදිද?**

ලෝකය නිර්මාණය කරගන්නේ තමන්ගේම මනසෙහිය. අවිද්‍යාව පවතින තාක් කල් මනසින් නිර්මාණය කරගත් ලෝකය විනාශ වන්නේ නැත. තමන් සත්‍ය දකිනතෙක් එම ලෝකය පවතී. සත්‍ය දැකීමෙන් තමන් නිර්මාණය කරගත් ලෝකයෙන් නිදහස් වෙයි. රහත් ඵලයේදී ලෝක විනාශය සිදුවෙයි. ඔබ සත්‍ය දුටු පසු මෛත්‍රී බුදුන් ඔබ තුළම පහළ වී ලෝකය ද මහා භද්‍ර කල්පය ද කෙලවර කරගනී. සත්‍ය නොදුටුවෝ මෛත්‍රී බෝධිසත්වයන් තව්තිසා දිව්‍යලෝකයෙන් චුත වී මිනිස් ලෝකයේ උපදින තෙක් බලා සිටිති. බුදුවරු දහසක් පහළ වුවද ඔවුන්ට එම බුදුවරු හඳුනා ගන්නට නොහැකිය. ඔවුහු බුද්ධ ප්‍රඥාවට එරෙහි වෙති.

**ප්‍රශ්නයඃ බුද්ධාන්තර කාලවලදී ධර්ම අවබෝධ වන්නේ පසේබුදුවරුන්ට නොවේද? එසේනම් ලොකුගේ මහතා පසේබුදු කෙනෙක්ද? නමුත් පසේබුදුවරුන්ට ධර්මය දේශනා කිරීමට හැකියාවක් නැති බව මා අසා ඇත.**

කිසිම බුදුවරයෙක් ධර්මය දේශනා කරන්නේ නැත. ලෝකෝත්තර ධර්මය දේශනා කළ නොහැකිය. නමුත් යම් පුද්ගලයෙක් බුදුන් ළඟට පැමිණ ප්‍රශ්නයක් නැගූ විට බුදුන් වහන්සේ එයට පිළිතුරු දෙයි. බුදුන් වහන්සේලා සහ රහතන් වහන්සේලා අතර වෙනසක් නැත. බුද්ධ යනු ප්‍රඥාවයි. එමනිසා 'බුද්ධ' වර්ග කළ නොහැකිය. මුළාවට පත් වූ පෘතග්ජනයා බාහිරෙන් සම්මා සම්බුදු කෙනෙක් හෝ පසේ බුදුකෙනෙක් හෝ රහතන් වහන්සේ කෙනෙක් පහළ වනතෙක් සසර සැරිසරයි. නමුත් බුද්ධ හෙවත් ප්‍රඥාව ඔබ තුළම පහළ වනතෙක් ඔබේ සසර ගමන නතර වන්නේ නැත. මෙය බුද්ධාන්තර කාලයක් නොවෙයි. 'බුද්ධ' ඇතිවන්නේ හෝ නැති

වන්නේ නැත. ධර්මය විලෝපනය වන විට නැවත ධර්මය විවෘත කිරීමට ගෞතම බුදුන් ඉදිරියේ පොරොන්දු වූ අය තමන්ගේ එම කාර්යය ඉටු කරති.

**ප්‍රශ්නයඃ බුදුන් සරණ යනවා යැයි කියන්නේ කුමක්ද? එසේම දහම් හා සඟුන් සරණයැමක් තිබේද ?**

අත්තාහි අත්තනො නාථෝ නම් වූ ලිපිය කියවන්න.

**ප්‍රශ්නයඃ බණ ඇසීමේ නිවැරදි පිළිවෙත කුමක්ද?**

අසන සෑම වචනයක්ම ඒ මොහොතේම අතහැරිය හැකිනම් එය බණ ඇසීමේ නිවැරදි පිළිවෙතයි.

**ප්‍රශ්නයඃ දාන පාරමිතාව ගැන දැන ගත්තෙමි. අනෙකුත් පාරමිතා වල නියම අදහස ගැන දැනගැනීමට සතුටුයි.**

අනෙක් පාරමිතා ගැන කරදර වෙන්නට අවශ්‍ය නැත. දාන පාරමිතාව සම්පූර්ණ වන විට අනෙක් පාරමිතා ද සම්පූර්ණ වෙයි.

**ප්‍රශ්නයඃ බුදුකෙනෙක් ධර්මය දේශනා නොකළාට යම් කෙනෙක් යම් ප්‍රශ්නයක් ඇසූ විට උත්තරදීම සිදුකරයි නේද? එසේනම් අද අප ත්‍රිපිටකය නමින් හඳුන්වන්නේත් බුද්ධ දේශනාම නේද?. උදාඃ ඔබ මට උත්තර දෙනවා වගේ.**

ත්‍රිපිටකයෙහි සත්‍ය සැඟවී ඇත. පෘතග්ජන පුද්ගලයකුට ත්‍රිපිටකයේ ඇති ලෝකෝත්තර ධර්මය දකින්නට නොහැකිය. එමනිසා ඒ වෙනුවට ලෞකික ධර්මයක් ම දේශනා කරයි. ලංකාදීප පුවත් පතේ පල වන 'නොපෙනෙන ලෝකය' ලිපි මාලාවේ බෙල්ලන

ඥාණවිමල හිමියන්ගේ 'අනුන්ගේ දුක දැක කාරුණික වන අයට වාසනාව පැදෙනවා' යන ලිපිය කියවා ඇතැයි සිතමි. එහි චූලකම්ම විභංග නම් සූත්‍රයක් ගැන විස්තර කර ඇත. එම ලිපියෙහි උන්වහන්සේ දේශනා කරන්නේ ලෞකික ධර්මයකි. නමුත් බුදුන් වහන්සේ දේශනා කළේ ලෝකෝත්තර ධර්මයකි. මට පහළ වූ එම ලෝකෝත්තර ධර්මය 'චූලකම්ම විභංග සූත්‍රය' නමින් මෙහි දක්වා ඇත.

**ප්‍රශ්නයඃ ලොකුගේ සිරිවර්ධන මහතා ත්‍රිපිටකය පිළිනොගන්නේ නොවේ නේද? එසේම ලොකුගේ මහතා එයට නව අර්ථකථන සපයයි. ඒ පිළිබඳව ඔබේ අදහස කුමක්ද? (උදාඃ උම්මග්ග ජාතකය)**

ත්‍රිපිටයේ ඇති ලෝකෝත්තර ධර්මය ලෞකික ධර්ම ඉක්මවූ යම් කෙනෙකුට දැකිය දැකි ය. එය පිළිගැනීමක් නොවෙයි. ඒවා අර්ථකථන ද නොවෙයි, එය දැකීමකි.

**ප්‍රශ්නයඃ දිබ්බ සෝත දිබ්බ චක්ඛු වැනි අභිඥඥා සත්‍ය ද? නැතිනම් සිතේ මායාවන් ද ?**

මේවා සිතෙහි ඇති තල වෙයි. ධ්‍යාන වැඩීමත් අභිඥා වැඩීමත් යනු සිත දැඩිව අල්ලා (උපාදානය) ගැනීමකි. ඒවාත් ලෞකික ධර්ම විනා ලෝකෝත්තර නොවෙයි. කැමති කෙනකුට ලෞකික ධර්ම වැඩි දියුණු කර දස්කම් විස්කම් පෑ හැක. නමුත් ඒවා නිවනට මග නොවෙයි. ප්‍රාතිහාර්ය යනු සැබෑ සිදුවීමකි.

**ප්‍රශ්නයඃ කාලයට හසු නොවෙන ළදරුවෙක් එම අවදියේදීම මියගිය විට ඔහු හෝ ඇය ගේ සංසාර චක්‍රයට කුමක් වේවිද ?**

ඔහු හෝ ඇය ඉන්නේ සංසාර චක්‍රයේමයි. සංසාර චක්‍රයෙහි

සතෙක් නැත. ඇත්තේ වට්ට තුනකි. මෙම වට්ට තුන කම්ම වට්ටය, ක්ලේශ වට්ටය හා විපාක වට්ටය ලෙස හඳුන්වයි.

**ප්‍රශ්නයඃ මා දන්නා විශ්වය හා ඔබ කියනා විශ්වය අතර ඇති වෙනස කුමක්ද ?**

ඔබගේ මනසින් සාදාගත්, නමුත් බාහිර දකින්නට නැති ලෝකයකින් ඔබ දන්නා විශ්වය නිර්මාණය කරගෙන ඇත. තමන් නිර්මාණය කරගත් ලෝකය අසත්‍යයක් බව දුටුවිට (පිළිගැනීම නොවේ) අකාලික විශ්වය දකී.

**ප්‍රශ්නයඃ ප්‍රඥා යුගයක් ගැන ඔබ කියයි. තවදුරටත් පහදන්න. ඔබ එයට කාලයක් දක්වා ඇත. ඒ ඇයි ?**

ප්‍රඥා යුගයේ ද මිනිසා දැනුම ප්‍රයෝජනයට ගනී. නමුත් දැනුම පිළිගන්නේ නැත. දැනුම ප්‍රයෝජනයට ගන්නා බැවින් කාලයක් දක්වා ඇත. දැනුම පිළිනොගන්නා බැවින් කාලය ඉක්මවා ඇත.

**ප්‍රශ්නයඃ ඔබ ළඟ ඇති ලොකුගේ මහතාගේ පටිගත කළ දේශනා එවීමට පුළුවන්ද ?**

ඔබට පහත දැක්වෙන වෙබ් අඩවියට ගොස් එතුමාගේ ධර්ම දේශනා පච3 ලෙස ාදඅබ කදා කර ගන්න පුළුවන්. වෙබ් අඩවියේ ලිපිනය පහත දැක්වෙයි.

**http://www.satyagaveshi.org**

**www.maitreyabuddhasasana.com**

**ප්‍රශ්නයඃ බුදුරජාණන් වහන්සේ සත්ත්ව පුද්ගල සංඥාව අතික ්‍රමණය කළ නිසා ආහාර නොගන්නා බව ලොකුගේ මහතා**

**පවසයි. බුදුන් පිඩුසිඟා වැඩි බවත් එක් වස් කාලයක යව ආහාරයෙන් යැපුන බවත් විටක මාරයා ගේ ආවේශයක් නිසා බුදුරජාණන් වහන්සේට දානය නොලැබුණ බවත් ලොකුගේ මහතා ම විටක ප්‍රකාශ කර ඇති බව මතක් කර දීමට සතුටුයිපහදන්න ?**

ශරීරයට ගන්නා ආහාරත් මනසට ගන්නා ආහාරත් යනුවෙන් ආහාර වර්ග දෙකකි. බුදු කෙනෙක් මනසෙන් නිදහස් වී ඇති බැවින් මනසට ආහාර ගන්නේ නැත. බුදු කෙනෙකුට ශරීරයක් ද නොමැති බැවින් ශරීරයේ පැවැත්මට ආහාර ගන්නේ ද නැත. නමුත් බුදු කෙනෙක් පිඬුසිඟා වඩියි. ආහාරයෙන් යැපෙයි. බුදුකෙනෙක් ආහාර ගන්නේ ද නැද්ද, මස් මාංශ අනුභව කරන්නේ ද නැද්ද, යන බව දකින්නට නම් ඔබත් බුදු විය යුතු ය. එසේ නැතිව සෑම පෘතග්ජන පුද්ගලයකුටම මෙම ධර්ම කෙරෙහි සැක පහළ වේයි. සත්‍ය දකින විට මෙම සැකය පහවෙයි.

**ප්‍රශ්නයඃ සත්ත්ව පුද්ගල සංඥාව සැබවින්ම නැතත් සත්ත්වයා එය නොදැක මමය මාගේය යන හැඟීම දරන නිසා සත්ත්වයාට සංසාරයක් තිබේයැයි සත්ත්වයා විශ්වාස කරයි. සත්‍යය මෙය නම් ආත්මයපුනර්භවය වැනි සංකල්ප ප්‍රතික්ෂේප වෙයි. මන්ද, යළි ඉපදීමට සත්ත්වයෙක් පුද්ගලයෙක් සත්‍ය වශයෙන්ම නොමැති නිසා. එසේනම් තමා තුළ නැති සත්ත්ව පුද්ගල සංඥාවක් නැති කිරීමට අප වෙහෙසිය යුත්තේ ඇයි ?**

එක තමා මමත් කියන්නෙ. ඉපදීමට සහ මිය යාමට සත්ත්වයෙක් නොමැති නිසා පුද්ගල සංඥාවක් නැති කිරීමට කායික හා මානසික වීර්යය යොදන්නේ ඇයි? කායික හා මානසික වීර්යය යොදා සත්ත්ව පුද්ගල දෘෂ්ඨියෙන් නිදහස් විය නොහැක. සත්ත්ව පුද්ගල සංඥාව නැති කිරීමට අප වෙහෙස වන විට එම දෘෂ්ඨි තවතවත් වර්ධනය වෙයි. නමුත් සියලු දෙනාම පුරුදු පුහුණු වී ඇත්තේ වීර්යය දරමින්ම පුද්ගල සංඥාව නැති කිරීමටයි. තමන් තුළින් ම බුදුන් දකින තෙක් සත්ත්වයා මෙම වීර්යය දරයි.

**ප්‍රශ්නයඃ සිද්ධාර්ථ ගෞතමයන් අවුඃ 35 දී පරිනිර්වාණය කළ බව ලොකුගේ මහතා පවසයි. එසේනම් අවුඃ 80 දී පරිනිර්වාණය කළේ කවුද ?**

අවු 35 දී සත්ත්ව පුද්ගල දෘෂ්ඨියෙන් නිදහස් වූ බැවින් අවු 80 දී පරිනිර්වාණයට කෙනෙක් නැත.

**ප්‍රශ්නයඃ බුදුරජාණන් වහන්සේ සත්ත්ව පුද්ගල සංඥාව ප්‍රතික්ෂේප කළත් හැම සූත්‍රයකම වාගේ සත්ත්වයෙක් ගැන කතා කරයි (උදාඃ සබ්බේ සත්තා අහාරඨිතිකා, සබ්බේ සත්තා භවන්තු සුකිතත්තා) පහදන්න?**

සත්ත්ව පුද්ගල ධර්මයෙන් තොර වූ වෙනත් ධර්මයක් නැත. බුදු කෙනෙක් ධර්ම දේශනා කරන්නේ නැතයි මම කියන්නේ ඒ නිසයි. ඔබ අසන එම සත්ත්ව පුද්ගල ධර්මය බුදුන් වහන්සේ ගේ නොවෙයි. බුදු කෙනෙක් ළඟ දේශනා කරන්නට ධර්මයක් ඉතිරි වී නැත. බුදු කෙනෙක් ධර්ම දේශනා කරන්නේ නැතයි යන්නෙහි තේරුම බුදු කෙනෙක් නිශ්ශබ්දව සිටිනවා යන්න නොවෙයි.

**ප්‍රශ්ණයඃ බුදුරජාණන් වහන්සේ සම්බුද්ධත්වය ලැබීමෙන් පසු උදාන වාක්‍යයක් ප්‍රකාශ කරයි. එයින් ප්‍රකාශ වන්නේ සංසාරයක් ඇති බවත් සංසාරය දික් කරන්නේ තෘෂ්නාව බවත් බුදුරජාණන් වහන්සේ එම තෘෂ්නාව නැමති වඩුවා දැක සංසාරය නැමති කැණිමඩල විනාශ කළ බවත්ය. එය අහන කියවන ඕනෑම පෘතග්ජනයෙකුටම සංසාරයක් ඇතිබවත්, ඒ ගැන භයත් උපදී. සංසාරයෙන් ගැලවීම ට හෙතෙම කල්පනා කරයි. නමුත් සංසාරයක් නොමැති බව ඔබලා පැවසීමෙන් ඉහත අරමුණ සම්පූර්ණ වේද ?**

සංසාරය නම් කාලය පිළිගැනීමයි. සංසාරය යනු සත්‍යයක් නම් එම

සංසාරයෙන් නිදහස් විය නොහැක. බුදුන් වහන්සේ ගේ ධර්මයෙන් (උදාන වාක්‍යයෙන්) කියන්නේ සංසාරයක් ඇති බවවත්, එම සංසාරයෙන් තමන් නිදහස් වූ බවවත්, නොව මෙතෙක් කල් තමන් පිළිගත් සංසාරය පිළිබඳ ධර්ම වලින් නිදහස් වූ බවය. බුදු කෙනෙක් සියළු පිළිගත් ධර්ම වලින් නිදහස් වෙයි.

අනුන්ගෙන් ඉගෙන ගත් දැනුමෙන් තමන්ට භය උපදී. ආගම් වලින් මෙම භය කුඩා කාලයේ සිටම තම අනුගාමිකයන්ට ඇති කර ඇත. භය උපදවා එමගින් ස්වයං පාලනයක් ඇති කිරීමට උත්සාහ කිරීම, මිනිසාගේ නොදියුණු බවෙහි ලක්ෂණයකි. හැකුළුන මානසිකත්වයක් ඇති අනුගාමිකයෝ පසුව මෙම භය නිසා මානසික රෝගීන් බවට පත්වෙති. එවිට ආගමික සාතෘවරයාට තම අනුගාමිකයා තමන්ගේ විශ්වාසයන් තුල ඇඳ බැඳ තබා ගැනීමට පහසු වෙයි. යමෙක් සත්‍ය දුටුපසු, තමන් මෙතෙක් ඉගෙන ගත් සියළුම ආගම් ධර්ම වලින් නිදහස් වන බැවින් භයෙන් ද නිදහස් වෙයි.

'බුද්ධ' බාහිරෙන් පනවන ලද විනයකින් පාලනය නොවෙයි. බුදු කෙනෙක් කිසිම විනයක් පනවන්නේ නැත. විනය පිටකයේ ඇති සියළුම විනය නිතී පෘතජන පුද්ගලයින්ගේ ඉල්ලීම පිට පනවන ලද්දාවූ නීති වෙති.

**මතුගම හර්බට් මුණසිංහ විසින් එවන ලද ප්‍රශ්න හා ඒවාට පිළිතුරු මෙසේයි.**

**ප්‍රශ්ණයː ඔබගේ ලිපි වල අන්තර්ගත ගැඹුරු අදහස් තේරුම් ගැනීමට උගහටය. එවැනි වැකි කීපයක් පහත පල කරමි 'අකාලික විශ්වයෙහි දකින්නට වස්තුවක් නැත. නැති වස්තුවක් දකින්නේ ආලෝකයේ ක්වන්ටම් ගුණය නිසයි ' මෙය පහදා දෙන්න.**

මෙය සරල භෞතික සිදුවීමකින් පැහැදිලි කළ හැක. තටු තුනක් සහිත විදුලි පංකාවක් ගැන සිතන්න. එය නිශ්චලව ඇති විට තටු තුනක් ඇති බව පෙනේ. තටු අතර අවකාශය ඇත. දැන් පංකාව වේගයෙන් කැරකෙන විට තටු කීයක් පෙනේ ද? එක තටුවක්වත් නොපෙනේ යයි සඳහන් කළොත් එය නිවැරදි පිළිතුරක් ද? අනෙක් අතට පංකාව කැරකෙන විට තටු අතර ඇති හිස් අවකාශය වෙනුවට දැන් යමක් ඇතයි පෙනෙයි. යමක් ඇතැයි පෙනුන ද එහි ඇත්තේ හිස් අවකාශයයි. වේගය නිසා යමක් ඇතයි පෙනෙයි. පදාර්ථය යයි පිළිගන්නා ශක්තියෙහි ද ඇත්තේ වේගයකි. එම වේගය නිසා නැති යමක් පෙනෙයි. එය සිදුවන්නේ ආලෝකයේ ඇති කම්පන ගුණය හෙවත් ක්වන්ටම් ගුණය නිසයි.

**ප්‍රශ්නයඃදිනක් මා අධිකාරම් මහතාගෙන් විමසූ විට පුනරුත්පත්තිය ගැන ඔහු පැවසුවේ, එය තමාත් හරියට නොදන්නා බවයි. බුදු දහම ගැන ගැඹුරු දැනුමක් ඇති ඔහු එසේ පැවසුවේ ඇයි?**

සත්‍ය නොදුටු අයගෙන් එක් කොටසක් පුනරුත්පත්තියක් ඇතැයි කියති, තව කොටසක් නැතයි කියති. මෙම දෙකොට්ඨාශයම පිළිතුරු දෙන්නේ අනුන්ගෙන් අසා දැනගත් දැනුම ප යෝජනයට ගැනීමෙනි. අධිකාරම් මහතාගේ පිළිතුරට මම ගරු කරමි. එතුමා තමන් නොදන්නා දෙයට නොදන්නේ යයි පිළිතුරු දී ඇත. පුනරුත්පත්තිය යන්නෙහි තේරුම නැවත උප්පත්තිය යන්නයි. උප්පත්තිය හා මරණය යනු තමන් පිළිගත් ලෝකයෙහි ඇති සංස්කාර ධර්මයකි. පුද්ගලයා පිළිගත් විට එම පුද්ගලයාගේ උප්පත්තිය හා මරණය ඇත. පුද්ගල දෘෂ්ඨියෙන් නිදහස් වූ විට උප්පත්තියෙන් හා මරණයෙන් ද නිදහස් වන බැවින් පුනරුත්පත්තියක් ඇතැයි යන අන්තයෙන් ද පුනරුත්පත්තියක් නැතැයි යන අන්තයෙන් ද නිදහස් වෙයි. පුද්ගල දෘෂ්ඨියෙන් නිදහස් වීමට නම්, බුදු දහම පිළිබඳ වූ ගැඹුරු දැනුමෙන් ද නිදහස් විය යුතුය.

**ප්‍රශ්ණයඃ මට ඔබෙන් දැන ගැනීමට ඇත්තේ සිතට සහනයක් ලබමින් ජීවිතය ගෙන යන්නේ කෙසේ ද? කියායි. ත්‍රිපිටකයට අනුව නිවන් අවබෝධ කර ගැනීම ලෙහෙසි පහසු නොවෙයි. එහෙත් සෝපාක වැන්නන් ක්‍ෂණිකව මග ඵල ලැබුවේ කෙසේ ද?**

හර්බට් මුණසිංහ මහතා මෙම ප්‍රශ්න මා වෙත එවූයේ ලංකාදීප පත්‍රයේ පලවූ ලිපි තුනක් පමණක් කියවීමෙනි. මෙහි පළවන සියලුම ලිපි කියවීමෙන් පසු යම් කෙනෙකුට යම් තරමකට මෙම ප්‍රශ්නයට පිළිතුරු ලැබෙනවා ඇත. බුදු දහම නම්, තමන් විසින් දැඩිව අල්ලාගත් සිතෙන් නිදහස් වන මාර්ගයයි. නිදහස් වූ සිතකට සහනයක් කුමට ද? බුදු දහම යනු කුමක් දැයි නොදන්නා යෝගාවචරයෝ සිත දියුණු කරති. දියුණු කරන ලද සිත දැඩිව උපාදානය කරන හෙයින් යෝගාවචරයාට සිතෙන් නිදහස් වීමට නොහැකි වෙයි. එමනිසා සිතට සහනයක් සොයති. ත්‍රිපිටකයේ ඇති ධර්ම පිළිපැදීමෙන් නිවන් අවබෝධ කරගන්නවා විනා නිවන් දැකිය නොහැකි ය. මිනිසාට ඇති 'දුක' නම් නිවන් අවබෝධ කරගැනීමට කායික හා මානසික වීර්යය යෙදීම මිස අනෙකක් නොවෙයි. නිවන් අවබෝධයට දරන උත්සාහය දුකකි. සෝපාක වැන්නන් ක්‍ෂණිකව මග ඵල ලැබුවේ ධර්ම අත්හැරීමෙනි, වීර්යය අත්හැරීමෙනි. එය දුකෙන් නිදහස් වීමේ මාර්ගයයි. එය ක්‍රියාමාර්ගයක් නොවෙයි. එය අලසව සිටීමක් ද නොවෙයි. එය දැකීමකි. නමුත් බෝහෝ දෙනෙකුට මෙම 'දැකීම' යනු කුමක් දැයි යන්න 'දකින්නට' අපහසු ය. එවැන්නෝ බුදුන්ට එරෙහි වෙති.

**ප්‍රශ්නයඃ ඔබ පවසන පරිදි සියලුම දෘෂ්ඨී දැනුමේ ඵලයන් ය. දැනුම වැරදි බැවින් සියලුම දෘෂ්ඨී මිත්‍යා දෘෂ්ඨී වෙයි. ළමයාට බාහිර දැනුමක් නොමැති බැවින් සත්ත්ව පුද්ගල දෘෂ්ඨීයක් නැති බව කියයි. සත්ත්ව පුද්ගල දෘෂ්ඨීය නැති කුඩා දරුවාට සසරින් එතෙර වීමට බැරි බව ඔබ කියයි. මෙය ව්‍යාකූල අදහසකි.**

මගේ ලිපි වලින් මෙම ව්‍යාකූලත්වයට තරමක් දුරට පිළිතුරු

ලැබෙයි. සත්‍ය දකින තෙක් මෙම ව්‍යාකූලත්වය පවතී. දැනුමෙන් තොර දෘෂ්ටියක් නැත. මාස දෙක තුනක් වයසැති දරුවාට දෘෂ්ටි තිබේ ද? සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය ඇතුළු සියලුම දෘෂ්ටි දැනුමත් සමගම එකතු කරගනී. සත්‍ය දැකීම යනු සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය ඇතුළු සියලු දෘෂ්ටි වල වැරදි දැක ඒවායින් නිදහස් වීමයි. දෘෂ්ටි නැතිනම් දෘෂ්ටි වැරදි බව දකින්නේ කෙසේ ද? එම නිසා සත්‍ය දැකීමට දැනුමෙන් නිර්මාණය කරගත් දෘෂ්ටි තමන් ළඟ තිබිය යුතුය. සත්ත්ව පුද්ගල දෘෂ්ඨියක් නැති කුඩා දරුවකුට සත්‍ය දකින්නට නොහැකි ඒ නිසයි.

**ප්‍රශ්නයඃ සසරින් එතෙර වීමට නම් නිවැරදි දැනුම අප තුළ තිබිය යුතු බව ද ඔබ කියයි. දැනුම වැරදි යයි කිවූ ඔබ නිවැරදි දැනුමක් ගැන නැවත කතා කරයි.**

ලංකාදීප ඉරිදා සංග්‍රහයෙහි 'ධර්ම පහුර හිස තබාගෙන මෝහ ගඟ තරණය කරන්නෝ' නැමති ලිපියෙහි 'සසරින් එතෙර වීමට නම් **නිවැරදි** දැනුම අප තුළ තිබිය යුතු ය' යයි සඳහන් වී තිබුණේ ප්‍රමාද දෝශයකිනි. එය 'සසරින් එතෙර වීමට නම් **වැරදි** දැනුම අප තුළ තිබිය යුතු ය' යනුවෙන් නිවැරදි විය යුතු ය. දැනුම වැරදි බව දැකීමෙන් සත්ත්වයා සසරින් එතෙර වෙයි.

**ප්‍රශ්නයඃ ලංකාදීප පත්‍රයේ පළවූ 'පන්සිල් සහ ළමා මනස' ලිපිය සමග මම සියයට සියයක් එකඟ වෙමි. ඔබ ගොඩනගන්නාවූ තර්කය හරියට හරිය. ඒ ගැන ප්‍රශ්නයක් නොමැත. පන්සිල් සමාදන් වන රටක් මිස පන්සිල් රකින රටක් නොවන ශ්‍රී ලංකාවේ සිදුවන අපරාධ දෙස බලන විට පුදුම සහගතය. ආචාර්ය අදිකාරම් තුමා දැනට බොහෝ කලකට පෙර මේ පිළිබඳ මත පළකරමින් ජීවිතයට එක් වරක් පන්සිල් ගැනීම සෑහේ ' යයි පැවසීය.**

'පන්සිල් සහ ළමා මනස' නැමති ලිපියත් එම ලිපියට පිළිතුරු වශයෙන් පල කරන ලද ලිපි වලට ලියූ ලිපියත් විවිධ හේතූන් නිසා

මෙම පොතට මම එකතු නොකෙළෙමි. අපි විසින් බිහි කළ යුත්තේ පන්සිල් සමාදන් වන සමාජයක් ද නැතිනම් පන්සිල් රකින සමාජයක් ද යන්න මගෙන් පාඨකයාට යොමු කරන එකම ප ්‍රශ්නයයි. මගේ ලිපිය අගය කිරීම ගැන මම මුණසිංහ මහතාට ස්තුති වන්ත වෙමි. මම දෙවන වරට පන්සිල් ගැන ලංකාදීපයට ලිවූ ලිපියෙහි කොටසක් මෙහි පල කිරීමට කැමැත්තෙමි. මේ සම්බන්ධයෙන් පාඨක ඔබේ විවේචන ද මම අගය කරමි.

කුඩා ළමයා 'මම සතුන් නොමරමි' යි යයි කියන නමුත් ඉන් ඔබ්බට ගිය විස්තරයක් ඔවුන් නොදන්නා බව ශාස්ත්‍රපති කහවත්තේ ඤාණසීහ හිමිපාණෝ උන්වහන්සේගේ 'පන්සිල් අමතක කර දැහැමි සමාජයක් ගොඩනගන්නේ කෙසේ ද?' යන ලංකාදීපයේ පළවූ ලිපියෙන් කියා සිටිති. උන්වහන්සේ එයින් අදහස් කරන්නේ දරුවාගේ එම 'කියවීම' තේරුමක් ඇතිව කරන දෙයක් නොවන බවයි. තේරුමක් නැති දේ දරුවන් ලවා කියවන්නේ කුමක් අරබයා දැයි මම දෙමව්පියන්ගෙන් පළමුව අසමි. මෙම ධර්ම තේරුමක් නැති කාලයේ සිටම කියාදීමෙන් දරුවා වැඩිහිටියකු බවට පත්වූ පසු ද 'මම සතුන් නොමරමි' යයි කියන නමුත් ඉන් ඔබ්බට ගිය විස්තරයක් ඔවුන් නොදනිති. මේ හේතුව නිසා බොහෝ දෙනෙක් පන්සිල් සමාදන් වනවා යයි කරන්නේ කටට එන වචන පිටකීරීමක් පමණි. බොහෝ දෙනෙකුට එය ඇබ්බැහි වූ පුරුද්දක් පමණි. මේ කිසි කෙනෙකු පන්සිල් රැකීමක් ගැන නොදනිති. ඔවුන් දන්නේ පන්සිල් සමාදන් වීම පමණි. අත් දෙක දොහොත් මුදුනේ තබා පන්සිල් කියවන විට මදුරුවෙක් දෂ්ඨ කළහොත් මෙවැනි වැඩිහිටියන් කරන්නේ වම් අත නළලේ තිබිය දී අකුණු අතින් මදුරුවාට මිටි පහර දී 'මම සතුන් නොමරමි' යි කියා අත් දෙක නැවත එකතු කර නලළේ තැබීමයි. පන්සිල් සමාදන් වූ මෙම උපාසක මව්පිය වරුන් ආපසු ගෙදර බලා සැපත් වන කල වතුර පිරි පොල් කටුවක මදුරු කීටයන් පිහිනමින් සිටිනු දුටු විට එම පොල් කටුව පෙරලා දමයි. අටසිල් පවාරණය කරන ලද ගම හාමිනේ ඉක්මන් ගමනින් නිවසට පිය නගන්නේ ගමරාළ ඇල්ලූ මාළු කූරියන් ටික කපා කොටා සුද්ද කර හෙට දිනයට යෙදී ඇති පේරු දානය පිළියෙල කරන්නට ය.

මෙය ග්‍රාමීය සංස්කෘතියේ එක් අංගයකි. ගම හාමිනේ පන්සිල් සමාදන් වී ඇති නිසා මාළු කුරියෝ මැරෙන්නට හරිනවා මිස පිහියෙන් හෝ පොල්ලෙන් ගසා මරන්නේ නැත. උන් ඔක්සිජන් හා ජලය නොමැතිව මැරියයි. එය හරියට කුමක් වැනි ද කියනවා නම්, යම් අයකුට තමන්ගේ සතුරා මරා දමන්නට උවමනා වූ විට, කට හා නාසය බැඳ පැත්තකින් තැබීමක් වැනි ය.

'ගුරුවරු මව්පියවරු හා ආගමික ශාස්තෘවරු තම දරුවන් පන්සිල් සමාදන් කරවීමට පෙළඹුවද ඔවුන්ගේ 'පන්සිල් රැකීම' ගැන කිසිම තැකීමක් නොකරයි. උදයේ පාසල් යාමට පෙර හා නින්දට යාමට පෙර තම දරුවාගෙන් 'පන්සිල් සමාදන් වූවාදැ' යි දෙමව්පියෝ දරුවන්ගෙන් අසන නමුත්, කිසිම දිනක තම දරුවාගෙන් 'පුතේ අද පන්සිල් රැක්කා දැ'යි අසන්නේ නැත. එසේ අසන්නට කිසිම වැඩිහිටියකුට ආත්ම ශක්තියක් ද නැත. 'අම්මා තාත්තා ගුරුවරයා හෝ හාමුදුරුවෝ පන්සිල් රැක්කා දැ'යි දරුවා පෙරලා ප්‍රශ්න කළොත් මෙම වැඩිහිටියන්ට කට උත්තර නැත. මෙවැනි ධර්ම නිසා 'පන්සිල් රැකීම' අවශ්‍ය නොවන දෙයක් ලෙස දරුවා සලකනවා පමණක් නොව, මෙම ධර්ම ඉගෙනගත් දරුවාගේ ආකල්පය වන්නේ ඕනෑම දෙයකට 'පොරොන්දු' වීම පමණක් සෑහෙන බවත්, එය ක්‍රියාවට නැංවීම අවශ්‍ය නොවන දෙයක් බවත් ය. ලාංකීය බෞද්ධ සමාජයෙහි ඇති මෙම සංස්කෘතික චර්යාව ඉතා පැහැදිලිව මම දුටුවේ ලංකාවෙන් එතෙර ජීවත් වන විටදී ය. රටක දියුණුවට ඉතාමත් අහිතකර ලෙස බලපාන මෙම අයහපත් චර්යාවන්ට මූලික හේතුව කුමක් දැයි දැන් ඔබට පෙනේද? අපි යම් කෙනෙකුට 'හරි මම එය කරදෙන්නම්' යයි පොරොන්දු වන්නේ එය කරදීමේ කිසිම චේතනාවකින් නොවේ. තම කාර්යයන් කර ගැනීමට විසි තිස් වරක් කාර්යාල වලට බඩ ගාන්නට ජනතාවට සිදුවී ඇත්තේ ඇයි? සංස්කෘතික අංගයක් වූ එවැනි චර්යාවන් අපට ඇති වූයේ කුඩා කාලයේ සිටම කඩකිරීමේ චේතනාවෙන්ම පන්සිල් සමාදන් වී එම පොරොන්දු ඉටු නොකරන පුරුද්ද නිසාවෙනි. මෙය සමාජීය ගැටලුවකි. හේතුවට බෙහෙත් කළ යුතුය.'

කුඩා දරුවාට තිරිසන් සත්වයාට මෙන් නිදහස් වෙන්නට ලෝකයක් නැත. මුලාවට පත්වී නැත . මුලාවට පත් නොවූ කුඩා දරුවෙකුට හෝ තිරිසන් සත්වයෙකුට නිවන් දකින්නට අවශ්‍ය කෙලෙස් ආදී ධර්ම නැත. දෙමවුපියන් ළඟ වැඩෙන කුඩා දරුවා දෙමව්පියන් සහ ගුරුවරුන්ගෙන් මුලාවට පත්වෙයි . ඔබත් තවම ඔබගේ ගුරුවරුන්ගෙන් ධර්ම අසයි ., ප්‍රගුණ කරයි . එමගින් ධර්ම පහුර සාදාගනියි. වාසනාවට පන්සිල් අට සිල් බුදු පිළිම වැඳිම වැනි සිල්වෘත රකින බෞද්ධයෝ මුලාවට පත්වී දර්ම පහුර සාදාගෙන යම් දවසක සසරින් එතෙර වෙති. පන්සිල් අට සිල් බුදු පිළිම වැඳිම වැනි සිල්වෘත වලින් මේ පහුර ශක්තිමත් කරයි . නමුත් අවාසනාවකට මෙන් මුලාවෙන් නිදහස් වීමට විර්යය දරන අලුත බිහිවූ දේශකයෝ පන්සිල් අටසිල් බුදු පිළිම වැඳිම වැනි වෘත වලින් ඉවත් වූ තැන නිවන ඇතැයි කරන දේශනා නිසා ධර්මය නමැති පහුර ගඟෙන් එතෙර වීමට පෙරම විනාශ කර දමති. ඔවුන්ට මේ විනාශ කරගත් පහුර නැවත සෑදීමට සසර බොහෝ කලක් සැරිසැරීමට සිදුවෙයි.

ප්‍රශ්නය: දැනුමෙන් නිදහස් වෙන්න සැකය එකම මාර්ගය වෙන්නේ කොහොමද?

පිළිතුර: සැකය හෝ ප්‍රශ්නය මාර්ගය නොවෙයි. එය ඇතිවන්නේ ප්‍රඥාවට පෙරයි . ප්‍රශ්නයක් ඇති කෙනා එම ප්‍රශ්නය විසදාගෙන (අනුන්ගෙන අසා දැනගෙන හෝ තමන්ගේ බුද්ධියෙන් විමසා බලා නොවෙයි) ප්‍රඥාව පහල කරගනියි. දුක දකින්නේ ඊට පසුවයි. මේ දුක අපි කියන දුක සැප නොවෙයි. ඕනෑම ජාතියකයෙක් ආගමිකයෙක් ප්‍රඥාව පහල වූ පසු මේ දුක දකියි . දුක, දුකට හේතුව, දුක නැති කිරීම දැක අවසානයේදී මාර්ගයට වැටෙයි . එය සෝවාන් මාර්ගයයි.

දැනුම ඇතිවෙලා තියෙන්නේ මුලාව නිසා . මුලාව නැති තැන බුද්ධියක් හෝ ඥානයක් නැහැ . මුලාවෙන් නිදහස් වුනාම දැනුම

හෙවත් ධර්මයෙන් නිදහස් වෙනවා . දැන් එතන දෘෂ්ඨි නැහැ. සෝවාන් ඵලය.

Prashnaya mulawen nidahas wenne keseda?

ඔරග්නාව පහල වෙලා දුක දැකල හේතුව දැකලා නැතිකිරීම දැකලා මාර්ගය දැකලා තමයි මුලාවෙන් නිදජස් වෙන්නේ. මේක හැම මිනිස් සත්වයකුටම පොදුයි.

mulawa kiyala oba kiyana seemwa kumakda?
මුලාවේ සීමාවක් නැහැ මුලාවට පත් වුනාට පස්සේ . නමුත් ඔබ මුලාවට පත්වෙන්නේ නැහැ බුද්ධිමතෙක් වුනේ නැත්නම්. ඒ කියන්නේ මනුෂ්‍යාත්වය.

.jeewath weeme aramuna kumakda?

අරමුක තීරණය කරන්නේ ඔබයි. අරමුණ තියෙන්නේ ඔබේ දැනුම තුලානේ. එකත් මුලාවෙන් වටවෙලානේ තියෙන්නේ?

prajnawa kiyanne danumata pitin ( Beyond) thiyena deyakda?
බොහෝ දෙනෙක් හිතන්නේ ප්‍රඥාව තියෙන්නේ බුද්ධිය තුලමයි කියල. බුද්ධ වචනය ප්‍රඥාවන්තයින් සඳහා යයි කිවම මේ අය කොලර් එක උස්සා ගන්නවා. නමුත් බුදුන්ට පයින් ගහනවා. බුද්ධ මරන්න හදනවා. තව කෙනෙක් හිතනවා ප්‍රඥාව තියෙන්නේ දැනුමෙන් ඔබ්බට කියලා. නැතිනම් ද්විත්වයෙන් ඔබ්බට කියලා. නමුත් ඒ දෙකටම එහායින් තමයි මුලාව තියෙන්නේ. නමුත් මේ ප්‍රඥාව මුලාව තියෙද්දීම මතු වෙනවා. එකයි ආශ්චර්ය. ඒ ප්‍රඥාව වර්ධනය වන ප්‍රඥාවක්. මේ ප්‍රඥාව වර්ධනය වෙන්නේ තන්හාවෙන්. කෙලෙස් වලින්. මේවා කියන කොට බෞද්ධයෝ මාව මරන්න හදනවා. මේ අය නිවන් දකින්න යන්නේ තන්හාව නැති කරලනේ. එක අවස්තාවකදී කෙලෙස් වලින් වර්ධනය වන ප්‍රඥාව ම හේතු වෙනවා මුලාවෙන් නිදහස් වෙන්න.

ඉන්ද්‍රිය යයි පවසූ කල මනින්ද්‍රියද එක් ඉන්ද්‍රියක් නේද? පඨවි යන්න ඇසෙන් දැකියහකි කනෙන් ඇසිය හැකි දෙයක් නොවුනත් ප්‍රඥා චර්තසිකය දියුනු කරන ලද මනෝවිඥානයකට අරමුනු කල හැකි දෙයක් නේද? මනින්ද්‍රිය තුල පහල වන මනෝවිඥානයකට අරමුනු වන දෙයක් නම් එය ඉන්ද්‍රිය ගෝචර දෙයක් නේද?

මේකයි Lahiru මනේන්ද්රියත් ඉන්ද්‍රියක් තමයි. ගෞතම බුදුන් දෙශනා කලේ ඉන්ද්‍රිය ගෝචර සියල්ලේ යථා ස්වභාවය ප්‍රඥාවෙන් දැකීම තමයි. නමුත් බොහෝ දෙනෙක් ඉන්ද්‍රිය ගෝචර බුද්ධියට ප්‍රඥාව යයි රැවටෙනවා. ඉන්ද්‍රිය ගෝචර සියල්ලේ යථා ස්වභාවය ඉන්ද්‍රිය ගෝචර ධර්මයකින් බලන්න බැහැ නේද? එසේනම් ප්‍රඥාව සිත දියුණු කිරීමෙන් ලබන්න පුලුවන්ද? සිත ඉන්ද්‍රිය ගෝචර නේද?



# ධර්ම පහුර හිස තබාගෙන

# මෝහ ගඟ තරණය කරන්නෝ

ආචාර්ය තිස්ස සේනානායක

බුදුන් වහන්සේ, රූපය පෙණ පිඩකටත්, වේදනාව දිය බුබුලකටත්, සංඥාව මිරිඟුවකටත්, සංස්කාරයෝ කෙසෙල් කඳකටත්, විඤ්ඤාණය මායාවකටත්, උපමා කළහ. ධර්ම පඬිවරූ එම රූප, වේදනා,සංඥා, සංඛාර හා විඤ්ඤාණ නම් වූ පංච උපාදානස්කන්ධයේ පදනම වූ ධර්මය හිස තබාගෙන මායාවක් වූ විඤ්ඤාණයෙන් ම සතය සොයති.

බුදුන් වහන්සේ ධර්මය පහුරකට උපමා කළ සේක. තොටියා පහුර මත හැඟී තබලෙන් ගඟ තරණය කර ගඟෙන් එතෙර වන්නේය. බෞද්ධ ශ්‍රාවකයා ධර්මය නමැති පහුර හිස තබාගෙන කායික හා මානසික වීර්ය යොදා මෝහය නැමති ගඟ තරණය කරන්නේය. ඔහු (ගඟෙන් එතෙර වීමට නොහැකිව) සැඩ පහරට අසුවී ගඟ පහළට ගසාගෙන යන්නේය.

ප්‍රශ්නයක් ඇතිව බුදුන් වහන්සේ හමුවට යන පුද්ගලයාට,
උන්වහන්සේ පිළිතුරු දෙයි. නුවණැති පුද්ගලයා එම පිළිතුර පිළිනොගනී. ප්‍රශ්නයත් පිළිතුරත් දෙකම අතහරී. අනුවණ පුද්ගලයා බුදුන් වහන්සේගේ පිළිතුර පිළිගනී. ඔහු ප්‍රශ්නයත් පිළිතුරත් ගබඩා කරගනී.

දැනුමෙන් අන්ධ වූ පෘතග්ජන පුද්ගලයා සිතන්නේ, තමන්ගේ දැනුමෙන් ලෝකය අවබෝධ කර ගන්නවා යනුවෙනි. නමුත් ඇත්තටම සිදුවන්නේ අනුන්ගේ දැනුමකින් බාහිර නැති ලෝකයක් තමන් විසින් නිර්මාණය කර ගැනීමකි.

Lecturer
Faculty of Science
University of Goroka
P O Box 1078
Papua NewGuinea

ISBN - 978-0-9804613-1-2